324 වන කාණ්ඩය - 03 වන කලාපය
தொகுதி 324 - இல. 03
Volume 324 - No. 03

2026 ජනවාරි 08 වන බ්‍රහස්පතින්දා
2026 சனவரி 08, வியாழக்கிழமை
Thursday, 08th January, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා** [තීරුව 436]

**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තා** [තීරුව 437]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 444-476]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමේදී මතුවී ඇති ගැටලු [තීරුව 477]

**2025 අය වැය යෝජනාවල ප්‍රගතිය:**

මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 481]

**සියයට 5ක උද්ධමන ඉලක්කයක් පවත්වාගෙන යාමේ තීරණය:**

මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 485]

**පෙර පාසල් අධ්‍යාපනය ප්‍රමිතිකරණය කිරීම:**

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමියගේ ප්‍රකාශය [තීරුව 491]

**මෝටර් වාහන පනත:**

නියෝග [තීරු 496-596]

**කල්තැබීමේ යෝජනාව:**

රජයේ ආයතනවල දිවා ආරක්ෂිත මධ්‍යස්ථාන පිහිටුවීම [තීරු 597-608]


# பிரதான உள்ளடக்கம்


**அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்** [ப: 436]

**அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழுவின் அறிக்கைகள்** [ப: 437]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 444-476]

**தனி அறிவித்தல் மூல வினா:**

புதிய கல்விச் சீர்திருத்தங்களை அறிமுகப்படுத்துவதால் எழுகின்ற சிக்கல்கள் [ப: 477]

**2025 வரவு செலவுத்திட்ட முன்மொழிவுகளின் முன்னேற்றம்:**

நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று [ப: 481]

**5 சதவீத பணவீக்க இலக்கைப் பேணுவதற்கான தீர்மானம்:**

நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று [ப: 485]

**முன்பள்ளிக் கல்வியைத் தரப்படுத்தல்:**

மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சரினது கூற்று [ப: 491]

**மோட்டார் வாகனச் சட்டம்:**

ஒழுங்குவிதிகள் [ப: 496- 596]

**ஒத்திவைப்புப் பிரேரணை:**

அரச நிறுவனங்களில் பகல் நேர பராமரிப்பு நிலையங்களை நிறுவுதல் [ப: 597-608]


# PRINCIPAL CONTENTS


MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 436]

REPORTS OF THE COMMITTEE ON PUBLIC ENTERPRISES [Col. 437]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 444-476]

QUESTION BY PRIVATE NOTICE:

Issues Arisen in Introducing New Education Reforms [Col. 477]

PROGRESS OF BUDGET PROPOSALS, 2025:

Statement by Deputy Minister of Finance and Planning [Col. 481]

DECISION TO MAINTAIN A 5 PER CENT INFLATION TARGET:

Statement by Deputy Minister of Finance and Planning [Col. 485]

STANDARDIZATION OF PRESCHOOL EDUCATION:

Statement by Minister of Women and Child Affairs [Col. 491]

MOTOR TRAFFIC ACT:

Regulations [Cols. 496-596]

ADJOURNMENT MOTION:

Establishment of Day-care Safe Centres in Government Institutions [Cols. 597-608]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 ජනවාරි 08වන බ්‍රහස්පතින්දා***

*2026 சனவரி 08, வியாழக்கிழமை*

*Thursday, 08th January, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2021, 2022 සහ 2023 වර්ෂ සඳහා සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගමේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ சபாநாயகர் அவர்களே, 2023ஆம் ஆண்டுக்கான இலங்கை மீன்பிடி துறைமுகங்கள் கூட்டுத்தாபனத்தின் ஆண்டறிக்கையை நான் சமர்ப்பிக்கின்றேன்.

இவ்வறிக்கை சுற்றாடல், கமத்தொழில் மற்றும் வளங்களின் நிலைத்தன்மை பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமென நான் பிரேரிக்கின்றேன்.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

கௌரவ சபாநாயகர் அவர்களே, அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவால் பாராளுமன்றத்தில் சமர்ப்பிக்கப்பட்ட அறிக்கையில் கடற்றொழில் அமைச்சு தொடர்பான விடயங்கள் பற்றி பாராளுமன்ற நிலையியற் கட்டளைகள் 119 (4) இன் பிரகாரம், அவதானிப்புக்கள் மற்றும் எடுக்கப்பட்ட நடவடிக்கைகள் தொடர்பான அறிக்கையை நான் சமர்ப்பிக்கின்றேன்.

இவ்வறிக்கை அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமென நான் பிரேரிக்கின்றேன்.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද,-

(i) (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 151 වගන්තිය සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ එවකට ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 සැප්තැම්බර් 04 දිනැති අංක 2452/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

[ගරු බිමල් රත්නායක මහතා]

(ii) (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වගන්තිය සමඟ කියවිය යුතු 141, 143, 144, 157අ, 168 සහ 190 වගන්ති යටතේ එවකට ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 සැප්තැම්බර් 25 දිනැති අංක 2455/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තා
## அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழுவின் அறிக்கைகள்
## REPORTS OF THE COMMITTEE ON PUBLIC ENTERPRISES

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

ගරු කථානායකතුමනි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දොළොස්වැනි වාර්තාව වූ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සම්බන්ධ වාර්තාව, දහතුන්වැනි වාර්තාව වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සම්බන්ධ වාර්තාව, දහහතරවැනි වාර්තාව වූ රාජ්‍ය දැව සංස්ථාව සම්බන්ධයෙන් වූ වාර්තාව, පහළොස්වැනි වාර්තාව වූ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය සම්බන්ධ වාර්තාව සහ දහසයවැනි වාර්තාව වූ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධ වාර්තාව සභාවේ විශේෂ අවසරය ඇතිව සිංහල භාෂාවෙන් පමණක් මම ඉදිරිපත් කරන අතර ඉංග්‍රීසි සහ දෙමළ භාෂා පිටපත් හැකි ඉක්මනින් ඉදිරිපත් කිරීමට ද කටයුතු කරමි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) අනුරාධපුර, ජයන්ති මාවත, 7වැනි පටුමග, අංක 2 යන ලිපිනයෙහි පදිංචි ඒ.එම්.එම්.ජී. සරත් ආනන්ද මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කොළඹගේආර, තිඹොල්කැටිය, 98 හන්දිය යන ලිපිනයෙහි පදිංචි කේ.ඩී.එන්. පෙරේරා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු කථානායකතුමනි, පොළොන්නරුව, නව නගරය, නිශ්ශංකමල්ල පෙදෙස, අංක 45 යන ලිපිනයෙහි පදිංචි පී. ඉවොන් දිල්රුක්ෂිකා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු රුවන් මාපලගම මහතා**
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)

ගරු කථානායකතුමනි, කඩවත, රන්මුතුගල, අංක 79/16 යන ලිපිනයෙහි පදිංචි කේ.ඒ. ආරියවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ඉතාම කෙටි කරුණු දැක්වීමක් සඳහා ඔබතුමාගෙන් අවසර ඉල්ලා සිටිනවා. ඊයේ දිනයේදී 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 24(4) වගන්තිය අනුව 2025 අංක 3 දරන විසර්ජන පනතේ 5වන වගන්තියට අනුකූලව "වීරමොං ක්‍රියාපටිපාටිය" යටතේ සිදු කරන ලද ප්‍රතිපාදන මාරු කිරීම සම්බන්ධයෙන් යම් කරුණක් පැන නැඟුණා. එය අදාළ කාල සීමාව තුළ ඉදිරිපත් වුණාද කියන ප්‍රශ්නය මන්ත්‍රීවරයකු මතු කළා. ඒ පිළිබඳව මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය ඇමතිතුමා විසින් මුදල් අමාත්‍යාංශය පැත්තෙන් පැහැදිලි කිරීමක් කළා. නමුත්, ව්‍යවස්ථාදායකය සහ විධායකය අතර මූලික වගකීම තිබෙන සභානායක කාර්යාලය පැත්තෙන් කරුණු කිහිපයක් සඳහන් කරලා ඒ පිළිබඳව ඔබතුමා සහ පාර්ලිමේන්තුව දැනුවත් කරන්න මා කල්පනා කළා.

ගරු කථානායකතුමනි, පළමුවන කරුණ මෙයයි. ඕනෑම අමාත්‍යවරයෙක් හෝ මුදල් අමාත්‍යවරයා මුදල් රෙගුලාසි 66 යටතේ හෝ ඕනෑම financial දෙයක් ඒ අදාළ අමාත්‍යවරයාට එවනකොට නීති උපදෙස් මත තමයි එවන්නේ, එතැනින්

පරීක්ෂාවට ලක් කරලා. විශේෂයෙන් මේ කාරණය ගත්තොත්, ජනාධිපතිතුමා මුදල් අමාත්‍යතුමා වශයෙන් සභානායකවරයා ලෙස මමත්, ගරු කථානායකතුමාත් අමතා එය ඉදිරිපත් කරන ලෙස දන්වා සිටියා. ගරු කථානායකතුමනි, සභානායක කාර්යාලය විධියට අපි අමාත්‍යවරයෙකු විසින් එවන දෙයක් වුණත් එය එවන ලෙසටම භාර ගන්නේ නැහැ. අපත් ඒක නීත්‍යානුකූලද, පනතට අනුකූලද කියලා බලලා තමයි මහ ලේකම්තුමියට යොමු කරන්නේ.

ඉන් පසුව මා දන්නා තරමින් මහ ලේකම්තුමිය එය Table Office එකට යොමු කරනවා, ඒකේ තිබෙන නීත්‍යානුකූලභාවය සහ අදාළ කාල සීමාව ඇතුළේද තිබෙන්නේ කියන එක බලන්න. මම හිතන විධියට, ඊටත් පසුව එතුමියලා ඔබතුමාත් සමඟ නැවත එක එක දවසේ agenda ගැන කථා කරනවා. මම හිතනවා, එතකොටත් නැවත පරීක්ෂාවට ලක් වෙනවා කියලා. ඒ සියල්ල සිදු වෙලා තමයි පාර්ලිමේන්තුවට ලේඛනයක් ඉදිරිපත් කෙරෙන්නේ, ගරු කථානායකතුමනි.

එම නිසා ගරු මන්ත්‍රීවරුන්ට ලේඛන පිළිබඳව ප්‍රශ්න කිරීමට තිබෙන අයිතිය ගැන මට කිසිම සැකයක් නැහැ. ඒ පිළිබඳව එතුමන්ලාට ප්‍රශ්න කරන්න සැබෑ අයිතියක් තිබෙනවා. එය භාවිත කරන්නත් අවශ්‍යයි. නමුත් මම පැහැදිලි කළේ මේ සභාවට ලේඛනයක් ඉදිරිපත් කරනකොට එය රටේ සම්මත වුණු නීති රීති සහ පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවලට අනුව අඩුම ගණනේ ස්ථාන පහකින් check වෙලා තමයි මේ සභාවට එන්නේ කියන එකයි. ඒ අනුව අදාළ අමාත්‍යාංශයෙන්, සභානායක කාර්යාලයෙන්, මහ ලේකම්තුමියට පසුව ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුවෙන්, නැවත මහ ලේකම්ගේ කාර්යාලයෙන් සහ ඔබතුමා විසින් එය පරීක්ෂා කරනවා.

ඒ නිසා මන්ත්‍රීවරුන්ගේ අවධානශීලීත්වය අගය කරන ගමන්, ඒ අයිතිවාසිකම ඉතා හොඳින් පරීක්ෂා කරලා භාවිත කරන්න කියලායි මා කරුණාවෙන් ඉල්ලා සිටින්නේ. මේ ලේඛනයට අදාළව ගත්තොත්, ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ ජූලි මාසයේ 07වැනි දා තමයි, පළමුවැනි transaction එක කරලා තිබෙන්නේ. ඒ නිසා හරියටම මාසයකට අඩු කාලයක් ඇතුළත එය කරලා තිබෙනවා. ඒ කාරණය තමයි මට පැහැදිලි කරන්න අවශ්‍යව තිබුණේ. ඒ කාරණය මම පොදුවේ සභාවේ අවබෝධය සඳහා තමයි ඉදිරිපත් කළේ.

බොහොම ස්තුතියි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේත්, ගරු සභානායකතුමාගේත් අවධානය පිණිස යම් කාරණයක් විමසීමේ අවශ්‍යතාව තිබෙනවා. සාමාන්‍යයෙන් පක්ෂ නායක රැස්වීමක් පාර්ලිමේන්තු සතිය තුළ පවත්වනවා, ඊළඟ පාර්ලිමේන්තු සතියේ න්‍යාය පත්‍රය ගැන සාකච්ඡා කරන්න. මේ සතියේ ඊළඟ පාර්ලිමේන්තු සතිය පිළිබඳ සාකච්ඡා කරන පක්ෂ නායක රැස්වීමක් ගැන තවම දිනයක්, වේලාවක් අපට දැනුම් දීලා නැහැ. මොකද, වසර ගණනාවක් තිස්සේ ඒ සම්ප්‍රදායය අපි පවත්වා ගෙන ආවා. එහෙම නැත්නම් මන්ත්‍රීවරුන්ට විවාද සඳහා සූදානම් වීමට ප්‍රමාණවත් කාලයක් ලැබෙන්නේ නැහැ. එම නිසා ඒ කාරණය මම ඔබතුමාගේත්, ගරු සභානායකතුමාගේත් අවධානය සඳහා යොමු කරනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඉදිරිපත් කරපු කරුණ ගැන කිව්වොත්, අපි පසුගිය කාලය තුළදී පාර්ලිමේන්තු සතිය තුළදීම පක්ෂ නායක රැස්වීමක් පවත්වන්න උපරිම වශයෙන් උත්සාහ කරලා තිබෙනවා. මේ සතිය තුළදී අපි පක්ෂ නායක රැස්වීමක් - Parliamentary Business Committee එක - පවත්වන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. එයට හේතුව, ආණ්ඩුවේ කටයුතු සම්බන්ධව තවත් පනත් දෙකකට අදාළ කරන අධිකරණමය ක්‍රියාමාර්ගවල අවසානවීමක් සිද්ධ වුණොත් අපට ඒක schedule කරන්න පුළුවන් වෙයි කියන බලාපොරොත්තුවෙන් ඉන්න නිසා. ඒ වාගේම, දැන් ඔබතුමන්ලා යම්කිසි ක්‍රියාවලියක යෙදී සිටිනවා, විශ්වාස භංග යෝජනාවක් ගැන. ඒ නිසා එය ඉදිරිපත් වුණොත්, ස්ථාවර නියෝග අනුව එයටත් ප්‍රමුඛතාව ලබා දිය යුතුයි.

එම නිසා අපි බලාපොරොත්තු වෙනවා, මේ සතිය තුළ Parliamentary Business Committee එක පවත්වන්නේ නැතුව එම ව්‍යවස්ථාදායක කටයුතු වාගේම ඔබතුමන්ලා විසින් සිදු කරන කටයුත්තේ තත්ත්වයත් අනුව ඒ පිළිබඳව දැනුවත් කරන්න. සාමාන්‍යයෙන් Resolution එකක් සම්මත කර ගන්නත් අවම වශයෙන් දින 5ක්වත් අවශ්‍යයි. ඒ සාධාරණය ඉටු කරලා, අපි ආණ්ඩුවේ කටයුතුවලට මුඛස්ථානය ලබා දෙමින් තමයි පාර්ලිමේන්තුවේ කටයුතු කරන්නේ. ඒ ගැන අපි ඔබතුමන්ලාව දැනුවත් කරන්නම්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, කෙටියෙන් අහන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මම අහන්නේ ඒකටම අදාළ වන දෙයක්. ගරු සභානායකතුමනි, මේ සතියට පමණද එතකොට ඒ තත්ත්වය තිබෙන්නේ, විශේෂ අවස්ථාවක් නිසා?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මේ සතියට තමයි ඒ තත්ත්වය තිබෙන්නේ. සමහර විට වෙනත් තත්ත්වයක් යටතේ දී වුණත් එහෙම වෙන්න පුළුවන්. නමුත්, අපි පොදුවේ අනුගමනය කරන්න උත්සාහ කරන්නේ

[ගරු බිමල් රත්නායක මහතා]

එකඟ වෙච්ච විධියටම පාර්ලිමේන්තු සතියේ බ්‍රහස්පතින්දා හෝ සිකුරාදා දිනයක එය පවත්වන්න. ඒක තමයි අපේ අරමුණ. ඒකේ කිසිම වෙනසක් නැහැ. හැබැයි, තත්ත්වය අනුව සමහර වෙලාවට ඒවා වෙනස් කරන්න වෙනවා නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා ඉදිරිපත් කරන කාරණය මොකක්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඔබතුමා ගරු සභානායකතුමාට ඊයේ සිදු වුණු දෙයක් පිළිබඳව පැහැදිලි කිරීමකට අවස්ථාව ලබා දුන්නා. ඒ නිසා මමත් ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, අනුරාධපුර දිස්ත්‍රික් මන්ත්‍රී ගරු රෝහණ බණ්ඩාර විජේසුන්දර මැතිතුමා ඊයේ දින ඉදිරිපත් කරපු විශේෂ කාරණාව පිළිබඳව. මම ඒ කාරණාව ඔබතුමාට පැහැදිලි කරන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඒක debate කරන්න ඕනෑ කාරණාවක් නොවෙයි නේ. එම කාරණය ඉදිරිපත් කළාට පසුව අවශ්‍ය කටයුතු සොයා බලනවා කියලා මම එතුමාට ඊයේ දැනුම් දුන්නා. ගරු විපක්ෂ නායකතුමනි. මම ඊයේ ඒ බව රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමාට දැනුම් දුන්නා. මට මේ ගැන ලේකම්තුමිය දැනුම් දීලා තිබුණේ නැහැ. *[බාධා කිරීම්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි,- *[බාධා කිරීම්]* Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා මට දැනුම් දුන්නාට පසුව ඒ සම්බන්ධයෙන් මම හොයා බලන්නම් කියලා මම එතුමාට ඊයේ දැනුම් දුන්නා. ඒ නිසා ඔබතුමා දැන් ඒ කාරණාව නැවත අහන්න අවශ්‍යතාවක් නැහැ. මම එතුමාට පිළිතුරු ලබා දීලා තිබෙනවා.
වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි,- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් ලේකම් මණ්ඩලය,-

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, - *[බාධා කිරීම්]* Sir, I rise to a point of Order.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
පාර්ලිමේන්තුව මෙහෙම වෙන්නේ නැහැ නේ, කවදාවත්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
පාර්ලිමේන්තුවේ මෙහෙම වෙලා තිබුණේ නැහැ.*[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඔව්, ඔව්, ඔව්. සභානායකකම තියලා ඔබතුමා යන්න අර මේසය ළඟට, කථානායකකමට.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මෙහෙම ස්ථාවර නියෝගවල,- *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි,- *[බාධා කිරීම්]* Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ලේකම් මණ්ඩලය කියනවා, ඒ report එක අපට - පාර්ලිමේන්තුවට - ලැබිලා නැහැ කියලා. ලැබුණාට පසුව ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ස්ථාවර නියෝග 28 යටතේ මම කියන්නේ. මේ සමස්ත මන්ත්‍රීවරුන්ගේම වරප්‍රසාද පිළිබඳ ගැටලුවක් තමයි විපක්ෂ නායකතුමා විපක්ෂයේ මන්ත්‍රීවරයකු වෙනුවෙන් අහන්න හදන්නේ. ඒක විපක්ෂ නායකතුමාට තිබෙන අයිතිය. ගරු කථානායකතුමනි, ඔබතුමා සභානායකතුමා කියන,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඒ කාරණාව අහලා ඒ සම්බන්ධයෙන් මම පිළිතුරක් ලබා දුන්නාට පස්සේ,-

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
නැහැ, නැහැ. එතුමාට අයිතිය තිබෙනවා, අපි පිළිබඳව කථා කරන්න. අපි විපක්ෂයේ මන්ත්‍රීවරු. එම නිසා අපි විටින් විට නැඟිටින්නේ නැතිව,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් වාර්තාවක් පාර්ලිමේන්තුවට ලැබිලාත් නැහැ. ලැබුණාට පසුව ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්නවා කියලා කිව්වාම නැවත ඒ ප්‍රශ්නය ඇසීමෙන් පලක් නැති බව මම කියන්න කැමැතියි. *[බාධා කිරීම්]*

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න.

ප්‍රශ්න අංක 1, ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.- *[Interruption.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා, ඒක ලිඛිතව දෙන්න. ඔබතුමා මට ලිඛිතව ලබා දෙන්න. අපට ලැබිලා නැහැ. ඔබතුමා ලිඛිතව මා වෙත එය ලබා දෙන්න.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමා, මට පොඩි අවස්ථාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, අවස්ථාව නැහැ. point of Order එකක් නැහැ නේ.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි,- *[බාධා කිරීම්]*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -20/2024- (2), ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -117/2024- (2), ගරු චමින්ද විජේසිරි මහතා. *[බාධා කිරීමක්]* ඔබතුමාට ප්‍රශ්නය අහන්න පුළුවන්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, දැන් මේ ඔක්කොම වැඩ පිළිවෙළ,- *[බාධා කිරීමක්]* මට තිබෙනවා, රීති ප්‍රශ්නයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නය අහන්න පුළුවන්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මට රීති ප්‍රශ්නයක් තිබෙනවා. ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92 (2) යටතේ රීති ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. ඔබතුමා මේ පාර්ලිමේන්තුවේ කටයුතුවලින් බැහැර වෙන්න එපා. විපක්ෂයේ අයිතිය තිබෙන්නේ, විපක්ෂ නායකට. අපේ මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්න අහන්න අයිතිය තිබෙන්නේ විපක්ෂ නායකට. හැබැයි, ඒක සභානායකට අහන්න දීලා අපි කොහොමද,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තර්කයක් නැහැ ගරු මන්ත්‍රීතුමා. එතුමාට ලිඛිතව ලබා දෙන්න කිව්වාම,-

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
දැන් අපට තනියෙන් ඇවිල්ලා තමුන්නාන්සේගෙන් ප්‍රශ්නයක් අහන්න බැහැ නේ. විපක්ෂයේ මන්ත්‍රීවරු ගැන කථා කරන්න අයිතිය තිබෙන්නේ විපක්ෂ නායකට. කරුණාකර එතුමාට ඒ අවස්ථාව දෙන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
( மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා. *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා. *[බාධා කිරීම්]*

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු කථානායකතුමනි, *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් මා දැනුවත් කර තිබෙනවා. නියෝජ්‍ය පොලිස්පතිතුමාව දැනුවත් කර තිබෙනවා. නමුත්, පාර්ලිමේන්තුවට පිටපතක් එවලා නැහැ. එතකොට කෙනෙකුගේ ජීවිත ආරක්ෂාව පිළිබඳව තර්ජනයක් තිබෙනවා කියලා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඕක ලිඛිතව මා වෙත ලබා දෙන්න. මොකද, ලේකම් මණ්ඩලයටවත්, මටවත් ඔය වාර්තාව ලැබී නැහැ. ලැබුණාට පසුව මම ක්‍රියාත්මක වෙන්නම්. *[බාධා කිරීමක්]* ඔබතුමාට මම කියන්නේ, ඔබතුමා අතට පත්වෙච්ච ඔය වාර්තාව මට ලබා දෙන්න කියලා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ඔබතුමා ඊයේ ඕක කිව්වේ නැහැ නේ. ඔබතුමා මට ඊයේ ඕක කිව්වාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔය වාර්තාව ලබා දෙන්න කියලායි ඔබතුමාට කියන්නේ. ඔබතුමා ලබා දෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, ගරු විපක්ෂ නායකතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
කෙනකුගේ ජීවිත ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනකොට ඒක කොහොමද Cabinet එකෙන් තීන්දු කරන්නේ?*[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ලිපිය එවන්න මට. ලිපිය මට ඇවිල්ලා නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඔබතුමා අවස්ථාව ලබා දුන්නා සභානායකතුමාට, ඊයේ සිදුවුණු ක්‍රියාවක් පිළිබඳව කරුණු පැහැදිලි කරන්න. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටියා, ඊයේ සිදුවුණු ක්‍රියාවලියක් පිළිබඳව, මන්ත්‍රීවරයෙකුගේ ජීවිතය පිළිබඳව කරුණක් ඉදිරිපත් කරන්න. ඒක ඔබතුමා ප්‍රතික්ෂේප කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පොඩ්ඩක් අවස්ථාව දෙන්න. මම ඔබතුමාගෙන් විනාඩියයි ඉල්ලන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කථා කරන්න, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මන්ත්‍රීවරයෙකුගේ ජීවිතය වෙනුවෙන් මට කථා කරන්න අයිතියක් නැද්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, කියන්න ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාට කියන්න කැමැතියි, මේ ලිපිය ගැන. මෙහි සඳහන් වන ආකාරයට, රෝහණ බණ්ඩාර විජේසුන්දර මන්ත්‍රීතුමාට ඇති ජීවිත තර්ජන සම්බන්ධයෙන් තර්ජන තක්සේරු වාර්තාවක් රාජ්‍ය බුද්ධි සේවාව, පොලිස් විශේෂ කාර්යාංශය හා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, උතුරු මැද පළාත මඟින් කැඳවා තිබෙනවා. මෙහි ඉතාම පැහැදිලිව කියා තිබෙනවා, "...තර්ජන තක්සේරු වාර්තාව මඟින් ඔබගේ ආරක්ෂාව සඳහා නිලධාරීන් යෙදවීම සුදුසු බව වාර්තා කර ඇත" යනුවෙන්. එතකොට, මෙතුමාට ආරක්ෂාව ලබා දෙන්න කියලා මේ නිර්දේශය තුළ තිබෙනවා. මම මේ ලිපිය **සභාගත*** කරනවා.

---
** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මම ඔබතුමාගෙන් මේ කාරණය අහන්න කැමැතියි. මේ තක්සේරු වාර්තාව මඟින් මෙතුමාගේ ජීවිත ආරක්ෂාව ලබා දීම සඳහා නිලධාරින් යෙදවීම සුදුසු බව වාර්තා වෙලා තිබෙන මොහොතකදී මේ ලියුමේම කියනවා, Cabinet approval එකක් ගන්න ඕනෑ කියලා ඒක ක්‍රියාත්මක කරන්නට. ගරු කථානායකතුමනි, මම ඔබතුමාට මතක් කරන්න කැමැතියි, මේ කාරණයත්. මතුගම මැතිවරණ බල ප්‍රදේශය සහ අගලවත්ත ප්‍රදේශය නියෝජනය කරන ජගත් විතාන මන්ත්‍රීතුමාට තක්සේරු වාර්තාවක් තුළ ආරක්ෂාව ලබා දුන්නා. ඒක හොඳයි. බොහොම ස්තුතියි, ඒකම අනුගමනය කරමින්,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, අවසන් කරන්න. *[බාධා කිරීම්]* ඔව්, දැන් විනාඩියක් ගිහිල්ලා.

ගරු විපක්ෂ නායකතුමා, ඒ සම්බන්ධයෙන් වාර්තාව ලේකම් මණ්ඩලයටත්, මටත් ලැබිලා නැහැ. එතුමාට මම කියන්නේ ඒ ගැන හොයලා බලන්නම් කියලා. මොකද, ඒක ලැබිලා නැහැ. ඔබතුමා එය ලබා දෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොයලා බලන්න දෙයක් නැහැ. මේ, පොලිස් වාර්තාව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔය ලිපිය මට ඇවිල්ලා නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොයලා බලලා එවලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔය ලිපිය මා වෙත ඇවිල්ලා නැහැ. ඔබතුමා මට එය ලබා දෙන්න.

ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ වේවා විපක්ෂයේ වේවා කවර හෝ මන්ත්‍රීවරයෙකුට ජීවිත තර්ජන තිබෙනවා කියලා ඒ මන්ත්‍රීවරයා නිසි ක්‍රමවේදය යටතේ දැනුම් දුන්නාම, ඒ බුද්ධි අංශ වාර්තා අනුව ඊට අදාළ කරන ආරක්ෂාව ලබා දෙන්න රජය කටයුතු කරනවා. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමන්ලාගේ පැත්තේ ජගත් විතාන මන්ත්‍රීතුමා එහෙම දෙයක් මේ පාර්ලිමේන්තුවේ කිව්වාම, ආණ්ඩුව හැටියට අපි මැදිහත් වුණා; පෞද්ගලිකව මමත් මැදිහත් වුණා; ගරු කථානායකතුමාත් මැදිහත් වුණා; ඒ අනුව එතුමාට අදාළ ආරක්ෂාව ලබා දුන්නා. ගරු විපක්ෂ නායකතුමනි, දැන් ඔබතුමාම පිළිගන්නවා, මේ මන්ත්‍රීවරයා මෙතැන ඒ ගැන කිව්වා විතරයි කියලා; අඩු තරමේ ගරු කථානායකතුමාට හරියට දැනුම් දීලාවත් නැහැ කියලා. අවුරුදු ගණනක් පාර්ලිමේන්තුවේ ඉඳලාත්, ඔබතුමා ඒ සම්බන්ධයෙන් තමන්ගේ මන්ත්‍රීවරයාට උපදෙස් දුන්නේ නැත්තේ ඇයි? විපක්ෂ නායකතුමා ඒ ක්‍රමවේදය ගැන ඒ මන්ත්‍රීතුමාට උපදෙස් දෙන්න එපායැ, තවත් දවසක් ගත වෙනකල් ඉන්නේ නැතුව. අද වන කල් -පැය 24ක්- ඉන්නවා, ඒ මන්ත්‍රීතුමාගේ ආරක්ෂාව ගැන කථා කරන්න. පාර්ලිමේන්තුවේ කථා කරන එක TV එකේ දමා ගන්න එක නොවෙයි වැඩේ. *[බාධා කිරීම්]* ඒ මන්ත්‍රීවරයාට ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒ ගැන ගරු කථානායකතුමාට හරියාකාරව කියන එකයි වෙන්න ඕනෑ. *[බාධා කිරීම්]* එහෙම කියන්නේ නැතුව පාර්ලිමේන්තුවේ කථා කර කර හිටියාට හරියන්නේ නැහැ. *[බාධා කිරීම්]* අපි ඒක serious ගන්නවා. *[බාධා කිරීම්]* ඔබතුමන්ලා ආරක්ෂාව ගැන ප්‍රශ්නයක් ඉදිරිපත් කළාම, අපි ඒක serious ගන්නවා. *[බාධා කිරීම්]* හැබැයි, ඒක ගැන දැනුම් දෙන්න කියලා ගරු කථානායකතුමා කිව්වාම, එහෙම නොකර, මෙතැන ඒ ගැන නිකම් කථා කරලා, අද වනකල් ඉඳලා, ආයෙත් හෙට වෙනකලුත් හිටියොත් මොකද වෙන්නේ? ඒ ආරක්ෂාවේ තරම මොකක්ද කියලා ඔබතුමාට තේරෙන්න ඕනෑ නේ, ගරු විපක්ෂ නායකතුමනි. *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඕනෑම මන්ත්‍රීවරයෙක් ඒ ගැන කරුණාකර නිසි ක්‍රමවේදයට අනුව දැනුම් දෙන්න. ඒ සම්බන්ධයෙන් රජය පියවර ගන්නවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, - *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි,- *[බාධා කිරීම්]* ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ එම කාරණය සම්බන්ධයෙන් වන ලිපිය දැන් මට ලැබුණා. ඒ සම්බන්ධයෙන් මම ක්‍රියාත්මක වෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමාට තමයි අප 225දෙනාගේම ආරක්ෂාව සම්බන්ධයෙන්- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -117/2024- (2), ගරු චමින්ද විජේසිරි මහතා. *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්නය අහනවාද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ මන්ත්‍රී වැටුප නොගන්නා මන්ත්‍රීවරුන් පිළිබඳ ප්‍රශ්නය දෙවැනි වතාවටත් මම අහනවා. නමුත්, උත්තරය දෙන්නේ නැහැ නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මට point of Order එකක් නඟන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 32(2) යටතේ මේ කල් ගැනීම සාධාරණයි. හැබැයි, පිළිතුර ලබා දීම සඳහා කල් ගන්නා කාරණය පිළිබඳව ඔබතුමාට ප්‍රශ්න කරන්න පුළුවන්. මම මේ ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ, "මේ වනවිට පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරුන්ගේ නම් කවරේද; පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වේ වනවිට ගෙවනු ලබන වැටුප් හා දීමනා කවරේද; වැටුප් හා දීමනා නොගන්නා මන්ත්‍රීවරුන්ගේ නම් කවරේද" කියලායි. මේ ප්‍රශ්නය කොටස් 3කින් විතරයි මා අහන්නේ. මේ ප්‍රශ්නයට උත්තර දීම දෙවැනි වතාවටත් කල් ගන්නවා. ඒක සාධාරණයිද, ගරු කථානායකතුමනි? පඩි නොගන්නේ NPP එකේ මන්ත්‍රීවරුන් විතරයි. එතකොට NPP එකේ මන්ත්‍රීවරුන් පඩි නොගන්නේ කී දෙනාද කියන ප්‍රශ්නයට පිළිතුර දවසකින් විතර දෙන්න බැරිද, මේ ගරු සභාවට?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, මන්ත්‍රී විශ්‍රාම වැටුපත් අහෝසි කරපු ආණ්ඩුවක්, අපේ ආණ්ඩුව. ඒ නිසා මේකට උත්තර දෙන එක එච්චර ප්‍රශ්නයක් නොවෙයි. අපි සති දෙකකින් උත්තර ලබා දෙන්නම්. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමා ස්ථාවර නියෝග පොත ගන්නකෝ. English එකයි තිබෙන්නේ, මා ගාව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කියන්නකෝ. ඔබතුමා මෙතැන මට අණ කරන්න ලෑස්ති වෙන්න එපා. *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මේ මන්ත්‍රීවරුන්ට පොඩ්ඩක් සද්ද නැතිව ඉන්න කියන්නකෝ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා මට අණ කරන්න අවශ්‍ය නැහැ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
කථානායකතුමනි, ඔබතුමන්ලාගේ කට්ටියට සද්ද නැතිව ඉන්න කියන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මෙතැනදී අණ කිරීම් කරන්න ඔබතුමාට බැහැ. *[බාධා කිරීම්]*
ප්‍රශ්න අංක 3.

## ඔටිසම් රෝගයෙන් පෙළෙන දරුවන්: මුල් හඳුනා ගැනීම සහ චිකිත්සක ප්‍රතිකාර ලබා දීමේ වැඩසටහන

## ஆட்டிஸம் நோயால் அவதியுறும் பிள்ளைகள்: முன்கூட்டியே இனங்கண்டு சிகிட்சையளிக்கும் வேலைத்திட்டம்

## CHILDREN SUFFERING FROM AUTISM: PROGRAMME FOR EARLY IDENTIFICATION AND THERAPEUTIC CARE

1650/2025

**3. ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ඔටිසම් වැනි රෝගවලින් පීඩා විඳින දරුවන් කල් ඇතිව හඳුනාගෙන ඒ සඳහා චිකිත්සක ප්‍රතිකාර ලබා දීමේ වැඩසටහනක් අමාත්‍යාංශය මඟින් ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, එම වැඩසටහන ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(iii) ළමා රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන් සේවය කරන රෝහල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම රෝහල් අතරින් ඔටිසම් වැනි රෝගී තත්ත්වයන්ට ප්‍රතිකාර කරන සායන ක්‍රියාත්මක වන රෝහල් කවරේද;

(v) එම රෝහල් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහ අනෙකුත් පහසුකම් ලබා දීම සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மதியிறுக்கம் (ஆட்டிஸம்) போன்ற நோய்களால் அவதியுறும் பிள்ளைகளை முன்கூட்டியே இனங்கண்டு அதற்கு சிகிச்சையளிக்கும் வேலைத்திட்டம் ஒன்றை அமைச்சு ஆரம்பித்துள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அவ்வேலைத்திட்டம் எந்த ஆண்டில் ஆரம்பிக்கப்பட்டது என்பதையும்;

(iii) குழந்தை மருத்துவ நிபுணர்கள் கடமையாற்றும் வைத்தியசாலைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) அத்தகைய வைத்தியசாலைகளில், ஆட்டிஸம் போன்ற நோய்களுக்குச் சிகிச்சையளிக்கும் கிளினிக்குகள் இயங்கும் வைத்திசாலைகள் யாவை என்பதையும்;

(v) அத்தகைய வைத்தியசாலைகளுக்குத் தேவையான உட்கட்டமைப்பு வசதிகளையும் ஏனைய வசதிகளையும் வழங்குவதற்காக நிதி ஒதுக்கப் பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) whether the Ministry has initiated a programme to identify children suffering from diseases such as autism in advance and to provide them with therapeutic treatment;

(ii) if so, the year in which the said programme was initiated;

(iii) the number of hospitals at which paediatric specialists are serving;

(iv) out of the said hospitals, the names of those that operate clinics to provide care for patients with diseases such as autism; and

(v) whether provisions have been allocated to provide the necessary infrastructure and other facilities to those hospitals?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඉතා වැදගත් ප්‍රශ්නයක් කෙරෙහියි මේ පාර්ලිමේන්තුවේ අවධානයට යොමු කරවන්නේ. ඒ, autism රෝගයෙන් පීඩා විඳින දරුවන් පිළිබඳවයි. ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්. මෙම වැඩසටහන "Inclusive Early Childhood Development" - අන්තර්කරණ මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන - ලෙස නම් කර ඇත. 2025 වසරේදී ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහ ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත.

(ii) 2020 වර්ෂයේ ජූලි මස නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කර 2021 වර්ෂයේ සිට දීප ව්‍යාප්තව ආරම්භ කිරීමට සැලසුම් කරන ලදී. ඒ අනුව මෙම වැඩසටහන කොළඹ, නුවර, ගම්පහ, කළුතර, මඩකලපුව හා ගාල්ල දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වේ. '

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchun a)
ගරු කථානායකතුමනි, - *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, වාඩි වෙන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, - *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු මන්ත්‍රීතුමා, ඔටිසම් දරුවන් පිළිබඳවයි කථා කරන්නේ. කෑ නොගහා පොඩ්ඩක් ඉන්න.

(iii)

| | පළාත | රෝහල් සංඛ්‍යාව |
|---|---|---|
| 1. | බස්නාහිර | 16 |
| 2. | දකුණ | 07 |
| 3. | සබරගමුව | 07 |
| 4. | වයඹ | 07 |
| 5. | උතුරු මැද | 02 |
| 6. | මධ්‍යම | 09 |
| 7. | ඌව | 02 |
| 8. | නැගෙනහිර | 03 |
| 9. | උතුර | 02 |
| | **එකතුව** | **55** |

(iv) 1. රිජ්වේ ආර්යා ළමා රෝහල

2. හෝමාගම මූලික රෝහල

3. මාලිගාවත්ත දිස්ත්‍රික් රෝහල

4. ශ්‍රී ජයවර්ධනපුර රෝහල

5. වේරහැර KDU රෝහල

6. පානදුර මූලික රෝහල

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

7. කළුතර මාතෘ හා ළමා රෝහල, **ගල්ලස්ස**
8. වතුපිටිවල මූලික රෝහල
9. උතුරු කොළඹ ශික්ෂණ රෝහලට අනුබද්ධිත ආයති මධ්‍යස්ථානය
10. සිරිමාවෝ බණ්ඩාරනායක ළමා රෝහල
11. පේරාදෙණිය ශික්ෂණ රෝහල
12. නාවලපිටිය මූලික රෝහල
13. ගම්පොල මූලික රෝහල
14. දිගන පුනරුත්ථාපන රෝහල
15. ගාල්ල ජාතික රෝහල ප්‍රගති මධ්‍යස්ථානය
16. කාත්තන්කුඩි මූලික රෝහල
17. මඩකලපුව ශික්ෂණ රෝහල
18. කුරුණෑගල ශික්ෂණ රෝහල
19. අනුරාධපුර ශික්ෂණ රෝහල
20. මහනුවර ශික්ෂණ රෝහල

(v) 2025 අය වැයෙන් මිලියන 200ක මුදලක් වෙන් කරනු ලැබූ අතර, 2026 අය වැයෙන් මිලියන 100ක මුදලක් වෙන් කර ඇත.

(ආ) පැන නොනඟී.

**ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය,-

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද, ඔබතුමාගේ point of Order එක?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම කිව්වේ, ස්ථාවර නියෝගවල English පිටපතේ තිබෙන වගන්තිය කියවන්නම් කියලායි. ස්ථාවර නියෝග 118 (2) මම කියවන්නම්. ඒකේ තිබෙන්නේ Committee on Ethics and Privileges ගැන. It states about the functions of the Committee. පළමුවෙනි එක තමයි, I quote:

> "(a) a complaint that is submitted to the Parliament, by a Member of Parliament,..."

පළමුවෙන්ම එය අපට submit කරන්න දෙන්න ඕනෑ, not to the Speaker. It states "submitted to the Parliament".

> "...with reference to a matter in respect to a violation of ethics and rules of the Code of Conduct of the Members of Parliament or a violation of the Privileges of the Parliament or a Member of Parliament, shall be examined,..."

So, it is the duty of the Committee, not the Speaker. The Speaker cannot decide whether it is a matter of Privilege or not; the Committee should decide. ඔබතුමන්ලාගේ ලේකම් මණ්ඩලයට මේක කියලා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, it states that the Speaker should be satisfied. - *[Interruption.]* ගරු අනුරාධ ජයරත්න මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ රෝගී තත්ත්වයෙන්, එහෙමත් නැත්නම් ආබාධිත තත්ත්වයෙන් පෙළෙන දරුවන් සමාජගත කරවීමට අමාත්‍යාංශයක් හැටියටත්, රජය හැටියටත් අපි හැමෝටම ලොකු වගකීමක් තිබෙනවා. එවැනි දරුවෙක් හඳුනා ගත්ත දිනයේ ඉඳලා සමාජගත කිරීම සඳහා නිශ්චිත නිවැරදි වැඩ පිළිවෙළක් තිබෙනවාද? ගරු අමාත්‍යතුමනි, ළමා විශේෂඥ වෛද්‍යවරු ඉන්න රෝහල් ගණනාවක් ඔබතුමා කිව්වා. ඒ රෝහල්වල මේ ආබාධයෙන් පෙළෙන දරුවන්ට ප්‍රතිකාර කිරීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා නම් හොඳයි කියන යෝජනාව කරන්න කැමතියි. එහෙම නොකරනවා නම් ඒ ඇයි කියන එකත් පැහැදිලි කරනවා නම් හොඳයි, ගරු ඇමතිතුමනි. ඒවාගේම මේ රෝගීන් ප්‍රවාහනය කිරීම සඳහා යම් වැඩ පිළිවෙළක් කරනවා නම් හොඳයි. මම දන්නවා අපේ ප්‍රදේශවල ඉන්න දරුවන් රෝහල්වලට ගෙනියන්න සමහර දෙමව්පියන්ට හැකියාවක් නැහැ කියලා. මෙවැනි ආබාධ තත්ත්වයෙන් ඉන්න දරුවෙක් පියාත් නැත්නම් තනියම රෝහලකට ගෙනියන්න අම්මාට හැකියාවක් නැහැ.

ඒ නිසා සෞඛ්‍ය අමාත්‍යාංශය මූලික කරගත් ඒ සායනවලට දරුවන් රැගෙන යෑම සඳහා යම් කිසි වැඩ පිළිවෙළක් අමාත්‍යාංශ මට්ටමින් ක්‍රියාත්මක කරන්න කියන යෝජනාව කරන ගමන්, එහෙම නොකරනවා නම් ඒ ඇයි කියන එකට ගරු ඇමතිතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු මන්ත්‍රීතුමා, වෙන වෙන කරුණුවලින් මේ ප්‍රශ්නයට disturb වුණාට, ඔබතුමාට මම බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා මේ කරුණට මේ පාර්ලිමේන්තුවේ අවධානය යළි යළිත් යොමු කිරීම පිළිබඳව. ඔටිසම් ඇතුළු මේ ආදී ස්නායු රෝගවලට ගොදුරු වූ දරුවන් පිළිබඳව මේ රජය පමණක් නොවෙයි, පසුගිය වසර කිහිපය තුළ රජයන් කිහිපයක් අවධානය යොමු කර තිබෙනවා. මෙතැනදී ප්‍රතිකාර කිරීම පමණක්ම නොවෙයි පවතින්නේ. මේ දරුවන් රැකබලා ගැනීම සඳහා ඔබතුමා කිව්වා වාගේ විශේෂ වැඩ පිළිවෙළක් අවශ්‍යයි. මම සඳහන් කරපු රෝහල්වල -ඒ රෝහල් 20 තුළ- ප්‍රතිකාර ක්‍රම ක්‍රියාත්මක වනවා. නමුත්, අපි හඳුනා ගත්ත අඩුපාඩුව තමයි, ඒ ප්‍රතිකාරයෙන් ඔබ්බට ගිහිල්ලා මේ දරුවන් රැක බලා ගැනීම වෙනුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයට පමණක් නොවෙයි, තවත් අමාත්‍යාංශ කිහිපයක සම්බන්ධීකරණයෙන් වැඩ පිළිවෙළක් අවශ්‍යයි කියන එක. විශේෂයෙන්ම ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය, ඒ වාගේම කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය මෙහිදී වැදගත්.

ජනාධිපතිතුමාත් මේ ගැන අවධානය යොමු කරලා, අපි අය වැයෙනුත් සාකච්ඡා කරලා මේ ප්‍රතිකාර මධ්‍යස්ථාන වැඩිදියුණු කරන්නත්, ඒ දරුවන් රැක බලා ගැනීමේ සුරැකුම් මධ්‍යස්ථාන වැඩි කරන්නත් කටයුතු කරනවා.

ප්‍රතිකාර මධ්‍යස්ථාන ගැන කථා කළොත්, LRH එකේ මේ සඳහා විශේෂිත මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා මූලික කටයුතු ආරම්භ කර තිබෙනවා. ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. ඒ කටයුතු ඉදිරියට කරගෙන යනවා. ඒ වාගේම ඔටිසම් ඇතුළු රෝගාබාධ සහිත මේ දරුවන් පිළිබඳව දැඩි අවධානයක් යොමු කිරීම සඳහා සාමාන්‍යයෙන් තිබෙන අපේ directorates සහ ඒ units අනුව කටයුතු කිරීම වෙනුවට සෞඛ්‍ය අමාත්‍යාංශයේ විශේෂ ඒකකයක් Family Health Bureau එක යටතේම ඇති කරන්න අපි දැන් සූදානම් කර තිබෙන්නේ.

ළමා රෝග විශේෂඥ වෛද්‍යවරු ඇතුළු මේ සම්බන්ධයෙන් කටයුතු කරන කණ්ඩායම් ගණනාවක් ඉන්නවා. ඒ සියලු අයගේ සම්බන්ධීකරණයෙන් මේ කටයුතු වේගවත් කරන්න මම බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම දැනට කරමින් තිබෙන කටයුතු ප්‍රමාණයක් තිබෙනවා. නමුත් ඔබතුමාත් දන්නවා, මෙවැනි ප්‍රශ්නයකදී ඒ දෙමව්පියෝ මුහුණ දෙන තත්ත්වය අතිශය බරපතළ බව. අන්න ඒකට තමයි රජයක් හැටියට අපි අවධානය යොමු කරන්න ඕනෑ. ඒ සඳහා කටයුතු කරමින් සිටින බව මට කියන්නට පුළුවන්.

**ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ඇසීමේ අවස්ථාව ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාට ලබා දෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඔටිසම් තත්ත්වය සම්බන්ධයෙන් ගරු අනුරාධ ජයරත්න මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් ඇසීම මම අගය කරනවා. ඒ වාගේම ඒ වෙනුවෙන් ප්‍රතිකාර ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ඔබතුමන්ලා ගන්නා උත්සාහයත් අගය කරනවා. ඒ කටයුතු තවදුරටත් ප්‍රවර්ධනය කිරීම වැදගත් කියන කාරණයත් කියමින්, මම ඔබතුමාට තවත් බොහොම සංවේදී කාරණාවක් ඉදිරිපත් කරන්නට කැමැතියි.

එක්තරා දරුවෙක් - මම එයාගේ නම කියන්නේ නැහැ - chronic lung disease කියන රෝගයෙන් පෙළෙනවා. ඒ කියන්නේ, පෙනහළු ආසාදිතභාවයෙන් පෙළෙනවා. ඇත්තටම ඒ දරුවාට pancreatic enzymes අවශ්‍ය වෙනවා, food absorption වෙන්නේ නැති නිසා. ඒ කියන්නේ food malabsorption තත්ත්වය නිසා. ආහාර ලබා ගත් පසු ඒවා උරා ගැනීම ක්‍රියාත්මක නොවන නිසා එයාට ඒ enzymes අවශ්‍යයි. මෙතැන තිබෙන බරපතළ ප්‍රශ්නය මේකයි. State Pharmaceuticals Corporation එක මේ ඖෂධය නිපදවන්නේ නැහැ. මේ දරුවා වෙනුවෙන් එයාගේ දෙමව්පියෝ රුපියල් 178,000ක් වියදම් කරලා pharmaceutical ආයතනයක් හරහා ඒ ඖෂධය ලබා ගන්න උත්සාහ දරා තිබෙනවා.

ඇත්තටම ඒ අය එම උත්සාහය දැරුවත්, දැනට දරුවන් 35දෙනෙකුට එම ඖෂධය ලබා ගැනීමට හැකියාව ලැබිලා නැහැ කියන කාරණය පිළිබඳව මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. තොරතුරු සොයා බලනකොට මේකට ප්‍රධාන හේතුව වෙලා තිබෙන්නේ, අදාළ ඖෂධය පිළිබඳව ටෙන්ඩර් පටිපාටිය ක්‍රියාත්මක වීමේ ප්‍රමාදයක් සිදුවී තිබීමයි. Cystic fibrosis කියන ආසාදිත තත්ත්වයෙන් පෙළෙන තවත් දරුවන් 35දෙනෙක් ඉන්නවා. මේ බෙහෙත ගෙන්වා ගැනීම පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා, cystic fibrosis කියන ආසාදිත තත්ත්වයෙන් පෙළෙන දරුවන් වෙනුවෙන් ගුණාත්මකභාවයෙන් ඉහළ ප්‍රමිතියෙන් යුත් ඖෂධ ගෙන්වා දීමේ කටයුත්ත ඉක්මනින් ක්‍රියාත්මක කරන්න. දරුවන් 35දෙනෙක් කියලා තමයි අපට ආරංචි වෙලා තිබෙන්නේ. තවත් දරුවන් ඉන්න ඉඩ තිබෙනවා.

ඒ වාගේම, State Pharmaceuticals Corporation එක දැනට මේ ඖෂධය නිෂ්පාදනය නොකරන්නේ ඇයි කියන කාරණාව පිළිබඳවත් සොයා බලන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව - State Pharmaceuticals Corporation එක - ඖෂධ නිෂ්පාදනය කරන්නේ නැහැ. ඖෂධ නිෂ්පාදනය කරන්නේ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව - State Pharmaceuticals Manufacturing Corporation එක. SPC එක කරන්නේ වෛද්‍ය සැපයීම් අංශය මඟින් ලබා දෙන ඖෂධ ප්‍රමාණයක් ආනයනය කිරීමයි. ඖෂධ වර්ග 464ක් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් ආනයනය කරනවා. මේ ඖෂධය ඉන්දියාවේ හිමාචල් ප්‍රදේශයේ company එකක් තමයි නිෂ්පාදනය කරන්නේ.

ඒ ඉන්දියානු ඖෂධය තමයි ලංකාවට ගෙන්වන්නේ. මේ ඖෂධයේ යම් හිඟයක් පැවතුණා. නමුත් මේ වෙනකොට එය වෙළෙඳ පොළේ පවතින බව කියන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -1662/2025- (1), ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5-1664/2025-(1), ගරු සංජීව රණසිංහ මහතා.

**ගරු සංජීව රණසිංහ මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ)
(The Hon. Sanjeewa Ranasingha)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 -1696/2025- (1), ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

## 2004-2014 දක්වා ජාතික ගිණුම් අනුපාතය, වාර්ෂික උද්ධමනය සහ ජාතික ආර්ථික වෘද්ධි අනුපාතය: විස්තර

## 2004-2014 வரை தேசிய கணக்கு விகிதம், வருடாந்த பணவீக்கம் மற்றும் தேசிய பொருளாதார வளர்ச்சி வீதம்:விபரம்

## NATIONAL ACCOUNT RATIO, ANNUAL INFLATION AND NATIONAL ECONOMIC GROWTH RATE FROM 2004-2014: DETAILS

1715/2025

**7.ගරු ආර්.ජී. විජේරත්න මහතා**
(மாண்புமிகு ஆர்.ஜீ. விஜேரத்ன)
(The Hon. R.G. Wijerathna)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2004, 2005, 2006, 2010, 2011, 2012, 2013 සහ 2014 යන වර්ෂයන්හි -

(i) ජාතික ගිණුමේ අනුපාතය කාර්තු වශයෙන් කවරේද;

(ii) වාර්ෂික උද්ධමනය හා ජාතික ආර්ථික වෘද්ධි අනුපාතය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ජාතික ආදායමෙහි වාර්ෂික වර්ධන වේගය සමඟ ජාතික උද්ධමන අනුපාතය ගැළපෙන්නේද;

(iv) නොඑසේ නම්, ඒ මන්ද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2004, 2005, 2006, 2010, 2011, 2012, 2013 மற்றும் 2014ஆம் ஆண்டுகளில்-

(i) தேசிய கணக்கின் விகிதம் காலாண்டு வாரியாக யாவை என்பதையும்;

(ii) வருடாந்த பணவீக்க மற்றும் தேசிய பொருளாதார வளர்ச்சி வீதம் வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) தேசிய வருமானத்தின் வருடாந்த வளர்ச்சி வேகத்துடன் தேசிய பணவீக்க வீதம் பொருந்துகின்றதா என்பதையும்;

(iv) இன்றேல், அது ஏன் என்பதையும்;
அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House in relation to the years 2004, 2005, 2006, 2010, 2011, 2012, 2013 and 2014 -

(i) the ratio of the national account in each quarter;

(ii) the annual inflation and the national economic growth rate, separately;

(iii) whether the national inflation rate reconciles with the annual growth rate of the national revenue; and

(iv) if not, why?

(b) If not, why?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ජාතික ගිණුමේ අනුපාතය යන්න පිළිබඳව පැහැදිලි අර්ථකථනයක් නොමැති වූ බැවින් ඒ පිළිබඳව පැහැදිලි කර ගැනීමට ඒ ප්‍රශ්නය යොමු කරපු අදාළ මන්ත්‍රී ගරු ආර්.ජී. විජේරත්න මැතිතුමා දුරකථනය මඟින් ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සම්බන්ධ කරගෙන තිබෙනවා. ඒ අනුව සඳහන් කරලා තිබෙන්නේ කාර්තුමය පදනම මත ඒ ඒ වර්ෂයේ ආර්ථික වෘද්ධි අනුපාතය පිළිබඳ සංඛ්‍යාලේඛන අවශ්‍ය බවයි. ඒ අනුව 2004 සිට 2014 දක්වා ඒ ඉල්ලා තිබෙන වර්ෂවල ආර්ථික වෘද්ධි අනුපාත කාර්තුමය වශයෙන් ඉදිරිපත් කරලා තිබෙනවා. එය එක් කාර්තුවක සියයට 16ක් වෙලා තිබෙනවා. සමහර කාර්තුවල සියයට 4යි. එක් කාර්තුවක සියයට 2.2යි කියලාත් සඳහන්ව තිබෙනවා. ආර්ථික වෘද්ධි අනුපාත ඒ විධියට විචලනයන් සහිතව සඳහන් වෙනවා.

ඒ අනුව උක්ත වර්ෂ සඳහා කාර්තු මට්ටමින් ආර්ථික වෘද්ධි අනුපාතය පහත වගුවේ දක්වා තිබෙනවා.

කාර්තුමය වශයෙන් ආර්ථික වෘද්ධි අනුපාතය (%)

| වර්ෂය | 1 වන කාර්තුව | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව |
|---|---|---|---|---|
| 2004 | 6.0 | 6.0 | 4.9 | 4.9 |
| 2005 | 5.2 | 6.4 | 6.9 | 6.4 |
| 2006 | 7.8 | 7.7 | 7.7 | 7.4 |
| 2010 | 7.1 | 8.5 | 8.0 | 8.6 |
| 2011 | 9.8 | 7.2 | 9.2 | 7.6 |
| 2012 | 16.1 | 9.7 | 5.2 | 6.8 |
| 2013 | 3.6 | 5.9 | 4.0 | 0.5 |
| 2014 | 1.3 | 2.2 | 5.1 | 10.6 |

සටහන: 2004, 2005, 2006 සහ 2010 දක්වා දත්ත - 2002 පදනම් වර්ෂය.

2011 සිට 2014 දක්වා දත්ත - 2010 පදනම් වර්ෂය.

(ii) ඒ වර්ෂවලටම අදාළව උද්ධමන අනුපාතයත් වෙනස් වෙලා තිබෙනවා, 3.3 සිට උපරිම 11 දක්වා, ආර්ථික වෘද්ධි අනුපාතයට සාපේක්ෂව. එය පහත වගුවේ දක්වා තිබෙනවා.

වාර්ෂික උද්ධමන අනුපාතය හා ආර්ථික වෘද්ධි අනුපාතය

| වර්ෂය | උද්ධමන අනුපාතය*(%) | ආර්ථික වෘද්ධි අනුපාතය**(%) |
|---|---|---|
| 2004 | 9.0 | 5.4 |
| 2005 | 11.0 | 6.2 |
| 2006 | 10.0 | 7.7 |
| 2010 | 5.9 | 8.0 |
| 2011 | 6.7 | 8.4 |
| 2012 | 7.6 | 9.1 |
| 2013 | 6.9 | 3.4 |
| 2014 | 3.3 | 5.0 |

* කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත.

** 2004, 2005, 2006 සහ 2010 දක්වා දත්ත - 2002 පදනම් වර්ෂය.

(iii) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ආර්ථික වර්ධන වේගය ඇස්තමේන්තු කිරීම සඳහා ස්ථාවර මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරන අතර, උද්ධමන අනුපාතය ගණනය කිරීම සඳහා කොළඹ පාරිභෝගික මිල දර්ශකය සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය සකස් කරනු ලබනවා. -2015 වර්ෂයේ සිට උද්ධමනය ගණනය කිරීමේ නිල මිල දර්ශකය ලෙස ජාතික පාරිභෝගික මිල දර්ශකය භාවිත කරනවා- කෙසේ වෙතත්, ආර්ථික වර්ධන වේගය සහ උද්ධමන අනුපාතය සකස් කර ප්‍රකාශයට පත් කිරීමේදී ඒවා අතර ගැළපීමක් සිදු කරන්නේ නැහැ.

1. ජාතික ගිණුම් සකස් කිරීමේදී දළ දේශීය නිෂ්පාදිතය පවත්නා මිල ගණන් යටතේ සහ ස්ථාවර මිල ගණන් යටතේ යන ආකාර දෙකෙන්ම ඇස්තමේන්තු කරන බැවින්, ඒවායේ අතුරු ඵලයක් වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකය හෙවත් deflator ව්‍යුත්පන්න කරගත හැකි වනවා. එහි වෙනස්වීම මඟින් දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරන ක්‍රමවේදවලට අදාළව ආර්ථිකයේ සාමාන්‍ය මිල මට්ටමේ වෙනස්වීම පෙන්නුම් කළත්, එය ආර්ථිකයේ සාමාන්‍ය මිල මට්ටමේ වෙනස්වීම මැනීම සඳහා සකස් කරනු ලබන කොළඹ පාරිභෝගික මිල දර්ශකය, ජාතික පාරිභෝගික මිල දර්ශකය යනාදිය මඟින් මැන දක්වනු ලබන උද්ධමනය සමඟ නිසැක වශයෙන්ම සමාන වීමක් අපේක්ෂා කරන්නේ නැහැ. මක්නිසාද යත්, පාරිභෝගික භාණ්ඩ පැසක් - basket of goods - පදනම් කරගෙන ගණනය කෙරෙන උද්ධමනයට වඩා ආර්ථිකය තුළ නිපදවනු ලබන සියලුම භාණ්ඩ හා සේවාවන්හි මිල ගණන් දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකය කෙරෙහි බලපාන නිසා.

2. ආර්ථිකයක මුදල් තොගය, එනම් සාමාන්‍යයෙන් ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම - M2b - සහ මුදලේ සංසරණ ප්‍රවේගය අතර ගුණිතය මඟින් අදාළ කාලය තුළ ආර්ථිකයේ සමස්ත වියදම නිරූපණය කෙරෙන අතර, එය මූර්ත දළ දේශීය නිෂ්පාදිතය සහ සාමාන්‍ය මිල මට්ටම අතර ගුණිතයට සමාන වෙන්න ඕනෑ. ඒ අනුව ආර්ථික වර්ධන වේගය සහ උද්ධමන වේගය අතර ගුණිතය මුදල් තොගයේ වැඩි වීම සහ මුදලේ සංසරණ ප්‍රවේගය අතර ගුණිතයට සමාන විය යුතුයි. තවද, උද්ධමන වේගය මූර්ත දළ දේශීය නිෂ්පාදිතය සහ මුදල් තොගය වැඩිවීමත්, මුදලේ සංසරණ ප්‍රවේගයත් අතර අනුපාතයට සමාන වේ. මෙහි බොහෝ විට මුදලේ සංසරණ ප්‍රවේගය නියතයක් වේ.

(iv) අදාළ නොවේ.

(ආ) පැන නොනඟී.

**ගරු ආර්.ජී. විජේරත්න මහතා**
(மாண்புமிகு ஆர்.ஜீ. விஜேரத்ன)
(The Hon. R.G. Wijerathna)

ගරු ඇමතිතුමනි, අපි කවුරුත් දන්නවා, පසුගිය වකවානුවේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් දත්ත ඉදිරිපත් කිරීමේදී අඩු ආදායම් ආර්ථිකයක සිට මැදි ආදායම් ආර්ථිකයක් දක්වා ආර්ථිකය ප්‍රසාරණය වුණා යැයි කෘත්‍රිමව මවා පෑම සඳහා දත්ත විකෘති කිරීමක් සිදු වුණා කියලා. ඒ වනකොට එම දෙපාර්තමේන්තුවේ හිටපු ජාතික ගිණුම් අංශයේ අධ්‍යක්ෂවරයාට කළ බලපෑම ඔහු පිළිනොගත් නිසා ඔහු වැඩ තහනම් කිරීමකට පවා ලක් වුණා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය වෙන්නේ, ඒ වකවානුවේ සත්‍ය දත්ත ඉදිරිපත් කිරීම වෙනුවෙන් පෙනී හිටපු ඒ නිලධාරියා වෙනුවෙන් ජනතාවාදී රජයක් හැටියට යම් පරීක්ෂණයක් පවත්වා ඔහුට සාධාරණයක් ඉෂ්ට කරනවාද කියන එකයි.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මෙවැනි පරීක්ෂණයක් පිළිබඳව මා තොරතුරු විමසා සිටියේත් නැහැ, වාර්තා වෙලාත් නැහැ. නමුත් ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ තොරතුරු මත එවැනි කටයුත්තක් සිදු වුණාද, එවැනි පරීක්ෂණයක් සිදු වනවාද කියලා විමසා බලන්න පුළුවන්.

**ගරු ආර්.ජී. විජේරත්න මහතා**
(மாண்புமிகு ஆர்.ஜீ. விஜேரத்ன)
(The Hon. R.G. Wijerathna)

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අපි නිෂ්පාදන ආර්ථිකයක් කරා යන ගමනේදී දත්ත මත පදනම් වෙලා තමයි ඒ සියල්ල සිද්ධ කරන්න වෙලා තිබෙන්නේ. එතකොට අපට පෙනෙන දේ තමයි, නිවැරදි දත්ත ලබා ගැනීමේ මූලාශ්‍රවල හිඟකමක් තිබෙනවා කියන එක. ඒ නිසා නිවැරදි දත්ත ලබා ගැනීම සඳහා යම් ව්‍යුහාත්මක වෙනසක් කිරීමට බලාපොරොත්තු වනවාද?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, ව්‍යුහාත්මක වෙනසක් කිරීමට අපි අනිවාර්යයෙන්ම බලාපොරොත්තු වනවා. ඒ සඳහා වූ වැඩකටයුතු දැනටමත් ආරම්භ කරලා තිබෙනවා. විශේෂයෙන්ම දත්ත ලබා ගැනීම සඳහා විවිධ ආයතන - agencies - වැඩකටයුතු කරනවා.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය හා මහ බැංකුව අනෙකුත් අමාත්‍යාංශවලින් තොරතුරු එක්රැස් කර ගැනීමේදී ඒකාබද්ධකරණය සහ තොරතුරු අතර සුසංයෝගය පිළිබඳව අතීතයේ ගැටලු පැන නැඟිලා තිබෙනවා. සමහර ඒවා බොහෝදුරට පරිගණක ආශ්‍රයෙන් process කළත්, ඒවා නැවත manually ඉදිරිපත් කිරීමේදී අන්තර් සම්බන්ධ කිරීම වාගේ ගැටලු තිබෙනවා. හැබැයි, අපි digitalization සඳහා ප්‍රවිෂ්ට වීමක් වෙලා තිබෙනවා. තොරතුරු digitalize කරන්නත්, සුසංයෝජනය - integrate - කරන්නත් අදාළ වැඩකටයුතු සිදු වෙමින් පවතිනවා. එම නිසාම තමයි සමහර agenciesවලින් ලබා දෙන තොරතුරු පිළියෙළ කරලා, ඊළඟ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනකොට යම් කාල පමාවකුත් වෙලා තිබෙන්නේ. තොරතුරුවල වැදගත්කම, ගුණත්වය හා අදාළ බව ලැබෙන්න නම් නිසි කාලයට, නිසි වෙලාවට තොරතුරු ලැබෙන්න ඕනෑ. අපි ඒ වැඩකටයුත්තත් වේගවත් කරමින් ඉදිරියට ගෙන යනවා. මේ සඳහා අදාළ පදනම වන්නේම තාක්ෂණය. ඒ අනුව මෙය තාක්ෂණය තුළින් විසඳීමට තමයි අපි බලාපොරොත්තු වන්නේ.

## සූර්ය බලශක්ති ජාල සම්බන්ධතා: යාපනය දිස්ත්‍රික්කය

### சூரிய சக்தி 'க்ரிட்' மின்னிணைப்புகள்: யாழ்ப்பாண மாவட்டம்

### SOLAR POWER GRID CONNECTIONS: JAFFNA DISTRICT

1718/2025

**8.ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) எஸ். ஸ்ரீ பவானந்தராஜா)
(The Hon. (Dr.) S. Sri Bavanandarajah)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2020 සිට මේ දක්වා සූර්ය බලශක්ති ජාල සම්බන්ධතා සඳහා යාපනය දිස්ත්‍රික්කය තුළ ඉදිරිපත් කර ඇති මුළු අයදුම්පත් සංඛ්‍යාව කොපමණද;

(ii) ජාල සම්බන්ධතා ලබා දී ඇති, අනුමත කර ඇති සහ ලබා දීමට අපේක්ෂිත තත්ත්වයේ පවතින අයදුම්පත් සංඛ්‍යාව කොපමණද;

(iii) ජාල සම්බන්ධතා ලබා දීම ප්‍රමාද වීමට හේතු සහ අපේක්ෂිත තත්ත්වයේ පවතින සම්බන්ධතා කඩිනම් කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) තෝරාගත් පුද්ගලයින් සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ ඇතැම් නිලධාරින් විසින් සිදු කරනු ලබන නීති විරෝධී ක්‍රියාකාරකම් පිළිබඳ චෝදනා තිබෙන බව දන්නේද;

(ii) සාධාරණත්වය සහ විනිවිදභාවය සහතික කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ස්වාධීන දුක්ගැනවිලි හැසිරවීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) 2030 පුනර්ජනනීය බලශක්ති ඉලක්කය සපුරාලීම සම්බන්ධයෙන් ලබා ඇති ප්‍රගතිය කවරේද;

(ii) උතුරු පළාතේ අනුමත පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) සූර්ය පැනල ජාල සම්බන්ධතාවලට පහසුකම් සැලසීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය, ආසියානු සංවර්ධන බැංකුව සහ පළාත් පාලන ආයතන අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2020ஆம் ஆண்டு முதல் இன்றுவரை சூரிய சக்தி 'க்ரிட்' மின்னிணைப்புகளைப் பெற்றுக்கொள்வதற்காக யாழ்ப்பாண மாவட்டத்தில் சமர்ப்பிக்கப்பட்டுள்ள மொத்த விண்ணப்பங்களின் எண்ணிக்கையையும்;

(ii) 'க்ரிட்' மின்னிணைப்புக்காக அங்கீகரிக்கப்பட்டுள்ள விண்ணப்பங்களினதும் மின்னிணைப்புகள் வழங்கப்பட்டுள்ள விண்ணப்பங்களினதும் மின்னிணைப்புகள் வழங்கப்படவுள்ள விண்ணப்பங்களினதும் எண்ணிக்கையையும்;

(iii) 'க்ரிட்' மின்னிணைப்புகள் வழங்கப்படுவதிலுள்ள தாமதங்களுக்கான காரணங்கள் மற்றும் நிறைவுபெறாத நிலையிலுள்ள மின்னிணைப்புகளைத் துரிதப்படுத்த எடுக்கப்பட்டு வருகின்ற நடவடிக்கைகள் எவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) குறிப்பிட்ட சில தனிநபர்கள் தொடர்பாக ஒருசில இலங்கை மின்சார சபை அதிகாரிகளின் சட்டவிரோத நடவடிக்கைகள் தொடர்பாகக் குற்றச்சாட்டுகள் உண்டா என்பதையும்;

(ii) நியாயமான தன்மையையும் வெளிப்படைத் தன்மையையும் உறுதிப்படுத்த எடுக்கப்பட்ட நடவடிக்கைகள் எவை என்பதையும்;

(iii) குறைகளைக் கையாளுவதற்கான ஒரு சுயாதீனமான பொறிமுறையைத் தாபிப்பதற்கான நடவடிக்கைகள் என்ன என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) 2030ஆம் ஆண்டளவில் மீள்புதுப்பிக்கத்தகு சக்தி இலக்கை அடைவதை நோக்கி மேற்கொள்ளப்பட்ட முன்னேற்றம் என்ன என்பதையும்;

(ii) வட மாகாணத்தில் அங்கீகரிக்கப்பட்டுள்ள மீள்புதுப்பிக்கத்தகு சக்தி கருத்திட்டங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) சூரிய சக்தி "பனல் க்ரிட்" மின்னிணைப்பு வசதிகளின் நிமித்தம் இலங்கை மின்சார சபை, ஆசிய அபிவிருத்தி வங்கி மற்றும் உள்ளூரதிகார சபைகள் என்பவற்றுக்கு இடையிலான ஒருங்கிணைப்பை வலுப்படுத்த எடுக்கப்பட்ட நடவடிக்கைகள் எவை என்பதையும்;

அவர் இச்சபைக்கு மேலும் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House the -

(i) total number of applications submitted in the Jaffna District for solar power grid connections since 2020;

(ii) number of applications that have been connected, approved and are pending for grid connection; and

(iii) reasons for delays and the measures being taken to expedite the pending connections?

(b) Will he also inform this House -

(i) whether there are allegations of illegal activities by certain CEB officials in relation to selected individuals;

(ii) the actions taken to ensure fairness and transparency; and

(iii) the steps taken to establish an independent grievance handling mechanism?

(c) Will he further inform this House the -

(i) progress made towards achieving the 2030 renewable energy target;

(ii) number of approved renewable energy projects in the Northern Province; and

(iii) measures taken to strengthen coordination among CEB, ADB and local authorities to facilities solar panel grid connections?

(d) If not, why?

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) අයදුම්පත් 7,259ක් ලැබී ඇත.

(ii)

| අනුමත කරන ලද අයදුම්පත් සංඛ්‍යාව | ජාල සම්බන්ධතා ලබා දී ඇති අයදුම්පත් සංඛ්‍යාව | ජාල සම්බන්ධතා ලබා දීමට ඇති අයදුම්පත් සංඛ්‍යාව |
|---|---|---|
| 4,452 | 4,448 | 04 |

ජාල සම්බන්ධතා ලබා දීමට ඉතිරිව ඇති අයදුම්පත් 04 අතරින් 03ක් ඉදිකිරීම් අවසන් කර නොමැති වීම නිසාත්, 01ක් මහජන විරෝධතා හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු තීරණ නිසාත් ප්‍රමාද වී ඇත. 2025.12.08 දින වන විට ජාල සම්බන්ධතා සඳහා අපේක්ෂිත තත්ත්වයේ පවතින අයදුම්පත් කිසිවක් නොමැත.

(iii) චුන්නාකම් ග්‍රිඩ් උපපොළෙහි පුනර්ජනනීය බලශක්ති ජනනයන් සම්බන්ධ කළ හැකි උපරිම ප්‍රමාණය ඉක්මවා ඇති බැවින් 2024.08.12 සිට යාපනය දිස්ත්‍රික්කය තුළ වහල මත ඉදිකළ සූර්ය පැනල සඳහා අනුමැතිය ලබා දීම නවතා ඇත. එබැවින් අපේක්ෂිත තත්ත්වයේ අයදුම්පත් නැත.

යාපනය දිස්ත්‍රික්කය තුළ වහල මත ඉදිකළ සූර්ය පැනල පද්ධතියට සම්බන්ධ කිරීම හා ඒ හා සම්බන්ධ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ මැදිහත් වීම පිළිබඳ සටහන ඔබගේ දැනගැනීම පිණිස ඇමුණුම 01 ලෙස දක්වා ඇත.

(ආ) (i) ලංවිම උතුරු පළාතට අදාළව, දැනට තෝරාගත් පුද්ගලයින් සම්බන්ධයෙන් චෝදනා නොමැත. වහල මත ඉදිකළ සූර්ය පැනල අයදුම්පත් සහ ඒ සඳහා අනුමැතිය ලබා දීම සම්බන්ධව ලංවිමට විරුද්ධව චෝදනා එල්ල වී තිබූ අතර ඒ පිළිබඳව නිසි පරීක්ෂාවක් සිදු කර පිළිතුරු සපයා ඇත. පිළිතුරු අදාළ පරිදි මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ද යොමු කර ඇත.

ලංවිම තුළ චෝදනා එල්ල වන සේවකයින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම නියමිත ක්‍රියාපටිපාටිය අනුව සිදු වෙමින් පවතී.

(ii) ලංවිම සේවකයෙකු සම්බන්ධයෙන් නීතිවිරෝධී ක්‍රියාකාරකම් පිළිබඳ චෝදනාවක් මතු වුවහොත්, ලංවිම විනය බලධරයා විසින් ලංවිම විනය ක්‍රියාපටිපාටිය ඔස්සේ සාධාරණ සහ විනිවිදභාවයකින් යුක්තව විමර්ශනය කිරීම, චෝදනා පත්‍ර ලබා දීම සහ විනය පරීක්ෂණ සභාවක් මඟින් විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව දඬුවම් ලබා දීම සිදු කරනු ලබයි.

ලංවිම සාමාන්‍යාධිකාරි හෝ ලංවිම සභාපති විසින් යම් විශේෂිත කරුණක් පිළිබඳව විමර්ශනය කර කරුණු වාර්තා කිරීම සඳහා ලංවිම විශේෂ විමර්ශන ඒකකය යොදවා ඇති අතර, අවශ්‍ය පරිදි අභ්‍යන්තර විගණන ශාඛාව වෙතද යොමු කර ලබා ගන්නා වාර්තා විමර්ශන සඳහා යොදා ගනු ලබයි.

සටහන: වහල මත ඉදි කරන සූර්ය පැනල අයදුම්පත්‍ර සහ ඒවාට අනුමැතිය ලබා දීමේ ක්‍රියාවලිය ලංවිම තුළ ස්ථාපිත ක්‍රමවේදයකට අනුව සිදු කරන අතර, එහිදී අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී ගෙවීම් සිදු කිරීමේ සිට පරිගණක පද්ධතියකින් ස්වයංක්‍රීයව ජනනය කරන ලද අනුපිළිවෙළ අනුව අනුමැතිය ලබා දීම සිදු කරයි.

ලංවිම උතුරු පළාත තුළද මෙම ක්‍රමවේදය නොවෙනස්ව ක්‍රියාත්මක වන බැවින්, අක්‍රමිකතා පිළිබඳ පැමිණිල්ලක් ලද විට පහසුවෙන් හඳුනා ගත හැකිය.

(iii) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද "සැපයුම් සේවා සංග්‍රහය"ට අනුව පාරිභෝගික පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටියක් ඇති අතර යම් පාරිභෝගිකයකුහට තමාගේ දුක් ගැනවිල්ල ඒ ඔස්සේ ඉදිරිපත් කළ හැක.

සටහන: සැපයුම් සේවා සංග්‍රහයේ 9 වන අයිතමය "පාරිභෝගික පැමිණිලි ක්‍රියා පටිපාටිය" පිළිබඳ වේ. එය ඇමුණුම 02 ලෙස දක්වා ඇත.

ඒ අනුව විදුලිබල සැපයුම සම්බන්ධයෙන් ඕනෑම පැමිණිල්ලක් අදාළ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට ඉදිරිපත් කළ හැකිය. යම් හෙයකින් පැමිණිල්ල විසඳා ගත නොහැකි වුවහොත් හෝ ප්‍රාදේශීය ඉංජිනේරුවරයා විසින් සපයන ලද විසඳුම සමඟ පාරිභෝගිකයා එකඟ නොවන්නේ නම්, එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වන ආරාවුල පාරිභෝගිකයාට පළාතේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි වෙත යොමු කළ හැකිය.

[ගරු කුමාර ජයකොඩි මහතා]

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා විසින් එම ආරාවුල ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව - PUCSL - විසින් නියම කර ඇති ආරාවුල් විසඳීමේ ක්‍රියාපටිපාටිය හරහා විසඳීමට උපරිම උත්සාහයක් ගනු ඇත. පළාතේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා උපරිම උත්සාහයක් දැරුවද, ආරාවුල විසඳා ගත නොහැකි නම් මහජන උපයෝගිතා කොමිසම - PUCSL - විසින් නියම කර ඇති ආරාවුල් විසඳීමේ ක්‍රියාපටිපාටියට -2016 ජනවාරි 25වෙනි දින අංක 1951/1 දරන ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇති- අනුව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා විසින් එය මහජන උපයෝගිතා කොමිසම - PUCSL - වෙත යොමු කරනු ඇත.

(ඈ) (i) දිගු කාලීන ජනන සැලැස්ම (2025-2044) සම්පාදනය කර ඇත්තේ 2030 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ බලශක්ති අවශ්‍යතාවෙන් සියයට 70ක් පුනර්ජනනීය බලශක්තිය මඟින් සපුරා ගැනීමේ ඉලක්කය පදනම් කරගෙනය. ඒ අනුව 2025 වර්ෂයේ ජූනි මස වන විටත් එම වර්ෂයට අදාළ සැලසුමේ සඳහන් මෙගාවොට් 1,848ක් පුනර්ජනනීය බලශක්ති ඉලක්කය අබිබවමින් මෙගාවොට් 2,695ක් පුනර්ජනනීය බලශක්තිය ජාතික විදුලිබල පද්ධතියට එක් කර ඇත. ඒ අනුව 2025 වර්ෂයට අදාළ පුනර්ජනනීය බලශක්ති ඉලක්ක අබිබවා ඇත.

සටහන: දැනට ගිවිසුම්ගත වී ඇති පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති දත්ත අනුව ඉදිරි වර්ෂවලදී එකතුවීමට නියමිත ධාරිතා පහත පරිදි වේ.

| | 2026 | 2027 | 2028 | 2029 |
|---|---|---|---|---|
| දිගුකාලීන ජනන සැලැස්ම (2025-2044) අනුව සැලසුම් කර ඇති සමුච්චිත පුනර්ජනනීය බලශක්ති ධාරිතාව (MW) | 2,078 | 2,563 | 3,253 | 3,943 |
| දැනට ගිවිසුම්ගත වී ඇති පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවල සමුච්චිත ධාරිතාව (සෑම වර්ෂයකදීම වහලය මත සවි කළ සූර්ය පැනල මඟින් 150MW ධාරිතාවක් එකතු වේ යැයි උපකල්පනය කර ඇත.) (MW) | 3,089.5 | 3,822.5 | 4,332.5 | 4,634.5 |

ඒ අනුව, ගිවිසුම්ගත කර ඇති ව්‍යාපෘති ඒ ආකාරයෙන් ක්‍රියාත්මක වුවහොත් 2030 වර්ෂය වනවිට පුනර්ජනනීය බලශක්ති ඉලක්කය අභිභවා යා හැක.

(ii) මන්නාරම් දූපත තුළ සූර්ය බලාගාර දෙකක් සඳහා ගිවිසුම් අත්සන් කර ඇත.

(iii) සූර්ය පැනල ජාල සම්බන්ධතාවලට පහසුකම් සැලසීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය, ආසියානු සංවර්ධන බැංකුව සහ පළාත් පාලන ආයතන අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම සඳහා දැනට වැඩ පිළිවෙළක් නොමැත.

(ඇ) අදාළ නොවේ.

ඇමුණුම් 01 සහ 02 **සභාගත*** කරමි.

**ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) எஸ். ஸ்ரீ பவானந்தராஜா)
(The Hon. (Dr.) S. Sri Bavanandarajah)

Thank you very much, Hon. Minister, for your Answer. Hon. Speaker, I wish to know from the Hon. Minister whether there is any tentative time frame to issue solar power facilities to the public in the Northern Province.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

Actually, there is a big deficit in the transmission network facility. We are now planning it and in the meantime, we are calling for financial support from international donor agencies and banks. We are expecting to reinstate that facility by 2028 or 2029. It is happening now. We need, at least, two or three years for that. We have especially focused on the Northern and the Eastern areas.

**ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) எஸ். ஸ்ரீ பவானந்தராஜா)
(The Hon. (Dr.) S. Sri Bavanandarajah)

Thank you very much.

Sir, the second Supplementary Question will be asked by the Hon. Rajeevan Jeyachandramoorthy.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

கௌரவ சபாநாயகர் அவர்களே, உள்ளூராட்சிச் சபைகளாலே தெருவிளக்குகள் பொருத்தப்பட்டு வருகின்றன. இதன்பொழுது, உள்ளூராட்சிச் சபைகளால் பெருமளவிலான நிதி இலங்கை மின்சார சபைக்கு வழங்கப்பட்டு வருகின்றது. உள்ளூராட்சிச் சபைகளுக்குக் கீழுள்ள பயிற்றப்பட்ட மின் இணைப்பாளர்களைக் கொண்டு தெருவிளக்குகளைப் பொருத்தும்பொழுது, குறைந்த செலவில் அதிகளவான தெருவிளக்குகளைப் பொருத்த முடியும். இது தொடர்பில் யாழ்ப்பாண மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில்

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

கதைத்து கிடத்தட்ட ஒரு வருடமாகி விட்டது. குறித்த ஊழியர்களுக்கு மின்சார சபை பயிற்சிகளை வழங்குவதாகச் சொல்லப்பட்டது. ஆனாலும், இதுவரை வழங்கப்படவில்லை. "சுண்டைக்காய் காற்பணம், சுமை கூலி முக்காற்பணம்" என்பதுபோல, bulbsஇன் விலை குறைவாக இருக்கின்ற போதிலும், அதனைப் பொருத்துவதற்கு அதிகளவு நிதியை மின்சார சபைக்குக் கொடுக்கவேண்டி இருக்கின்றது. எனவே, இந்தத் திட்டத்தை இலகுபடுத்தி உள்ளூராட்சிச் சபைகளுக்கு வழங்குவதனூடாக இருளில் காணப்படுகின்ற வீதிகளை வெளிச்சமாக்க முடியும்.

மேலும், இந்திய அரசாங்கத்தால் கோவில்களுக்காக 40,000 solar panels வழங்கப்பட்டன. அவை யாழ்ப்பாண மாவட்ட ஆலயங்களுக்கும் கிடைத்திருக்கின்றன. எனினும், இதுவரை அதற்கான இணைப்புகள் வழங்கப்படவில்லை. எனவே, அதன் தற்போதைய நிலை என்ன என்பதை கௌரவ அமைச்சர் அவர்கள் தெளிவுபடுத்த முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

වීදි ලාම්පු සැපයීම තමයි ඇත්තටම පළාත් පාලන ආයතනවලින් සිදු කරන්නේ. බොහෝ විට ඒවා සවි කරන්නේ ලංකා විදුලිබල මණ්ඩලය හෝ ලංකා විදුලි පුද්ගලික සමාගම විසිනුයි. ඔබතුමා කියන කාරණය මොකක්ද කියලා මට පැහැදිලි කර ගන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමනි. වීදි ලාම්පු සවි කිරීම සහ විදුලි බලය සැපයීම තමයි ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්යය වෙන්නේ. වීදි ලාම්පු සැපයීම RDA එකෙනුත් කරනවා, පළාත් පාලන ආයතනවලිනුත් කරනවා. ඒක තමයි සාමාන්‍යයෙන් සිදු කරන ක්‍රමය. ඒ ගැන මට පැහැදිලි කිරීමක් වෙනම ලබා දුන්නොත් හොඳයි.

ගරු මන්ත්‍රීතුමනි, කෝවිල්වල තත්ත්වය පිළිබඳ විස්තර ටික මට ලබා දෙන්න. මොකද, සමහර ඒවා අපේ ආණ්ඩුව පත් වෙන්නත් කලින් ඉන්දීය ණය යෝජනා ක්‍රමය හරහා ලබා ගෙන තිබෙනවා. හැබැයි, grid capacity සම්බන්ධතාවට අදාළව ලබා නොගෙන දේශපාලන වුවමනාවට විතරක් සමහර පූජනීය ස්ථානවලට සූර්ය පැනල කට්ටල බෙදා දීලා තිබෙනවා, ඡන්දය ලබා ගන්න. හැබැයි, දැන් ඒවා සවි කරන්න බැහැ, grid එකේ capacity එක නැති නිසා. එහෙම ප්‍රශ්න තිබෙනවා. මම හිතන විධියට, ගෙන්වපු සූර්ය පැනල කට්ටල 5,000න්, කට්ටල 200ක්ම කාටවත්ම වැඩක් නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මොකද, grid එකේ capacity එක වැඩි කරනකම් ඒවා තියාගෙන ඉන්න ඕනෑ. හැබැයි, අපට ඒවා ලබා දුන්නොත් පුළුවන් තැන්වලට අපට සවි කරලා දෙන්න පුළුවන්. ඒවා හැර අනෙක් ඔක්කෝම ටික සවි කරලා තිබෙන්නේ. මට විස්තර ලබා දුන්නොත් කියන්න පුළුවන්, මෙන්න මේ හේතුව නිසා තමයි එහෙම වෙලා තිබෙන්නේ කියලා. අපට සමහර පූජනීය ස්ථානවලින් ඒවා return කරලා තිබෙනවා, grid capacity එක නැති නිසා. සමහර තැන්වලින් ඒවා දෙන්නේ නැහැ. එතැන තමයි ප්‍රායෝගික ප්‍රශ්නය තිබෙන්නේ. ඒ ගැන මාව වෙනම දැනුවත් කළොත් මට උදවු කරන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 9 -1719/2025- (1), ගරු තනුර දිසානායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## 2024/2025 සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබූ සිසුන් අතර සිටින රාජ්‍ය සේවකයින්ගේ දරුවන්: පහසුකම්
## 2024/2025இற்காக அரச பல்கலைக்கழகங்களுக்கு அனுமதிக்கப்பட்ட மாணவர்களில் அரச ஊழியர்களின் பிள்ளைகள்: வசதிகள்
## CHILDREN OF PUBLIC SERVANTS AMONG STATE UNIVERSITY ENTRANTS IN 2024/2025: FACILITIES PROVIDED

1741/2025

**10.** ගරු නන්ද බණ්ඩාර මහතා
(மாண்புமிகு நந்த பண்டார)
(The Hon. Nanda Bandara)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2024 සහ 2025 වර්ෂවල රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරගනු ලැබූ සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම සිසුන් අතරින් රාජ්‍ය සේවකයන්ගේ දරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සිසුන් සඳහා මහපොළ ශිෂ්‍යාධාර, ශිෂ්‍යාධාර හෝ නේවාසිකාගාර පහසුකම් ලබා දෙන්නේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2024 மற்றும் 2025ஆம் ஆண்டுகளில் அரச பல்கலைக்கழகங்களுக்கு அனுமதிக்கப்பட்ட மாணவர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) அம்மாணவர்களில் அரச ஊழியர்களது பிள்ளைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) அம்மாணவர்களுக்கு மஹபொல புலமைப் பரிசில்கள், உதவித் தொகைகள் அல்லது விடுதி வசதிகள் வழங்கப்படுகின்றனவா என்பதையும்;

(iv) இன்றேல், அதற்குரிய காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the number of students admitted to State universities for the years 2024 and 2025, separately;

(ii) the number students, out of those admitted, who are children of public servants;

(iii) whether the Mahapola Scholarship, bursaries or hostel facilities are provided for those students; and

[ගරු නන්ද බණ්ඩාර මහතා]

(iv) if not, the reasons thereof?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)

| | 2024 වර්ෂය | 2025 වර්ෂය |
|---|---|---|
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ වන විශ්වවිද්‍යාල | 44881 (2023/ 2024) | 43237 (2024/ 2025) |
| බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 116 | 164 |
| භික්ෂු විශ්වවිද්‍යාලය | 169 | 186 |
| සාගර විශ්වවිද්‍යාලය | 302 | *307 |
| වෘත්තීය තාක්ෂණ | 1105 | 1100 |
| සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | 1781 | 2137 |
| එකතුව | **48354** | **47131** |

* 2025 අධ්‍යයන වර්ෂය සඳහා බඳවා ගැනීම් අවසන් කර නොමැත. (සිසුන් 307දෙනෙකු බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු අවසන් කර ඇත.)

ගරු කථානායකතුමනි, මේ වනවිටත් ප්‍රවේශ කටයුතු සිදු වෙමින් පවතිනවා. ඒ අතරතුර කාලයේ විශේෂ ප්‍රවේශ, අභියාචනා කමිටුව මඟින් අනුමත කරන ප්‍රවේශ සහ විශේෂ අවශ්‍යතා සහිත ප්‍රවේශ යටතේ සිසුන් ද බඳවා ගන්නවා. එම නිසා මෙම ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි වීමට නියමිතයි. 2025 අධ්‍යයන වර්ෂය සඳහා මෙම සිසුන් ද ඇතුළු කර ගත්තාට පසුව තව සිසුන් 1,269ක් විතර ඇතුළු කර ගැනීමේ හැකියාවක් තිබෙනවා.

(ii) විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් කැඳවීමේදී රාජ්‍ය සේවකයින්ගේ දරුවන්ද යන්න වෙනම හඳුනා ගැනීමක් සිදු නොකෙරේ.

(iii)

<u>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින විශ්වවිද්‍යාල</u>

- 2023/2024 අධ්‍යයන වර්ෂයට අදාළව මහපොළ ශිෂ්‍යත්ව ඉල්ලුම් කරන ලද රාජ්‍ය සේවකයින්ගේ දරුවන් 5,232ක් අතරින් දරුවන් 1,863ක් තේරී පත්ව ඇත.
- 2024/2025 අධ්‍යයන වර්ෂය සඳහා අයදුම්පත් තේරීම් කටයුතු සිදු කරමින් පවතී.
- ඒ අතරතුර කාලයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති 04/2025 දරන චක්‍රලේඛයේ ප්‍රතිපාදනවලට යටත්ව සුදුසුකම් ලබන සිසුන් සඳහා ශිෂ්‍යාධාර ලබා දෙනු ලබන අතර ඒ සඳහා දළ වශයෙන් 30,000ක් පමණ ශිෂ්‍ය සංඛ්‍යාවකට කොමිෂන් සභාව විසින් අදාළ විශ්වවිද්‍යාලවලට ශිෂ්‍යාධාර නිකුත් කරමින් පවතිනවා.
- ඒ වාගේම 2024 දෙසැම්බර් 31වැනි දින වනවිට විශ්වවිද්‍යාලවලට අයත් නේවාසිකාගාර පහසුකම් හා කුලී/බදු පදනම මත ලබා ගත් නේවාසිකාගාර සැපයිය හැකි සිසුන් සංඛ්‍යාව 65,462කි.
- ඒ අතරතුර විශ්වවිද්‍යාල නේවාසිකාගාර පහසුකම් ලබා දීම විශ්වවිද්‍යාලවල නේවාසිකාගාර ප්‍රතිපත්තිය අනුව සිදු කරනු ලබයි. මේ වනවිට සිසුන්ගෙන් සියයට 60ත්, සියයට 65ත් අතර ප්‍රමාණයකට නේවාසිකාගාර පහසුකම් ලැබෙන අතර තව සිසුන් 16,000කට පමණ එම පහසුකම් ලබා දිය යුතුයි.
- 2026/2030 කාල රාමුව ඇතුළත නේවාසිකාගාර 55ක් ඉදිකිරීම සඳහා ව්‍යාපෘතියක් අනුමත කර තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ සඳහා රුපියල් මිලියන 1,500ක ප්‍රතිපාදන 2026 වසර සඳහා වෙන් කර තිබෙනවා.

<u>ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය</u>

- වාර්ෂික ආදායම රුපියල් ලක්ෂ 5ට අඩු සියලුම සිසුන්ට මහපොළ හෝ ශිෂ්‍යාධාර ලබා දීමට කටයුතු කරනු ලැබේ.

  නේවාසිකව සිටින ළමුන් ගණන 414කි.

| | ගිහි | පැවිදි |
|---|---|---|
| **දේශීය** | **99** | **262** |
| **විදේශීය** | **01** | **52** |

<u>ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය</u>

- ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා 41නමකට මහපොළ ශිෂ්‍යාධාර මුදල හා ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා 456නමකට ශිෂ්‍යාධාර මුදල ලබා දෙනු ලැබේ.

<u>ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය</u>

- පැමිණීම අනුව වාර්ෂික ආදායම රුපියල් 500,000ට අඩු ආදායම් ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට රුපියල් 5,000 සහ රුපියල් 4,000 වශයෙන් ශිෂ්‍යාධාර ලබා දේ.
- නේවාසිකාගාර ප්‍රමාණවත් නොමැති බැවින් සිසුන් සඳහා නේවාසිකාර කටයුතු සීමා කර ඇත. 2024 වර්ෂයේ සිසුන් 195ක් හා 2025 වර්ෂයේ සිසුන් 158ක් සඳහා නේවාසිකාගාර පහසුකම් ලබා දී ඇත.

- නේවාසිකාගාර පහසුකම් ලබා දීමේදී අඩු ආදායම් සහිත පවුල්වල වැඩිම දුරක් සහිත සිසුන්ට ප්‍රමුඛතාව ලබා දී ඇත.

- තවද ඩිප්ලෝමා පුහුණු පාඨමාලා හදාරන සිසුන්ට අදාළ ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ නේවාසිකාගාර ඉල්ලුමට සරිලන පරිදි ප්‍රමාණවත් නොවේ නම් ඉහතින් සඳහන් කර ඇති ආකාරයට නේවාසිකාගාර සැපයීම සිදුවේ.

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

- නිපුණතා සිසු සවිය ශිෂ්‍යාධාර සඳහා සුදුසුකම් ඇති විශ්වවිද්‍යාලව සිසුන්ට නියමිත ශිෂ්‍යාධාර ලබා දෙනු ලැබේ. ඒ අනුව 2024 වර්ෂයේ සිසුන් 1,213ක් හා 2025 වර්ෂයේ සිසුන් 1,554ක් සඳහා ශිෂ්‍යාධාර ලබා දී ඇත.

ආරක්ෂක විශ්වවිද්‍යාලය

- මෙම විශ්වවිද්‍යාලයේ සිසුන් සඳහා මහපොළ ශිෂ්‍යාධාර ලබා නොදේ.

- සියලුම කැඩෙට් නිලධාරින් සඳහා නේවාසික පහසුකම් නොමිලයේ ලබා දේ.

(iv) ඉහත (iii) හි පරිදි වේ.

(ආ) අදාළ නොවේ.

**ගරු නන්ද බණ්ඩාර මහතා**
(மாண்புமிகு நந்த பண்டார)
(The Hon. Nanda Bandara)

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. රාජ්‍ය සේවයේ නියුතු අයගේ දරුවන් 5 වසර ශිෂ්‍යත්වය සමත්වීමේදී මව හෝ පියා, එහෙම නැත්නම් ඒ දෙදෙනා රාජ්‍ය සේවයේ නිරතවීම නිසා ඒ දරුවන්ට ශිෂ්‍යාධාර ලැබෙන්නේ නැහැ. ඒ වාගේම තමයි උසස් පෙළ සමත් වුණාට පසුව විශ්වවිද්‍යාලවලට යන ඒ දරුවන්ට -රාජ්‍ය සේවයේ නියුතු අයගේ දරුවන්ට- ශිෂ්‍යාධාර නොලැබීමත් බරපතළ ගැටලුවක්. එය පවතින තත්ත්වය වුණත් මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය වෙන්නේ, ඉදිරියේදී එය නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගන්නවාද කියන එකයි.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, එම අතුරු ප්‍රශ්නය ඇසීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මේ සම්බන්ධයෙන් අය වැය පූර්ව සාකච්ඡාවලදී සාකච්ඡා කර තිබුණා.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ කළමනාකරණ කමිටුව එක්ක අපට ඉදිරියේදී මේ සාකච්ඡාව ගැනීමේ හැකියාව තිබෙනවා. ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව පරිදි, ඒ සම්බන්ධ සාකච්ඡාව ගැනීමට අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු නන්ද බණ්ඩාර මහතා**
(மாண்புமிகு நந்த பண்டார)
(The Hon. Nanda Bandara)

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. සමහර රාජ්‍ය සේවකයන්ගේ -බොහෝ වෙලාවට අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිරත අයගේ- දරුවන් දෙන්නා, තුන්දෙනා එකවර උසස් අධ්‍යාපනය හදාරන අවස්ථා තිබෙනවා. එවැනි පවුල්වල දරුවන්ට විශ්වවිද්‍යාල වරම් ලැබුණු පසු නේවාසිකාගාර පහසුකම් නොලැබීම බරපතළ ගැටලුවක් වනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ අනුව රාජ්‍ය සේවකයන්ගේ දරුවන් සඳහා දැනට තිබෙන ඒ නේවාසිකාගාර පහසුකම් ලබා නොදීමට අදාළ කාරණා නිවැරදි කිරීමට අදාළ නීති සංශෝධනය කර හෝ වෙනස් කර හෝ ක්‍රියාමාර්ග ගන්නවාද කියලා මා දැන ගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, මේ කාරණාවේදී පැහැදිලි ගැටලුවක් තිබෙනවා. පසුගිය අවුරුද්ද තුළම අපි කටයුතු කළේ නේවාසිකාගාර ගැටලු සම්බන්ධයෙන්. දැනට සිසුන්ගෙන් සියයට 60ක්, 65ක් අතර ප්‍රමාණයකට නේවාසිකාගාර පහසුකම් ලැබෙන අතරතුර, අපි සඳහන් කළා වාගේ නේවාසිකාගාර 55ක් ඉදි කිරීම සඳහාත් මේ අතරතුර කාලයේදී අපි කටයුතු සම්පාදනය කරමින් තිබෙනවා. දැනට පාඨමාලාවලට අනුකූලව තමයි නේවාසිකාගාර පහසුකම් සැපයෙන්නේ. මේ වෙනකොට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නේවාසිකාගාර ප්‍රතිපත්තියක් සකසමින් පවතිනවා. මේ ප්‍රතිපත්තිය ඇතුළත මේ සාකච්ඡාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් එකවරක් අරගෙන තිබෙනවා. ඒ ප්‍රතිපත්තියට අදාළව මේ නිශ්චිත කාරණාව සම්බන්ධයෙන් සාකච්ඡා කළ හැකියි. ඒ සම්බන්ධයෙන් අපි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට මේ කටයුත්ත ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

## මත්පැන් අලෙවිසැල් පිහිටුවීම: අධිකරණ නියෝගයට අනුකූල වීම
### மதுபானசாலைகளைத் தாபித்தல்: நீதிமன்ற உத்தரவுக்கு இணங்குதல்
### LOCATION OF LIQUOR SHOPS: COMPLIANCE TO COURT ORDER

20/2024

**1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Hesha Withanage Ankumbura Arachchi)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ඇති සුරාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) සුරාසල් පිහිටුවීමේදී ඒවා පන්සල්, පල්ලි, කෝවිල් සහ පාසැල් වැනි ස්ථානවල සිට මීටර් 100ක් දුරින් පිහිටුවිය යුතු බවට අධිකරණය මඟින් තීන්දුවක් ලබාදී තිබෙන බව දන්නේද;

(iii) මේ වනවිට එම තීන්දුව ප්‍රකාරව සහ පටහැනිව පිහිටුවා ඇති සුරාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இன்றளவில் இலங்கையில் காணப்படும் மதுபானசாலைகளின் எண்ணிக்கை யாது;

(ii) மதுபானசாலைகளைத் தாபிக்கும்போது, அவற்றை விகாரைகள், ஆலயங்கள், பள்ளிவாசல்கள், கோயில்கள் மற்றும் பாடசாலைகள் போன்ற இடங்களிலிருந்து 100 மீற்றர் தூரத்தில் அமைக்க வேண்டுமென நீதிமன்றம் தீர்ப்பு வழங்கியுள்ளமையை அறிவாரா;

(iii) இன்றளவில் இத்தீர்ப்புக்கு ஏற்பவும் மாறாகவும் அமைக்கப்பட்டுள்ள மதுபானசாலைகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House -

(i) the number of liquor shops existing in Sri Lanka, at present;

(ii) whether he is aware that a court decision has been issued to the effect that when liquor shops are established, they must be at least 100 metres away from places such as temples, churches, mosques, kovils and schools; and

(iii) the number of liquor shops that have been established as at present in compliance with the aforesaid decision and in violation of the decision, separately?

(b) If not, why?

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) සුරාසල් සංඛ්‍යාව 4,216කි.

(ii) අංක 2366/39 හා 2024.01.12 දිනැති වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 02/2024 දරන සුරාබදු නිවේදනයේ "රීති" 12 වගන්තියෙහි "අ" සිට "ඒ" දක්වා එක් එක් බලපත්‍ර ලබා දීම සඳහා වන ලියාපදිංචි පාසල් සහ රජයේ ලියාපදිංචි පූජනීය ස්ථානවලට ඇති දුර ප්‍රමාණය පැහැදිලිව දක්වා ඇත. ඒ අනුව ඒ මත බලපත්‍ර නිකුත් කර ඇත. මීට අමතරව මෑතකදී ලබා දුන් CA(Writ) 36/2025 දරන නඩු තීන්දු මඟින් ද ඒ බව තහවුරු කර ඇත.

(iii) ඉහත පරිදි ලබා දී ඇති සුරාබදු බලපත්‍ර සංඛ්‍යාව 4,216ක් වන අතර, එම අයදුම්කරුවන්ට සුරාබදු නියෝගයන්ට පටහැනිව කිසිදු බලපත්‍රයක් ලබාදී නොමැත.

එහෙත් ඉල්ලුම්කරුවන්ට අයදුම්පත් ලබා දීමේදී විනිවිදභාවයකින් යුතු නිසි ක්‍රමවේදයකට අනුව අයදුම්පත් ලබා දී ඇති බවට තොරතුරු නොමැත. අයදුම්පත්‍ර ලබා ගැනීමෙන් පසු නිසි ක්‍රමවේදයකට ඉදිරිපත් කර, නියමිත සුදුසුකම් සපුරාලන ඉල්ලුම්කරුවන්ට විනිවිදභාවයකින් යුතුව, අදාළ රෙගුලාසිවලට අනුව එම බලපත්‍ර ලබා දීම සිදු කෙරේ.

(ආ) පැන නොනඟී.

## හඟුරන්කෙත, වලපනේ සහ කොත්මලේ ප්‍රා.ලේ. කොට්ඨාස: ප්‍රාදේශීය ලේකම් කාර්යාල
## வலப்பனை, கொத்மலை பிரதேச செயலாளர் பிரிவுகள்: பிரதேச செயலகங்கள்
## HANGURANKETHA, WALAPANE AND KOTMALE DS DIVISIONS: DIVISIONAL SECRETARIATS

1662/2025

**4. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. (Dr.) V.S. Radhakrishnan)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත, වලපනේ සහ කොත්මලේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි, එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය බැගින් ස්ථාපිත කර ඇති බවත්;

(ii) එම ප්‍රදේශවල ජීවත්වන ජන සංඛ්‍යාව අනුව, එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් මඟින් පමණක්, ජනතාවගේ සේවා අවශ්‍යතා සපුරාලීම ගැටලුකාරී වී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත (අ)(i)හි සඳහන් ප්‍රදේශ සඳහා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙක බැගින් ස්ථාපිත කළ යුතු බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நுவரெலியா மாவட்டத்தில் ஹங்குரன்கெத்த, வலப்பனை, கொத்மலை ஆகிய பிரதேச செயலகப் பிரிவுகளில் ஒரு பிரதேச செயலகம் வீதம் தாபிக்கப்பட்டுள்ளது என்பதையும்;

(ii) குறிப்பிட்ட பிரதேசத்தில் வதிகின்ற மக்கள் தொகைக்கு ஏற்ப, ஒரு பிரதேச செயலகத்தின் ஊடாக மாத்திரம் மக்களுக்குத் தேவையான சேவைகளை வழங்குவது பிரச்சினையாக அமைந்துள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேலே (அ)(i) இல் குறிப்பிடப்படும் பிரதேசங்களில், இரண்டு பிரதேச செயலகங்கள் வீதம் தாபிக்கப்பட வேண்டுமென்பதை அவர் ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) ஆமெனில், அது தொடர்பில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Is he aware that -

(i) only one Divisional Secretariat has been established for each of the Divisional Secretaries' Divisions of Hanguranketha, Walapane and Kotmale in the Nuwara Eliya District; and

(ii) as far as the number of people living in the said areas is concerned, it has become problematic to provide the services needed by those people through only one Divisional Secretariat in each area?

(b) Will he inform this House -

(i) whether he accepts that two Divisional Secretariats should be established for each of the areas mentioned in (a)(i) above; and

(ii) if so, the measures that will be taken in that regard?

(c) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

*** සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) සහ (ii)

පැවති පරිපාලනමය ගැටලු සහ ජනතාවගේ සේවා අවශ්‍යතා මත පදනම්ව 2012 සීමා නිර්ණය කමිටු නිර්දේශයන් අනුව නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ හඟුරන්කෙත සහ මතුරට ලෙසත්, වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වලපනේ සහ නිල්දණ්ඩාහින්න ලෙසත්, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කොත්මලේ නැගෙනහිර සහ කොත්මලේ බටහිර ලෙසත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හයක් මේ වනවිටත් ස්ථාපිත කර ඇත.

(ආ) (i) ස්ථාපිත කර ඇත.

(ii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 6 -1696/2025- (1), ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමිය.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)

ගරු කථානායකතුමනි, ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති 2ක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 9 -1719/2025- (1), ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)

ගරු කථානායකතුමනි, ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති 2ක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා.

# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

## නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමේදී මතුවී ඇති ගැටලු
## புதிய கல்விச் சீர்திருத்தங்களை அறிமுகப்படுத்துவதால் எழுகின்ற சிக்கல்கள்
## ISSUES ARISEN IN INTRODUCING NEW EDUCATION REFORMS

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මම පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

අධ්‍යාපනය විශ්වීය මානව අයිතිවාසිකමක් ලෙස එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් විශ්ව ප්‍රකාශය මඟින් පිළිගෙන ඇති අතර, ලෝකයේ බොහෝ රටවල්වල මූලික අයිතිවාසිකමක් ලෙස අධ්‍යාපනය පිළිගනු ලබනවා. මූලික අයිතිවාසිකමක් නොවුවද, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VI වන පරිච්ඡේදයේ රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම හා මූලික යුතුකම්වල නිදහස් අධ්‍යාපනයක් ලබා දීම රජයේ මූලික යුතුකමක් ලෙස සලකනවා.

ඇත්තවශයෙන්ම අධ්‍යාපනයත්, සෞඛ්‍යයත්, ඒ වාගේම සෙසු ක්ෂේත්‍රත් අපේ රටේ මූලික අයිතිවාසිකම් බවට පත් කළ යුතුයි කියන ප්‍රතිපත්තියේ අපි -සමගි ජන බලවේගය, සමගි ජන සන්ධානය- සිටිනවා.

නව විෂය මාලා ප්‍රතිසංස්කරණ තුළ ඇති වී ඇති ගැටලුකාරී තත්ත්වය හේතුවෙන් පාසල් දූ පුතුන්ගේ අධ්‍යාපන අයිතියට බරපතළ තර්ජනයක් එල්ල වී ඇති බව පෙනෙන්නට තිබෙන බැවින්, පහත සඳහන් ප්‍රශ්න මා යොමු කරන අතර, ඒ සඳහා නිවැරදි හා නිශ්චිත පැහැදිලි කිරීම් රජයෙන් බලාපොරොත්තු වෙමි. රාජ්‍ය ප්‍රතිපත්තියේ තිබෙන නිවැරදි හා නිශ්චිත පැහැදිලි කිරීම් අපට අවශ්‍යයි, මේ කරුණු පිළිබඳව. මොකද, ළමා ප්‍රඥප්තියේ 13, 14, 18 සහ 19 වැනි වගන්ති අනුව ගත්තාම, ඇත්තවශයෙන්ම අධ්‍යාපනය අසභ්‍යකරණය කිරීම තුළ ළමුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වෙලා තිබෙනවාය කියන එක මා කියන්නට කැමැතියි.

1. 6 ශ්‍රේණියේ ඉංග්‍රීසි මොඩියුලයේ ඇති වී තිබෙන ප්‍රශ්නගත තත්ත්වය සහ නව විෂය මාලා ප්‍රතිසංස්කරණයේ ඇති වී තිබෙන ප්‍රශ්නකාරී තත්ත්වයන් හේතුවෙන් දරුවන්ගේ අධ්‍යාපන අයිතිය සහ මානව අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව රජය පිළිගන්නේද?

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට මම තව කොටසක් එකතු කළා, "එසේ නම් මේ සම්බන්ධයෙන් වග කිව යුත්තේ කවුරුන්ද යන කාරණාව මේ වනවිට හඳුනා ගෙන තිබේද?" කියලා. හැබැයි, ඒක කපා දමා තිබෙනවා. "බලධරයා විසින් කපන ලදී." හොඳයි.

ගරු කථානායකතුමනි, මා ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. අපි වැදගත් ප්‍රශ්නයක් ඇහුවාම ඒ ප්‍රශ්නයෙන් කොටසක් කපා දමනවා. එහෙම කරන්න පුළුවන්ද?

2. නිසි ක්‍රමවේදයක් අනුගමනය කරමින් පාසල් ළමුන්ගේ ප්‍රයෝජනය වෙනුවෙන් නිවැරදි, ගුණාත්මක සහ විද්‍යාත්මක විෂය මාලාවක් හඳුන්වා නොදීමට රජයට තිබූ බාධා මොනවාද? මෙම විෂය මාලා ප්‍රතිසංස්කරණයන් හඳුන්වා දීමට පෙර සිදු කළ ගුණාත්මක සහ විද්‍යාත්මක අධ්‍යයනයන් මොනවාද? ඒවා සභාගත කරන්නේද?

ඒ අහපු ප්‍රශ්නයෙනුත් කොටසක් කපා දමා තිබෙනවා, ගරු කථානායකතුමනි. "සිසු දූ දරුවන්ව පටු දේශපාලන උපක්‍රමයක් වශයෙන් යොදා ගැනීම" කියන කොටස කපා දමා තිබෙනවා. මම අහන්න කැමැතියි, අප අහන ප්‍රශ්නවල කොටස් ඒ විධියට කපා දමන්නේ කොහොමද කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඒ සම්බන්ධයෙන් ලේකම් මණ්ඩලය දැනුම් දෙනවා, ඒක revise කරලා ඔබතුමාගේ කාර්යාලයෙන්ම තමයි ලබා දීලා තිබෙන්නේ කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා දීපු පළමුවැනි එකේ ඔය විධියට තිබිලා තියෙනවා. දෙවැනි එක revise කරලා ඔබ කාර්යාලයෙන් දීලා තිබෙනවා කියලා තමයි කියන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඔබතුමාට කියන්නම්. මේ ඔක්කෝම සාක්ෂි සහිතව මා ළඟ තිබෙනවා. මම ඒ ටික ඔබතුමාට ඉදිරිපත් කරන්නම්. අපි මේවා බොරුවට ඉදිරිපත් කරන්නේ නැහැ. වගකීමෙනුයි ඉදිරිපත් කරන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Sir, I rise to a point of Order.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම කථා කරලා ප්‍රශ්නය ඇහුවාට පස්සේ ඔබතුමා උත්තර දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මේක පක්ෂ නායකයන්ට තිබෙන අවස්ථාවක්. එතුමා දුන්නු ප්‍රශ්නය නැවත එතුමාගේම කාර්යාලයෙන් revise කරලා දුන්නු බවට ඔබතුමා දැනුම් දුන්නා. නමුත්, ගරු විපක්ෂ නායකතුමා දැන් එය පිළිගන්නේ නැති බව

තමයි පෙනී යන්නේ. මේකට අනවශ්‍ය චෝදනාවක් ගන්න අවශ්‍ය නැහැ. අපි හිතනවා, ලේකම් මණ්ඩලය මඟින් අද දිනය තුළදී මේ සම්බන්ධව ප්‍රකාශයක් සිදු කරනවා නම් හොඳයි කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම ඒ ගැන නැවත වරක් පැහැදිලිව කියනවා. අපි පළමුවෙන්ම original ප්‍රශ්නය යොමු කළා. ඒ යොමු කරපු original ප්‍රශ්නයේ ප්‍රශ්න දෙකක කොටස් දෙකක් ඉවත් කරලා තිබෙනවා. මම වගකීමෙන් කියන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා ප්‍රශ්නය කියවාගෙන යන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

නිකම් කියවාගෙන යන්නේ නැහැ. මම මේ ප්‍රශ්නයක් අහන්නේ.

3. නව විෂය මාලා ප්‍රතිසංස්කරණ යටතේ සකස් කළ අධ්‍යාපන මොඩියුල සඳහා වෙබ් අඩවිවල නම් ඇතුළත් කිරීම සඳහා වූ නිර්ණායක මොනවාද? ඒවා තෝරා ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සතු වූ ප්‍රමිති සහ නිර්ණායක මොනවාද?

   ගරු කථානායකතුමනි, යම්කිසි වෙබ් අඩවියක් හෝ තවත් මොකක් හරි දෙයක් reference එකකට දානවා නම්, ඒක යම්කිසි ප්‍රමිතිකරණයක් යටතේ සිදු වෙනවාද, නැද්ද කියන එකයි මේ අහන්නේ. මෙම වෙබ් අඩවි තෝරා ගැනීමේ ක්‍රියාවලියේදී විනිවිදභාවය සහ වගවීම සහතික කළේ කෙසේද?

   ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුගමනය කරනු ලැබුවේද?

4. මේ ආකාරයෙන් විවිධ පෞද්ගලික ආයතන සතු වෙබ් අඩවි යොදා ගැනීම හරහා යම් ආර්ථික ප්‍රතිලාභයක් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත හෝ අදාළ පෞද්ගලික ආයතනවලට ලැබෙන්නේද? එසේ නම්, එම ආර්ථික ගනුදෙනු පිළිබඳ විස්තර සභාගත කරන්නේද?

5. මෙම නව අධ්‍යාපන විෂය මාලා ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා මේ වන විට දිවයිනේ සියලුම ගුරුවරුන් පුහුණු කර අවසන් ද? ඔවුන් වෙත අදාළ අන්තර්ජාල හා තොරතුරු තාක්ෂණ පුහුණුව හා ඊට අදාළ පහසුකම්, එනම් උපකරණ, අන්තර්ජාල පහසුකම් ආදිය සපයා තිබේද? පුහුණු කර නොමැති ගුරුවරුන්ගේ සංඛ්‍යාව කොපමණද?

6. මෙම නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම්, එනම් පරිගණක, අන්තර්ජාල සම්බන්ධතා, විදුලිය, තාක්ෂණික යටිතල පහසුකම් අපේ රටේ සියලු පාසල් සතුද?

   මට දළ වශයෙන් කියන්න පුළුවන් 10,126කට වැඩි පාසල් ප්‍රමාණයක් අපේ රටේ තිබෙනවා කියලා. එම පාසල්වල පහසුකම් තිබෙනවාද, මේ නව ක්‍රමවේද ක්‍රියාත්මක කරන්න?

   එසේ නොමැති නම්, එම පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද? ඒවා සපයා නැති නිසා නව ප්‍රතිසංස්කරණ අනුව ඉගැන්වීම් කටයුතු කළමනාකරණය කර ගන්නේ කෙසේද?

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මේ මොඩියුල ක්‍රමවේදය සඳහා first term එකට නම් මුදල් වෙන් කරලා තිබෙනවා. අපි දැන ගන්න කැමැතියි දෙවැනි සහ තුන්වැනි වාරවලට - for second and third terms - මුදල් වෙන් කරලා තිබෙනවාද කියලා. ඒ වාගේම අසභ්‍ය වෙබ් අඩවි ඇතුළත් කිරීම පිළිබඳ මූලික වාර්තාවක් ඉදිරිපත් වෙලා තිබෙනවා කියා ප්‍රකාශයට පත් වෙනවා. මේ වැඩ පිළිවෙළේ විනිවිදභාවය එළිදැක්වීමට නම් ඒවා සභාගත කිරීම බෙහෙවින් වැදගත් වෙනවා. ඒ වාගේම මම රජයෙන් අහන්න කැමැතියි, මේ මොඩියුල ක්‍රමය ඉදිරියට ක්‍රියාත්මක කරන්න තවත් පිටු කීයක් ගලවන්න තිබෙනවාද, එහෙම නැත්නම් තවත් පිටු කීයක් එකතු කරන්න තිබෙනවාද කියලා. අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ රැඳී සිටින නිසාත්, විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් අහපු ප්‍රශ්නයකට උත්තර ලබා දුන්නු නිසාත් මේ ප්‍රශ්නයටත් උත්තරයක් ලැබෙයි කියා මම බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධව පැහැදිලි, නිශ්චිත පිළිතුරක් සැපයීම සඳහා හෙට දිනය දක්වා කල් ගන්නවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මෙම පාර්ලිමේන්තුව විශේෂ කාරක සභාවක් පත් කළා, කන්ටේනර් 323 පිළිබඳ ප්‍රශ්නය විභාග කරන්න. දැන් වන විට නොවැම්බර් මාසයත් ගත වුණා, දෙසැම්බර් මාසයත් ගත වුණා. මේ, ජනවාරි මාසය. අදටත් ඒ පිළිබඳ රැස්වීමක් කැඳවා නැහැ, ගරු කථානායකතුමනි. මේ ප්‍රශ්නය ඉතා බරපතළ ප්‍රශ්නයක්; රටේ කථා වුණු ප්‍රශ්නයක්.

ඒ වාගේම ආණ්ඩු පක්ෂයත් එකඟ වුණා, විශේෂ කාරක සභාවක් පත් කරන්න. පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් මෙහෙයවන එක, එහි රැස්වීම් පවත්වන එක එහි සභාපතිතුමාගේ වගකීමයි. ගරු අධිකරණ ඇමතිතුමා තමයි මේ කියන කාරක සභාවේ එම වගකීම දරන්නේ. මීට කලින් -ගිය මාසයේ- එහි රැස්වීමක් පවත්වන්න නියමිතව තිබිලා, ඒක කල් දැම්මා. ආණ්ඩුව එම කාර්යය අධෛර්යවත් කරන්න එය කල් දානවා නම් ඒක වෙනම ප්‍රශ්නයක්. එහෙම නැත්නම් ඒක පවත්වන්න ඕනෑ. මමත් ඒ කමිටුවේ සාමාජිකයෙක්. අපි සූදානම් වෙලා ඉන්නවා, ඒකට ක්‍රියාශීලිව සහභාගි වෙන්න. රටේ මිනිස්සු දැනගන්න කැමැතියි, පාර්ලිමේන්තුව මේ ගැන විමර්ශනය කරන්නේ කොහොමද කියලා. කරුණාකර මේකට road map එකක් හදලා, කවදාද එය පටන් ගන්නේ, ඒ වැඩ පිළිවෙළ කුමක්ද, දවස් කීයක් රැස් වෙනවාද කියලා කියන්න. මොකද, අපටත් ඒක සැලසුම් කර

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ගන්න අවශ්‍යයි. එහෙම නැතුව සභාපතිතුමාට -අධිකරණ ඇමතිතුමාට- හිතෙන හිතෙන වෙලාවට දින දාන්න පුළුවන්කමක් නැහැ. මේක කරන්න බැරි නම්, අධෛර්යවත් කරන්න කල් දානවා නම්, කරුණාකර ඒක කියන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අධිකරණ අමාත්‍යතුමා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
පසුගිය අවුරුද්දේ පාර්ලිමේන්තුවේදී ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා ඒ ගැන කථා කළා. මම ඒ අවස්ථාවේ දැනුම් දී සිටියා, හදිසියේ යොදපු දිනයක් වූ නිසා ඒ පාර්ලිමේන්තු දිනයේදී තමන්ට එයට එන්න නොහැකි බවට එහි බහුතර සාමාජිකයන් මාව දැනුවත් කළා කියලා. ඒ අනුව එය මේ පාර්ලිමේන්තු වාරයට යොදලායි තිබෙන්නේ. මම ඕවාට වැඩිය උත්තර දෙන්න ඕනෑ නැහැ. මොකද, ඒක කරන්න වුවමනාව අපට තිබෙනවා. ඒ වුවමනාව නැතුවා නොවෙයි. ඔබතුමාට අවශ්‍ය දේ ඔබතුමා කියන්න, ගරු මන්ත්‍රීතුමා. නමුත් කරුණාකර හොඳට මතක තියා ගන්න, ඒක කිරීමේ වුවමනාව අපට තිබෙන බව. අවශ්‍ය සිතියම, සැලැස්ම සියල්ල සහිතව අපි දැනුවත් කරන්නම්. මේ වාරය දැනුයි පටන් ගත්තේ. අපි ඒ වැඩේ කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන. 2025.10.24වන දින ගරු සජිත් ප්‍රේමදාස මහතා සහ ගරු රවී කරුණානායක මහතා ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද ප්‍රශ්නවලට මුදල් ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගරු ආචාර්ය අනිල් ජයන්ත මහතා විසින් පිළිතුරු ලබා දීම.

## 2025 අය වැය යෝජනාවල ප්‍රගතිය: මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

### 2025 வரவு செலவுத்திட்ட முன்மொழிவுகளின் முன்னேற்றம்: நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று

### PROGRESS OF BUDGET PROPOSALS, 2025: STATEMENT BY DEPUTY MINISTER OF FINANCE AND PLANNING

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු විපක්ෂ නායකතුමා විසින් 2025.10.24වන දින අසන ලද ප්‍රශ්නයට මුලින්ම මා පිළිතුර ලබා දෙනවා. That is about the details of Budget, 2025 and about the Capital Expenditure.

01. 2025 අය වැය යෝජනා වශයෙන් ඉදිරිපත් කර තිබෙන වියදම් යෝජනා 54යි.

ඒ එක් එක් යෝජනා සහ අනුමත කරනු ලැබූ ප්‍රතිපාදන ප්‍රමාණ පිළිබඳ දීර්ඝ විස්තරයක් තිබෙන්නේ. ඒක කියවන්න අවශ්‍ය නැහැ. එම තොරතුරු ඇමුණුම 01හි සඳහන් වෙනවා.

අය වැය වියදම් යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම පැවරී ඇති රේඛීය අමාත්‍යාංශයේ, පළාත් සභාවේ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, පළාත් පාලන ආයතනයේ හෝ විශේෂ වියදම් ඒකකයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට අදාළ අය වැය වියදම් යෝජනාවන්හි ප්‍රගතිය මැන බැලීම සඳහා වගකීම පැවැරිලා තිබෙනවා.

2025 අය වැය යෝජනාවල ප්‍රගතියට අදාළ පිළිතුර සකස් කරනකොට 2025.10.31 දිනට අය වැය වියදම් යෝජනා 54ක වත්මන් භෞතික හා මූල්‍ය ප්‍රගතිය අමාත්‍යාංශ/ පළාත් සභා/ දිස්ත්‍රික් ලේකම් කාර්යාල/ පළාත් පාලන ආයතන/ විශේෂ වියදම් ඒකක යටතේ ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කර තිබෙනවා.

මම කැමැතියි, අද වනකොට - ඒ කියන්නේ දෙසැම්බර් මාසයේම - ප්‍රගතිය ඉදිරිපත් කරන්න. ඒ ප්‍රගතිය ගත්තාම, රුපියල් බිලියන 956ක් වාර්තා වෙලා තිබෙනවා. විදේශ projects යටතේ එන්න තිබෙන රුපියල් බිලියන 10ක විතර තවත් පුංචි ගැළපීමක් තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ප්‍රතිශතාත්මකව කියන්න පුළුවන්ද, ගරු ඇමතිතුමනි?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ප්‍රතිශතාත්මකව කිව්වොත්, රුපියල් බිලියන 1,315ක් නේ, 2025 වර්ෂයට වියදම් කළේ. ඒකෙන් සියයට 70ක් වෙන් වෙලා තිබෙනවා. නමුත්, වර්ෂයෙන් වර්ෂය අපි යම් ප්‍රතිශෝධන කරනවා. ප්‍රතිශෝධිත අගයෙන් සියයට 90ට වඩා වැඩිපුර වියදම් කර තිබෙනවා. ඒ සංඛ්‍යා දත්ත, ලේඛන ලබා දෙන්නට පුළුවන්.

02. 2025 වර්ෂයේ නිම කිරීමට සැලසුම් කළ අය වැය වියදම් යෝජනා 54ක් පවතින අතර, අය වැය වියදම් යෝජනා යටතේ සපයා ඇති ප්‍රතිපාදන වටිනාකම රුපියල් මිලියන 215,650ක් වන අතර, ඒ අනුව 2025.10.07 වන විට මූල්‍ය ප්‍රගතියක් පෙන්වා ඇති ව්‍යාපෘති ලේඛනය ඇමුණුම 03හි සඳහන් කර ඇත.

ඉදිරිපත් කර තිබෙන ඇමුණුම 03හි තිබෙන්නේ ඔක්තෝබර් මාසය වනකල් තිබෙන ප්‍රගතිය. *[බාධා කිරීමක්]* එතැන ප්‍රතිශතයක් විධියට ගණනය කරලා නැහැ. දීර්ඝ ප්‍රකාශන ටිකක් තිබෙන්නේ. ගණනය කරලා total එකේ මූල්‍ය ප්‍රගතිය වාර්තාවට ඇතුළත් කරලා ඉදිරිපත් කරන්න පුළුවන්. ඒක එකතු කළ යුතු වනවා.

03. එවැනි යෝජනා නොමැත.

04. එම තොරතුරු ඇමුණුම 04හි සඳහන් කර ඇත.

මාස්පතා ගත්තාම Current Account එකේ සෘණ අගයක් වාර්තා වුණා, සැප්තැම්බර්, ඔක්තෝබර් මාසවලදී. නමුත්, නොවැම්බර් මාසයේදී ධන අගයක් වාර්තා වෙලා තිබෙනවා. අවසාන වශයෙන් Current Account එකේ cumulative figure එක ගත්තාම රුපියල් බිලියන 1.7ක ධන අගයක් තිබෙන්නේ.

05. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ පවතින දත්ත අනුව විදේශ ණය යටතේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතිවල 3වන කාර්තුව අවසානයේ ප්‍රගතිය ඇමුණුම 05හි සඳහන් කර තිබෙනවා.

2025.09.30 දිනට විදේශ ණය ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති විශාල ප්‍රමාණයක ප්‍රගතිය ඇමුණුම 06හි සඳහන් වෙනවා. *[බාධා කිරීමක්]* මම එහි ප්‍රතිශතය ඉදිරිපත් කරන්නම්.

06. 2025 සැප්තැම්බර් මාසය අවසානයේ ලැබුණු සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 827යි.

2026 වසර සඳහා සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ වැඩ පිළිවෙළ විධියට, ආයෝජන පරිසරය වැඩිදියුණු කිරීම සහ විදේශ සෘජු ආයෝජන ගලා ඒම පහසු කිරීම අරමුණු කරගත් වැඩසටහන් මාලාවක් රජය විසින් ක්‍රියාත්මක කිරීම. 2026 දී සෘජු විදේශ ආයෝජන - FDIs - ආකර්ෂණය කර ගැනීම සඳහා ආයෝජන මණ්ඩලය සහ අදාළ රාජ්‍ය ආයතනවල සම්බන්ධීකරණය යටතේ සැලසුම් කර ඇති වැඩසටහන යටතේ ප්‍රධාන ක්ෂේත්‍ර ගණනාවකට අවධානය යොමු කර තිබෙනවා. ඒ පිළිබඳව ඇමුණුම 07හි සඳහන් වෙනවා. *[බාධා කිරීමක්]*

ඇමුණුම් 01, 02, 03, 04, 05, 06 සහ 07 **සභාගත*** කරමි.

අපි බලාපොරොත්තු වුණු ප්‍රමාණය ලැබිලා තිබෙනවා. යම් ඉලක්ක සහිතව ස්ථාවරත්වයක ඉඳලා කටයුතු කරන්න තමයි අපි FDIsවලින් target කළේ. ඒ ප්‍රමාණය අපට ලැබී තිබෙනවා. *[බාධා කිරීමක්]* ඇමෙරිකානු ඩොලර් මිලියන 827යි.

සම්පූර්ණ පිළිතුර ලබා දීලා ඉවරයි, ගරු කථානායකතුමනි. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම මම මේ කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. බොහෝ වෙලාවට අපි කථා කරනවා, සාර්ව ආර්ථික විචල්‍යයන් පිළිබඳව, ඒ කියන්නේ macroeconomic indicators පිළිබඳව. හැබැයි, අපි සාර්ව ආර්ථික විචල්‍යයන් ගැන කථා කළාට, ආර්ථික වර්ධන වේගය වේවා, වෙනත් සංඛ්‍යාලේඛන වේවා, microeconomy එකට මේක ඉතාම වැදගත්, ගරු අමාත්‍යතුමනි. මේක ක්ෂුද්‍ර ආර්ථිකයට බලපාන්නේ කොහොමද? ඒ කියන්නේ පුද්ගලයන්ට, ගෘහ ඒකකවලට, ව්‍යවසායකයන්ට සහ ව්‍යාපාරවලට බලපාන්නේ කොහොමද? අද පවතින ආර්ථික වර්ධන වේගය quarterly ආකාරයට සහ සමස්ත ආකාරයට ඔබතුමන්ලා ඉදිරිපත් කරනවා. මම දැනගන්න කැමැතියි, එය කොහොමද ක්ෂුද්‍ර ආර්ථිකය, ඒ කියන්නේ, තනි පුද්ගලයන්ගේ ව්‍යාපාර සහ ව්‍යවසායකයන්ගේ, ඒ වාගේම ගෘහ ඒකකවල ආදායමට බලපාන්නේ කියලා.

ඒ වාගේම මම ඔබතුමාගේ අවධානය මේ කාරණය කෙරෙහිත් යොමු කරවන්න කැමතියි. "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ ව්‍යසනය නිසා විවිධ ද්විපාර්ශ්වීය ආධාර සහ බහුපාර්ශ්වීය ආධාර අපේ රටට ලැබිලා තිබෙනවා. ගරු කථානායකතුමනි, හැබැයි මේ අය සමහර වෙලාවට ක්‍රියාත්මක වෙන විදේශ ආධාර වැඩ පිළිවෙළ repurpose කරලා තිබෙනවා. ඒ කියන්නේ අලුතින් මුදල් ලබා දීමක් නොවෙයි. මුදල් ලැබිලා ක්‍රියාත්මක වන විවිධ ව්‍යාපෘතිවලින් මුදල් අරගෙන ඒවා "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් වුණු අයට යටිතල පහසුකම් සැලසීමට ලබා දෙන මුදල් හැටියට repurpose කරනවා. මම ඔබතුමාට යෝජනාවක් කරන්න කැමතියි. අපි ඒ ආයතනවලට කියන්න ඕනෑ, repurpose කරන එක වෙනුවට, ක්‍රියාත්මක වූ විදේශ ආධාර ක්‍රම එසේම ක්‍රියාත්මක වෙද්දී වෙනත් ආධාරයක් දෙනවා නම් අලුතින්ම දෙන්න කියලා. Repurpose funds කියන එකෙන් මොකක්ද වෙන්නේ? තිබෙන ආධාර ටික repurpose කිරීමෙන් අපේ රටට අලුත් අගයක් එකතු වෙන්නේ නැහැ. ඒ නිසා මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමතියි, repurpose කරන ක්‍රියාවලිය වෙනුවට අලුතින් මූල්‍ය ශක්තියක් ලැබෙන විධියට ඔබතුමන්ලා ඒ අදාළ ආයතන සමඟ සාකච්ඡා කරන්න කියන කාරණයට.

ඊළඟට මම ඔබතුමාට මේ කාරණයත් කියන්න කැමතියි. සාර්ව ආර්ථික විචල්‍යයන් හරහා මේ කථා කරන ලොකු සංඛ්‍යාලේඛන තනි පුද්ගලයාට බලපාන්නේ කොහොමද, ගෘහ ඒකකවලට බලපාන්නේ කොහොමද, ව්‍යවසායකයන්ට, ව්‍යාපාරිකයන්ට බලපාන්නේ කොහොමද? ඔබතුමා ඇත්තටම දන්නවා නේ, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර අද පතුලටම වැටිලා බව. අද ඒ අයට ඇත්ත වශයෙන්ම සහන ක්‍රියාත්මක වෙන්නේ නැහැ. දැන් ඒ අය වාණිජ බැංකුවලට විරුද්ධව, මූල්‍ය ආයතනවලට විරුද්ධව නඩු මාර්ගයට යන්න හදනවා. ඒ තරම් පීඩනයකට මේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් මුහුණ දෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් මේ කාරණාව පිළිබඳ පැහැදිලි කිරීමක් බලාපොරොත්තු වෙනවා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, මේ මතු කළේ ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක් වන macroeconomics and microeconomicsවලින් ප්‍රතිඵල එනවාද කියන එක. සමස්තයක් වශයෙන් ආර්ථිකයක වැදගත් වන්නේ ආර්ථික වෘද්ධිය. අපේ අවුරුද්ද ඇතුළත ඒක විශේෂයෙන් පෙන්නුම් කළා. අපි කාර්තුවෙන් කාර්තුව අඛණ්ඩව ඉතාම නිවැරදිව ඒ ඉලක්කය වන සියයට 8කට වැඩි වෘද්ධියක් ගන්න දිශාවට ගමන් කළා.

ඊට පසුව ඔබතුමා අහනවා, micro level එක ගැන. ඇත්තටම micro level එක අවුරුදු ගණනාවක් පුරා පැවතිලා විශේෂයෙන් ලංකාවේ දුප්පත්භාවය එන්න එන්න වැඩි වෙලා තිබෙන්නේ. අපි මේ අවුරුද්ද ගන්නකොට එය මනිනු ලබන Gini coefficient එක ක්‍රමිකව වැඩි වෙලා, අවසානයේ දශම 415ට වැඩි වෙලා තිබුණේ.

එතැනින් තමයි මේ micro level එකේ ගැටලුව විසඳන්න ඕනෑ. ඒකටත් අපි විශේෂ වැඩසටහනක් යොදලා තිබෙනවා. ප්‍රජාශක්ති වැඩසටහන සඳහා 2026 වර්ෂයට රුපියල් බිලියන 25ක් වෙන් කරලා තිබෙනවා. ගම දියුණු කරලා ඒගොල්ලන් සවිබලගැන්වීමේ වැඩසටහන් ඒ තුළ තිබෙනවා. ගරු කථානායකතුමනි, කියන්න සන්තෝෂයි, මේ වෙනකොට GDP Per Capita එක ක්‍රමයෙන් වැඩිවෙලා තිබෙනවා. අපේ ආණ්ඩුව පටන් ගන්නකොට ඒක ඇමෙරිකානු ඩොලර් තුන්දහස් ගණනට තිබිලා දැන් ඒක ඇමෙරිකානු ඩොලර් 4,500 දක්වා ඉහළට එමින් තිබෙනවා. ඒ නිසා ව්‍යුහාත්මක - structural - ප්‍රශ්න තිබෙනවා මිස, ක්‍රමිකව ආර්ථික වෘද්ධිය සහ සංවර්ධනය අත්පත් කර ගැනීමේ දිසාව තමයි අපේ ඉලක්කය.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ඒ වාගේම, repurpose කිරීම ගැන සහ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කරපු කථාව වැරදියි. මොකද, අපි පළමුවෙන්ම කරන්නේ වියදම. අපට වියදම් කිරීම සඳහා වූ රුපියල් බිලියන 500 මූලනය කරගන්නේ කොහෙන්ද කියන එක, මහා භාණ්ඩාගාරයේ, මුදල් අමාත්‍යාංශයේ කාර්යභාරයක්. ඒ අනුව මේ රුපියල් බිලියන 500 යටතේ සැලසුම් කරපු කිසිදු ව්‍යාපෘතියක් කිසිදු ආකාරයකට වෙනස් කරලා නැහැ. Foreign funding සම්බන්ධයෙනුත් එහෙමයි. "දිට්වා" සුළි කුණාටුව වෙනුවෙන් ආපු රුපියල් බිලියන 500 වෙනම එකක්. මේ දෙක වැරදියට පටලවාගන්න එපා. ගරු විපක්ෂ නායකතුමනි, foreign funding යටතේ රුපියල් බිලියන 1480ක Capital Expenditure එක 4 per cent තිබෙනවා. ඒක කිසි විධියකින් වෙනස් කරලා නැහැ. ඒ කටයුත්ත කෙරෙන අතරතුරේ තමයි රුපියල් බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවක් එන්නේ. ඒ වියදම් සීමාව මූල්‍යනය කර ගැනීමේදී අපට යම් යම් විධිවිධාන ගන්න වෙනවා. ඒ නිසා කිසිදු ආකාරයකින් ඒ ව්‍යාපෘති නවත්වලා හෝ අතහැරලා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, ස්ථාවර නියෝග 27 (2) යටතේ ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයටත් පිළිතුරු ලබා දෙන්න.

## සියයට 5ක උද්ධමන ඉලක්කයක් පවත්වාගෙන යාමේ තීරණය: මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## 5 சதவீத பணவீக்க இலக்கைப் பேணுவதற்கான தீர்மானம்: நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று
## DECISION TO MAINTAIN A 5 PER CENT INFLATION TARGET: STATEMENT BY DEPUTY MINISTER OF FINANCE AND PLANNING

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
Hon. Speaker, the Answer to the Question under Standing Order No. 27(2) raised by the Hon. Ravi Karunanayake on 24th October, 2025 is as follows:

1.
- The 5 per inflation target for Sri Lanka reflects the structural characteristics of a developing and a small open economy, which faces greater exposure to external shocks, supply-side disruptions and exchange rate volatility. In such a context, aiming for a very low inflation target would be excessively costly in terms of output and employment.

- Empirical and historical evidence also supports the appropriateness of the 5 per cent target. According to historical context, between 2009 to 2021, inflation averaged around 5 per cent in Sri Lanka and from 1978 to 2008, the average inflation was 12 per cent per annum.

  Further, quantitative analysis using Sri Lanka's historical data revealed that maintaining the inflation target around 5 per cent helps maximize economic growth, to which the statistical models are used to gauge these average calculations.

- From a policy perspective, targeting an inflation rate as low as 2 per cent at initial stages of inflation targeting would necessitate maintaining persistently tight monetary conditions, which could suppress investment, slow down economic recovery and raise unemployment, outcomes that are undesirable for an emerging market economy. Therefore, the 5 per cent target strikes a balanced approach under the Flexible Inflation Targeting - FIT - framework. This allows sufficient flexibility to accommodate temporary shocks while anchoring inflation expectations at a credible and realistic level. For the same reason, most of the emerging market and developing economies, in general, set inflation targets above 2 per cent.

2.
- Monetary policy decisions in most countries are made on a broader perspective, considering the overall macroeconomic conditions to maintain price stability, rather than only considering the interest cost to the Government, which is only one stakeholder of the economy.

- Under the Central Bank of Sri Lanka Act, No. 16 of 2023 - CBA, the primary objective of the Central Bank shall be to achieve and maintain domestic price stability. Under the FIT framework, monetary policy decisions are guided primarily by the objective of maintaining domestic price stability and supporting sustainable economic growth. Several factors such as inflation developments and outlook, economic growth outlook, external sector developments, monetary sector developments, fiscal developments and overall financial market developments are taken into consideration in monetary policy decision-making. Fiscal implications are among many such factors for consideration.

3.
- Under the FIT framework, the Central Bank is responsible for formulating and implementing monetary policy while managing a flexible exchange rate regime aimed at achieving and maintaining domestic price stability. In this framework, the exchange rate is determined largely by market supply and demand conditions with

limited intervention by the Central Bank solely to smooth excessive short-term volatility. Accordingly, the exchange rate acts as a shock absorber under this arrangement, thus helping to avoid building vulnerabilities in the economy. Historically, attempts to maintain exchange rate stability beyond the economic fundamentals have proven to be unsuccessful.

- The 1 per cent depreciation has both positive and negative impacts on different stakeholders. For example, there are benefits to exporters, remittances and the tourism industry, whereas a negative impact on importers.
- Maintaining and achieving inflation around 5 per cent helps anchor expectations and supports currency stability by promoting confidence in the domestic monetary framework. A credible and consistent inflation target reduces speculative pressures, supports orderly exchange rate movements and strengthens macroeconomic and external stability in the long term.

4.

- The medium-term inflation target of 5 per cent is expected to ensure overall price stability, which is essential for sustaining economic growth and maintaining public confidence.
- The nominal GDP reflects the total value of goods and services produced at current market prices and therefore, includes the impact of inflation. In contrast, the real GDP is adjusted for inflation and provides a measure of changes in actual production and economic activity.
- The target of 5 per cent is set with several considerations such as the historical inflation trends and all those things are also basic macroeconomic factors.
- The inflation objectives, therefore, seek to introduce price pressures, enabling the real growth led by productivity, competitiveness and value addition, rather than nominal gains arising from inflationary pressure.
- The Central Bank also supports the enhancement of real economic growth, supported by structural reforms and productivity improvements.

5.

- Following the peak level of inflation of 69.8 per cent in September, 2022, inflation has been brought down to low levels through appropriate policy actions. Inflation is not maintained above 5 per cent.
- In terms of domestic savings, maintaining inflation at a stable and predictable level helps protect the real value of savings by preventing a rapid erosion of purchasing power in deposits and fixed-income instruments. Stable inflation also helps keep real interest rates steady, which, in turn, encourages long-term savings and financial planning.
- In this regard, a well-defined and credible inflation target helps reduce the erosion of domestic savings by serving as an anchor for price stability. When the target is clearly communicated and consistently pursued, it helps shape public and market expectations about future inflation.

6.

- Following restoration of price stability after the highest level of inflation historically, there is evidence of improved market and investor confidence. For example, the sovereign rating of the country was recently upgraded by all three rating agencies by several notches.
- The Central Bank and the Government maintain a coherent macroeconomic policy framework, anchored by prudent monetary policy, fiscal consolidation and a market-determined, flexible exchange rate. These policies have helped anchor inflation expectations, rebuild investor confidence and strengthen macroeconomic stability. For long-term foreign direct investment, this environment offers both stability and growth potential.

7.

- According to Section 26(4) of the Central Bank Act, "The Minister and the Central Bank may review the inflation target and any other parameters relating thereto once in every three years or in such other intervals, if exceptional circumstances so warranted." Accordingly, the current inflation target, which was set out in October, 2023, remains in effect for a three-year period.

  So, in future, if needed, we can consider adjusting it.

8.

- No. Inflation being targeted at 5 per cent is appropriate.
- Meanwhile, a flexible exchange rate will allow timely adjustment to the exchange rate in line with the fundamentals and external shocks, thus helping to maintain export competitiveness.
- Greater predictability of inflation for exporters will help their business planning and investment process.

9

- Under the International Monetary Fund Extended Fund Facility - IMF-EFF - Programme, the Monetary Policy Consultation Clause - MPCC - has been introduced to monitor monetary policy performance in line with the domestic price stability objective.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

10. • As indicated in response to the Question No. 7 - this is connected to the Question No. 7 - the review process of the inflation target for the next three years will commence soon.

Sir, since this is a lengthy Answer, I skipped some parts of it. Therefore, I would like to **table*** the full Answer.

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Ravi Karunanayake, you can get an explanation now.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Thank you, Sir.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මීට පෙර ලබා දුන් උත්තරයත්, මට ලබා දුන් උත්තරයත් අතර පරස්පරතාවක් එතැනින්ම පෙනෙන්න තිබෙනවා. මේ කථා කරන මොහොතේ ඔබතුමා කිව්වා, GDP per capita එක අද වැඩි වෙලා තිබෙනවාය කියලා ඇමෙරිකානු ඩොලර් 3,900 ඉඳලා 4,100ට. *[බාධා කිරීමක්]* ඔව්, ඒ ප්‍රමාණය තිබුණේ ඩොලර් එක රුපියල් 298ට තිබුණාම. අද ඩොලර් එක රුපියල් 315 වුණාම ඒක අඩු වෙලා තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් 3,800ට. මේක තමයි එතැන තිබෙන ද්විත්වය.

ඒ වාගේම මේ අවස්ථාවේදී ඔබතුමන්ලාගේ ණය වැඩි වෙලා තිබෙනවා, රුපියල් ට්‍රිලියන 31කට. ඒ කියන්නේ, ආණ්ඩුව භාර ගන්නා අවස්ථාවේදී රුපියල් ට්‍රිලියන 27.9ක් ලෙස තිබුණු ණය ප්‍රමාණය අද රුපියල් ට්‍රිලියන 31ට වැඩි වෙලා තිබෙනවා. දැන් ඔබතුමා උත්තර දීලා තිබෙන්නේ, මූලා ප්‍රශ්නයට අදාළව. මම දන්නවා, ඔබතුමා හදවතින් ඔබේ උත්තරය නොවෙයි ඒ දීලා තිබෙන්නේ කියලා. ඒ, ස්වාධීනයි කියන මහ බැංකුවෙන් දීලා තිබෙන උත්තරය. දැන් ඔය මහ බැංකුව දීලා තිබෙන උත්තරය ඔබතුමන්ලා පිළිගන්නවාද? අද ඔය තරම් ස්වාධීන මහ බැංකුවක් තිබිලා, ඇඟිලි ගහන්නේ නැති ආණ්ඩුවක් තිබිලා, මුදල් අච්චු ගහන්නේ නැති ආණ්ඩුවක් තිබිලා, රුපියල් 292ට තිබුණු ඩොලරය අද රුපියල් 315ක් වෙලා රුපියල අවප්‍රමාණය වෙලා තිබෙන්නේ කොයි ආකාරයෙන්ද?

ඒ විතරක් නොවෙයි. මේ තුළ තිබෙන භයානකභාවය තමයි, මේ රටේ තිබෙන සියයට 5ක උද්ධමනය දිගටම තබා ගන්නවා කියන එක. ඒ කියන්නේ, හැම අවුරුද්දේම ක්‍රය ශක්තිය - purchasing power - සියයට 5කින් අඩු කරනවාය කිව්වාම එතකොට ඔබතුමා පඩිත් වැඩි කරනවාද, මේ ආකාරයෙන් සියයට 5කින්? ඉතින් මහ බැංකුව මේ වාගේ ප්‍රතිපත්ති තීරණ ගත්තාම දෙන උත්තරය මොකක්ද? මෙහෙම උද්ධමනය සියයට 5ක් කරන එක සංවර්ධනයට හොඳයි කියනවා. එහෙම නම් ඇයි, සියයට 15ක් කරන්නේ නැත්තේ? මේ වාගේ ද්විත්ව ස්වරූප උත්තර නොදී ඔබතුමාගේ හෘදය සාක්ෂිය අනුව ඒක කියන්න.

ඊයේ මුදල් අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේදී ජනාධිපතිතුමා දුන් උත්තරේ රටට ගැළපෙනවා. නමුත් අද පාර්ලිමේන්තුවේදී කියලා තිබෙන උත්තරය බලන්න. ඊයේ කිව්වා, EPF එක, pension එකක් කරන කථාවක්. ඊයේ ජනාධිපති කිව්වා, එහෙම නැහැ කියලා. ඉතින් ඔබතුමා පාර්ලිමේන්තුවේදී උදේ වරුවේ ලබා දෙන උත්තරය ප්‍රතික්ෂේප වෙනවා, මුදල් ඇමති වශයෙන් ජනාධිපතිතුමා උත්තර දෙනකොට. මම දන්නවා, ඔබතුමාත් එතැන සිටි බව. ඔබතුමන්ලා දන්නවා, මොනවාද ලැබෙන උත්තර කියලා. ගරු කථානායකතුමනි, මම ඉතාම ඕනෑකමින් අහන්නේ මේ රටේ ආර්ථිකය ගැන.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ සඳහා විනාඩි තුනක් ගත්තා. දැන් අවසන් කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින් ඒ ගැන කරුණාකරලා කියන්න. රුපියල ශක්තිමත් කරලා, ඩොලර් ගෙනැල්ලා, ආයෝජන ගෙනැල්ලා ඔබතුමන්ලා කටයුතු කරන්නේ කොහොමද? දැන් මට දීපු උත්තරයයි, විපක්ෂ නායකතුමාට දීපු උත්තරයයි සම්පූර්ණයෙන් දෙකක්.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, එහෙම පරස්පරතාවක් නැහැ. උත්තර දෙකක් නොවෙයි, එකම උත්තරයක් තිබෙන්නේ. මෙතැනට සම්බන්ධයක් නැහැ, මේ EPF පිළිබඳ කථාව. *[බාධා කිරීමක්]* මම සඳහන් කරන්නම්, මහජනතාව නොමඟ යවන 5 per cent inflation ගැන. මේකෙන් කියන්නේ, උද්ධමනය අපි five per centම තියා ගන්නවාය කියන එක නොවෙයි. උද්ධමනය කියන්නේ, පොදුවේ මිල මට්ටම වර්ධනය වීමේ වේගය. ඒක අපට පාලනය කර ගන්න බැරි මට්ටමකට යන එක තමයි මේ අධික උද්ධමනය කියන්නේ. ඒක තමයි ආර්ථිකයට අහිතකර වෙන්නේ. එතකොට යම් උද්ධමනයක් පවතිනවා. ඒ අනුව එය පාලනය කර ගන්න තමයි flexible inflation target එකක් මෙලෙස තබා තිබෙන්නේ. ඒ target එක අවුරුදු තුනකට. ඒ අවුරුදු තුනේ target එක හදද්දී යම් කරුණු කාරණා බලනවා, macroeconomy එක සම්බන්ධයෙන්. එහෙම නැතුව ලෝකයේ න්‍යායක් නැහැ, inflation එක එකයි, දෙකයි, තුනයි කියලා යන්න. ඒක වෙනස් වෙනවා. ඒ නිසා එහෙම target එකක, framework එකක යන එක හොඳයි. ඒ framework එක අවුරුදු තුනෙන් තුනට review කරනවා. එතකොට ඔබතුමා අදහස් කරන විධියට මේ පහ වැඩි නම්, ලෝක තත්ත්වයන් යටතේ අපට ඊළඟ review එකේදී ඒක consider කරන්න පුළුවන්. දැන් අපි යන්නේ, අපේ වගකීම තිබෙන්නේ, framework එක ඇතුළේ පහ තිබෙනවා නම්, පහ පනින්නේ නැතිව ඉදිරියට යෑම. ඒක තමයි අපේ වගකීම. ඒක කැඩිලා නැහැ. අපේ අවුරුද්ද ඇතුළතදී ඒක ඉතාම ලස්සනට framework එක ඇතුළේ යනවා.

ඊළඟට, ණය සම්බන්ධයෙන් වූ කතන්දරය ගැනත් කියනවා නම්, ඇත්තටම එතැන තිබෙන්නේ වැරදි දත්ත. මේ සමස්ත ණය ප්‍රමාණය ප්‍රකාශ කිරීමේදී තමයි 30.9 කියන්නේ. නමුත් ඩොලර්වලින් ගත් ණය ප්‍රමාණය වැඩි වෙලා නැහැ. ඒ ප්‍රමාණය ස්ථාවරවම තිබිලා තිබෙන්නේ. ඒ නිසා ඒ තොරතුරු ඒ විධියට ඉදිරිපත් කිරීම වැරදියි. *[බාධා කිරීමක්]*

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟ අමාත්‍යාංශ නිවේදනය, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍ය ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය.

## පෙර පාසල් අධ්‍යාපනය ප්‍රමිතිකරණය කිරීම: කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමියගේ ප්‍රකාශය

## முன்பள்ளிக் கல்வியைத் தரப்படுத்தல்: மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சரினது கூற்று

## STANDARDIZATION OF PRESCHOOL EDUCATION: STATEMENT BY MINISTER OF WOMEN AND CHILD AFFAIRS

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් 2025.11.25වැනි දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. සමස්ත ලංකාවේම පෙර පාසල් සංඛ්‍යාව ගත්තොත්, 18,982ක් තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව පෙර පාසල් පිළිබඳ වාර්තාවක් මම **සභාගත*** කරනවා.

2. පෙර පාසල් විෂය ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම වෙනුවෙන් අපි ලබා දෙන දීමනාව වැඩි කිරීම සඳහා කටයුතු කළා. පෙර පාසල් ගුරුවරුන් වෙත ලබා දුන් මුදල පසුගිය ජූනි මාසයේ ඉඳලා රුපියල් 6,000ක් දක්වා වැඩි කරලා තිබෙනවා, ගරු විපක්ෂ නායකතුමනි.

3. දැනට ගෙවන මාසික දීමනාව සඳහා,

   (i) 2024 වර්ෂයේ සුදුසුකම් ලැබූ පෙර පාසල් ගුරුවරියන් සංඛ්‍යාව - 15,669යි.

   (ii) 2025 වර්ෂයේ සුදුසුකම් ලැබූ පෙර පාසල් ගුරුවරියන් සංඛ්‍යාව - 15,833යි.

   (iii) 2021.06.03 දිනැතිව සියලු දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නිකුත් කරන ලද කාන්තා හා ළමා සංවර්ධන චක්‍රලේඛ 02/2021 ප්‍රකාරව සුදුසුකම් සපුරන ලද පෙර පාසල් ගුරුවරියන් වෙත එම දීමනාව ලබා දීම.

4. සුදුසුකම් සපුරා දීමනාවට ඇතුළත් වූ කිසිදු පෙර පාසල් ගුරුවරියක් දීමනාව ලබා ගැනීමෙන් ඉවත් කර නොමැත.

5. මේ වන විට පෙර පාසල් විෂය මාලාව අපි සකස් කරලා තිබෙනවා. ඊට අමතරව එම විෂය මාලාවට අනුව ගුරුවරියන් පුහුණු කිරීමේ කටයුතුවල මූලික පියවර ආරම්භ කර තිබෙනවා. ඒ සියලු ගුරු භවතුන් ගුරුවරියන් හැටියට ලියාපදිංචි කිරීමට, ඒ අයගේ පෙර පාසල් ලියාපදිංචි කිරීමට ක්‍රමවේදයක් සකස් කර තිබෙනවා. ඒ එක එක්කෙනා හදාරා තිබෙන්නේ එක එක ඩිප්ලෝමා පාඨමාලා. නමුත්, ඔවුන්ගේ වෘත්තීයභාවය සංවර්ධනය කිරීම සඳහා ඒ සියලුම ඩිප්ලෝමා පාඨමාලා නියාමනය කරමින් එකම තලයකට ගෙන එන්න අපි කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම ඔවුන්ගේ වෘත්තීය ආරක්ෂාව, ආර්ථික සුරක්ෂිතතාව වෙනුවෙන් රුපියල් 6,000ක දීමනාවක් ලබා දීම සඳහා කටයුතු කරමින් තිබෙනවා.

   දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව පෙර පාසල් පළාත් සභා විෂයයක් ලෙස දක්වනවා. පළාත් සභාවල පෙර පාසල් ඒකක, එහෙම නැත්නම් මුල් ළමාවිය සංවර්ධන අධිකාරි මඟින් තමයි එම පෙර පාසල් නියාමනය වෙන්නේ. පළාත් සභා 09 තුළ එක් එක් විධියේ පෙර පාසල් ප්‍රඥප්ති සහ පෙර පාසල් ප්‍රතිපත්ති වෙන වෙනම ක්‍රියාත්මක වන එක අපි ජාතික ප්‍රතිපත්තියක්, ජාතික ප්‍රඥප්තියක් හරහා එකම පෙර පාසල් වැඩසටහනකට ගෙන ඒම සඳහා කටයුතු කරමින් තිබෙනවා.

6. කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විසින් 2006 වර්ෂයේදී පෙර පාසල් සඳහා අවම ප්‍රමිති හඳුන්වා දී තිබෙනවා. එම ප්‍රමිතිවලට අදාළව සෑම පෙර පාසලක්ම එකම මට්ටමට ගෙන ඒම සඳහා යටිතල පහසුකම් සංවර්ධනයට අවශ්‍ය ණය දීමනා ලබා දීම සඳහා අපි ඉදිරියේදී සාකච්ඡා කරමින් සිටිනවා. ඒ වාගේම පළාත් පාලන ආයතන හරහා පාලනය වන පෙර පාසල් සඳහා එම පළාත් පාලන ආයතන හරහාම යටිතල පහසුකම් සඳහා අවශ්‍ය කරන සියලු උපකරණ, සෙල්ලම් මිදුල සහ ළමයින්ගේ ඉගෙනුම් ආධාරක ආදිය ලබා දීම සඳහා වන වැඩසටහන් අපි ක්‍රියාත්මක කරමින් යනවා.

7. පෙර පාසල් ගුරුවරුන් සඳහා මේ වන විට විශ්‍රාම වැටුප් ක්‍රමවේදයක් නැතත්, මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික බහු ආංශික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම - NMSAP-ECCD - අනුව 2025-2029හි අවම වැටුප සැකසීමේ කටයුතුවලට සමගාමීව ඉදිරියේදී මේ සම්බන්ධවත් පියවර ගැනීමට නියමිතයි.

   අපි ධීවර ජනතාව වෙනුවෙන් දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් සකස් කළා වාගේම, පෙර පාසල් ගුරුවරියන් සඳහාත් දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් යෝජනා කරලා තිබෙනවා. දැනටත් විශ්‍රාම ගිය සමහර ගුරුවරියන්ට පළාත් සභා හරහා -යම් පළාත්වල- පෙර පාසල් ඒකකවලින් දීමනාවක් ලබා දෙනවා. එක් එක් පළාත් සභාවලින් වෙන වෙන දීමනා ලබා දුන්නත්, අපි එකම ක්‍රමයක් යටතේ දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් යෝජනා කරන්න කටයුතු කරමින් තිබෙනවා.

8. මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳව ජාතික විෂයමාලා රාමුව ජාතික අධ්‍යාපන ආයතනය විසින් සකස් කර අධ්‍යාපන අමාත්‍යාංශයත් අනුබද්ධිතව අපි එළිදක්වා තිබෙනවා. ඊට අදාළව පෙර පාසල් ගුරු පුහුණු වැඩසටහන ඉදිරියේදී පැවැත්වීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කර තිබෙනවා.

9. යෝජිත පෙර පාසල් අධ්‍යාපන ප්‍රතිපත්තිය 2027 වර්ෂයේ - ඒ කියන්නේ, ලබන වසරේ - සිට ක්‍රියාත්මක කිරීමට නියමිත අතර අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය සහ ජාතික අධ්‍යාපන ආයතනය ඒකාබද්ධව පෙර පාසල් ගුරුවරු පුහුණු කිරීමේ වැඩසටහන 2025.11.24වැනි දින සිට ආරම්භ කළා.

10. (i) දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය මට්ටමින් වාර්තා වන එවැනි ගැටලු තිබෙනවා නම් අපි මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය හැටියට මැදිහත් වීමක් කරනු ලබනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය]

(ii) මෙම දීමනාව ලබා දීම සඳහා නිශ්චිත දිනයක් වෙන් කිරීම කියන ප්‍රශ්නය ගත්තොත්, ගරු විපක්ෂ නායකතුමනි, අපි පළාත් සභා ඒකකවලට අපේ අමාත්‍යාංශය හරහා භාණ්ඩාගාරයෙන් මුදල් නිකුත් කිරීම කියන එක සිදු වන්නේ කාර්තුමය වශයෙන්. පළාත් පෙර පාසල් ඒකක විසින් තමයි එම මුදල් ලබා දීමේ දිනය තීරණය කරනු ලබන්නේ.

11. රජයේ සහ පෞද්ගලික පෙර පාසල් සම්බන්ධව ගත්තොත්, මෙම පෙර පාසල් ලියාපදිංචි කිරීම හා සම්බන්ධ බලතල දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රකාරව පළාත් පෙර පාසල් ඒකක වෙත තමයි පැවරී තිබෙන්නේ. පෙර පාසල් අධ්‍යාපනය හා සම්බන්ධ ප්‍රමිතීන් පවත්වා ගැනීම හා පෙර පාසල් අධ්‍යාපනය නියාමනය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පැවරී තිබෙනවා. ඒ අතර මේ සම්පූර්ණ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ නියාමන කටයුතු මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය හරහා සිදු වෙමින් තිබෙනවා.

ස්තුතියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු අමාත්‍යතුමියනි, විශේෂයෙන්ම මේ කාරණය ඔබතුමිය දන්නා කාරණාවක්. මේක අද ඊයේ සිදු වුණු දෙයක් නොවෙයි. කාලයක් පුරාවටම අපේ රටේ පෙර පාසල් අධ්‍යාපනය ක්‍රියාත්මක වෙන්නේ අවිධිමත් ආකාරයකට, හරියාකාර නියාමන පද්ධතියක් නොමැතිව, හරියාකාර ජාතික ප්‍රතිපත්තියක් නොමැතිව. ඒ වාගේම, වාණිජකරණයට ලක් වීම තුළ සහ අනෙකුත් අඩුපාඩුකම් නිසා දරුවන්ගේ අධ්‍යාපන අයිතිය බරපතළ ලෙස උල්ලංඝනය වෙලා තිබෙනවා. ඒ වාගේම, අවිධිමත් ආකාරයට ගාස්තු අය කිරීම තුළ ඇත්තවශයෙන්ම දෙමාපියනුත් අපහසුතාවට පත් වෙනවා. ඒ වාගේම, ඉගැන්වීම් කටයුතු කරන ගුරුවරියන්ටත්, සහාය පාලිකාවන්ටත් ඇත්තවශයෙන්ම ලැබෙන දීමනාව අඩු දීමනාවක් වීම තුළ ඒ අයට ආර්ථික රැකවරණයත් අහිමි වෙලා තිබෙනවා. මේ තත්ත්වය දෙස බැලුවාම ගුරුවරුන්ගේ වෘත්තිය ගරුත්වය, රැකියාවල ආරක්ෂිතභාවය, දරුවන්ගේ ආරක්ෂාව, දෙමාපියන්ගේ හැකියාව වැනි කරුණු කාරණා තුළ මේක බහුවිධ ප්‍රශ්න, අභියෝග රැසකට මුහුණ දෙන ක්ෂේත්‍රයක් කියා මම හිතනවා. මම පැහැදිලිව කියන්නට ඕනෑ, මේක අද ඊයේ නිර්මාණය වුණු දෙයක් නොවෙයි කියන එක. ඒ නිසා විශේෂයෙන්ම පෙර පාසල් පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් අනුගමනය කරලා, එක් එක් පළාත් සභාවල ඕනෑ එපාකම් අනුව ප්‍රඥප්ති නිර්මාණය වළක්වාලීම සඳහා මම හිතන විධියට මධ්‍යම ආණ්ඩුවේ යම්කිසි ඍජු මැදිහත්වීමක් අවශ්‍යයි.

ගරු ඇමතිතුමියනි, මම ඔබතුමියට මේ කාරණයත් පෙන්වා දෙන්න කැමැතියි. ළමා රෝග විශේෂඥ වෛද්‍යවරුන් - paediatriciansලා - කියන ආකාරයට ඇත්තවශයෙන්ම මොළයේ වර්ධනය - brain development - වාගේම cognitive development සියයට 70ක් සිද්ධ වෙන්නේ ඉපදුණු අවස්ථාව හෝ ඊට පෙර යම් වේලාවක සිට අවුරුදු 5 දක්වා කාලය තුළයි.

ගරු කථානායකතුමනි, ඔබතුමා වෛද්‍යවරයෙක් හැටියට මටත් වඩා ඒ ගැන දන්නවා ඇති. හැබැයි, අපේ රටේ මුල් ළමාවිය අධ්‍යාපනය පටන් ගන්නේ දළ වශයෙන් අවුරුදු 3 සිට 5 දක්වා කාලය තුළයි. අවුරුදු 3 සිට 5 දක්වා අපේ රටේ ක්‍රියාත්මක වන්නේ නිදහස්, නිවහල් අධ්‍යාපනයක් නොවෙයි. ඒ වාගේම විධිමත් අධ්‍යාපනයක් නොවෙයි. ඒ නිසා ළමා රෝග විශේෂඥ වෛද්‍යවරුන් - paediatriciansලා - කියන ආකාරයට මොළයේ වර්ධනය සියයට 70ක් සිදු වෙනවාය කියන ඒ කාල වකවානුව තුළ අපේ රටේ ක්‍රියාත්මක වන්නේ අවිධිමත්, නිදහස් නොවන, නොමිලේ නොවන අධ්‍යාපන වැඩ පිළිවෙළක්. මෙන්න මේ කාරණාව පිළිබඳවත් අවධානය යොමු කරන්න ඕනෑ.

ඒ වාගේම, පෙර පාසල් දූ දරුවන්ගේ පෝෂණ මට්ටම් පිළිබඳව ජාතික වැඩසටහනක් අවශ්‍යයි කියා අපි විශ්වාස කරනවා. MOH වාගේම අනෙකුත් වෛද්‍ය අංශ, සෞඛ්‍ය අංශ සම්බන්ධ කරගෙන ඒ අයට මන්දපෝෂණ තත්ත්වයන් තිබෙනවාද, නැද්ද කියන එක ගැන සොයා බලන්න පෙර පාසල් මට්ටමින් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමත් වැදගත් වනවා.

මම කරුණු ගණනාවක් ඉදිරිපත් කළා. ඔබතුමියගෙන් මම ඉල්ලීමක් කරනවා, මේ කරුණු කාරණා පිළිබඳව හිතා බලා මේ සියලු දෙයම අඩංගු ජාතික පෙර පාසල් ප්‍රතිපත්තියක්, නිදහස්, නිවහල්, නොමිලයේ ලබා දෙන අධ්‍යාපන ප්‍රතිපත්තියක් පෙර පාසල් පද්ධතියටත් ලබා දෙන්න කටයුතු කරන්න කියලා.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)

ගරු විපක්ෂ නායකතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ඔබතුමා ඒ විෂය ක්ෂේත්‍රය පිළිබඳව දක්වන උනන්දුව සම්බන්ධයෙන්. මුලින්ම මම කියන්න ඕනෑ, ඇත්තටම පෙර පාසල් ගුරුවරු සම්බන්ධව ගත්තොත්, රාජ්‍ය නියාමනය සහිත පෞද්ගලික අංශයක් හැටියට තමයි මේ පෙර පාසල් ගුරු වෘත්තිය පවතින්නේ කියන එක. ඒක සේවා ව්‍යවස්ථාවක්, බඳවා ගැනීම් පටිපාටියක්, රැකියා කාර්ය පටිපාටියක් සහ උසස්වීම් ක්‍රමවේදයක් සහිත සංවෘත සේවාවක් නොවෙයි. ඒ නිසා විධිමත් රාජ්‍ය සංවෘත සේවාවකට තිබෙන වැටුප නොවෙයි අපි ඔවුන්ට ලබා දෙන්නේ. අපි ඔවුන්ට ලබා දෙන්නේ මේ සේවාව දිරිගැන්වීම සඳහා වන දීමනාවක්. අන්න ඒක තමයි අපි රුපියල් 6,000ක දීමනාවක් බවට පත් කරලා තිබෙන්නේ. පෙර පාසල් ගුරු සේවය තුළ ඉන්න සෑම ගුරුවරයෙකුටම NVQ සහතිකයක් ලබා දීම, පෙර පාසල් උසස් ඩිප්ලෝමාවක්, එහෙම නැත්නම් එය උපාධි මට්ටම දක්වා වර්ධනය කරලා සංවෘත සේවාවක් බවට පත් කරමින් වෘත්තීයභාවය හා ආර්ථික සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා වන වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් අපි දැනට අධ්‍යාපන අමාත්‍යාංශය එක්ක සාකච්ඡා කරමින් සිටිනවා.

ගරු විපක්ෂ නායකතුමනි, අපි මේ වනවිටත් MOHs හරහා සෑම පෙර පාසලක්ම අධීක්ෂණය කරලා, දරුවන්ගේ උස හා බර මැනීම සිදු කරනවා. ඒ අනුව, උස සහ බර නිසි ප්‍රමිතියට නැති දරුවන් සඳහා උදෑසන ආහාර වේල සඳහා මෙතෙක් වෙන් කර තිබූ රුපියල් 60ක දීමනාව මේ වනකොට අපි රුපියල් 100 දක්වා වැඩි කරලා තිබෙනවා. අධ්‍යාපන විෂය ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීමත්, මුල් ළමාවිය සංවර්ධනය සඳහා වන පෝෂණයත් ඉතා වැදගත් වෙනවා. මොකද, ඔබතුමා කිව්ව විධියට දරුවෙකුට අවුරුදු 3ක් පමණ වනවිට සියයට 75කුත්, අවුරුදු 5ක් වනකොට සියයට 90කුත් වශයෙන් මොළය වර්ධනය සෑහෙන ප්‍රමාණයකින් සම්පූර්ණ වෙනවා කියලා තමයි දැන් කියන්නේ. එම නිසා ඒ දරුවන්ගේ පෝෂණය සඳහා වන වැඩසටහනක් අපි මේ වනකොට සංවිධානය කරමින් සිටිනවා. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයත්, අධ්‍යාපන අමාත්‍යාංශයත්, ජාතික අධ්‍යාපන ආයතනයත් එකතු වෙලා දැනට සිටින පෙර පාසල් ගුරුවරුන්ගේ ගුණාත්මකභාවය වැඩි කිරීමත්, ඔවුන්ගේ සුදුසුකම් සම්පූර්ණ කිරීමත්, මේ සේවාව සඳහා සියලු ගුරුවරු අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහාත් වන කටයුතු පිළිබඳව සාකච්ඡා කරමින් සිටිනවා. ස්තුතියි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම ස්ථාවර නියෝග 38 යටතේ තමයි මේ ප්‍රශ්නය මතු කරන්නේ. ලසන්ත වික්‍රමතුංග ඝාතනයට ලක් වෙලා අද දිනට අවුරුදු 17ක් සපිරෙනවා. අගමැතිනියගෙන් ප්‍රශ්නයක් අහන්න මම ඔබතුමාගේ කාර්යාලයට එය ඉදිරිපත් කළා. ඒ කාර්යාලය විසින් කරුණු ඉදිරිපත් කළා, ඒ සම්බන්ධයෙන් උත්තර දෙන්න බැහැ, ඒක උසාවිය ඉදිරියේ තිබෙන කාරණයක් කියලා. හැබැයි, මේ පාර්ලිමේන්තුවේම පාස්කු බෝම්බ ප්‍රහාරය ගැන උත්තර දෙනවා; "X-Press Pearl" Ship එක ගැන උත්තර දෙනවා; බාල බෙහෙත් ගැන උත්තර දෙනවා. හැබැයි, ඒවාත් උසාවිය ඉදිරියේ තිබෙන කාරණා. ලසන්ත වික්‍රමතුංග ගැන ඊයේ මම ප්‍රශ්නයක් ඇහුවේ එතුමා ඝාතනය වෙලා අදට අවුරුදු 17ක් සපිරෙන නිසායි. මම කනගාටු වනවා, මෙවැනි ද්විත්ව ස්වරූපයක් ගෙනියන එක සම්බන්ධයෙන්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ලසන්ත වික්‍රමතුංග මැතිතුමාගේ ඝාතනය, "සිරස" ආයතනයට කළ පහර දීම පිළිබඳව රජයේ ස්ථාවරය සම්බන්ධයෙන් මීට දින කිහිපයකට කලින් මේ සභා වාරයේදීම මහජන ආරක්ෂක අමාත්‍යතුමා විසින් පිළිතුරු ලබා දුන්නා. ඒ වාගේම කැබිනට් මාධ්‍ය ප්‍රකාශක නලින්ද ජයතිස්ස ඇමතිතුමා විසිනුත් ඒ සම්බන්ධයෙන් පිළිතුරු ලබා දුන්නා. අප ආණ්ඩුවක් විධියට උපරිම වශයෙන් උත්සාහ කරමින් සිටිනවා, මාධ්‍යවේදීන් ඝාතනය, මාධ්‍ය ආයතනවලට පහරදීම් සම්බන්ධව පරීක්ෂණ සිදු කරන්න. ඔබතුමන්ලා දන්නවා, ලසන්ත වික්‍රමතුංග මැතිතුමාව ඝාතනය කළේ 2009 අවුරුද්දේ කියන එක. එතුමා ඝාතනය වෙලා අදට අවුරුදු 17ක් වනවා. ඒ ඝාතකයින්, ඝාතකයින්ට උදවු කළ අය සහ ඒ ඝාතකයින් අල්ලනවා කියමින් ආපු හිටපු ආණ්ඩුවල ඇමතිවරු ගොඩකුත් පහු කරලා අවුරුදු 17කට පස්සේ තමයි මේ ප්‍රශ්නය මතු වෙලා තිබෙන්නේ. මම දන්නේ නැහැ, ස්ථාවර නියෝග අනුව ඔබතුමන්ලා ඒ සම්බන්ධයෙන් යම් ප්‍රකාශයක් කළාද කියලා. නමුත්, ස්ථාවර නියෝගවල මොනවා කිව්වත්, ආණ්ඩුවක් විධියට අපි මේ ඝාතකයින්ව සොයලා යුක්තිය ඉටු කිරීම වෙනුවෙන් අවශ්‍ය සියලු දෙයම කරනවා. ඒ ඝාතකයින් මේ රටේ ආණ්ඩු කළා. ඒ වාගේම එම ඝාතකයින් පසුගිය ආණ්ඩුවල ඇමතිකම් දැරුවා. ඔබතුමන්ලා ඒ ඝාතන අල්ලනවා කියලා ආණ්ඩු හදාගෙන ඇවිල්ලා අවුරුදු ගාණක් ආණ්ඩු කළා. නමුත්, අපි පැහැදිලිව ඒ ඝාතකයින් සොයාගෙන ඒ වෙනුවෙන් යුක්තිය ඉටු කරන්න කටයුතු කරනවා. ඒක තමයි ඒ සම්බන්ධව මට කියන්න තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සහ 2 ඉදිරිපත් කිරීම, the Hon. Bimal Rathnayake, the Leader of the House. You have 25 minutes.

## මෝටර් වාහන පනත: නියෝග
## மோட்டார் வாகனச் சட்டம்: ஒழுங்குவிதிகள்
## MOTOR TRAFFIC ACT: REGULATIONS

[පූ.භා. 11.25]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "(203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 151 වගන්තිය සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ එවකට ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 සැප්තැම්බර් 04 දිනැති අංක 2452/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.12.18 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 - මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 2) - ද මා ඉදිරිපත් කරනවා.

අද අප විවාද කරන්න බලාපොරොත්තු වන්නේ, මාර්ග ආරක්ෂාව පිළිබඳව ඉතා වැදගත් වන නියෝග දෙකක් පිළිබඳවයි. මම ඉතා ඉක්මනින් කරුණු ඉදිරිපත් කරන්නම්. පළමුවැනි එක තමයි, මෝටර් වාහන (මත්ද්‍රව්‍ය) නියෝග. ගරු කථානායකතුමනි, (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 151 වන වගන්තිය අනුව, ඇල්කොහොල් සහ මත්ද්‍රව්‍ය භාවිත කිරීමෙන් පසුව වාහනයක් මහා මාර්ගයකට නොගත යුතු බවට, පැදවිය නොයුතු බවට නීති සකස් කරලා තිබුණා. ඒ විශේෂයෙන්ම ඇල්කොහොල් භාවිතය සම්බන්ධයෙන් පමණයි. දැන් "මත්පැන්" කියන එක සම්බන්ධයෙනුත් ප්‍රශ්නයක් තිබෙන නිසා, ඒකේ නිවැරදි සිංහල වචනය මොකක්ද කියලා සොයා ගන්න ඕනෑ. "පැන්" කියලා කියන්න එපා කියනවා නේ, ඒ නිසා. නමුත්, මෝටර් වාහන පනත යටතේ ඇල්කොහොල් ගෙන රිය ධාවනය කරන පුද්ගලයන් පරීක්ෂා කිරීමට පමණයි නියෝග සකස් කරලා තිබුණේ. නමුත්, ඒ පනතේ දක්වා ඇති පරිදි මත්ද්‍රව්‍ය කිසිවක් ගෙන තිබේද යන්න නිශ්චය කිරීම සඳහා යම් පරීක්ෂණයක් පවත්වනු ලැබිය හැකි ක්‍රමය සහ ආකාරයත්, මත්ද්‍රව්‍ය ගෙන ඇතැයි සලකනු ලැබිය යුතු මත්ද්‍රව්‍ය සාන්ද්‍රණයේ ප්‍රමාණයද නියම කරමින් රෙගුලාසි ප්‍රකාශයට පත් කරලා තිබුණේ නැහැ. ඒක ඇත්තටම අපේ රටේ තිබුණු ආණ්ඩුවල ලොකු වැරැද්දක්. මොකද, ලංකාවේ කුඩු ප්‍රශ්නය ඇති වෙලා විශාල කාලයක් වෙනවා. නමුත්, මත්ද්‍රව්‍ය ගෙන ඇත්දැයි පරීක්ෂා කරන්න ක්‍රමවේදයක් තිබුණේ නැහැ. ඒ නිසා අප සිදු කළේ මේකයි. මෝටර් වාහන පනතේ 151 වන වගන්තිය සමඟ කියවිය යුතු 237 වන වගන්තිය යටතේ තිබෙන රෙගුලාසි සකස් කිරීමේ බලය යටතේ, විෂය භාර අමාත්‍යවරයා විධියට මම අපේ අමාත්‍යාංශයේ නිලධාරින්ගේ සහයෝගය ඇතිව, 2025 අංක 01 දරන මෝටර් වාහන (මත්ද්‍රව්‍ය) නියෝග, අංක 2452/40 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් 2025 සැප්තැම්බර් 04වැනි දා, ඒ කියන්නේ හරියටම මීට මාස හතරකට කලින් ප්‍රකාශයට පත් කළා. ඒ අති විශේෂ ගැසට් නිවේදනය ක්‍රියාත්මක කරලා තිබෙනවා. නමුත්, පනතට අනුව එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුයි. එය තමයි, අද දිනයේ අප සිදු කරන්නේ.

[ගරු බිමල් රත්නායක මහතා]

මෙම නියෝගයේ සඳහන් කරුණු අනුව, යම් පුද්ගලයෙකු මත්ද්‍රව්‍ය භාවිත කර මෝටර් වාහනයක් පදවන බවට පොලිස් නිලධාරියෙකුට සාධාරණ සැකයක් ඇති වූ විට, එම පුද්ගලයා රජයේ වෛද්‍ය නිලධාරියෙකු හෝ රෝහල විසින් එම බලය පවරන ලද නිලධාරියෙකු වෙත ගෙනියන්න පුළුවන්. එම වගන්තියේ සඳහන් විධිවිධාන අනුව රියදුරෙකුගේ හැසිරීම, කථාව, ශරීර චලනය හෝ සමබරතාව, ඇස්වල පෙනුම, ඇඳුම්වල පෙනුම ආදී වශයෙන් මත්ද්‍රව්‍ය භාවිත කරන අයගේ විවිධ හැසිරීම් රටා තිබෙන බව අපි දන්නවා. ඒවා සාමාන්‍ය තත්ත්වයට වඩා වෙනස් වෙනවා. එහෙම සැක කෙරෙනවා නම්, ඒ වාගේ පුද්ගලයෙක් එක්ක ගෙන ගිහිල්ලා ඔහු මත්ද්‍රව්‍ය පාවිච්චි කරලා තිබෙනවාද කියලා බලන්න පොලිස් නිලධාරියෙකුට පුළුවන්. ඒ සඳහා රුධිර, මුත්‍රා, ඛෙට හෝ වෙනත් ශාරීරික ශ්‍රාවයන්ගේ සාම්පලයක් රජයේ වෛද්‍ය නිලධාරියෙකුට ලබා දෙන්න නීත්‍යනුකූල බලයක් පොලිස් නිලධාරින්ට ලැබෙනවා. ඒ වාගේම, එම වගන්තිය අනුව ඔහු මත්ද්‍රව්‍ය පාවිච්චි කරලා තිබෙනවා කියලා ඔප්පු වුණොත්, ඊට අදාළ අධිකරණමය කටයුතුවලට යන්නත් පොලීසියට බලය ලැබෙනවා.

ගරු කථානායකතුමනි, අද බස්රථ හිමියන්ගේ සංගම්වලින්ම කියන දෙයක් තමයි, සමහර මාර්ගවල - routesවල - ධාවනය වන බස්රථවල රියදුරන් සහ කොන්දොස්තරවරුන් වැඩි ප්‍රමාණයක් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙච්ච අය කියන එක. මම දැක්කා, එක සභාපතිවරයෙක් අවුරුදු ගණනාවකට කලින් ඒක කියලා තිබෙනවා. ඒක සැලකිය යුතු ප්‍රශ්නයක්. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, මේ ළඟදී බොරැල්ල ප්‍රදේශයේදී ටිපර් එකක් ඇවිල්ලා හැපිලා pavement එකේ හිටපු මනුස්සයෙක් මිය ගිය බව. ඒ රියදුරා drugs ගත්ත කෙනෙක්. මේක ඉතා බරපතළ ප්‍රශ්නයක්. නමුත්, ඒකට අදාළ කරන නීති-රීති, රෙගුලාසි තිබුණේ නැහැ ක්‍රියාත්මක කරන්න. ඒවා ක්‍රියාත්මක කිරීම තමයි, අද මේ නියෝග පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමත් සමඟ සම්පූර්ණ වෙන්නේ.

දෙවැනි කාරණය තමයි, මත්ද්‍රව්‍ය පරීක්ෂණ කියන ඒවා දැන් ටිකක් දුර්ලභයි, සංකීර්ණයි.

ගරු කථානායකතුමනි, අපි සෞඛ්‍ය අමාත්‍යාංශයට, විශේෂයෙන්ම නලින්ද ඇමතිතුමාටත්, හංසක විජේමුණි නියෝජ්‍ය ඇමතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයට විවිධ අවස්ථාවලදී විවිධ ආයතනවලින් අවුරුදු ගණනක් තිස්සේ - ඔබතුමාත් වෛද්‍යවරයෙක් වශයෙන් දන්නවා - sophisticated විධියට හදපු mobile laboratories සහිත බස් රථ ලබා දී තිබෙනවා. ඒවායේ පරීක්ෂණ සියල්ලක්ම කරන්න පුළුවන්. එහි තිබෙන විශේෂත්වය තමයි, පරීක්ෂණයේ ප්‍රතිඵලය විනාඩි දෙක තුනකින් ලබා දෙන්න පුළුවන් වීම. දුෂ්පත් ගම්මානවලට ගිහිල්ලා පරීක්ෂණ කරන්න තමයි ඒවා තිබෙන්නේ. එවැනි බස් රථ ගණනාවක් භාවිතයෙන් තොරව පැත්තකට දමා තිබෙන බව දැන ගත්තාට පස්සේ, ඒවායෙන් එක් බස් රථයක් අපි ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයට ලබා ගත්තා. ලබාගෙන ඒකේ කටයුතු අපි දැන් ආරම්භ කරලා තිබෙනවා. දැන්, බස් ස්ටෑන්ඩ් එකක් ළඟට ගිහිල්ලා ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ නිලධාරින්ට සහ පොලීසියේ නිලධාරින්ට එකතුවෙලා ඒ කටයුත්ත කරන්න පුළුවන්. ඒ වාගේම රියදුරු මහත්වරුන්ට පුළුවන්, ඒ බස් එකට ඇවිල්ලා තමන්ගේ සාම්පල් එකක් දීලා එවෙලේම ප්‍රතිඵලය ගන්න. මම ඒක අත්හදා බැලුවා, මේ කටයුත්ත මාකුඹුරේ ආරම්භ කරපු දවසේදී. විනාඩි 2ක, 3ක වාගේ කෙටි කාලයකදී මත්ද්‍රව්‍ය 12ක් පිළිබඳව result එක දෙනවා. ඒ තරමටම ඒක sophisticated. ඒකේ, result sheet එකත් print කරලා අදාළ රියදුරු මහත්මයාට දෙන්න පුළුවන්. අපි බලාපොරොත්තු වෙනවා, අනෙක් සෑම පළාතකටම මෙවැනි බස් අරගෙන සහ මේ බස් එක යොදාගෙන ඒ කටයුත්ත කරන්න. ඒ නිසා මම ලංකාවේ ඉන්න නගරාධිපතිතුමන්ලාගෙන්, ආණ්ඩු පක්ෂයේ හෝ විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ගෙන් සහ පළාත් සභාවල ආණ්ඩුකාරතුමන්ලාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. එතුමන්ලා ලැහැස්තියි නම් තමන්ගේ ප්‍රදේශයේ බස් ස්ටෑන්ඩ් එකේදී මේක කරන්න, අපි ලැහැස්තියි ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය හරහා මේ සේවාව ලබා දෙන්න. ඔවුන් ඒ සඳහා දින ලබා දෙනවා. කිසිම අය කිරීමක් කරන්නේ නැහැ. පරීක්ෂා කරන්න පුළුවන්. මේක අතිවිශාල ප්‍රශ්නයක්. මත්ද්‍රව්‍ය පාවිච්චි කරලා බස් එකක් එළවනවා කියන්නේ, මරාගෙන මැරෙන බෝම්බකරුවෙක් බස් එකක් එළවනවා වාගේ දෙයක්. ඒ නිසා අද දිනයේදී ඒ සම්බන්ධව නීතිය සහ ප්‍රායෝගික පැත්ත කියන දෙකම සම්පූර්ණ වෙනවා.

ගරු කථානායකතුමනි, අද දින ඉදිරිපත් කරන ලද අනෙක් ගැසට් පත්‍රය තමයි මෝටර් වාහන (අධිවේගී මහා මාර්ග) නියෝග ප්‍රකාශයට පත් කරන ලද අංක 2455/29 දරන 2025 සැප්තැම්බර් 25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය. ගරු කථානායකතුමනි, මෝටර් වාහන පනත යටතේ 2011 අගෝස්තු 9වැනි දා -මීට අවුරුදු 15කට කලින්- ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කළා, ඕනෑම පාරක යන වාහනයක රියදුරු අසුනේ සහ ඊට යාබද අසුනේ යන අය seat belts පාවිච්චි කරන්න ඕනෑ කියලා. අපේ රටේ ඒ නීතිය සෑහෙන දුරට ක්‍රියාත්මක වෙනවා. නමුත්, accidentsවලදී වැඩිපුර තුවාල සිදුවෙන්නේ කාටද, වැඩිපුර මිය යන්නේ කවුද කියලා අධ්‍යයනය කරලා බැලුවාම වාහනයේ පිටුපස සීට්වල යන අයට සිදුවෙන අනතුරු වැඩියි. අධිවේගී මාර්ගවලදී ඒක තවත් වැඩියි. ඒ සම්බන්ධයෙන් ඕනෑ තරම් videos තිබෙනවා. ඒවා බලන්න පුළුවන්. පිටුපස සීට්වල යන අය තමයි ඉතාම අනාරක්ෂිත. ඒගොල්ලන්ට සිදුවෙන injury එක, මිය යාම ඉතාම වැඩියි, අනෙක් අයට වඩා, belt එක දමන අයට වඩා. අපි මේ ගැන අධ්‍යයනය කරලා පොලීසියෙන් සහ orthopaedic surgeonsලාගෙන් තොරතුරු සහ උපදෙස් ලබාගෙන පසුගිය අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ 25වැනි දා ගැසට් එකක් නිකුත් කළා, අධිවේගී මාර්ගයේ යන සියලුම මගීන් - බස් එකේ වේවා, වෙනත් ඕනෑම වාහනයක වේවා, ඉස්සරහ ගියත්, පිටිපස්සේ ගියත් - අනිවාර්යයෙන්ම seat belt එක දමන්න ඕනෑ කියලා. ඒක ක්‍රියාත්මක කරන්න පටන්ගෙන තිබෙනවා, සැප්තැම්බර් මාසයේ 25වැනි දා ඉඳලා. ඒ නිසා දැන් පොලීසියට පුළුවන් එසේ නොකරන මගීන්ට සහ රියදුරන්ට අදාළව නීති ක්‍රියාත්මක කරන්න. ගරු කථානායකතුමනි, මේ නියෝගවල 8ඇ. වගන්තියේ තිබෙනවා, "වගන්තියේ සඳහන් විධිවිධාන අනුව නිසි පරිදි ක්‍රියා කරන පුද්ගල ආරක්ෂක ආසන පටි සවිකර ඇති මෝටර් වාහනයක් වන්නේ නම් මිස, එම මෝටර් වාහනයේ අයිතිකරු විසින් අධිවේගී මාර්ගයකට ඇතුළත් කරනු ලැබීම හෝ ඇතුළත් කරනු ලැබීමට සැලැස්වීම සිදු කරනු නොලැබිය යුතු ය" කියලා. මේක තේරෙන්න කිව්වොත්, හරියට seat belts නැතිනම් expressway එකට දමන්න එපා කියන එකයි. එහෙම කළොත් පොලීසියට නීති මඟින් කටයුතු කරන්න පුළුවන්. "මට තිබෙන්නේ මේ වාහනය, මට seat belt එක දමන්න සල්ලි නැහැ" කිව්වාට කරන්න දෙයක් නැහැ. අපි හැම කෙනෙක්ම ජීවත් වෙද්දී රටක නීතිය අනුව හැඩ ගැහෙන්න ඕනෑ. මේ ආණ්ඩුව උපරිම උත්සාහයක් ගන්නවා, නීතියේ පාලනයට ලක්වෙච්ච රටක් හදන්න.

ජනාධිපතිවරයා, අගමැතිතුමිය, ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් පමණක් නොවෙයි, අපේ ජනතාවත් නීතියේ පාලනයට ලක් විය යුතුයි. අපි ආණ්ඩුවක් වශයෙන් උපරිම ලෙස ආදර්ශය දෙමින් තිබෙනවා, නීතියේ විධානයට අනුව කටයුතු කරන්න. එම නිසා

"මගේ වාහනයේ seat belts හදා ගන්න මට බැහැ, seat belts ගණන් ගිහිල්ලා, seat belts හංගලා" කියලා කියන්න එපා. අපි ඒවාට වෙනම කටයුතු කරමු. Seat belts දැන් අනිවාර්ය කරලායි තිබෙන්නේ. එම නිසා seat belts හදා ගන්න. නමුත්, සමහර වාහන තිබෙනවා, ඒවා එද්දී seat belts තිබුණේ නැති. එම නිසා අපි ඒවාට අදාළව මාස තුනක කාලයක් දුන්නා, seat belts හදා ගන්න. මං හිතන විධියට, දැන් ඒ මාස තුන පහු වෙලායි තිබෙන්නේ. එම නිසා අපි කරුණාවෙන් ඉල්ලා සිටිනවා, නීතියට පිටුපාන්නේ නැතිව seat belts ටික හදා ගන්න කියලා. අපට දකින්න ලැබෙන සමහර වාහනවල modificationsවලට කරලා තිබෙන වියදම ගත්තාම, ඒ වාහන අලංකරණයට කරලා තිබෙන වියදම ගත්තාම, seat beltsවලට යන වියදම බොහොම අඩුයි.

ගරු කථානායකතුමනි, ඒ වාගේම තවත් කාරණයක් කියන්න තිබෙනවා. ඒ තමයි, අවුරුදු 12ට අඩු දරුවන්ට මොකක්ද කරන්නේ කියන එක. අපේ ගරු මන්ත්‍රීතුමන්ලා ඒ ගැන කථා කරයි. මම ඒ ගැන ගොඩක් කථා කරන්න යන්නේ නැහැ. අපි බලාපොරොත්තු වෙනවා, අවුරුදු 12ට අඩු කුඩා දරුවන් සඳහා ලංකාවේ මොකක්ද කළ යුත්තේ කියන එක ගැන වෛද්‍ය ආයතනවලින් නිර්දේශ ලබා ගන්න. ලෝකයේ සාමාන්‍යයෙන් භාවිත වන විධියේ ක්‍රමවේදවලට අප යා යුතුයි කියන එක ගැන විවාදයක් නැහැ. ඒ පිළිබඳව නිර්දේශ අපට ලබා දෙනවා නම් අපි බලාපොරොත්තු වෙනවා, එම නිර්දේශ පිළිබඳව තවත් සාකච්ඡා කරලා කුඩා දරුවන් සම්බන්ධව කටයුතු කරන්න. අපි දකිනවා, සමහර තාත්තලා පොඩි එක්කෙනා steering wheel එක ළඟම උකුළේ තියාගෙන යනවා. ඒක ආදරයට හොඳයි වාගේ වුණාට දරුවාගේ ආරක්ෂාවට හොඳ නැහැ. ලංකාවේ ඒ සම්බන්ධව නීති රීති හරියටම නැහැ. එම නිසා අපි බලාපොරොත්තු වෙනවා, වෛද්‍ය ආයතනවලින් ඒ පිළිබඳව යම් මඟ පෙන්වීමක් කරයි කියලා.

අද ඉදිරිපත් කරන අපේ මේ නියෝගවල ප්‍රධාන අරමුණ මොකක්ද? මහජනතාව රැක බලා ගැනීම ආණ්ඩුවක වගකීමක්. ඒ සඳහා ආණ්ඩුව හොඳ පාරවල්, safe roads හදන්න ඕනෑ. ආණ්ඩුවක් විධියට අපි හොඳ වාහන ගෙන්වන්න ඕනෑ, ආරක්ෂිත වාහන ගෙන්වන්න ඕනෑ. ඒ වාගේම ජනතාව විධියට අපි ආරක්ෂිත විධියට ගමන් බිමන් යන්න ඕනෑ. මේ තුනම එකතු වුණාම තමයි road safety කියන එක, එහෙම නැත්නම් transport safety කියන එක හදා ගන්න අපට පුළුවන් වෙන්නේ, ගරු කථානායකතුමනි. දැනට අපට තිබෙන තොරතුරු අනුව අපේ රටේ රියැදුරු මහත්වරුන්ගේ වැරදි හැසිරීම නිසා තමයි රිය අනතුරුවලින් සියයට 53ක්ම සිදු වෙන්නේ. ඒ කියන්නේ, රිය අනතුරුවලින් සියයට 53ක්ම සිද්ධ වෙන්නේ රියැදුරු මහත්වරුන් මත්ද්‍රව්‍ය, alcohol ගැනීම, නිදිමත, අවශ්‍ය විවේකය නොගැනීම, රිය පදවද්දී mobile phones පාවිච්චි කිරීම, රේස් යෑම ආදි විවිධ දේවල් නිසායි. මම ළඟදීත් දැක්කා, expressway එකේ container එකකට ඉඩ දුන්නේ නැහැ කියලා container එක බස් එකකට පොඩි පාට් එකක් දාගෙන යනවා. එයාට විරුද්ධව නීතිමය පියවර ගන්න කියලා පොලිස්පතිතුමා දැනුම් දීලායි තිබෙන්නේ. අපි කියන්න කැමැතියි, මාර්ග ආරක්ෂාවේදී behaviour කියන එක ජනතාවගේ පැත්තෙනුත්, රියැදුරන්ගේ පැත්තෙනුත් ගොඩක්ම වැදගත් බව. මෙම ගැසට් පත්‍ර දෙකෙහි පළ වන නියෝග දෙකෙන් සිදු වන ප්‍රධානම දේ තමයි, මහජන ආරක්ෂාව සහතික කරන එක.

මේ කියන්න යන කාරණය පිළිබඳවත් ගරු මන්ත්‍රීතුමන්ලා අදහස් දක්වනවා නම් මම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම දූර ගමන් සේවා බස් රථ ගොඩක් දුරට ගමන් කරන්නේ අධිවේගී මාර්ගවලට වඩා සාමාන්‍ය මාර්ගවලයි. දැනට හදන්න නියමිත වෙලා තිබෙන සියලු අධිවේගී මාර්ග අපි අවුරුදු දෙකහමාරක් ඇතුළත හදලා අවසන් කරනවා. එතකොට මේ තත්ත්වය තරමක් වෙනස් වෙයි. නමුත්, දැනට අපි යාපනයට යන්නේ, අනුරාධපුරයට යන්නේ, මොනරාගලට යන්නේ අධිවේගී මාර්ගවලම නොවෙයි. මොනරාගලට යන්න නම් දැන් මත්තල දක්වා අධිවේගී මාර්ගය තිබෙනවා. සාමාන්‍ය මාර්ගවල ගමන් කරන දූර ගමන් බස් රථවල seat belts අනිවාර්ය කිරීමේ පැහැදිලි අවශ්‍යතාවක් අපට තිබෙනවා. එම නිසා ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් අද දිනයේදී අපි බලාපොරොත්තු වෙනවා, ඒ පිළිබඳ අදහසුත්. මොකද, තනි ක්‍රියාමාර්ගයක් ලෙස ගත්තොත් seat belts කියන්නේ, මඟියෙකු ආරක්ෂා කරන්න ලෝකයේ තිබෙන most effective ක්‍රියාමාර්ගය. මඟියෙකුගේ ආරක්ෂාව සඳහා කළ හැකි ගොඩක් දේවල් තිබෙනවා. ඒවා අතරින් most effective එක තමයි seat belts. Motorcycles ගත්තොත්, helmets. ඒවා rocket science නොවෙයි. ඒවා ඔප්පු කරලා තිබෙන දේවල්. එම නිසා මම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මේ කියපු කාරණය සම්බන්ධවත් අදහස් දැන ගන්න කැමැතියි. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා සමාජීය කරුණු ගැන ගොඩක් උනන්දු වෙනවා. ඔබතුමා අද කථා කරනවා නම්, මේ කියපු කාරණා ගැන ඔබතුමාගේ අදහසත් දැන ගන්න අපි කැමැතියි. සාමාන්‍ය මාර්ගවල ගමන් කරන දූර ගමන් බස් රථ සඳහා seat belts අනිවාර්යය කිරීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස මොකක්ද කියලා දැන ගන්න අපි කැමැතියි.

ගරු කථානායකතුමනි, ඊළඟට මම කියන්න කැමැතියි, මඟී ප්‍රවාහන බස් රථ ධාවනය කරන රියැදුරන්ගේ පැත්ත ගැන. අපි දන්නවා, ගොඩක් රටවල මඟී ප්‍රවාහන රියැදුරු කියන්නේ සාමාන්‍ය රියැදුරු වෘත්තියට වඩා වෙනස් දෙයක් බව.

ඒ වෙනස හඳුනාගෙන ලංකාවේත් පසුගිය කාලයේ ඉඳලාම කටයුතු කරලා තිබෙනවා. එහිදී PT - Public Transport - කියලා විශේෂ licence එකක් ගන්න ඕනෑ. අපට heavy vehicle licence එකක් තිබුණත්, අප මඟීන් ප්‍රවාහනය කරනවා නම් PT licence එකක් ගන්න ඕනෑ. ඒ licence එක සඳහා දැනට 6,000ක් වාගේ පිරිසක් තමයි පුහුණු වෙලා තිබෙන්නේ. යම් පිරිසක් එම බලපත්‍ර අරගෙන තිබෙනවා. දින දෙකක පුහුණුවකින් තමයි එය ලබා ගෙන තිබෙන්නේ. ඒ දින දෙකේ පුහුණුව වුණත් හරියටම කෙරුණාද කියලා දන්නේ නැහැ. නමුත්, මඟී ප්‍රවාහනය කියන්නේ, සාමාන්‍ය ප්‍රවාහනයට වඩා වැඩි දෙයක්. ඒක යම්කිසි ශික්ෂණයක් ඇතිව වෙනම ඉගෙන ගත යුතු දෙයක්. අපේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව දැනට අදාළ කටයුතු කරගෙන යනවා. Public transport සිදු කරන බස් රියැදුරු මහත්වරු, office vansවල රියැදුරු මහත්වරු, school vansවල රියැදුරු මහත්වරු ඇතුළු හැම කෙනෙක්ම - public transport සිදු කරනවා නම් ඒ හැම කෙනෙක්ම - PT licence එක ගන්න ඕනෑ. ටැක්සි රියැදුරන්ට පවා PT licence එකක් ගන්න වේවි. අපි ඒකට අදාළ course content එක හදලා ඉවරයි. අපි ඒ සඳහා පෞද්ගලික අංශයට අදාළ සංවිධානවල අත්දැකීම්ද ලබා ගත්තා. අපි ඒ කටයුත්ත අනිවාර්ය කරනවා. අපි යම් කාලයක් දෙන්නම්, අවුරුද්දකින් හරි මාස 6කින් හරි ඒ කටයුත්ත කර ගන්න. ඒ කාලය තුළ අලුතින් PT licence එක ගන්න ඕනෑ. දැනට තිබෙන අයට වෙනම වැඩ පිළිවෙළකුත් තිබෙනවා. අලුතින් එන අය හැම කෙනාම ඒ කටයුත්ත කරලා ආවාට පසුව තමයි PT licence එක දෙන්නේ.

ඒ වාගේම තමයි වයස. අපි දන්නවා, PT licence එක දෙනකොට අපටත් කලින් කටයුතු කරපු ආකාරය. "සිසු සැරිය" වැඩසටහන යටතේ ග්‍රාමීය දුෂ්කර මාර්ගවලට සිසු සැරිය බස් රථයක් සඳහා ආණ්ඩුවේ මුදල් ලබා ගන්න නම් සැපිරිය යුතු කොන්දේසියක් තිබෙනවා. ඒ තමයි, ඒ රියැදුරු මහත්මයා අවුරුදු 30ට වැඩි කෙනෙකු වෙන්න ඕනෑ කියන එක. ඒ කියන්නේ,

[ගරු බිමල් රත්නායක මහතා]

driving licence එකත් තිබෙනවා; PT licence එකත් තිබෙනවා; හැබැයි, වයසත් බලනවා. ඒ වයස බැලීම තුළින් අප බලාපොරොත්තු වන්නේ, දරුවන් පිළිබඳව යම් අත්දැකීමක් හා අවබෝධයක් තිබෙන පිරිසක් එම කාර්යයේ යෙදවීමයි. මොකද, ප්‍රශ්න දිහා බලන්න ජීවත් වීම හරහා ලබා ගන්නා යම් පරිණතකමකුත් අවශ්‍යයි නේ. සමහරු නම් කොච්චර වයසට ගියත් එහෙම වෙන ගතියක් නැහැ. නමුත්, සාමාන්‍යයෙන් නම් එහෙම තමයි. *[බාධා කිරීමක්]* මා ඒක කිව්වේ රියැදුරන් ගැන නොවෙයි, වෙනත් අය ගැනයි. මොකද, මට එවැනි සමහරුන් ජේනවාත් එක්ක. "සිසු සැරිය" අපේ යෝජනාවක් නොවෙයි. ඒගොල්ලන් අධ්‍යයනය කරලායි කියා තිබෙන්නේ, දරුවන් ප්‍රවාහනය කරනවා නම් අවුරුදු 30කවත් ඩ්‍රයිවර් කෙනෙකු වෙන්න ඕනෑ කියලා. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, මම හිතනවා තාත්තා කෙනෙකු විධියට ඔබතුමා වුණත් ඒක පිළිගන්නවා ඇති කියලා. අපි බලාපොරොත්තු වෙනවා මේ කියන PT licenceඑක school busesවලට අනිවාර්ය කරන්න. අපේ ගරු අගමැතිතුමිය, අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය ගරු මධුර සෙනෙවිරත්න මැතිතුමා ඇතුළු අය school busesවලට, school vansවලට අදාළව යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. ඒවා මත පදනම් වෙලා අපි බලාපොරොත්තු වෙනවා පාසල් බස් රථ හා vanවලටත් වයස් සීමාව ඒ විධියට තීන්දු කරන්න. පොදුවේ PT licence එකක් ගන්න සම්පූර්ණ විය යුතු වයසක් තිබෙනවා. අවුරුදු 21දී පුළුවන්, heavy vehicle licence එකක් ගන්න. නමුත්, පොදු මගී ප්‍රවාහන licence එකක් ගන්න පුළුවන් වෙන්නේ, අවුරුදු 25න් පසුවයි. දරුවන් ප්‍රවාහනය කරනවා නම්, අවුරුදු 30 වෙන්න ඕනෑ. අපි ඒ කටයුත්ත කරන්න යනවා, විශේෂ course එකකුත් එක්ක.

රියැදුරු මහත්වරුන්ගේ ප්‍රශ්නය ගත්තොත්, බොහෝ රටවල අනුගමනය කරන දෙයක් තමයි demerit system එක. අපි එහි අතරමැදි පියවරකට ළඟදීම යන්න බලාපොරොත්තු වෙනවා. පොලීසිය, තැපැල් දෙපාර්තමේන්තුව සහ අපේ අමාත්‍යාංශය සම්බන්ධ වෙලා අතරමැදි පියවරකට යන්න බලාපොරොත්තු වෙනවා. ගරු කථානායකතුමනි, යම් කෙනෙකු රථවාහන වැරැද්දක් කළොත් ඒකට අදාළ දඩය online හරහා ගෙවන්න පුළුවන්; ලංකාවේම පුළුවන්. නමුත්, හැම කෙනාටම online ගෙවන්න phones නැති නිසා අපි ඉදිරි කාලයේදී බලාපොරොත්තු වෙනවා, පොලීසිවල සියලුම traffic මහත්වරුන්ට smart phones ලබා දෙන්න. එතකල් දැනට කෙරෙන විධිය තමයි online ගෙවීම. අනෙක් කට්ටිය තැපැල් කන්තෝරුවට ගිහිල්ලා ගෙවනවා. අපි දැන් අවස්ථාව හදලා තිබෙනවා, ඒගොල්ලන්ගේ payment system එක GovPay හරහා කරන්න. එතකොට අපි දන්නවා, ඒ payment එක එන්නේ, මොන රියැදුරා, මොන තැනදී, මොන වැරැද්ද කළාටද කියලා. Demerit එක අපි යම්කිසි ආකාරයකට බලනවා. අඩුම ගණනේ big data පැත්තෙන්වත්. මොකද, big data එකක් එනවා. Individual data එක ගන්න අපට ලොකු digital system එකකට යන්න ඕනෑ. ඒකට මාස 7ක්, 8ක් යයි. ඒ එන big dataවලින් අපට හඳුනා ගන්න පුළුවන්, මොන ප්‍රදේශවල, මොන වෙලාවේ, මොන තැනද මේවා වෙන්නේ කියලා. මම හිතනවා, මේ මාසය අවසන් වනකොට අපට ඒ කටයුත්ත පටන් ගන්න පුළුවන් වෙයි කියලා. එතකොට පොලීසියටත් ලේසියි, අපටත් ලේසියි big data මත පදනම් වෙලා තීන්දු තීරණ ගන්න. ඒ නිසා අපි demerit system එක අනුගමනය කරනවා. ඒ අනුව, ඩ්‍රයිවර් මහත්වරුන්ගේ ලකුණු කැපිලා දිගටම අඩුපාඩුකම් කරන කට්ටියට licence එක නැති වෙනවා. නමුත්, මගී ප්‍රවාහනය ගත්තොත්, ඩ්‍රයිවර් මහත්මයාව demerit කරලා බින්දුවට ගෙනාවාට වැඩක් නැති බව. ඊට පසුව බස් හිමියා කරන්නේ වෙනත් ගෝලයෙකු දම්මලා බස් එක ධාවනයට යොදවන එකයි.

ඒ නිසා බස් හිමියාට ලොකු වගකීමක් තිබෙනවා ගරු කථානායකතුමනි, බස් එකේ රියදුරු ආරක්ෂිතව මිනිසුන් ගෙනියන්න පුළුවන් රියදුරෙකු බවට පත් කරන්න. බස් එකට permit එක දුන්නාම ඕනෑ කෙනෙක් දාලා බස් එක දුවවන්න අයිතිකරුට අවස්ථාව තිබිය යුතු නැහැ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, bus permit එකටත් demerit system එකක් ගේන්න. Permit එක තිබෙන යම් කිසි බස් රථයක රියදුරු මහත්වරු කවුරු වුණත්, ඒ බස් එක මඟින් දිගටම වැරදි වෙනවා නම්, ඒ බස් එකටත් අපි demerit system එකක් හඳුන්වා දෙනවා. මොකද, ඒ බස් එක auto dirve වෙන්නේ නැහැ නේ. ඒ රියදුරු මහත්වරු කවුරු වුණත්, ඒ අය ඒ බස් එකට යොදවන්නේ අයිතිකරු නේ.ඒ නිසා ඒ බස්වලටත් අපි demerit system එකක් හඳුන්වා දෙනවා. අපි දැන් ඒක හදාගෙන යනවා, ඉදිරියේදී නීති මට්ටමට ගේන්න.

ඒ වාගේම ගරු කථානායකතුමනි, ලංකාවට මේ අවුරුද්දේ ඉඳලා ගේන්න පුළුවන් බස් රථවල ආරක්ෂිත පිරිවිතර - safety specifications - අපි finalize කරලා තිබෙන්නේ අවුරුදු ගණනක් කථා කරලා. අපි දැන් ඒ කටයුතු බොහෝ දුරට අවසන් කරලා - සියයට 99ක්ම- තිබෙන්නේ. අපි බලාපොරොත්තු වනවා, ඒකත් නීතිගත කරන්න, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබුණාට පස්සේ. අපි මිනිසුන් බලා ගැනීම වෙනුවෙන් මාර්ග ආරක්ෂාව පැත්තෙන් කථා කරන්නේ අද. ඒ වෙනුවෙන් අපි ගොඩක් දේවල් කරගෙන යනවා.

අපි මාකුඹුරේ පිහිටුවලා තිබෙනවා බස් රථය ගමනාගමනයට සුදුසුද කියලා roadworthiness test එකක් කර ගන්න පුළුවන් තැනක්. සාමාන්‍ය මට්ටමේ roadworthiness test එකක් නොමිලේ කරන්න අපි මාකුඹුරේ තැනක් පිහිටුවලා තිබෙනවා. බස් රථ හිමියන්ට පුළුවන් නොමිලේ ඒක කරන්න. නමුත් මම උපදෙස් දුන්නා තව මාසයක් දෙකක් ගිහිල්ලා ඒකට සාධාරණ මිලක් අය කරන්න කියලා. අපි අපේ රටේ ව්‍යාපාරිකයන්ට ආරාධනා කරනවා, ඔබතුමන්ලාටත් පුළුවන් මේ කටයුත්තට සම්බන්ධ වෙන්න. අපි මේක නීතිගත කරනවා තව මාස දෙකකින්. සෑම බස් එකක්ම මාසයකට වරක් තමන්ගේ බස් රථයේ මූලික දේවල් ටික හරියට තිබෙනවාද කියලා සහතිකයක් ගන්න ඕනෑ. ඒක අමාරු දෙයක් නොවෙයි. මොකද ඔය හැම බස් එකක්ම මාසයකට එක්කෝ එක අවස්ථාවක් නැත්නම් දෙවතාවක් service කරනවා. එතැනදී මේක කර ගන්න පුළුවන්. සම්පූර්ණයෙන්, සියලු දේවල් පිළිබඳව ඒක අවශ්‍ය වෙන්නේ නැහැ. නමුත් බ්‍රේක් තිබෙනවාද, ලයිට් තිබෙනවාද, ඒ වාගේ දේවල් බලාගන්න ඕනෑ. ඒ roadworthiness test එක කර ගැනීම සඳහා දැනට අපි මාකුඹුරේ නොමිලේ තැනක් පිහිටුවලා තිබෙනවා. නමුත් අපි යෝජනා කරනවා, සුදුසුකම් තිබෙන දක්ෂ ගරාජ් හිමියන්ට, ඒ වාගේ තැන්වලට පුළුවන් ඒ සඳහා register වෙන්න. මෙතැනින් ඔබට business එකක් හැදෙනවා; ව්‍යාපාරයක් හැදෙනවා. ඔබ මේ ව්‍යාපාරය පටන් ගන්න. ඔබට තිබෙන්නේ පළාත් සභාවේ හෝ DMT එකේ register කර ගන්නයි ඔබගේ ගරාජ් එක. එතකොට බස් රථවලට සිද්ධ වෙනවා, roadworthiness test එක මාසයකට සැරයක් කර ගන්න. හැබැයි, අපි ඒ මිල පාලනය කරනවා සාධාරණ market rates අනුව.

ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරියේදී අපේ licences අලුත් කරද්දී ප්‍රවාහන වෛද්‍ය ආයතනයෙන් ඒක කර ගන්න. ගරු කථානායකතුමනි, ඒකට මාස කිහිපයක් යයි. එතකොට අපට යන්න ඕනෑ වෙන්නේ නැහැ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට. ඇත්තටම ඒක මේ රටේ ප්‍රවාහනය පරිපාලනය කරන ඉතා වැදගත් ආයතනයක් ලෙස ගොඩනගන්නට අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම මට ඊයේ කිව්වා, කෙරවලපිටියේ ප්‍රශ්නයක් ගැන. ගරු කථානායකතුමනි, මම ඉතා ඉක්මනින් කියන්නම්. කටුනායක අධිවේගී මාර්ගයේ ETC ක්‍රමය නිර්මාණය කර තිබුණේ පැලියගොඩ හෝ සීදුව පිටවීමේදී ETC මඟින් ඇතුළත්වීමක් නොමැතිව පැමිණෙන වාහන සඳහා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, you have two minutes more.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
තව පොඩි වේලාවක් ඉල්ලා ගන්න වෙයි.

කටුනායක හා සීදුව අතර ගාස්තු විතරයි අය කළේ. මොකද, ETC ක්‍රමය තිබෙන්නේ Katunayake Expressway එකේ විතරයි. අනික් ඒවායේ නැහැ. ඒ නිසා කොහොම ඇතුළු වුණත් ප්‍රශ්නයක් නැහැ, Katunayake Expressway එකට. සීදුවෙන් පිටවුණත් ගණන ගන්නවා; කටුනායකින් පිටවුණත් ගණන ගන්නවා. ඒ නිසා ETC entrance එකක වැදගත්කමක් තිබුණේ නැහැ. ETC exit එක විතරයි වැදගත් වුණේ. ETC exit එකෙන් read කළාම ඒ වාහනයට යන්න දෙනවා. ඒ නිසා ඇතුළු වෙන තැන ගැන වාදයක් තිබුණේ නැහැ. නමුත් කටුනායක අධිවේගී මාර්ගයට පමණක් ETC සවි කරපු නිසා වෙච්ච දේ තමයි, දක්ෂිණ සහ Outer Circular Highway එකෙන් යන අයට කිසිම වැඩක් වුණේ නැති එක, ETC එකෙන්. ඒ නිසා ETC promote වුණේ නැහැ. ඒ නිසා පසුකාලීනව කටුනායකත්, දක්ෂිණ අධිවේගී මාර්ගයත් එකතු කළා, කඩවත කෙරවලපිටියට දිගු කිරීම හරහා. ගරු කථානායකතුමනි, ඊට පස්සේ කෙරවලපිටිය හරහා එනකොට සිද්ධ වෙච්ච දේ තමයි මිනිස්සුන්ට තැන් දෙකකදී ගෙවන්න වුණා. කෙරවලපිටිය දක්වා ඇවිල්ලා එක ගණනක් ගෙවන්න ඕනෑ. නැවත ජාඇලදී තව ගණනක් ගෙවන්න ඕනෑ. එහෙම නැතිනම් කටුනායකදී තව ගණනක් ගෙවන්න ඕනෑ. ඉතින් මේක ඇත්තටම කිසිම තේරුමක් නැති නිසා දළ වශයෙන් ගත්තොත්, විනාඩි 6කට වැඩි අනවශ්‍ය ප්‍රමාදයක් සිදු වුණා, කෙරවලපිටියේ. මොකද, එතැන තැන් දෙකකදී ගෙවන්න ඕනෑ. සමහර තැන්වල අපි නිකම් ටිකට් එක අරගෙන යන්නේ.

ගරු කථානායකතුමනි, වේලාව නැති නිසා මම ගොඩක් දේවල් කියන්න යන්නේ නැහැ.

ඊළඟට මම කියන්න කැමැතියි, අධිවේගී මාර්ග භාවිත කරන ප්‍රමාණය විශාල වශයෙන් වැඩි වෙලා තිබෙන බව. "ලංකාදීප" පුවත් පතේ භානුක අමරසිංහ මහතා වාර්තා කර තිබෙනවා, අධිවේගී මාර්ග භාවිත කරන ප්‍රමාණය වැඩි වී තිබෙන බව. ගරු කථානායකතුමනි, ඒ ප්‍රමාණය 2024 වර්ෂයට සහ 2025 වර්ෂයට අදාළව සංඛ්‍යාලේඛන වශයෙන් කියනවා නම්, පැලියගොඩින් පිටවන වාහන ප්‍රමාණය ලක්ෂ 5කින් වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ 2024 වර්ෂයේ වාහන ලක්ෂ 42ක් පිටවෙලා තිබෙනවා; 2025 වර්ෂයේ වාහන ලක්ෂ 47ක් පිටවෙලා තිබෙනවා; 2024 වසරේ කටුනායකින් වාහන ලක්ෂ 44යි. දැන් ලක්ෂ 50යි. ජා-ඇලෙන් 2024 වර්ෂයේ පිටවුණු ප්‍රමාණය ලක්ෂ 12යි, දැන් ලක්ෂ 15යි. ඒ කියන්නේ සාමාන්‍යයෙන් සියයට 18.8කින් වැඩි වෙලා තිබෙනවා, අධිවේගී මාර්ග භාවිත කරන ප්‍රමාණය.

හැබැයි, අධිවේගී මාර්ග භාවිත කරන ප්‍රමාණය වැඩි වුණු පළියට ඒ තරමට entrances and exits හදන්න අපට බැහැ. ඒ නිසා තමයි අපි කෙරවලපිටියේ යම් වෙනසක් කළේ. ඒකත් total solution එකක් නොවෙයි. අනවශ්‍ය ලෙස කෙරවලපිටියේ රැඳී සිටීමක් සිද්ධ වුණා, තැන් දෙකකින් ticketsවලට ගෙවන්න වෙච්ච නිසා. ඒ නිසා අපි ඒක ඉවත් කළා. ඒ නිකම් නොවෙයි, අධ්‍යයනය කරලා. හැබැයි, අපි කලින් පුරුදු වෙලා හිටියේ ඕනෑම තැනකින් ETC lane එකට ඇතුළු වෙන්න. එතකොට ප්‍රශ්නයක් නැහැ. එතකොට ගෙවන්න තිබුණේ points 2කට විතරයි. ඒ, එක්කෝ ජා -ඇලදී, නැත්නම් කටුනායකදී. නමුත් දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? මත්තල ඉඳලා එන වාහනත් තිබෙනවා නේ. මුල් දවස් 2-3 තුළ වුණේ මොකක්ද? ඒගොල්ලන් ඇතුළු වෙන්නේ ETC lane එකකින් නොවෙයි නේ. එතකොට ඒ අයකැමිට read කරන්න වෙන්නේ ඔහු මත්තල ඉඳලා ආපු විධියට. දෙවැනි කරුණ තමයි ඒ වාගේ අත්දැකීම් නැති අය, ETC lanes කවදාවත් පාවිච්චි නොකරපු සමහර අය තමයි සමහර විට යම් යම් ප්‍රශ්න හදා ගත්තේ. ඕනෑම දෙයක් අලුතින් පටන් ගන්න කොට, පොඩි blunder එකක් එනවා. අපි ඒක දැනගෙන හිටියා. අපි යම් simulation එකක් drawingsවල කළා. නමුත් අපට නීතිය අනුව full rehearsal එකක් කරන්න බැහැ, ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා ගැසට් එක අවලංගු නොකර. කෙරවලපිටියෙන් සල්ලි නොගෙන යවන්න බැහැ. ඒ නිසා ගැසට් එක අවලංගු කරලා තමයි ඒක කරන්න සිද්ධ වුණේ. දැන් අපි අලුතින් ගේට්ටු දමා තිබෙනවා, වැඩිපුර tellersලා දමා තිබෙනවා, නිල් පාටින් mark කර තිබෙනවා. දැන් මිනිස්සු දන්නවා, ETC lane එකෙන් යන්න නම්, ETC lane එකෙන් එන්න ඕනෑ කියලා. ඒක කෙරවලපිටියේ ඇති වුණු සිද්ධියට උත්තරයක් වුණා, විනාඩි 6ක්-7ක් ප්‍රමාදය අඩු වීමෙන්.

හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා කියන දවස ජනවාරි 5, ඉස්කෝල පටන් ගත් දවස. අපි පිළිගන්නවා, එදා පැලියගොඩ සිට කොළඹ දෙසට එන එකේ තදබදය වැඩි වුණ බව. මගේ ළඟ photos සහ screenshots තිබෙනවා, එක එක වේලාවල් එක්ක. ඒ නිසා තමයි එහෙම වුණේ. නමුත් ඔබතුමා බලන්න, දැන් ඒ තත්ත්වය යම් ප්‍රමාණයකට පාලනය වෙලා තිබෙනවා. නමුත් අපි පිළිගන්න ඕනෑ, අධිවේගී මාර්ග භාවිත කරන ප්‍රමාණය වැඩි වෙනකොට, අපට තිබෙන එකම උත්තරය තමයි ETC lanes වැඩි කරන එකත්, bank payment systems වැඩි කරන එකත් බව. මට tellersලා කියා තිබෙනවා, "ඇමතිතුමනි, සමහර අය සල්ලි මාරු කර ගන්නත් expressway toll boothsවලට එනවා" කියලා. ඒ කියන්නේ රුපියල් 200 ගාස්තුව ගෙවන්නත් 5,000 කොළයක් අරගෙන එනවා ලු. දැන් ඉස්සර වාගේ සල්ලි මාරු කරලා දෙන්නේ නැහැ නේ, කඩවලින්. අපි bank payment ක්‍රමය අනිවාර්ය කරන්න බලාපොරොත්තු වෙනවා. අපේ Minister of Energy, Minister of Ports and Civil Aviation අපට ලියුම් දීලා තිබෙනවා, අපි ETC lanes දියුණු කිරීම තුළ ඒගොල්ලන්ගේ වාහන එම මංතීරුවල ධාවනය කරන බවට. නමුත් ප්‍රශ්නය වන්නේ පසුගිය අවුරුදු ගණනක් තිස්සේ ETC lanes promote කරන්න වැඩ පිළිවෙළක් තිබිලා නැතිකමයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, you have taken extra three minutes already.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි අපි බලාපොරොත්තු වෙනවා, ඔන්න ඔය වාගේ වෙනස්කම් ප්‍රමාණයක් කරන්න.

අවසාන වශයෙන් ගරු කථානායකතුමනි, මම හිතුවා මේ විෂයයට ඍජුව සම්බන්ධ නැති නමුත් ජාතික වශයෙන් වැදගත් කරුණක් ගැන විනාඩි 4ක්, 5ක් විතර අරගෙන කියන්න. අපේ මන්ත්‍රී කණ්ඩායම කථා කරාවි, අද ඉදිරිපත් කරන කරුණු පිළිබඳව; මේ නියෝග ගැන.

[ගරු බිමල් රත්නායක මහතා]

ගරු කථානායකතුමනි ඔබතුමා දන්නවා, මෑතකදී අන්තර්ජාතික වශයෙන් විශාල සිදුවීමක් වුණු බව. වෙනිසියුලාවේ ඡන්දයෙන් පත් වී සිටි ජනාධිපතිතුමා එක්සත් ජනපදයේ ආක්‍රමණයකින් පැහැර ගෙන ගියා. අද ඔහු නඩුවලට ඉදිරිපත් කර තිබෙනවා, වෙනත් රටක. අපි ජනතා විමුක්ති පෙරමුණ විධියට එම කටයුත්ත හෙළා දැක statement එකක් පළ කර තිබෙනවා. එහි සඳහන් වෙනවා, "We strongly condemn the United States of America's military aggression against the independent and sovereign State of Venezuela and the abduction of democratically elected President Nicholas Maduro and his wife" යනුවෙන්. අපි මේ තුළ අවධාරණය කර තිබෙන විශේෂ දේ වන්නේ, පැහැදිලිවම මෙම ක්‍රියාව එක්සත් ජාතීන්ගේ අපි පිළිගන්නා ප්‍රඥප්තිවලට එකඟ නැති දෙයක් කියන එකයි. අපි දකින විධියට අද ලෝකයේ අතිබහුතරයක් රටවල් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්ති පිළිඅරගෙන තමයි කටයුතු කරන්නේ.

ගරු කථානායකතුමනි, රටක් තුළ මොනවා වුණත් ඒ රට හොඳද, නරකද කියන එක ඒ රටේ මිනිස්සුන්ගේ ප්‍රශ්නයක්.

වෙන කිසිම රටකට ඒ රට ආක්‍රමණය කරන්න බැහැ කියන එක එක්සත් ජාතීන්ගේ සංවිධානය 1945 ලෝක යුද්ධයෙන් පස්සේ ඇති කරපු එකක්. ඒක ලොකුම දෙයක්. ලෝකයේ එතෙක් තිබුණු කැලෑ න්‍යාය, ඒ කියන්නේ ලොකු එකා පොඩි එකාව දඩයම් කරන ක්‍රියාවලිය නතර කරලා ලෝකයට සෑහෙන දුරට සාමය ලැබුණේ 1945 එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රඥප්තිය පිළිගත්ත නිසා. ඇත්තටම අපි වාගේ රටවල lifeline එක, ඒක. ලෝකයම ගත්තත් - හැම රටක්ම ගත්තත් - ප්‍රධාන රටවලින් යුද්ධ ගොඩාක් කරන්න පුළුවන් රටවල් හැරුණාම, අනෙක් හැම රටකම තිබෙන lifeline එක මොකක්ද? රටක් වශයෙන් ගත්තාම, ලොකුම ලොකු රටක් එක්කත් අපි කාටත් සමාන අයිතිවාසිකම් තිබෙනවා කියලා පිළිගන්න එක නීත්‍යානුකූලයි. මම හිතන විධියට ලෝක සාමයට ආපු ලොකුම lifeline එක තමයි ඒක. වෙනිසියුලාව හෝ අප්‍රිකාව හෝ කොහේ හෝ රටක් හොඳ නැද්ද කියන එක තීරණය කරන්න ඕනෑ, ඒ රටේ ජනතාව මිසක් වෙනත් රටක කවුරුවත් නොවෙයි. ඉරාකය, සිරියාව, ඇෆ්ගනිස්ථානය වාගේ රටවල් ගත්තාම රටේ ජනතාවගේ කැමැත්තෙන් තොරව ඒ රටවල ආණ්ඩු වෙනස් කරපු එක ඉතාම නරක අත්දැකීමක් ලෙස අපට පෙනෙනවා. මොකද, ඒ රටවල් සාර්ථක වෙලා නැහැ. ගරු කථානායකතුමනි, වෙනිසියුලාව ගත්තොත්, Fifth Republic Movement පක්ෂයත්, United Socialist Party of Venezuela කියන පක්ෂයත් අවුරුදු 25ක් ඒ රට පාලනය කරලා තිබෙන බව ඔබතුමාත් දන්නවා ඇති. ඔබතුමන්ලා ඕනෑ කෙනෙකු හිතන්න පුළුවන්, මේ අවුරුදු 25ක් තිස්සේ ඒ රට මොනවාද කළේ කියලා. මම වැඩි වෙලාවක් ගන්න එක සාධාරණ නැහැ. මේ සම්බන්ධ තොරතුරු ඇතුළත් වාර්තාව සභාගත කරන්න මා බලාපොරොත්තු වෙනවා.

මේවා අන්තර්ජාතික වශයෙන් පිළිගත් දේවල්; achievements versus outcomes. වෙනිසියුලාව 2000 සිට 2025 දක්වා දුප්පත්කම, අසමානතාව, සෞඛ්‍ය සේවය, අධ්‍යාපනයට තිබෙන අයිතිය, ආර්ථික සංවර්ධනය, උද්ධමනය, ආහාර සුරක්ෂිතභාවය කියන මේ කරුණු මත ලෝකයේ අන්තර්ජාතික සංවිධාන රාශියක් වාර්තා සකස් කරලා තිබෙනවා. වෙනිසියුලාවේ 25 අවුරුද්දක ආණ්ඩු පාලනය වාර 2කට කඩන්න පුළුවන්, 2000-2014 සහ 2014-2021, සිට අද දක්වා වශයෙන්. 2014 කියන අවුරුද්දේ තමයි වෙනිසියුලාවට එක්සත් ජනපදය අසීමාන්තික සම්බාධක දාන්නේ. ස්වාධීන සාමාන්‍ය රටකට තිබෙන අයිතිවාසිකම් තිබෙන වෙනිසියුලාවේ 2014 වෙනකොට, poverty, sharply reduced, inequality, significantly reduced and health access, greatly expanded. කවදාවත් free health තිබුණු රටක් නොවෙයි, ඒක. විවිධ තරුණ වැඩසටහන් සඳහා අපි කිහිප සැරයක් visit කරලා තිබෙනවා. ඒ රට අපි වාගේ free health තිබුණු රටක් නොවෙයි. දැනට පවතින ආණ්ඩුව තමයි free health ගෙනාවේ, for the first time. Education access ගත්තොත්, එය කවදාවත් free education තිබුණේ නැති රටක්. 2000න් පස්සේ free education ආවේ. Economic output ගත්තොත්, growth fueled by oil. ඔබතුමන්ලා දන්නවා වෙනිසියුලාව ALBA Bank ආදී දකුණු ඇමෙරිකාවටම උදව් කරන විවිධ දේවල් හැදූ බව. 2014 දක්වා, inflation was managed via controls; food security was improved via subsidies. සාමාන්‍ය සාධාරණ රටක් ලෙස වෙනිසියුලාවේ විවිධ පාලකයන් වැඩ කරද්දී, ඔවුන් ඔවුන්ගේ රට තිබුණාට වඩා ඉහළට ගෙනාවා. Caracas කියන්නේ සම්පූර්ණයෙන්ම shanty town එකක්. අද ලෝකයේ අවුරුද්දකට වැඩිම ගෙවල් හදලා තිබෙන රට වෙනිසියුලාව. මට ඒ ගැන කියන්න වෙලාව නැහැ. Caracas නගරය ගත්තාම සම්පූර්ණයෙන්ම shanty town එකක් විධියට තිබුණේ. අද ඒවා සෑහෙන දුරට වෙනස් වෙලා තිබෙනවා. විශාල සුබසාධනයක් මේ ආණ්ඩුවලින් කළා. ඊට පස්සේ 2014දී සම්බාධක ආවා. 2014-2020 වසරවල සම්බාධක ආවාට පස්සේ මොකක්ද වුණේ? There was a crisis and a collapse. With regard to poverty, there has been a catastrophic increase. Inequality increased dramatically; ඔක්කොම වැඩි වෙනවා.

ඇයි, වෙනිසියුලාවට සම්බාධක දැම්මේ? වෙනිසියුලාව ඇමෙරිකාවට විරුද්ධව කිසිම දෙයක් කරලා නැහැ; ඇමෙරිකාවේ ස්වෛරීත්වයට කිසිම වැරැද්දක් කරලා නැහැ. ඒ නිසා වෙනිසියුලාවේ මැතිවරණය පිළිබඳව Carter Centre එක කියලා තිබෙනවා, ලෝකයේ තිබෙන පිරිසිදුම මැතිවරණය කියලා. මැතිවරණ ගොඩාක් තිබුණා. යම් යම් මැතිවරණ ගැන කියලා තිබෙනවා. ඊට පස්සේ මේ සම්බාධක නිසා 2020 දක්වා වෙනිසියුලාව වැටුණා. ඕනෑම රටකට සම්බාධක දාලා බලන්න, ඒ රටට අමාරු වෙනවා. අද කියුබාවට වෙලා තිබෙන්නෙත් ඒකමයි. ඊට පස්සේ 2021 ඉඳලා 2025 දක්වා වෙනිසියුලාවේ ආණ්ඩු මේකත් එක්ක fight කරලා නැවත වෙනස් වෙන්න පටන් ගත්තා. 2021 ඉඳලා 2025 වෙනකන් එක්සත් ජාතීන්ගේ වාර්තාවල මොකක්ද තිබුණේ? Poverty improves slightly; inequality, තරමක් හොඳ පැත්තට; health access, gradually increasing. ඒ නිසා ඒගොල්ලන් ආයේ මේකත් එක්ක සටන් කරමින්, 2021 ඉඳලා 2025 දක්වා යම් කිසි මට්ටමකට - හොඳ මට්ටමකටම නොවෙයි - අත්පත් කරගෙන තිබෙනවා. ගරු කථානායකතුමනි, මම මේ කරුණු කිව්වේ ඒකයි.

මේ පැහැර ගැනීම එක්සත් ජනපද ආණ්ඩුවේ තීරණයක් බව ඇත්ත. නමුත්, මේ පැහැර ගැනීම, මේ ප්‍රශ්නය එක්ක එන දෙයක් තිබෙනවා. ඒ මොකක්ද? අපි වාගේ රටවලට ස්වාධීනව දියුණු වෙන්න නම්, අපට එක්සත් ජාතීන්ගේ system එක පැවතීම අත්‍යවශ්‍යයි. මම දුටුවා, එක්සත් ජනපද ආණ්ඩුව අද වනකොට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සංවිධාන 31කින් ඉවත් වෙන්නත්, අන්තර්ජාතික සංවිධාන 35කින් ඉවත් වෙන්නත් තීන්දු කර තිබෙනවා කියලා. ඒ රටට ඒ අයිතිය තිබෙනවා. ඒ රටේ ජනතාව ඡන්දය දීලා නේ, ට්‍රම්ප් ජනාධිපතිතුමා පත් කරගෙන තිබෙන්නේ. නමුත්, එක්සත් ජාතීන්ගේ සංවිධානය කියන්නේ ලෝකයම හදා ගත්ත සංවිධානයක්. ඒකට මුල් වුණා, එක්සත් ජනපදය. එක්සත් ජනපදය අද මොනවායින්ද ඉවත් වෙන්න තීන්දු කර තිබෙන්නේ? UN Framework Convention on Climate Change, UN Women, UN Pupulation Fund, UN Human Settlements Programme, UN Democracy Fund, UN Peacebuilding Commission, UN University, UN Water, UN

Energy ආදී ඒවායින්. ඒ රටට අයිතිය තිබෙනවා. නමුත්, මම මේකෙන් පෙන්වන්න හදන්නේ වෙන දෙයක්. අනෙකුත් international organizations මොනවාද? Colombo Plan Council එකෙනුත් එක්සත් ජනපදය අයින් වෙනවා. එම විස්තර ඇතුළත් ලේඛනය මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

අපට පෙනෙනවා, එක්සත් ජනපද ආණ්ඩුව එතරම්ම UN එකට කැමැති නැහැ වාගේ කියලා. ඒක නේ අයින් වෙන්නේ. නමුත්, අපට තිබෙන දේ මොකක්ද? අපට UN එක අවශ්‍යයි. ඉතා පැහැදිලිව කියන්න ඕනෑ කාරණය මේකයි. මම විනාඩියෙන් අවසන් කරනවා, ගරු කථානායකතුමනි. සමහර අය ලියලා තිබෙනවා මම දුටුවා, "මදුරෝ දූෂිතයි, ඒකාධිපතියි, නමුත් එයා අල්ලාගෙන ගිය විධිය වැරදියි" කියලා. මම දැක්කා ඡන්ද සම්බන්ධව හිටපු කෙනෙකුත් ඒක ලියලා තිබෙනවා. වයඹ ඡන්දය මංකොල්ල කද්දී එතුමා හිටියේ මැතිවරණ නිලධාරියෙක් වශයෙන්. එතකොට එතුමා කිව්වාද, ඒ ආණ්ඩුවට වෙන රටකින් ගහලා හරි උස්සගෙන ගියා නම් හරියනවා කියලා? ඇත්ත මොකක්ද? රටවල්වල පාලකයන්ගේ අඩුපාඩුකම් තිබෙන්න පුළුවන්. නමුත්, ඒ හැම වැරැද්දක් නිසාම තවත් රටකට බලයක් ලැබෙනවා නම් ඒක වෙනස් කරන්න, ඒක වැරදියි. දැන් මොකක්ද කරන්නේ? ඇත්ත පැත්තේ හිට ගන්නේ නැතිව අරයා වැරදියි, මෙයා වැරදියි කියන එක නොවෙයි අපි දකින්නේ. අපි දකින දේ මේකයි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කරගන්නට අපට අවශ්‍යයි. ඒ නිසා අපට ආණ්ඩුවක් විධියට එක්සත් ජාතීන්ගේ සංවිධානය අවශ්‍යයි.

ඇත්තටම UN Secretary-General's Special Envoy for Road Safety මුණ ගැසුණා. ගරු කථානායකතුමනි, UN එකේ ඉන්නවා මාර්ග ආරක්ෂාව සම්බන්ධ එක්සත් ජාතීන්ගේ මහලේකම්තුමාගේ විශේෂ නියෝජිතයෙක්. එතුමා Ferrari එකේ champion කෙනෙක්. එතුමා වියදම් කරගෙන ලෝකය වටේ යන්නේ. එතුමා අපේ රටට උදවු කරන්න කැමැතියි. ඒ, UN එක තිබෙන නිසා. මොකද, අපි ඔක්කොම දන්නේ නැහැ නේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මේ ප්‍රඥප්ති කවුරු හරි උල්ලංඝනය කරනවා නම් ඒක ඒ රටට පමණක් නොවෙයි, අපේ රටටත් බලපානවා. ඒ නිසා මේ කාරණයේදී කියන්න කැමැතියි, අපි වාගේ රටවල lifeline එක හැදෙන්නේ UN Charter එක ක්‍රියාත්මක වීම මතයි කියන එක. ඒ නිසා අපි කවුරුත් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්ති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් උනන්දු විය යුතුයි කියන ස්ථාවරයේ තමයි ඉන්නේ.

මම වෙලාව වැඩිපුර ගත්තා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Next, the Hon. Gayantha Karunathilleka. You have ten minutes.

Order, please! Before he starts, the Hon. Deputy Speaker will take the Chair.

* **ප්‍රස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[අ.භා. 12.03]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහනය කියන්නේ රටක ජනතාවටත්, රටේ සංවර්ධනයටත් බෙහෙවින්ම බලපාන ක්ෂේත්‍රයක්. මෝටර් වාහන පනත යටතේ ගෙනෙන නියෝග කිහිපයක් අනුමත කරන මේ අවස්ථාවේ ඒ පිළිබඳව වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වනවා. සාමාන්‍යයෙන් සභානායකතුමාත් එක්ක අපි එකඟ නොවන අවස්ථා තිබෙනවා. නමුත් එතුමාගේ කථාවෙන් පසුව මට කථා කරන්නට ලැබුණු අවස්ථාවේ මම කියන්නට ඕනෑ, අද දින ප්‍රවාහනය සම්බන්ධව අලුතින් හඳුන්වා දෙන නීති, එම සංශෝධන ඉතාම හොඳයි කියලා තමයි අපට පෙනෙන්නේ කියන එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට මොන විධියකටවත් අමතක කරන්න බැරි කාරණයක් තමයි, සියවස් ගණනාවක් තිස්සේ යුගයෙන් යුගයට දියුණු වුණු ප්‍රවාහන පද්ධතියක්, මාර්ග පද්ධතියක් අපේ රටට උරුම වී තිබෙනවා කියන එක. අඩි පාරෙන්, බොරළු පාරෙන්, තාර පාරෙන්, කාපට් පාරෙන්, අධිවේගී මාර්ග දක්වා මාර්ග පද්ධතිය සංවර්ධනය වෙද්දී ඊට සාපේක්ෂව දෝලාවෙන්, බර කරත්තයෙන් ආරම්භ වෙලා අද වන විට විද්‍යුත් මෝටර් රථ දක්වාම අපි රටක් හැටියට ඉදිරියට ඇවිත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ආපු ගමන් මගේ ඉතිහාසය පුරාම ඒ වෙනුවෙන් දායක වුණු, ප්‍රතිපත්තිමය තීන්දු-තීරණ ගත් පාලකයින් වාගේම දහඩිය හෙළපු කම්කරුවා දක්වාම අපේ ගෞරවය හිමි විය යුතුව තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නැතිව ඉතිහාසයේ කරපු හැම දෙයක්ම වැරදියි, මේවාට සම්බන්ධ වුණු හැමෝම හොරු, දූෂිතයෝ, දැන් තමයි හරි දේවල් කරන්නේ, දැන් ඉන්නේ ඔක්කෝම සාන්තුවරු කියන අදහසේ ඉඳලා මේ වාගේ විෂයක් ගැන කථා කරන්න අපට පුළුවන්කමක් නැහැ. මොකද, ඉතිහාසයට නිසි ගෞරවය නොදෙන ජාතියකට වර්තමානයක් හෝ අනාගතයක් පවතින්න පුළුවන්කමක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ පදනම මත සිටිමින් වර්තමානයේ පැන නැඟෙන කාලීන ගැටලුවලට විසඳුම් සොයන එක විශේෂයෙන්ම ආණ්ඩුවේ වගකීමක්. ඒ වාගේම ඊට අදාළ නව නීති හඳුන්වා දෙන එක මේ සභාවේ සිටින පක්ෂ විපක්ෂ අප කාගේත් වගකීමක් හැටියටයි මා දකින්නේ.

අධිවේගී මාර්ගයේ ගමන් කරනකොට ආසන පටි පැළඳීම අනිවාර්ය කිරීම මෙච්චර කල් තිබුණේ ඉදිරිපෙළ ආසනවල යන අයට විතරයි. දැන් වාහනවල පිටුපස ආසනවල යන අයටත් ඒක අනිවාර්ය කිරීම ඉතාම කාලෝචිත යෝජනාවක්. ඒ වාගේම බීමතින් රිය පැදවීම සම්බන්ධව නව නීති හඳුන්වාදීමත් ඉතාම කාලෝචිත යෝජනා හැටියට අප දකිනවා. මොකද, අද රටේ සිදුවන මිනිස් ජීවිත විනාශ වීමේ ප්‍රධානම හේතුවක් තමයි, මේ accidents. මේක අද පළමුවැනි තැනට ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා මේක සුළුපටු කොට සලකන්න කාටවත් පුළුවන්කමක් නැහැ. මේවා සම්බන්ධයෙන් පැවතුණු නීති ක්‍රියාත්මක කිරීම ගැන, පැවති නීති ගැන, විශේෂයෙන්ම පසුගිය කාලයේ ඒවා

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ක්‍රියාත්මක කරන්න ගියාම පැන නැඟුණු දේවල් ගැන රටේම ජනතාව කථා කරපු හැටි අපි පසුගිය දවස්වල දැක්කා. විද්‍යුත් සහ මුද්‍රිත හැම මාධ්‍යයකම වාගේ, විශේෂයෙන්ම සමාජ මාධ්‍ය තුළින් මේ නීති ක්‍රියාත්මක වීම පිළිබඳව ලොකු කථාබහක් ඇති කළා. බීමතින් රිය පැදවීම සම්බන්ධව පරීක්ෂණ ගැන කථා කරනකොට සමහරු කිව්වා, ඒවා "රන්වලකරණය" වෙච්ච හැටි. ඒ වාගේම බීමතින් රිය පැදවූවාද කියා සොයා ගන්න තිබෙන බැලූන පොලිස් ස්ථානවල නොතිබීම ගැනත් ලොකු ආන්දෝලනයක් පසුගිය තිබුණා. අන්තිමේදී පොලීසියේ හුළං බැහැපු හැටිත් දකින්න ලැබුණා. ඒ නිසා මේ විෂය බොහොම වැදගත් විෂයයක්.

මේ රජයේ ආරම්භක ප්‍රධානම ව්‍යාපෘතියක් ලෙස මහා ලොකු සද්දයක් දාලා පටන් ගත්තා, Clean Sri Lanka වැඩසටහන. ඒක පටන් ගත්තේම බස්වලයි, ත්‍රීරෝද රථවලයි කැලි ගලවලා. නමුත්, අද වනකොටත් ඒ සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තිය කුමක්ද කියන එක අපට පැහැදිලි නැහැ. බොහෝදෙනෙක් ඒ ගැන දන්නේත් නැහැ. අපෙනුත් අහනවා, මේ මොකක්ද, මේ සම්බන්ධයෙන් නිවැරදි නීතිය මොකක්ද කියලා. ඒ විතරක් නෙවෙයි. පාරේ යනකොටත් මේක හරියට ක්‍රියාත්මක වනවා කියන එකක් පෙනෙන්නත් නැහැ.

ඒ වාගේම අද වෙද්දි පවතින තවත් ප්‍රධාන ගැටලුවක් තමයි, පෞද්ගලික ප්‍රවාහන රථවලින් කොටසක් ජාලගත සමාගම් සමඟ සම්බන්ධ වෙලා App එකක් පාවිච්චි කරමින් hire යන එක. අනෙක් අය වෙනම පෞද්ගලිකවත් hire යනවා. විශේෂයෙන්ම සංචාරක කලාපවලදී මේ දෙපිරිස අතර මතභේද නිතර ඇති වනවා. රජය මේ සම්බන්ධයෙන් වහාම මැදිහත් වෙලා මේ දෙපිරිස අතර ඇතිවෙලා තිබෙන මේ ගැටලුකාරී තත්ත්වයට විසඳුමක් ලබා දීමත් අවශ්‍යයි කියන එක මම කියන්න කැමැතියි. මේ දෙපිරිසේම අය කියනවා, "රට අනුරට" කියලා අපි වාහනවල ස්ටිකර් ගහගෙන තමයි ගියේ කියලා. ඒ නිසා මේ දෙපිරිසටම සාධාරණ විසඳුමක් ලබා දෙන්න පුළුවන් නම් එහි වටිනාකමක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම කලක පටන් පවතින ගැටලුවක් තමයි, අලුතින් එන වාහනවලටයි, මෝටර් සයිකල්වලටයි number plates නොලැබීම. මට මතකයි, ඇමතිතුමා එක වෙලාවක අපේ මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයකදී අතුරු ප්‍රශ්නයකට උත්තර දුන් ආකාරය.

2025 සැප්තැම්බර් 26වැනි දා හැන්සාඩ් වාර්තාවේ 1247 තීරුවේ ගරු බිමල් රත්නායක මහතා මෙසේ සඳහන් කරනවා:

> "ගරු මන්ත්‍රීතුමනි, අපි හිතනවා නොවැම්බර් 15වන දා වෙනකොට number plates ලබා දෙන්න අපට පුළුවන් වේවි කියලා."

එහි තවදුරටත් එතුමා මෙසේ සඳහන් කරනවා:

> "මම පිළිගන්නවා, දැනට නිසියාකාරව number plates නැතුව යම් වාහන ප්‍රමාණයක් පාරේ ධාවනය කරවන්න සිදු වෙලා තිබෙනවා කියලා. මම හිතනවා, මේ නොවැම්බර් 15වන දායින් පසුව ඒ ප්‍රශ්නය වේගයෙන් විසඳන්න අපට පුළුවන් වෙයි කියලා. බොහෝ විට නොවැම්බර් 15වන දා දක්වාත් - ඒ අතර මැද්දටත් - තාවකාලික solution එකක් ලබා දීමේ කටයුත්ත ලබන සතියේ පටන් ගන්න අපට පුළුවන් වෙයි."

මේ, ගිය අවුරුද්දේ සැප්තැම්බර් 26වැනි දා ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයකට එතුමා ලබා දුන් උත්තරයක්.

නොවැම්බර් 15වැනි දා පහුවෙලා දැන් ජනවාරි 15ටත් ළංවෙලා තිබෙනවා, නමුත් තවමත් number plate ප්‍රශ්නයට විසඳුමක් දෙන්න රජයට බැරිවෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මේ ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් ජනාධිපතිතුමා අය වැය කථාවේදීත් කාරණා කිහිපයක් ගැනම සඳහන් කළා. අපි හිතනවා, පසුගිය අය වැයේදී වාගේ ඒවා කථාවට පමණක් සීමා නොවී -කතාබස්වලට පමණක් සීමා නොවී- බස් ප්‍රශ්න, දුම්රිය ප්‍රශ්න විසඳීම සඳහා එතුමා කියපු කාරණා ඉවහල් කරගනීවි කියලා. එතුමා අය වැය කථාවේදී කිව්වා, ප්‍රවාහන සේවය ශක්තිමත් කිරීම සඳහා රුපියල් මිලියන 67,200ක් වෙන් කරනවා කියලා. ඒ වාගේම දූර ගමන් සේවා සඳහා බස් රථ 600ක් ගෙන්වන බවත් එතුමා කිව්වා. අලුතින් ඩීසල් දුම්රිය බලවේග කට්ටල 5ක් ගෙන්වන්න කටයුතු කරනවා කිව්වා. දැන් 2026 අවුරුද්ද ආරම්භ වෙලා තිබෙනවා. අපි බලාපොරොත්තු වනවා, මේවාට කාල වකවානු දමාගෙන, නියම වෙලාවට ටෙන්ඩර් පටිපාටි ක්‍රියාත්මක කරලා, වෙන් කළ මුදලින් රටට උපරිම ප්‍රයෝජනයක් ලබා දෙයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරත්තය අදින ගවයා පිටුපස ගැල එනවා වාගේ, මේ ආණ්ඩුව දේශපාලන වේදිකාවේ කියපු හැම වචනයක්ම දෛවෝපගත විධියට දැන් ආණ්ඩුව පස්සෙන් එන්න පටන් අරගෙන තිබෙනවා. අපට මතකයි ජනාධිපතිතුමා පසුගිය දවස්වල ඇහුවා, "මත්තලට ගුවන් යානයක් ආපු එකත් ප්‍රවෘත්තියක්ද?" කියලා. නමුත් අපි පසුගිය දවසක දැක්කා, ආපදා තත්ත්වය නිසා හානි වුණු දුම්රිය පොළක් ප්‍රතිසංස්කරණය කරලා එතැනට දුම්රියක් ආපු එකත් ප්‍රවෘත්තියක් වුණු හැටි. ඒ වෙලාවේ ඇමතිවරුන් විශේෂ නැටුමකුත් දාලා පෙන්නුවා. මිනිස්සු නම් ඒ නැටුමට කිව්වේ, "ආපදා වන්නම" කියලා. ඉතිහාසයේ ඇති කළ දැවැන්ත සංවර්ධන ව්‍යාපෘතිවල ඉඳලා මෙවැනි පුංචි ව්‍යාපෘති විවෘත කිරීම දක්වා ඇමතිවරුන් නටලා පෙන්නුවා නම්, අද වනකොට "ගජගා වන්නම", "මයුරා වන්නම" වාගේ ඒවාට වඩා සමහර විට "ඇමති වන්නම" ජනප්‍රිය වෙන්න තිබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන ක්ෂේත්‍රය ගැන කථා කරන විට අපි කාගේත් අවධානය යොමු විය යුතු වැදගත්ම දේ තමයි, නිතර නිතර අහන්න ලැබෙන මාරක රිය අනතුරු පිළිබඳ ප්‍රශ්නය. පසුගිය අවුරුද්දේ රටම කම්පාවට පත් කළ මාරක රිය අනතුරු ගණනාවක් වාර්තා වුණා. අපට ජීවිත ගණනාවක් අහිමි වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද වනකොට මේක බරපතළ සමාජ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මේ වන විට වැඩිම ජීවිත හානියක් සිදු වන කාරණය දක්වා රිය අනතුරුවලින් සිදු වන මරණ සංඛ්‍යාව බහුල වෙලා තිබෙනවා. ඇමතිතුමාත් දැන් කිව්වා, ජීවිත හානි සිදු වීම අතින් රිය අනතුරු සඳහා පළමු තැන හිමිවෙලා තිබෙනවා කියලා. රිය අනතුරු නිසා හැම වසරකම ජීවිත විශාල සංඛ්‍යාවක් අහිමි වනවා, තුවාල ලබනවා, ආබාධිතයින් බවට පත් වනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Gayantha Karunathilleka, your time is up.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මම තව විනාඩියකින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ නිසා තමන්ගේ ජීවිතවලට වාගේම අන්‍යයන්ගේ ජීවිතවලටත් ගරු කරන, ආදරය කරන රියදුරන් පිරිසක් බිහි කරන්න අපි කටයුතු කළ යුතුව තිබෙනවා. ගරු ඇමතිතුමා කිව්වා වාගේම පාසල් දරුවන් ප්‍රවාහනය කිරීමේ ක්‍රියාවලිය සඳහා තව අලුත් නීති ගෙනෙන එක හොඳයි. මගීන්ගේත්, රියදුරන්ගේත්, පදිකයින්ගේත්, දරුවන්ගේත්, ඒ හැමෝගේම ආරක්ෂාව වෙනුවෙන් තමයි මේ නීති ගෙන එන්න අවශ්‍ය වන්නේ. සමහර නීති මුලදී ජනප්‍රිය නොවෙන්න පුළුවන්. නමුත්, මෙහිදී ජනතාවගේ ආරක්ෂාව තමයි වැදගත් වන්නේ.

මම අවසාන වශයෙන් කියන්න කැමැතියි, ග්‍රාමීය ප්‍රදේශවලට කළුවර වැටුණාට පස්සේ අදටත් බස් නැති ප්‍රශ්නයක් තිබෙන බව. සමහර ග්‍රාමීය පාරවල්වල වැඩ කරමින් තිබුණු බස් එකවත් දැන් වැඩ කරන්නේ නැහැ කියනවා. සම්බන්ධීකරණ කමිටුවලට ගියාම බොහෝදෙනෙක් මේ ප්‍රශ්නය බරපතළ විධියට මතු කරනවා. මේ පිළිබඳවත් ඉක්මනින් අවධානය යොමු කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.ඒ වාගේම ප්‍රවාහනයත් හරියට රටක නහර පද්ධතිය වාගේ බව මම මතක් කරන්න කැමැතියි.

කොවිඩ් වසංගතය පැවති කාලයේ රට lockdown වුණාම සිදු වුණු දේ අපට මතකයි. ප්‍රවාහන පද්ධතිය සාර්ථක නම් විතරයි ගමේ ආර්ථිකය නගරයට යන්නේත්, නගරයේ ආර්ථිකය ගමට එන්නේත් කියන කාරණය මම මතක් කරනවා. අද ගෙනෙන නීති ඇත්තවශයෙන්ම රටකට අවශ්‍ය නීති. ප්‍රමාද වෙලා හරි මේ නීති ගෙනෙන්න ලැබුණු එක ගැන අපි සතුටු වෙනවා. අපි ඒ ගැන අපේ සහාය පළ කරන බව ප්‍රකාශ කරනවා. ඇමතිතුමා විග්‍රහ කළා, අද ගෙනෙන නීතිවලට අමතරව එතුමාගේ සැලසුම් කිහිපයක් ගැන. ඒ හැම එකක්ම කඩිනමින් ගෙනැල්ලා මාරක රිය අනතුරු වළක්වා ගැනීම සඳහා ගත හැකි, ගත යුතු සියලු පියවර ගන්නා හැටියට ඉල්ලා සිටිමින්, මට විනාඩි කිහිපයක් අමතරව ලබා දීම ගැන ඔබතුමාටත් ස්තුති කරමින් මගේ වචන කිහිපය අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. Sunil Rathnasiri. You have 10 minutes.

[අ.භා.12.16]

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා, අද දවසේ ගෙනැල්ලා තිබෙන මෙම නීති දෙක සම්බන්ධයෙන් විපක්ෂයේ පොදු අදහස ඉදිරිපත් කිරීම ගැන. "මේ නීති දෙක මෙයට පෙරාතුව ගෙන ඒමට තිබුණු නීති දෙකක්. නමුත් අද දවසේ හෝ එය ගෙන ඒම සම්බන්ධයෙන් සතුටු වෙනවා" කියලා එතුමා කිව්වා. එතුමන්ලාගේ කාලයේ සිදු කරන්නට බැරි වුණු බොහෝ කරුණු - කාරණා අපි මේ වනකොට ඉෂ්ට සිද්ධ කරමින් ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ කිලෝමීටර් 119,000කට අධික මාර්ග පද්ධතියක් පවතිනවා. ඒ මාර්ග පද්ධතියෙන් කිලෝමීටර් 82,000ක් පමණ ග්‍රාමීය මාර්ග. ඒ බොහොමයක් මාර්ග අබලන් වූ මාර්ග බවට පත් වෙලා තිබුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ වසරකට රිය අනතුරු 23,000කට අධික ප්‍රමාණයක් සිදු වෙනවා. සාමාන්‍යයෙන් ගත්තොත් දිනකට රිය අනතුරු 64කට අධික ප්‍රමාණයක් සිදු වෙනවා. ඒ වාගේම වසරක් තුළදී රිය අනතුරු නිසා මිය යන සංඛ්‍යාව 2,500කට ආසන්නයි. දිනකට ආසන්න වශයෙන් වටිනා මිනිස් ජීවිත 6කට වැඩි ප්‍රමාණයක් මේ හේතුවෙන් අහිමි වීම සිදු වෙනවා.

විශේෂයෙන්ම රිය අනතුරුවලට බලපා තිබෙන එක් ප්‍රධාන සාධකයක් තමයි, මාර්ගවල තිබෙන අබල-දුබලතාව. පසුගිය කාලයේ සිදු වුණු රිය අනතුරු අපි හොඳින් විශ්ලේෂණය කරලා බැලුවාම ඇතැම් අවස්ථාවල රියදුරන් මත් ද්‍රව්‍ය භාවිත කරලා සිටියාද කියන සැකය අපට තිබුණා. අපේ පළමුවැනි නීතිය විධියට මත් ද්‍රව්‍ය භාවිත කර රිය පැදවීම වැළැක්වීමේ නීතිය සම්මත කර ගන්නා මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මේ කාරණය මම සඳහන් කරන්නට ඕනෑ. 2025 වර්ෂයේදී අපේ රටේ පොලීසිය ගංජා කිලෝ 17,000කට අධික ප්‍රමාණයකුත්, අයිස් කිලෝ 3,800කට අධික ප්‍රමාණයකුත්, හෙරොයින් කිලෝ 1,800කට අධික ප්‍රමාණයකුත්, මත්පෙති සහ මත් කරල් 4,048,000කට අධික ප්‍රමාණයකුත් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. මත් ද්‍රව්‍ය භාවිතය සහ රිය අනතුරු අතර සංජානනීය බැඳීමක් තිබෙනවාද කියන සැකය ඇති වෙලා තිබෙනවා, දෛනිකව සිදු වන රිය අනතුරු සංඛ්‍යාව දිහා බැලුවාම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම යටතේ ගෙවුණු අවුරුද්ද තුළ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කාපට් මාර්ග කිලෝමීටර් 29කට ආසන්න ප්‍රමාණයක වැඩ අවසන් කරන්න අපි සමත් වුණා. ඒ සඳහා රුපියල් මිලියන 1,112ක් වැය කරලා තිබෙනවා. විශේෂයෙන්ම කොටලීය පාලම පිළිබඳව අපේ රට විතරක් නොවෙයි, මුළු ලෝකයම කථා වෙන්න ගත්තා. සමහර දරුවෝ මේ කොටලීය පාලමෙන් පහළට වැටිලා මැරුණා. ඒ වාගේම විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ වාගේම මගීන් බස් රථ පිටින් කොටලීය පාලමෙන් පහළට වැටිලා මැරුණා.

දැන් මේ විපක්ෂයේ සිටින, එදා ආණ්ඩුකරණයේ හිටපු ගරු අමාත්‍යවරයාගෙන් බැරිම තැන මාධ්‍යවේදියෙක් ඇහුවා, "ඔයගොල්ලන් මේ කොටලීය පාලම හදන්නේ නැද්ද?" කියලා. "පාලම් හදන්න සල්ලි කොහේද තිබෙන්නේ? සල්ලි හොයලා දෙන්න, අපි පාලම හදලා දෙන්නම්" කියලා හිටපු ඇමතිතුමා ඒ වෙලාවේදී මාධ්‍යවේදියාට තරවටු කරනවා අපි දැක්කා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කොටලීය පාලම හදන්න ආරම්භ කළා. එහි ඇස්තමේන්තු මුදල රුපියල් මිලියන 382ක් වෙනවා. හැබැයි, කොන්ත්‍රාත් මුදල රුපියල් මිලියන 250 දක්වා අඩු කරගෙන අද වනකොට අපි පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කොටලීය පාලම හදන්න පටන් අරගෙන තිබෙනවා.

ඒ වාගේම අපි ඇළහැර, ගමඇල පාලම හදන්න පටන් ගත්තා. එහි ඇස්තමේන්තු මුදල රුපියල් මිලියන 139ක් වෙනවා. අපි එහි කොන්ත්‍රාත් මුදල රුපියල් මිලියන 100ක් දක්වා අඩු කර ගත්තා. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි ගල්ලැල්ල පාලම හදන්න පටන් ගත්තා. එහි ඇස්තමේන්තු මුදල රුපියල් මිලියන 348ක් වෙනවා. අපි එහි කොන්ත්‍රාත් මුදල රුපියල් මිලියන 207 දක්වා අඩු කරගෙන තිබෙනවා. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, හබරණ-මඩකලපුව මාර්ගයේ තිබෙන පාලම, මැදිරිගිරිය පාර ආදී වශයෙන් රුපියල් මිලියන 1,768කට අධික මුදලක් වැය කරලා, 2025 වර්ෂයේදී පමණක් පාලම් සහ පාරවල් විශාල ප්‍රමාණයක් හදලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 වර්ෂය අවසාන වෙලා 2026 නව වර්ෂය ආරම්භ වන අවස්ථාවේදී අපට ආණ්ඩු පක්ෂය විධියටත්, විපක්ෂයට විපක්ෂයේ පොදු කණ්ඩායම හෝ තනි තනි පක්ෂ විධියටත් වශයෙන් අපි හැමෝටම නිවැරදි සහ සත්‍ය

[ගරු සුනිල් රත්නසිරි මහතා]

සමාලෝචනයක් රැගෙන එන්නට පුළුවන්. ආණ්ඩු පක්ෂය විධියට අපේ ගරු ජනාධිපතිතුමා 2025 වර්ෂය ආරම්භයේදීම පාර්ලිමේන්තුවට පැමිණ ප්‍රකාශ කළා, අපි 2025 වර්ෂය අවසාන කරන්නේ ලංකා ඉතිහාසයේ සංචාරකයින් වැඩිම ප්‍රමාණයක් ලංකාව ගමනාන්තය බවට පත් කර ගත්ත වර්ෂය බවට පත් කරගෙන කියලා. 2025 වර්ෂය ආරම්භයේදී කිව්ව ඒ ඉලක්කයට අනුව 2018න් පසු 2,333,000 ඉක්මවපු සංචාරකයින් ප්‍රමාණයක් ලංකාවට රැගෙන එන්නට සමත් වුණා. එතැනින් පසුව ජනාධිපතිතුමා ප්‍රකාශ කළා, විදේශගත ශ්‍රමිකයින්ගේ ප්‍රේෂණ වැඩිම ප්‍රමාණයක් ලංකාවට එවපු වර්ෂය බවට 2025 වර්ෂය පරිවර්තනය කර ගන්නවා කියලා. අපි ඒ ඉලක්කය සම්පූර්ණ කර ගන්නට සමත් වුණා. ඩොලර් බිලියන 7 ඉක්මවපු විදේශගත ශ්‍රමිකයින්ගේ ප්‍රේෂණ ප්‍රමාණයක් ගෙන එන්නටත් අපි සමත් වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමා 2025 වර්ෂය ආරම්භයේදී ප්‍රකාශ කළා, අපි අනිවාර්යයෙන්ම 2025 වර්ෂය අවසාන කරන්නේ වැඩිම රාජ්‍ය ආදායම් ප්‍රමාණය උපයා ගත්ත වර්ෂය බවට පත් කරගෙන කියලා. ඒ අනුව වසර 48කට පසුව -1977න් පසුව- අඩුම අය වැය පරතරය සහිත වර්ෂය බවට 2025 වර්ෂය පත් කර ගන්නට අප සමත් වුණා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තමන්ගේ ආදායම් ඉලක්කය වෙච්ච රුපියල් බිලියන 2,203 ඉක්මවන්නට සමත් වුණා. ඒ වාගේම රේගු දෙපාර්තමේන්තුවට ලබා දීපු බදු ආදායම් ඉලක්කය රුපියල් බිලියන 2,115 ඉක්මවූවාට පසුව සංශෝධිත ඉලක්කයක් ලබා දුන්නා. ඒක රුපියල් බිලියන 2,200 ඉක්මවපු ඉලක්කයක්. අපි බොහොම සන්තෝෂයෙන් කියන්නට ඕනෑ, වසර අවසාන වනකොට රුපියල් බිලියන 2,497 ඉක්මවපු ඉලක්කයකට රේගු දෙපාර්තමේන්තුව ගමන් කළා කියලා. ඒ වාගේම අපේ ඉලක්කයක් තිබුණා, අපනයන ආදායම ඩොලර් බිලියන 17 ඉක්මවපු ඉලක්කයකට ගමන් කරන්න. ඒ ඉලක්කයත් අපි සම්පූර්ණ කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරු සියලු දෙනා නොවුණත් සමහර අය හිතනවා, වාචාලකම දක්ෂතාවය, වාචාලකම තමන්ගේ හැකියාව, මේ සභා ගර්භයට ඇවිල්ලා කුණුහරුප කියන එක දක්ෂතාව සහ මූලාසනයට නිගරු කරන එක දක්ෂතාව කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාචාලකම දක්ෂතාව නම්, කුණුහරුප කියන එක දක්ෂතාව නම් මර්වින් සිල්වාත් අද පාර්ලිමේන්තුවේ ඉන්න ඕනෑ. ඒ වාගේම තිසකුට්ටි ආරච්චි අද පාර්ලිමේන්තුවේ ඉන්නත් ඕනෑ. ජොන්ස්ටන් ප්‍රනාන්දු සිර භාරයේ නොවෙයි, අද පාර්ලිමේන්තුවේ ඉන්න ඕනෑ, ඒගොල්ලන්ගේ වාචාලකම දක්ෂකම නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් අපි කියනවා, "දිට්වා" සුළි කුණාටුවේ බලපෑමට ලක් වෙලා තිබියදීත් ඉතිහාසයේ පළමුවන වතාවට 2026 ජනවාරි පළමුවැනි දා අපි ලංකාව පුරාම ග්‍රාමීය මාර්ග 76ක් හදන්න පටන් ගත්තා කියන එක. ඉතිහාසයේ පළමුවැනි වතාවට තමයි රුපියල් මිලියන 5,000ක් වෙන් කරලා මේ වැඩේ පටන් ගත්තේ කියමින්, මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Gnanamuththu Srineshan. You have eight minutes.

[பி.ப. 12.25]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, மோட்டார் வாகனச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் பற்றிய இன்றைய விவாதத்தில் கலந்துகொள்வதில் மகிழ்ச்சியடைகின்றேன். உண்மையில், 'போதையற்ற தேசம்' உருவாக்கப்பட வேண்டும் என்பது இந்த அரசாங்கத்தின் நிகழ்ச்சிநிரலில் உள்ள விடயமொன்றாக இருக்கின்ற அதேவேளை, இலஞ்சமற்ற போக்குவரத்துப் பொலிஸ் சேவையும் இந்த நாட்டுக்கு கிடைக்க வேண்டுமென்று நாங்கள் விரும்புகின்றோம். ஆனால், இந்தப் போக்குவரத்துப் பொலிஸ் பிரிவில் இலஞ்சம், கையூட்டு இருப்பதாக மக்கள் பரவலாகப் பேசிக் கொள்கின்றார்கள். அதேவேளை, நியாயமான முறையில் பணியாற்றுகின்ற போக்குவரத்துப் பொலிசாரை நாங்கள் குறைத்து மதிப்பிடவில்லை என்ற விடயத்தையும் நான் சுட்டிக்காட்ட விரும்புகிறேன்.

இந்தச் சந்தர்ப்பத்தில், மட்டக்களப்பு மாவட்டத்தில் காணப்படுகின்ற புகையிரதப் போக்குவரத்துச் சேவை தொடர்பாகச் சில விடயங்களைக் குறிப்பிடலாம் என்று நினைக்கின்றேன். மட்டக்களப்பில் 'பாடும் மீன்' என்ற பெயரில் புகையிரதப் போக்குவரத்துச் சேவை காணப்பட்டது. இந்தப் போக்குவரத்துச் சேவையில் ஆரம்பத்தில் 600 பயணிகள் பயணிக்கத்தக்கதாக Romanian வகையைச் சேர்ந்த புகையிரதம் பயன்படுத்தப்பட்டு வந்தது. மட்டக்களப்பு புகையிரத நிலையம் தினமும் கிட்டத்தட்ட 1,000,000 - ஒரு மில்லியன் - ரூபாயை ஈட்டக்கூடிய விதத்தில் அந்தச் சேவை அமைந்திருந்தது. அதன்பிறகு, புகையிரதப் போக்குவரத்துச் சேவையில் மாற்றத்தை ஏற்படுத்தி, இப்போது powerset ரக புகையிரத சேவை நடைபெற்றுக் கொண்டிருக்கின்றது. இந்தப் புகையிரதப் போக்குவரத்துச் சேவையில் பயணிக்கின்றவர்களின் எண்ணிக்கை இப்போது குறைந்து விட்டது. ஏனென்றால், நான் ஆரம்பத்தில் சொன்ன Romanian வகை புகையிரதத்தில் 10 பெட்டிகள் இருந்தமையால் 600 பயணிகள் பயணித்தனர். புகையிரத நிலைய ஆசன முன்பதிவின்மூலமாக ஒரு நாளைக்கு 500,000 ரூபாய் வரை வருவாய் ஈட்டக்கூடிய நிலை காணப்பட்டது. அது மட்டுமல்லாமல், சிற்றுண்டிச்சாலை வசதி அதேபோன்று பொதிகளைக் கொண்டுசெல்லும் சேவை, தபால் சேவை என்பனவும் அதில் காணப்பட்டது.

அதன் பின்னர், powerset புகையிரத ரக சேவை மாற்றப்பட்டதன் காரணமாக, 600 பயணிகள் சென்ற நிலை 350 பயணிகளாகக் குறைக்கப்பட்டதோடு மட்டுமல்லாமல், முன்பதிவின்மூலம் ஈட்டிக்கொண்ட ஐந்து இலட்சம் ரூபாய் வருவாயானது இப்போது இரண்டரை இலட்சம் - மூன்று இலட்சம் வரை குறைந்திருக்கின்றது. மொத்தத்தில், அன்று Romanian set புகையிரத சேவை நடைபெற்றபோது, தினமும் பத்து இலட்சம் ரூபாய் வருவாயை ஈட்டிய அந்தப் புகையிரத நிலையம் இப்போது இரண்டு - மூன்று இலட்சம் ரூபாய் வருவாயை ஈட்டி நட்டத்தில் இயங்குகின்ற நிலை காணப்படுகின்றது. அங்குள்ள மக்களிடமும் புகையிரத நிலைய அதிகாரியிடமும் பேசியபோது அவர்கள், மீளவும் ஏற்கெனவே சேவையிலிருந்த Romanian set ரக புகையிரத சேவையைச் செயற்படுத்த வேண்டும் அல்லது இப்போது இருக்கின்ற powerset ரக புகையிரத சேவையில் மேலும் முதலாம் வகுப்பு, இரண்டாம் வகுப்பு உறங்கல் இருக்கைகளை இணைப்பதன்மூலம் அதனை ஈடுசெய்யலாம் என்ற கருத்தைச் சொன்னார்கள்.

இதில் இன்னுமொரு பிரச்சினை இருக்கின்றது. அதாவது, இப்பொழுது மட்டக்களப்பு - கொழும்பு புகையிரத சேவையானது நேரடியாக இல்லாமல், திருகோணமலைக்குச் சென்று அங்கு மாற்றீடு செய்யப்பட்டு இரண்டு புகையிரதங்களுக்கூடாகப் பயணம் செய்ய வேண்டிய காரணத்தால், 350 பேர் பயணிக்கக்கூடிய புகையிரத்தில் மிகக் குறைவான பயணிகளே பயணம் செய்கின்ற நிலை ஏற்பட்டிருக்கின்றது. நாட்டில் வருவாயை அதிகரிக்க வேண்டுமென நினைக்கின்ற இந்த அரசாங்கம், நிச்சயமாக ஏற்கெனவே சேவையிலிருந்த புகையிரத சேவையைக் கொண்டுவர வேண்டும்.

அத்தோடு, இன்னுமொரு விடயத்தை நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன். ஆரம்பத்தில் கொழும்பிலிருந்து பிற்பகல் 7 மணிக்குப் புறப்படும் புகையிரதமானது அதிகாலை 4 அல்லது 5 மணிக்கு மட்டக்களப்பை வந்தடைகின்றபடியால், அதில் பயணம் செய்கின்ற அலுவலர்கள் - officers - அடுத்தநாள் பணிகளுக்குச் செல்லக்கூடிய வாய்ப்பு இருந்தது. ஒரு நாளில் அதாவது, 24 மணித்தியாலத்துக்குள் கொழும்புக்குச் சென்று மட்டக்களப்பு வரக்கூடியதாக இருந்தது. தற்போது இரவு 11.00 மணிக்கு கொழும்பிலிருந்து புறப்படுகின்றபடியால் மறுநாள் காலை 9.30 மணிக்கு மட்டக்களப்பை வந்தடைகின்றது. இதன் காரணமாக மக்கள் இரண்டு நாட்களை அநாவசியமாகச் செவழிக்க வேண்டிய நிலைமை ஏற்பட்டிருக்கின்றது. ஆனபடியால், பழைய நேரசூசியை - timetableஐ - பின்பற்றவதன் மூலமாக இந்தப் புகையிரதச் சேவையைப் பயன்படுத்துகின்ற மக்களின் எண்ணிக்கையைக் கூட்டுவதோடு, வருவாயை அதிகரித்துக் கொள்ளக்கூடிய வாய்ப்பும் இருக்கின்றதெனக் கூறிக்கொள்ள விரும்புகின்றேன். இந்த விடயம் சம்பந்தமாக போக்குவரத்து அமைச்சின் committee meetingஇலும் எங்களுடைய கௌரவ டாக்டர் சிறிநாத் அவர்களும் சுட்டிக்காட்டியிருந்தார். அதேபோன்று, கடிதங்கள் மூலமாகவும் புகையிரதத் திணைக்களத்துக்கு அறிவித்திருந்தோம். எனவே, இந்த நேரத்தை மாற்றீடு செய்யுமாறு கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்டுக் கொள்கின்றோம். அதிகாரிகளும் இந்த விடயத்தைக் கவனத்திற் கொள்மாறு இந்த இடத்தில் வேண்டிக் கொள்கின்றேன்.

அடுத்து, விளையாட்டுத்துறை பற்றியும் மேலதிகமாகச் சில விடயங்களைக் கூற வேண்டியிருக்கின்றது. இன்றைய விவாதத்திற்கு இந்த விடயம் பொருந்தாதுவிட்டாலும், கௌரவ இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர் கௌரவ சுனில் குமார கமகே அவர்களின் கவனத்துக்குக் கொண்டுவர வேண்டுமென்பதற்காகச் சொல்ல வேண்டிய தேவையிருக்கிறது. மட்டக்களப்பில் கபடி சம்மேளனம் இருக்கின்றது. அங்குள்ள எல். தனுசன் என்பவர் இதில் தேசிய வீரராக மட்டுமல்லாமல், சர்வதேச ரீதியிலும் புகழ் ஈட்டித்தருகின்ற வீரராகக் காணப்படுகின்றார். இவருடைய விளையாட்டுத் திறமை காரணமாக பாகிஸ்தான், இந்தியா, தென் கொரியா, சீனா போன்ற பல நாடுகளுக்குச் சென்று விளையாட்டில் பங்குபற்றி எமது நாட்டுக்குப் பல பதக்கங்களைப் பெற்றுத்தந்தவர். ஆனால், இம்முறை மலேசியாவுக்கான சுற்றுப் பயணத்தின்போது அவர் புறக்கணிக்கப்பட்டிருக்கின்றார். தேசிய ரீதியில் கபடி விளையாட்டில் இரண்டாம் இடத்தில் இருந்தும்கூட, நேர்முகத்தேர்வில் அவரது திறமையைக் கவனத்தில் கொள்ளவில்லை. அத்தோடு, மட்டக்களப்பு கபடி சம்மேளனத்திற்கு உரிய விதத்தில் அறிவித்தல் செய்யாதபடியால், மேலும் சில தகுதியான வீரர்களும் அதில் கலந்துகொள்ள முடியாத துர்ப்பாக்கிய நிலைமை காணப்பட்டிருக்கின்றது. எனவே, கௌரவ இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர் அவர்கள் இந்த விடயத்தைக் கவனத்தில் கொள்ளுமாறு கேட்டுக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, your time is up. Would you please wind up?

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

Sir, give me only a minute.

இதைவிடவும், நான் இன்னும் ஒருசில விடயங்களைச் சொல்லி முடிக்கின்றேன். யானைகளின் தொல்லை என்பது மட்டக்களப்பில் மிகவும் பயங்கரமாக இருக்கின்றது. ஏற்கெனவே சொன்னது போன்று, அங்கு வன இலாகா அலுவலகங்களையும் பணியாட்களின் தொகையையும் அதிகரிக்கவேண்டிய தேவையும் இருக்கின்றபடியால், இந்த விடயத்தைக் கருத்திற் கொள்ளவேண்டும் எனக் கேட்டுக் கொள்கின்றேன்.

மீன்பிடி விடயத்திலும்கூட machine power and manpower என்ற இரண்டு விடயங்கள் பிரச்சினையாக இருக்கின்றது. சில இடங்களில் மீன்பிடியில் ஈடுபடுகின்றவர்கள் மனித வலுக் குறைவான வேளையில் கரைவலைகளை இழுப்பதற்கு உழவு இயந்திரங்களைப் பயன்படுத்தலாமா? என்று கேட்கின்றார்கள். இந்த விடயத்தையும் கடற்றொழில் அமைச்சர் கவனத்திற்கொண்டு உரிய நடவடிக்கையை எடுக்கவேண்டும் என்று கேட்டுக் கொள்கிறேன். அத்தோடு, அங்கிருக்கின்ற பல்கலைக்கழக நியமனங்கள் மற்றும் பீடாதிபதிகள் பற்றி அங்கிருக்கின்ற ஆசிரியர் சங்கம் குறிப்பிட்டிருக்கின்ற விடயம் சம்பந்தமாகவும் கதைக்க வேண்டியிருக்கின்றது. ஆனால், எனக்கு ஒதுக்கப்பட்ட நேரம் கழிந்துவிட்டபடியால், இதனை கௌரவ பிரதம மந்திரியாக இருக்கின்ற கல்வி அமைச்சர் அவர்களின் கவனத்திற்குத் தருகின்றோம். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The ongoing Business of the House shall stay suspended till 1.00 p.m. for lunch.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. **1.00ට** නැවත පවත්වන ලදී.*

*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டுந் தொடங்கிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) Prasanna Gunasena, you have 13 minutes.

[අ.භා.1.00]

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)
Thank you, Hon. Deputy Speaker.

අද දවසේ මාර්ග ආරක්ෂාව පිළිබඳව මෝටර් වාහන පනත යටතේ වූ වැදගත් නියෝග 2ක් සම්බන්ධයෙන් පැවැත්වෙන මේ විවාදයේදී කාරණා කිහිපයක් එකතු කිරීමට මම බලාපොරොත්තු වෙනවා.

මාර්ග අනතුරු නිසා ජීවිත විශාල සංඛ්‍යාවක් අහිමි වෙනවා වාගේම බොහෝ පිරිසක් තුවාල ලබනවා. ඒ කෙනා සමහර විට පවුලක breadwinner වෙන්න පුළුවන්. අපි විශ්වාස කරනවා සංවිධානාත්මක මැදිහත්වීමකින් එකී අනතුරු වළක්වා ගෙන ඒ සෑම ජීවිතයක්ම ආරක්ෂා කර ගන්න හැකි වේවි කියලා. ඒ විශ්වාසය අපට තිබෙනවා.

මාර්ග අනතුරුවල ප්‍රවණතාව වැඩි වෙලා තිබෙන්නේ කෙසේද, අඩු වෙලා තිබෙන්නේ කෙසේද කියලා අපට දැනගන්න පුළුවන්, පසුගිය අවුරුදු කිහිපයක සංඛ්‍යා ලේඛන පිළිබඳව යම්කිසි විමසීමක් කළාට පසුව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2024 වර්ෂය ගත්තොත්, මාරක රිය අනතුරු 2,403ක් වාර්තා වෙනවා. ඒක 2025 වනකොට 2,583ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ මාරක රිය අනතුරු 180කින් වැඩි වෙලා තිබෙනවා. බරපතළ ලෙස හානි සිදු කළ රිය අනතුරු 7,157ක් 2024 වර්ෂයේ වාර්තා වෙනවා. 2025 අවුරුද්දේ ඒක 5,276ක් දක්වා 1,881කින් අඩු කර ගැනීමට අපට හැකියාව ලැබෙනවා. ඒ වාගේම, 2024 වර්ෂයේ මාර්ග අනතුරු නිසා සුළු තුවාල ලැබූ පිරිස 9,996ක් ලෙස වාර්තා වනකොට 2025 අවුරුද්දේ එය තවත් 71කින් වැඩි වෙලා 10,067ක් බවට පත් වෙනවා. ඒ වාගේම, අලාභ හානි ගත්තොත්, 2024 අවුරුද්දේ 5,743යි. 2025 අවුරුද්දේ එය 1,516කින් - තරමක්- අඩු වෙනවා, 4,227ක් විධියට. 2024 අවුරුද්දේ මාර්ගවල සිදු වුණු මාරක රිය අනතුරු, බරපතළ තුවාල සිදු කළ රිය අනතුරු, සුළු සහ අලාභ හානි සිදු කළ රිය අනතුරුවල එකතුව ගත්තොත්, 25,299ක් වෙනවා. 2025 අවුරුද්දේ එය තරමක් අඩු වෙනවා, 22,153ක් විධියට. හැබැයි අපට මෙය සාධනීය ලක්ෂණයක් විධියට බලන්න, දකින්න විධියක් නැහැ, මාරක රිය අනතුරු ප්‍රමාණය වැඩි වෙලා තිබෙන නිසා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මාරක රිය අනතුරුවලට මුල් වන රථවාහන මොනවාද කියන එක පිළිබඳව අපි පොඩි විමසීමක් කරමු. වැඩියෙන්ම අනතුරුවලට ලක් වෙලා තිබෙන්නේ පදිකයන්. 2024 අවුරුද්ද ගත්තොත්, 815යි. 2,521න් 815ක් පදිකයන්. යතුරුපැදිකරුවන් 781යි. මේ දෙකේ එකතුව තමයි වැඩි ප්‍රමාණයක් contribute වෙලා තිබෙන්නේ රිය අනතුරුවලට. 2025 අවුරුද්ද ගත්තත් වැඩි වෙනසක් වෙන්නේ නැහැ. 2025 වර්ෂයේ අනතුරට ලක් වුණු පදිකයන් 720ක් වෙනකොට යතුරුපැදිකරුවන් 713ක් බව සඳහන් වෙනවා. මේ ආකාරයෙන් ගත්තාම, මේ සැලසුම් සකස් කරන කොට පදිකයන් සහ යතුරුපැදිකරුවන් කෙරෙහි වැඩි අවධානයක්, වැඩි සැලකිල්ලක් යොමු කරන්න අපට සිදු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහාමාර්ගවල සිදු වන රිය අනතුරු අපි ඇහැට දකිනවා. ඒවා ගැන අප සංවේදීයි. මොකද, ඒ හැම දේකම දත්ත අපට එනවා. හැබැයි අපි කවුරුත් අවධානය යොමු නොකරන පැත්තක් තිබෙනවා. ඒ තමයි දුම්රියේ ගැටීම නිසා කොච්චර ප්‍රමාණයක් අනතුරුවලට ලක් වෙනවාද කියන එක. දුම්රියේ අලි ගැටීම නම් මාධ්‍යයේ වැඩියෙන්ම ඉස්සිලා පෙනෙනවා, හැමෝගේම කථාබහට ලක් වෙනවා. හැබැයි දුම්රියේ මිනිසුන් ගැටීම නිසා වන අලාභහානි කියන එක එච්චර එළියට එන කාරණාවක් නොවෙයි. දත්ත වශයෙන් ගත්තොත්, දුම්රියේ ගැටීම නිසා 2021 අවුරුද්දේ මිනිස්සු 208ක් මිය යනවා. ඒවා සියදිවි නසා ගැනීම් නිසා වූ මරණ වෙන්නත් පුළුවන්. ඒවා සියදිවි නසා ගැනීම්ද, නැත්නම් දුම්රියේ ගැටීම්ද කියන එක වෙන් කරලා සඳහන් වන දත්ත නැහැ. නමුත් 2021 අවුරුද්දේ ජීවිත 208ක් අහිමි වෙලා තිබෙනවා. එය 2022 අවුරුද්දේ 414ක් වනවා, 2023 අවුරුද්දේ 402ක් වනවා, 2024 අවුරුද්දේ 407ක් වනවා, 2025 අවුරුද්දේ 374ක් වනවා. මේ ආකාරයට ගත්තාම, දුම්රියේ ගැටීම නිසාත් ජීවිත වැඩි ප්‍රමාණයක් අහිමි වෙනවා.

ඒ වාගේම, දුම්රියේ ගැටීම නිසා වාහනවලට සිදු වුණු අනතුරු ගත්තොත්, 2021 අවුරුද්දේ 61ක්, 2022 අවුරුද්දේ 78ක්, 2023 අවුරුද්දේ 74ක්, 2024 අවුරුද්දේ 66ක්, 2025 අවුරුද්දේ 75ක් විධියට වාර්තා වෙනවා. මේ ඉලක්කම් ගත්තොත්, විශාල සංඛ්‍යා දකින්න තිබෙනවා. හැබැයි, මාධ්‍යයෙන් ගොඩක් වෙලාවට අපට දකින්න ලැබෙන්නේ අලි -කකුල් 4 අලි- දුම්රියේ ගැටීම නිසා සිදු වන අනතුරු සම්බන්ධවයි. 2024 අවුරුද්ද ගත්තොත්, දුම්රියේ ගැටීම නිසා අලි 8දෙනෙක් මිය යනවා, 10දෙනෙක් තුවාල - injuries- ලබනවා. එකතුව 18ක් විධියට සඳහන් වෙනවා. 2025 අවුරුද්දේ දුම්රියේ ගැටීම නිසා අලි 14දෙනෙක් මිය යනවා, 8දෙනෙක් තුවාල ලබනවා. දුම්රිය නිසා ජීවිතවලට සිදු වුණු හානි දත්ත වශයෙන් ගත්තාම මේ ආකාරයට තමයි ලේඛනගත වෙන්නේ. මේවා වළක්වාගන්න අමාත්‍යාංශය විධියට අපි මැදිහත් වෙනවා.

ඒ වාගේම ගරු බිමල් රත්නායක ඇමතිතුමාගේ සෘජු මැදිහත්වීම ඒ වෙනුවෙන් තිබෙනවා. මා දන්නා විධියට එතුමා නොමැතිව meeting එකක්වත් conduct කරලා නැහැ. ඒ හැම meeting එකකටම වාගේ එතුමා වාඩි වුණා. මාර්ග ආරක්ෂාව - road safety - පිළිබඳ හැම meeting එකකටම එතුමා directly සම්බන්ධ වුණා. ඒක එතුමා වැඩි උනන්දුවක් දක්වපු, වැඩි බරක් තබපු ක්ෂේත්‍රයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 අවුරුද්දේ අපි මේ අංශය සඳහා මුදල් වෙන් කළා. ඒ මුදල් වෙන් කළ අංශ කිහිපයක් තිබෙනවා. පදිකයන්ට, රිය පදවන්නන්ට අදාළව නීති සම්පාදනය කරලා, ඔවුන් නීතියට යටත් කරලා, එය පොලීසිය මඟින් නියාමනය කරලා, දඬ පැනවීම කරලා, දඬ මුදල් වැඩි කරලා රිය අනතුරු සිදුවීම යම්තාක් දුරකට පාලනය කර ගැනීමේ හැකියාව අපට තිබෙනවා. එක ක්‍රමයක් තමයි ඒක. තවත් කාරණයක් තමයි, වාහනයේ ප්‍රමිතිය. අපි ඒ සම්බන්ධවත් අවධානය යොමු කළා. ඒ වාගේම, තවත් කාරණයක් තිබෙනවා. ඒ තමයි, මාර්ගවල ගුණාත්මකභාවය. මාර්ගවල ගුණාත්මකභාවය අනුවත් අපට යම් ප්‍රමාණයකට මාර්ග අනතුරු අඩු කර ගැනීමේ හැකියාවක් තිබෙනවා. මාර්ග සංවර්ධන අධිකාරිය පැත්තෙන් ගත්තොත්, infrastructure and road safety vote එක යටතේත් මුදල් වෙන් වනවා. අපි ඒ මඟින් chevron signs ගහනවා. එනම්, කඳුකරයේ, බදුල්ල, නුවරඑළිය, මහනුවර ආදි පැතිවල ලොකු bends තිබෙන තැන්වල chevron signs ගහනවා. එතකොට රියැදුරාගේ ඇස ගැටෙනවා, ඉස්සරහින් ලොකු වංගුවක් තිබෙනවා කියලා. එතකොට පොඩි precaution එකක් සපයා ගන්න පුළුවන්. ඒ වාගේම W Beam Crash Barriers ගහන්න පුළුවන්. ඒ කියන්නේ, වංගුවලදී වාහන ගිහිල්ලා හැපුණොත් පෙරළිලා යන්නේ නැති වෙන්න ගහන පොඩි barrier එකක්. තවත් එකක් තමයි side

obstacle boards සවි කිරීම. ඒ කියන්නේ දෙපැත්තේ obstacle එකක් තිබෙනවා කියන සංඥා පුවරු. ඒ වාගේම, pedestrian fencing, flexible guide post වාගේ දේවල් සවි කරන්න පුළුවන්. අපි ඒ සම්බන්ධව විශේෂයෙන්ම අවධානය යොමු කර තිබෙනවා. පැල්මඩුල්ල, ඇඹිලිපිටිය, බදුල්ල, හම්බන්තොට, මහනුවර, නාලන්දා, නුවරඑළිය, අවිස්සාවේල්ල, ගම්පහ වාගේ ප්‍රදේශ කිහිපයක අපි 2025 අවුරුද්දේ ඒවා සවි කළා. ඒ වෙනුවෙන් 2025 අවුරුද්දේ වියදම් වෙච්ච මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 140.084ක් වනවා. ඒ අනුව මාර්ග පද්ධතියේ අඩු පාඩු නිසා සිදු වන රිය අනතුරු අවම කර ගැනීමට කළ යුතු දේ වෙනුවෙන් 2025 වර්ෂය සඳහාත් මුදල් වෙන් කරලා අපි ඒ වැඩ කටයුතු කරගෙන ගිහින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපි 2026 අවුරුද්දේත් මුදල් වෙන් කරනවා. ඒ යටතේත් අපි පැති කිහිපයකින් මුදල් වෙන් කරනවා. එකක් තමයි, safety improvement in high pedestrian areas. ඒ කියන්නේ, දරුවන් ගැවසෙන පාසල් අවට ප්‍රදේශ, එනම් school zones, hospital zones, townships and industrial zones ආදි වශයෙන් ස්ථාන 15ක අවශ්‍ය improvement කිරීම සඳහා රුපියල් මිලියන 362ක මුදලක් වෙන් කරනවා. තවත් එකක් තමයි, ▯afety improvement at hazardous locations. ඒ කියන්නේ, roadside hazards වළක්වා ගන්න visibility improve කිරීම සඳහා pedestrian fencing යොදනවා, ස්ථාන 11ක. W Beam Crash Barriers යොදනවා, ස්ථාන 19ක. ඒ වාගේම chevron signs යොදනවා, ස්ථාන 16ක. ඊළඟට pedestrian-standing areas improve කරන්නත් කටයුතු කරනවා. මේ ආකාරයෙන් අපි 2026 අවුරුද්දේ රුපියල් මිලියන 149.839ක මුදලක් වෙන් කරනවා. ඒ වාගේම supply and installation of safety apparatus, flexible bollards, advanced warning blinkers, flexible guide posts, pedestrian illuminations, flexible boards ආදි වශයෙන් ඉලක්කම් සහිතව සඳහන් වනවා විශාල විස්තරයක්. අපි මේ වෙනුවෙන් වෙන් කරනවා, රුපියල් මිලියන 87.740ක මුදලක්. ඒ අනුව 2026 අවුරුද්දට සම්පූර්ණ මුදල වශයෙන් අපි වෙන් කරනවා, මාර්ග ආරක්ෂාව වෙනුවෙන්, මාර්ග සංවර්ධනය කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 750ක මුදලක්. ඒ සියලු දත්ත මෙතැන තිබෙනවා. දින වකවානු අරගෙන, time plan එකක් අනුව ප්‍රසම්පාදන කටයුතු අවසන් කරලා, සවි කරන දින දක්වා සඳහන් කරලා ඊට අදාළ කටයුතු කරනවා.

ඒ වාගේම 2026 අවුරුද්දේ අපේ අවධානය යොමු වෙනවා, අපේ traffic light system අලුතින් install කරන්න සහ තිබෙන ඒවා improve කරන්න. ඒ සඳහා ස්ථාන 14ක් හඳුනාගෙන තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, installation of TLS system - Traffic Light System - at Angoda Junction on B 435 Road and B 231 and Siri Sumana Mawatha Intersection. ඔන්න ඔය ආකාරයට අපි ස්ථාන 14ක් සඳහා රුපියල් මිලියන 540ක් වෙන් කරනවා, traffic light system එක අලුතින් ඉදි කරන්න සහ දැනටත් සමහර ස්ථානවල තිබෙන ඒවා දියුණු කරන්න. මාර්ග අනතුරු වළක්වා ගැනීම සඳහා නීති පනවන ගමන්, එනම් අණ පනත් හරහා නීති පනවා යම්කිසි ආකාරයකට රියැදුරා නීතිගරුක, විනයගරුක තත්ත්වයට පත් කරන ගමන්, අනෙක් පැත්තෙන් මාර්ග පද්ධතිය දියුණු කළ හැකි සෑම දෙයක් කෙරෙහිම අපි අවධානය යොමු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලය පුරාවටම කථා බහට ලක් වුණා 2025 අවුරුද්දේ අය වැය ලේඛනය හරහා ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කළ මුදල් අපි කෙසේද වියදම් කළේ කියන එක. 2025 අවුරුද්ද අවසානයි, මේ 2026 අවුරුද්ද. විපක්ෂයෙන් ලොකු චෝදනාවකුත් ආවා, ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් මුදල් වෙන් කළාට ඒවා බිමේ වියදම් වුණේ නැහැ කියලා. නමුත් වියදම් වූ මුදල ඉලක්කම් වශයෙන් අපට කියන්න පුළුවන්. මොකද, දැන් අවුරුද්ද අවසාන නිසා ඒක අපට පැහැදිලිව කියන්න පුළුවන්. 2025 අය වැය පෙබරවාරි මාසයේ ඉදිරිපත් කළාට ඒ ඉලක්කම් කිව්වේ සැප්තැම්බර් මාසයේ. ඒ නිසා ඒවා සම්පූර්ණයෙන් වැරදියි. ඒවා විකෘති ලේඛන. එම නිසා මම ඒ කාරණයටත් පොඩි අවධානයක් යොමු කරන්නම්.

2025 අවුරුද්දේ ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කිරීම් ගත්තොත්, transport division එක සඳහා වෙන් වුණු මුදලින් සියයට 60.59ක් අපි වියදම් කරලා තිබෙනවා. ඒ, Indian Credit Line එකේ ගණන අයින් කළාට පසුව එන මුදල. මොකද, ඒක අපට control කළ හැකි දෙයක් නොවෙයි. National Transport Commission එකේ තොරතුරු ගත්තොත්, අපි සියයට 89.47ක් වියදම් කරලා තිබෙනවා; Financial progress එකක් අරගෙන තිබෙනවා. Sri Lanka Transport Board - SLTB -එක ගත්තොත්, financial progress එක සියයට 91.91යි. DMT - Department of Motor Traffic - එක ගත්තොත්, සියයට 62.75ක් වියදම් කරලා තිබෙනවා. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ගත්තොත්, ඒකෙත් Indian Credit Line එකේ ගණන අයින් කළාම වියදම සියයට 79.32ක් විධියට සඳහන් වනවා. ඒ සංඛ්‍යා ලේඛන ගත්තොත්, මූල්‍ය ප්‍රගතිය - financial progress එක - වාගේම භෞතික ප්‍රගතියත් අපි achieve කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම විශේෂයෙන්ම කියන්න ඕනෑ, මාර්ග සංවර්ධන අධිකාරියේ - RDA - highway sector එක ගත්තොත්, අපි සියයට 93ක මූල්‍ය ප්‍රගතියක් - financial progress එකක්- අත් කරගෙන තිබෙන බව. මේ අවුරුද්ද මුළු මාර්ග සංවර්ධන ඉතිහාසයේම ප්‍රාග්ධන වියදම් වැඩියෙන්ම භාවිත කළ අවුරුද්ද. සියයට 93ක් වියදම් කර තිබෙනවා. 2025 අවුරුද්ද සඳහා අපි ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් වෙන් කළ මුදල බිලියන 374.509යි. අපි ඒකෙන් වියදම් කරලා තිබෙනවා, බිලියන 347.713ක්. ඒ කියන්නේ, සියයට 93ක්. මම නැවත වරක් කියනවා, ඉතිහාසයේ සිට ගත්තාම මාර්ග සංවර්ධන අධිකාරිය ප්‍රාග්ධන වියදම් නිසියාකාරයෙන් සහ වැඩියෙන්ම පාවිච්චි කළ වසර 2025 කියලා. ඒ වෙනුවෙන් අමාත්‍යාංශයේ වාගේම, මාර්ග සංවර්ධන අධිකාරියේ සියලු නිලධාරි මණ්ඩලයට අපේ කෘතවේදීතාව පළ කරනවා. එහි විශේෂත්ව තමයි, අපි 2025 වසර සඳහා අය වැය ලේඛනය ඉදිරිපත් කළේ පෙබරවාරි මාසයේ. මාර්තු 31 වාගේ තමයි ඒ කටයුතු ඉවර වුණේ. ඊළඟට, අවුරුදු උත්සව කාලය ආවා; ඡන්දයක් ආවා. අපට වැඩ කරන්න තිබුණේ මාස හයක්, හතක් පමණයි. අවුරුද්දේ අන්තිම මාසය -දෙසැම්බර් මාසය- ගත වුණා "දිට්වා" සුළි කුණාටුව නිසා. අපි මාස හයකින්, හතකින් තමයි මේ ප්‍රගතිය අත් කර ගත්තේ. මෙය පැහැදිව පොත්වල ලියා තබා ගන්න, මම කියනවා, 2026 අවුරුද්දේ මීට වඩා achievement එකකට අපට යන්න පුළුවන් බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇති වූ ආපදා තත්ත්වයෙන් පසුව මේ රට යථා තත්ත්වයට පත් කිරීම සඳහා අපි කෙසේද කැප වුණේ කියන එකත් ඉතිරි විනාඩිය තුළ මා සඳහන් කරන්නම්. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව පැත්තෙන් ගත්තොත්, දුම්රිය ධාවනය යථා තත්ත්වයට පත් කරන්න අපි සෑම උත්සාහයක්ම දැරුවා. ඒ අනුව, කොළඹ සිට රඹුක්කන දක්වා දුම්රිය මාර්ගයේ 2025.12.10වැනි දා වනකොට අපි service එක පටන් ගත්තා. ඒ වාගේම නාවලපිටිය, හැටන් මාර්ගයේ දුම්රිය ධාවන විශේෂයෙන්ම මේ ජනවාරි මාසයේ පටන් ගත්තා. මොකද හේතුව, නාවලපිටියේ පාසල් ළමුන් සඳහා පාසල් යෑමට වෙන මාර්ගයක් නැහැ. පාරවල් විනාශ වෙලා, බස් රථ ධාවනය වෙන්නේ නැහැ.

[ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා]

එතකොට යන්න එන්න තිබෙන එකම මාර්ගය දුම්රිය නිසා අපි දුම්රිය ධාවනය ජනවාරි 06 පටන් ගත්තා. ඊළඟට, අඹේවෙල ඉඳලා බදුල්ල දක්වා දුම්රිය ධාවනය පසුගිය දෙසැම්බර් මාසයේ පටන් ගත්තා. ඊළඟට, Northern Line එක ගත්තොත්, පොල්ගහවෙල ඉඳලා මහව දක්වා 2025.12.10 අපි service එක යථා තත්ත්වයට පත් කළා. මහව ඉඳලා කන්කසන්තුරේ දක්වා 2025.12.25 අපි දුම්රිය ධාවනය පටන් ගත්තා. Batticaloa Line එක ගත්තොත්, මහව ඉඳලා Batticaloa දක්වා 2025.12.25 පටන් ගත්තා. Trincomalee Line එක ගත්තොත්, ගල්ඔය ඉඳලා Trincomalee දක්වා අපි 2025.12.20වැනි දා පටන් ගත්තා. Puttalam Line එක ගත්තොත්, රාගම ඉඳලා නාත්තණ්ඩිය දක්වා 2025.12.14වැනි දා පටන් ගත්තා. නාත්තණ්ඩියේ ඉඳලා Chillaw දක්වා අපි ජනවාරි 01වැනි දා පටන් ගත්තා. Mannar Line එක ගත්තොත්, මැදවච්චියේ ඉඳලා තලෙයිමන්නාරම දක්වා වැඩ පටන් අරගෙන තිබෙනවා. ඒ කටයුතු අපට ඉක්මනින් ඉවර කරන්න පුළුවන් වෙයි කියලා විශ්වාසය තිබෙනවා. දුම්රියක් හිර වෙලා තිබුණා, මාතලේ. අපි Wattegegama Line එකෙන් මාර්ගය තාවකාලිකව ප්‍රතිසංස්කරණය කරලා එම දුම්රිය එළියට අරගෙන තිබෙනවා. දැන් එම දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අපි අවධානය යොමු කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Prasanna Gunasena, your time is up

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණය කියලා මම කථාව අවසන් කරනවා.

අපි මාර්ග සංවර්ධන අධිකාරිය පැත්තෙනුත් විශේෂ මෙහෙයක් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආපදා තත්ත්වය යටතේදී අපට පැවරුණා වගකීමක්. අමාත්‍යාංශය විධියටත්, දේශපාලන ව්‍යාපාරයක් විධියටත් අපට වගකීමක් පැවරුණා. එම වගකීම තමයි අපි ඉෂ්ට කළේ. පෞද්ගලිකව ගත්තොත්, මම සතියක් යන කල් මගේ ආසනයට ගියේ නැහැ. මාධ්‍ය ආයතන දෙකක් මෙතැන ඉන්නවා. ඒ මාධ්‍ය ආයතන දෙකට ඕනෑ නම් ඒක capture කර ගන්න පුළුවන්. මොකද, ඒගොල්ලන්ටත් මොනවා හරි කරුණක් තිබෙන්න ඕනෑ නේ. "සති දෙකක් යන කල් නියෝජ්‍ය ඇමතිතුමා ආසනයට ගියේ නැහැ". ඔන්න ප්‍රචාරය කරන්න පුළුවන් මාධ්‍යයට. හැබැයි, අපට පැවරුණු වගකීමක් තිබුණා. අපේ මන්ත්‍රී කණ්ඩායමට එක් එක් වගකීම් පැවරුණා. ඒ වගකීම් වෙනුවෙන් තමයි අපි කැප වුණේ. එම සාමූහිකත්වයෙන් කැපවීමේ ප්‍රතිඵලය විධියට තමයි අපට කෙටි කාලයක් තුළ ආපදා තත්ත්වයෙන් එළියට එන්න ලැබුණේ. එම නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට දැඩි විශ්වාසයක් තිබෙනවා, 2026 අවුරුද්දෙත්, ඉදිරි වර්ෂ කිහිපය තුළත් අපේ සාමූහික වගකීමෙන්, අපේ සාමූහික එකමුතුවෙන් මේ වෙන් වන මුදල්වලින් ආපදා තත්ත්වය නිසා හානියට පත් වුණු මාර්ග පද්ධති ඇතුළු සියලු දේවල් යථා තත්ත්වයට පත් කරන්න අපට ඉක්මනින් හැකියාව ලැබෙයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ කාලය ලබා දුන්නා ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Chanaka Madugoda, please. You have eight minutes.

[අ.භා. 1.15]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මෝටර් වාහන පනත යටතේ ගෙනෙන නියෝග පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේ එම නියෝග අනුමත කිරීම පිළිබඳව අපේ කැමැත්ත, එකඟත්වය පළමුවෙන්ම ප්‍රකාශ කරන්නට කැමැතියි.

මත්ද්‍රව්‍යවලට විරුද්ධව කටයුතු කරලා දේශපාලනයට ආපු කෙනෙකු විධියට මම, අද මේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් නියෝග තුළ දැකපු විසඳාගත නොහැකි ගැටලු කිහිපයක් පිළිබඳවත් මේ සභාව හමුවේ කරුණු ඉදිරිපත් කරන්න අදහස් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මත්ද්‍රව්‍ය භාවිත කරලා රිය පදවලා අනතුරුවලට ලක්වෙලා, ඒ රිය අනතුරුවලට ආණ්ඩුවේ පාර්ශ්වයට ඇඟිල්ල දිගු වෙච්ච වෙලාවක, ආණ්ඩුවේ ගරු මන්ත්‍රීවරුන්ට ඇඟිල්ල දිගු කරන වෙලාවක, නීතිය ක්‍රියාත්මක වීම පිළිබඳ යම් යම් ගැටලු පිළිබඳවත් මේ සමාජය හමුවේ කතිකාවක් තිබෙන වෙලාවක මෙවැනි නියෝග ගෙන ඒම ඉතාම කාලෝචිත කරුණක් කියා මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මත්ද්‍රව්‍ය භාවිත කර රිය පදවලා යම් නිරීක්ෂණයකට ලක්වෙලා, පොලිස් නිලධාරින් විසින් අත්අඩංගුවට ගත්ත අවස්ථාවක කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් මේ නියෝග තුළ කරුණු අඩංගු වෙලා නැහැ. ඒ නිසා මම ඒ කාරණයත් අවධානයට යොමු කරන්න කැමැතියි. අත්අඩංගුවට ගත්ත මොහොතේ සිට කොතරම් කාලයක් තුළ මත්ද්‍රව්‍ය පිළිබඳව කරන පරීක්ෂණ කළ යුතුද කියන කාරණය පිළිබඳ හරි නිර්වචනයක් මේ තුළ නැහැ කියන කාරණය මා සිහිපත් කරනවා. ඒ කාලය පිළිබඳ නිර්වචනයක් නොමැති වීම නිසා ඒ සිදු කරන පරීක්ෂණ තුළින් ලැබෙන ප්‍රතිඵලයේ වාස්තවිකභාවය පිළිබඳව ගැටලු මතු වෙනවාය කියන කාරණයත් මම මේ මොහොතේ සිහිපත් කරනවා. ඒ වාගේම, ඒ ලබා ගන්නා samplesවල ආරක්ෂිතභාවය පිළිබඳවත් මේ ගැසට් පත්‍රයේ කිසිම සඳහනක් නැහැ. ඒ නිසා මේ කරුණු කිහිපය පිළිබඳව යම් අවධානයක් යොමු කරන්න පුළුවන් නම් හොඳයි කියන කාරණය සිහිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මොහොතේ රට හමුවේ තිබෙන යම් ගැටලුවක් පාර්ලිමේන්තුව හමුවේ තබන්නත් මම මේ අවස්ථාව යොදා ගන්නවා. මේ මොහොත වන විට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සේවයේ නියුතු අයගේ රැකියාවේ විශාල අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. මෙතෙක් කල් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සේවකයන්ගේ අතිකාල දීමනා ලබා දුන්නේ ජීවන වියදම් දීමනාවට ගළපලා. නමුත්, නව වැටුප් සංශෝධනයෙන් ඒ ජීවන වියදම් දීමනාව ඉවත් කරලා අතිකාල දීමනාව ගණනය කරන තැනට පත්වෙලා තිබෙනවා. මෙහි තිබෙන ඉතාම අසාධාරණ කරුණ තමයි, අතිකාල දීමනා

ලබා දීමේදී සලකා නොබලන ජීවන වියදම් දීමනාව, EPF, ETFවලට කපා හැරීමේදී සලකා බැලීම. තවත් විධියකට කියනවා නම්, සේවකයන්ගේ වැටුප වැඩිවීමේදී ජීවන වියදම් දීමනාව සලකා බලන්නේ නැහැ. හැබැයි, වැටුපෙන් අඩු කිරීමේදී, වැටුපෙන් කපා හැරීමේදී ජීවන වියදම් දීමනාව සලකා බලනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක එක්තරා ආකාරයකට සේවකයන් මර්දනයට ලක් කිරීමක්.

ඒ වාගේම, පසුගිය වැටුප් සංශෝධනයේදී රාජ්‍ය සේවකයන්ට ලබා දුන් අන්තර් දීමනා මූලික වැටුපට එකතු කළා. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සේවයේ නියුතු අය අර්ධ රාජ්‍ය සේවකයන් වුණත්, ඔවුන් වෘත්තීය අරගළ කරලා 2021 සිට ඒ අන්තර් දීමනාව දිනාගෙන තිබෙනවා. හැබැයි, එදා අන්තර් දීමනාව දිනා ගැනීමේදී ඔබ, ඔබේ පක්ෂය විධියට ඒ සඳහා සහයෝගය දුන්නත්, අද ඔබ ආණ්ඩුව කරනකොට ඒ සේවකයන්ගේ අන්තර් දීමනාව වන රුපියල් 2,500ක දීමනාව කපා හැර තිබෙනවා. ඒ වාගේම, වාර්ෂික බෝනස් මුදල විශාල ප්‍රමාණයකින් අඩු කරලා තිබෙනවා. මේ සියල්ලෙන්ම පෙනෙන්නේ සේවකයන්ගේ ආර්ථික වෘද්ධිය ධෛර්යවත් කරන දේවල් අද කෙමෙන් කෙමෙන් ඉවත් කරමින්, ඔවුන් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවලට තල්ලු කරමින් මේ ආණ්ඩුව කටයුතු කරනවාය කියන කාරණයයි. ඒ වාගේම, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරින්ට තානාපති සේවය සඳහා තිබෙන ප්‍රවේශය අද අහුරලා තිබෙනවා. සිංගප්පූරුවේ consul තනතුර, ඊශ්‍රායලයේ දෙවන ලේකම් තනතුර සඳහා තවම පත්වීම් කරලා නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ තනතුරු දෙක විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරින්ට තිබෙන අයිතියක්. නීතිපති දෙපාර්තමේන්තුවෙන්, ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් විවිධ මත ප්‍රකාශ කර තිබෙනවා ඒක ලබා දෙන්න කියලා.

නමුත්, අද මේ ආණ්ඩුව තමන්ට හිතවත්, තමන්ගේ දේශපාලනයට නතු වෙච්ච නිලධාරින් පත් කිරීම වෙනුවෙන් කල් මරනවාද කියන කාරණයත් අපි අහන්න කැමැතියි.

මේ රටේ තරුණ තරුණියන් දහස් ගණනකට ජීවිතය සාර්ථක කර ගන්න උදවු කරපු රටවල් දෙකක් තමයි කොරියාව සහ ඊශ්‍රායලය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඒ රටවල් දෙකට රැකියා සඳහා යැවීම සම්බන්ධයෙන් විශාල ගැටලු මතු වෙලා තිබෙනවා. විශේෂයෙන් 2004 අපේ ආණ්ඩුව තිබෙනකොට තමයි කොරියානු රැකියා සඳහා EPS රැකියා වැඩසටහන හඳුන්වා දුන්නේ. පසුගිය වසරේ ඉඳන් එම කොරියානු රැකියා කෝටාව අඩු වෙලා තිබෙනවා. දත්ත විධියට බැලුවොත්, අපි 2021දී 5,137ක් යවලා තිබෙනවා; 2023දී 4,766ක් යවලා තිබෙනවා; 2024දී 5,020ක් යවලා තිබෙනවා. නමුත් 2025 වසරේදී යවලා තිබෙන්නේ 3,595යි. ඒක අඩු වෙලා තිබෙනවා. අද මේ වෙනකොට EPS වෙබ් අඩවියේ නම් 2,500කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා, තවම ගිවිසුම්ගත කර ගන්න බැරිව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2,500කට අධික එම පිරිස කොරියානු රැකියා සඳහා සුදුසුකම් ලබලා, ඒ සඳහා විභාග සමත් වෙලා, වෛද්‍ය පරීක්ෂණ සමත් වෙලා ඉන්නවා. හැබැයි මේ වනවිට ඒ සියලුදෙනාට විශාල අවදානමක් තිබෙනවා. අද ඔවුන්ගේ අනාගත සිහිනය බොඳවෙමින් තිබෙනවා. නමුත් මේ ආණ්ඩුව, විදේශ කටයුතු, විදේශ රැකියා අමාත්‍යාංශය, තානාපති කාර්යාල මේ ගැටලු පිළිබඳව ඉතා සැහැල්ලු, නිද්‍රාශීලී ප්‍රතිපත්තියක් අනුව කටයුතු කරමින් ඉන්නවා. ඒ නිසා මේ තරුණ තරුණියන්ට තිබෙන ඒ අවස්ථාව වෙනුවෙන් ඔබතුමන්ලාගේ මැදිහත්වීම ලබා දෙන්න කියන කාරණය මේ මොහොතේ ඉතාමත් ගෞරවයෙන් සිහිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ විදුහල්පතිවරුන්ගේ ස්ථාන මාරුවීම් ක්‍රියාවලිය අසාධාරණයට ලක් වෙලා තිබෙනවා. එම ස්ථාන මාරුවීම් පටිපාටියේදී ශ්‍රේණිය සහ ජ්‍යෙෂ්ඨත්වය සලකා බලා නැහැ. අද මේ ආණ්ඩුව තමන්ට හිතවත්, තමන්ට ගැති, තමන්ට එකඟ විදුහල්පතිවරුන්ට අවස්ථාව ලබා දීම වෙනුවෙන් වෙනත් ක්‍රියාමාර්ග ගනිමින් සිටිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා ඒ පිළිබඳව ගරු අධ්‍යාපන ඇමතිතුමියගේ අවධානය යොමු කරන්න කියන කාරණයත් අපි මේ මොහොතේ සිහිපත් කරන්න කැමැතියි.

ගාල්ල දිස්ත්‍රික්කයේ පැවැති ප්‍රගති සමාලෝචන රැස්වීමේ සිදු වුණේ මොකක්ද? ඉතිහාසය වෙනස් කරන්න ආපු ආණ්ඩුවක් මෙවැනි කටයුත්තක් කරයි කියලා අපි හිතුවේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයේදී 2026.01.06 දින වාර්ෂික ප්‍රගති සමාලෝචන රැස්වීම පැවැත් වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිහාසයේ කවදාවත් සිදු නොකළ කටයුත්තක් එහිදී සිදු වුණා. ඒ ගැන ආණ්ඩුව ලජ්ජා වෙන්න ඕනෑ. එවැනි මර්දනකාරී ක්‍රියාවලියක් අපි මේ ආණ්ඩුවෙන් බලාපොරොත්තු වුණේ නැහැ. තමන්ට විරුද්ධ මත දරන පක්ෂ, තමන්ට විරුද්ධ මත දරන දේශපාලන කණ්ඩායම් මේ විධියට මර්දනය කරයි කියලා අපි හිතුවේ නැහැ. විශේෂයෙන්ම නාගොඩ, වැලිවිටිය-දිවිතුර, රත්ගම, නෙළුව, බෙන්තොට ඇතුළු අනික් ප්‍රාදේශීය සභාවල සභාපතිවරු එම ශ්‍රවණාගාරයෙන් ඉවත් කරන්න කටයුතු කරලා තිබෙනවා. තමන්ගේ දේශපාලන පක්ෂයේ සභාපතිවරු, නිලධාරින්, අමාත්‍යාංශ ලේකම්වරුන් විතරක් එකතු කරගෙන ඒ ප්‍රගති සමාලෝචන රැස්වීම තියලා තිබුණා. ඒ සම්බන්ධයෙන් අපේ දැඩි විරෝධය මේ මොහොතේ ඉදිරිපත් කරන්න කැමැතියි. අපි ආණ්ඩුවෙන් අහනවා, විපක්ෂයේ කණ්ඩායම් එකතු කරගෙන ප්‍රගති සමාලෝචන රැස්වීමක්වත් තියන්න බැරි ඇයි කියලා. අපි මේ ආණ්ඩුවට චෝදනා කරනවා. විශේෂයෙන්ම ගාල්ල දිස්ත්‍රික්කයේ නාගොඩ, වැලිවිටිය-දිවිතුර, රත්ගම, නෙළුව, බෙන්තොට ප්‍රාදේශීය සභාවල සභාපතිවරු ශ්‍රවණාගාරයෙන් ඉවත් කිරීම පිළිබඳව අපි කනගාටු වෙනවා. සජබය වෙන්න පුළුවන්, එක්සත් ජාතික පක්ෂය වෙන්න පුළුවන්, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ වෙන්න පුළුවන්, ඒ පෙරමුණු තුනම විපක්ෂයේ කණ්ඩායම්. විපක්ෂයේ මතය මර්දනය කරන්න ගත්ත උත්සාහය තුළින් ඒ දිස්ත්‍රික්කයේ, ප්‍රදේශයේ ජනතාවගේ අවස්ථාව තමයි නැති කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇක්ටන් සාමි කියලා තිබෙනවා "බලය මිනිසා දූෂණය කරයි, අධික බලය මිනිසා අත්‍යන්තයෙන්ම දූෂණය කරයි" කියලා. අපි මේ ආණ්ඩුවට කියනවා ඒ පිළිබඳව අවබෝධය තියාගෙන කටයුතු කරන්න කියලා. මේ විධියට කටයුතු කළොත් ඔබතුමන්ලාගේ දේශපාලනයේ අවසානයත් ඒ තුළින්ම ඉදිරියට යාවි කියන කාරණයත් සිහිපත් කරමින්, අද දවසේ ඉදිරිපත් කර තිබෙන නියෝග පිළිබඳව අපේ එකඟත්වය පළ කරමින්, මට අවස්ථාව ලබා දීම සම්බන්ධව ස්තුති කරමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Dr.) Nishantha Samaraweera. You have eight minutes.

[අ.භා. 1.24]

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කර තිබෙන නියෝග පිළිබඳව පවත්වන විවාදයේදී අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම ගැන මම බෙහෙවින්ම සතුටු වෙනවා. අතිශය වැදගත් කාරණා කිහිපයක් පිළිබඳව තමයි අද දවසේ මේ විවාදය පැවැත්වෙන්නේ. මේ රටේ ජනතාව ප්‍රධාන වශයෙන්ම මහා මාර්ග පද්ධතිය පාවිච්චි කරන්නේ ප්‍රවාහන අවශ්‍යතා වෙනුවෙන්. ඒ වෙනුවෙන්ම තමයි මහා මාර්ග පද්ධතිය design කරලා තිබෙන්නේ, සකස් කරලා තිබෙන්නේ.

නමුත්, ලංකාව වාගේ රටවල මහා මාර්ග පද්ධතිය ප්‍රවාහන අවශ්‍යතාවෙන් බාහිර බොහෝ කටයුතුවලට භාවිත වෙන බව අපි දන්නවා. ඒකත් එක්කම මතු වෙන විශේෂ කාරණයක් විධියට, වාහන ධාවනයේදී රියදුරන් විසින් මත් ද්‍රව්‍ය පාවිච්චි කරලා මාර්ගයේ ධාවන කටයුතුවල යෙදීම කියන කාරණයත් ඇතුළත් වෙනවා.

මම වසර 20කට වැඩි කාලයක් රෝහල්වල සේවය කරලා තිබෙනවා. ඒ වාගේම මොළයේ ශල්‍යකර්ම සිදු කරන ස්නායු ශල්‍ය වෛද්‍ය ඒකකයේ අවුරුදු පහක විතර කාලයක් වැඩ කළා. මට තිබෙන විශේෂ අත්දැකීමක් තමයි, මත්ද්‍රව්‍ය පාවිච්චි කරලා අනතුරට ලක්වෙන රියැදුරන්. බොහෝවිට මෝටර් සයිකල් ධාවනකරුවන්, රියදුරන් මුළු රථ එළිවනතුරු රෝහලට ගේනවා. අපට සෑම දිනයකම ඒ අනතුරුවලට ලක් වෙලා ගෙනෙන අයට ප්‍රතිකාර කරන්න සිද්ධ වෙලා තිබෙනවා. රටේ ජාතික ධනයෙන් විශාල ප්‍රමාණයක් ඒ වෙනුවෙන් වැය කරනවා. අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා වාගේම, average එකක් විධියට ගත්තොත්, අවුරුද්දකට 3,000ක විතර මරණ ප්‍රමාණයක්, දැඩි තුවාලවලට - critical injuriesවලට - ලක් වෙන 8,000ක විතර කණ්ඩායමක් මේ සමාජයේ ඉන්නවා. එහෙම අවුරුදු පහක, දහයක කාලයක් ගත්තාම, සමාජයට ඉතා විශාල හානියක් කරමින් තමයි, ඒ රිය අනතුරු සිද්ධ වෙන්නේ. එයින් සියයට 80කට වාගේ වගකියන්න ඕනෑ, මත්ද්‍රව්‍ය සහ මත්පැන් භාවිත කර සිදු කරන රිය ධාවනය. ඒ නිසා මම නැවතත් අවධාරණය කරනවා, මේක අත්‍යවශ්‍ය නියෝගයක්, මේ වෙනුවෙන් අපි සියලුදෙනා එකාවන්ව එකතු වෙලා, කටයුතු කරන්න ඕනෑ කියන එක.

මම කලින් කිව්වා වාගේම මාර්ග භාවිත කිරීම සම්බන්ධයෙන් ගත්තොත්, අපේ රටේ මාර්ග භාවිත කරන අදහස විධියට තිබෙන්නේ, "කොහොම හරි යන්නම්" කියන සංකල්පය. ඒ සංකල්පයෙන් තමයි වාහන පාරට ගන්නේ. ඒ කියන්නේ, ඇත්තටම මාර්ග පද්ධතිය කොහොම හැදුවත්, වාහනවල තත්ත්වය මොකක් වුණත්, අපි මේ සියලු නීති-රීති, පද්ධති ගොඩනැඟුවත්, මාර්ග පද්ධතිය ඉතා හොඳට ගොඩ නැඟුවත් අපිට කරන්න තව අත්‍යවශ්‍ය කොටසක් තිබෙනවා. ඒ තමයි, මේ රටේ මාර්ගවල ධාවනයේ යෙදෙන රියදුරන් වාගේම මාර්ගය භාවිත කරන මඟීන් ප්‍රධාන වශයෙන්ම මාර්ගය භාවිත කිරීමේ අරමුණ සහ ඒ මොහොතේ ඔවුන්ගේ මනසේ පවත්වා ගෙන යා යුතු තත්ත්වය පිළිබඳව සාකච්ඡාවක් තිබෙන්න ඕනෑ. අපේ රටේ මාර්ග භාවිතයේ theme එක වෙලා තිබෙන්නේ, "කොහොම හරි යන්නම්" කියන concept එක. විශේෂයෙන්ම, මෝටර් සයිකල්, ත්‍රී -වීලර් සහ අනිකුත් කුඩා වාහන පාරට ගත්තාම අපි දකින්නේ, "කොහොම හරි යනවා" කියන සංකල්පයෙන් ධාවනය කරනවා මිසක්, මාර්ග නීති පිළිපැදලා, මාර්ගය පිළිබඳ අවධානයෙන්, ඊළඟට වෙන්නේ මොකක්ද කියලා අවධානයෙන් පාරේ යන ස්වභාවයක් නොවෙයි. ඒ නිසා මාර්ගය භාවිත කිරීමේ, "Go anyway" කියන theme එක මුළුමනින්ම පරාජය කළ යුතුව තිබෙනවා. රටක් විධියට මේ පාර්ලිමේන්තුවේ ඉඳලා සියලු සමාජ කණ්ඩායම් එකතු වෙලා "කොහොම හරි යන්නම්" කියන සංකල්පයෙන් - theme එකෙන් - වාහන පාරට දමන එක නතර කර ගන්න ඕනෑ. මොකද, ඒකෙන් තමයි දැඩි අනතුරු වෙන්නේ.

අපි පසුගිය දවස්වල දැකපු, කථා කරපු, ලංකාවේ ජන සමාජය තුළ අතිශය අවධානයට ලක් වෙච්ච විශාල අනතුරු ගත්තොත්, ඒ හැම එකකම නොසැලකිල්ල, අනවධානය, ඒ වාගේම මත් ද්‍රව්‍ය භාවිතය යන සියල්ල තිබෙනවා. අපි කඳුකර මාර්ගයකට අවතීර්ණ වෙනවා නම්, පාර ගැන අවබෝධයෙන් යන්න ඕනෑ. ඒ අනවබෝධය නිසා, ඒ අනවධානය නිසා, ඒ මොහොතේ කටයුතු කරමින් තිබුණු ආකාරය නිසා, ඒ වාගේම මත්ද්‍රව්‍ය භාවිතය නිසා තමයි මිනිස් ජීවිත විශාල ප්‍රමාණයක් අපි අහිමි කරගෙන තිබෙන්නේ. ඒ නිසා මේ රටේ මහා මාර්ගවලට පිවිසීමේදී මහජනතාව අතර තිබෙන "කොහොම හරි අද යනවා" කියන සංකල්පය ඉවත් කර ගන්න ඕනෑ. ඒක අතිශය වැදගත් කාරණයක්. මොකද, මේ රටේ මහා මාර්ග පද්ධතිය භාවිත වෙන්නේ ප්‍රවාහනයට විතරක් නොවෙයි. භාණ්ඩ ප්‍රවාහනය සහ මිනිසාගේ ප්‍රවාහන අවශ්‍යතා වෙනුවෙන් හදලා තිබෙන මහා මාර්ග පද්ධතිය ඇතුළේ තමයි, බොහෝ වෙළෙඳ ව්‍යාපාර ආයතනවල advertisements තිබෙන්නේ. පාරේ තමයි ඔළුබක්කෝ නටන්නේත්.

පාසල් ඇරුණාම සියලුම ළමයි එන්නේ ප්‍රධාන පාරට. ගාල්ලේ තිබෙන විශාල පාසලක් තමයි, සංඝමිත්තා බාලිකා විද්‍යාලය. එම විද්‍යාලයේ ගේට්ටු ඔක්කෝම තිබෙන්නේ ප්‍රධාන පාරට මුහුණලා. පාසල ඇරුණාම පැය ගණනාවක traffic එකක් ඇති වනවා. අපි අතීතයේදී සමත් වුණේ නැහැ, පාසල් දරුවන් මාර්ගයට පිවිසීමේ ක්‍රමය ආරක්ෂිත ආකාරයකට වෙනස් කරන්න. බොහෝ පාසල්වල ගේට්ටු මහාමාර්ගයට තමයි විවෘත වන්නේ. වාහන නවත්වන්නේ, කඩ සාප්පුවලට බඩු පටවන්නේ මහාමාර්ගයේ ඉඳලා. මේ නීති පද්ධතිය සම්පාදනය කරනවාත් එක්කම මහාමාර්ගය භාවිත කිරීම ගැනත් විශාල අවධානයක් යොමු කරන්න ඕනෑ. මත්ද්‍රව්‍ය භාවිතය නිසා ගැටලු මතුවනවා වාගේම මහජනතාවගේ ඔළුවේ, මනසේ මහාමාර්ගය භාවිත කළ යුතු ආකාරය ගැන නිසි වුවමනාවක්, ඇඟැයීමක්, චිත්‍රයක් නොමැතිවීම නිසාත් අනතුරු වළක්වා ගැනීමට නොහැකි වී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපි විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ, වාහනවල තත්ත්වය, මාර්ගවල තත්ත්වය, මාර්ග සංඥාවල තත්ත්වය සහ රටේ තිබෙන visual pollution ගැන. මාර්ග සංඥාව දකින්න තිබෙන අවස්ථාව අහිමි කරපු වෙළෙඳ දැන්වීම් විශාල ප්‍රමාණයක් මහාමාර්ගවල තිබෙනවා. මහාමාර්ගවල තිබෙන සංඥා පුවරු රියදුරුට පෙනෙන්නේ නැහැ, අලෝකවත් කරපු වෙළෙඳ දැන්වීම් නිසා. ඒ නිසා මාර්ග අනතුරු විශාල ප්‍රමාණයක් සිදුවනවා. ඒ නිසා මාර්ගයේ theme එක, ප්‍රවාහනය සඳහාම dedicated වෙච්ච මහාමාර්ග පද්ධතියක් පිළිබඳ සංකල්පය අපි මේ අවස්ථාවේදී රට තුළ ඇති කරන්න ඕනෑ. මේක තමයි රටේ තිබෙන ප්‍රධානම අවශ්‍යතාව. ඒ තුළින් තමයි කලින් කියපු 3,000ක් පමණ වෙච්ච වාර්ෂික මරණ ප්‍රමාණය, 8,000ක් පමණ වෙච්ච critical injuries ප්‍රමාණය සහ 15,000ක් පමණ වෙච්ච minor injuries ප්‍රමාණය වළක්වා ගන්න පුළුවන් වන්නේ. මේ පිළිබඳව අවධානය යොමු කරලා මේ රටේ සිදුවන මාර්ග අනතුරු පුළුවන් තරම් අවම කර ගැනීමට අපි කටයුතු කරන්න ඕනෑ. ඒ සඳහා අප සියලුදෙනාටම අවශ්‍ය ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬවනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Imran Maharoof. You have nine minutes.

[பி.ப. 1.32]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று இந்தச் சபையில் மோட்டார் வாகனச் சட்டத்தின் கீழான ஒழுங்கு விதிகள் சம்பந்தமாக விவாதிக்கப்படுகின்றது. மக்களைப் பாதுகாக்கும் நோக்கில் போக்குவரத்து சம்பந்தமாகக் கொண்டுவரப்படுகின்ற நல்ல சட்ட ஏற்பாடுகளை நாங்கள் எப்பொழுதும் ஆதரிக்கத் தயாராக இருக்கிறோம். அந்த அடிப்படையில் மிகவும் முக்கியத்துவம் வாய்ந்த ஒழுங்கு விதிகள் கொண்டுவரப்பட்டு இருக்கின்றன. அதற்காக முதலில் என்னுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். எனக்கு வழங்கப்பட்டு இருக்கின்ற நேரத்தைக் கருத்திற் கொண்டு, எங்களுடைய மாவட்டத்தில் காணப்படுகின்ற சில பிரச்சினைகளை இந்த இடத்தில் கூறலாமென நினைக்கின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கிண்ணியா விலுள்ள குறிஞ்சாக்கேணி பாலத்தின் நிர்மாணப் பணிகள் முன்னெடுக்கப்படுகின்ற இந்த நேரத்தில், அங்கு படகுப் பாதையொன்று ஆரம்பிக்கப்பட்டு அதன் செயற்பாடுகளும் முன்னெடுக்கப்படுகின்றன. இன்று அந்த இடத்தில் அது பெரும் பிரச்சினையாக மாறியிருக்கின்றது. இந்தப் படகுப் பாதை நிர்மாணிக்கப்பட்டதன் நோக்கம் மற்றும் அதை யார், எவ்வாறு நிர்மாணித்தார்கள் என்ற விடயங்கள் தொடர்பில் இன்று பரவலாகப் பேசப்படுகின்றன. ஏனென்றால், அங்கு நிர்மாணிக்கப்பட்டுள்ள அந்தப் படகுப் பாதைக்கு சுமார் 70 மில்லியன் ரூபாய் செலவழிக்கப்பட்டதாகக் கூறப்படுகின்றது. 70 மில்லியன் ரூபாய் செலவு செய்யப்பட்டு மக்களுக்கான அந்தப் போக்குவரத்து வசதி செய்யப்பட்டுள்ளபோதிலும், அதைச் சரியான முறையில் பயன்படுத்த முடியாத சூழல் காணப்படுகின்றது.

அது அந்த இடத்துக்குக் கொண்டுவரப்பட்ட படகுப் பாதையா அல்லது அதை அந்த இடத்துக்கு வழங்கிவிட்டு, அது அவ்விடத்துக்குப் பொருத்தமில்லையென்ற அடிப்படையில் வேறோர் இடத்துக்கு எடுத்துச் செல்லும் நோக்கத்தில் இச்செயற்பாடு முன்னெடுக்கப்பட்டு இருக்கின்றதா என்ற சந்தேகம் இன்று எங்களுக்கு எழுகின்றது. ஏனெனில், 70 மில்லியன் ரூபாய் செலவழித்து செய்யப்பட்டுள்ள அந்தப் படகுப் பாதையினூடான பயணம் மிகவும் கஷ்டமாக இருக்கின்றது. இன்று அந்த இடத்தில் தண்ணீர் இல்லா விட்டால் அதில் பயணிக்க முடியாத ஒரு சூழல் காணப்படுகின்றது. தண்ணீர் நிறைந்திருக்கின்ற இந்த நேரத்தில் அந்தப் படகுப் பாதையை இயக்க முடியாது விட்டால், வருகின்ற காலங்களில் நீர்மட்டம் இன்னும் குறைவடையும்போது எவ்வாறு அதைப் பயன்படுத்த முடியும் என்பது பற்றி நாங்கள் சிந்திக்கவேண்டி இருக்கின்றது.

இந்த விடயத்தை மக்கள் எங்களுடைய கவனத்துக்குக் கொண்டுவந்தபொழுது, நாங்கள் அந்த இடத்துக்குச் சென்று அதில் பயணித்தோம். அங்கு வேலை செய்கின்றவர்களோடும் அதில் பயணிக்கின்ற மக்களோடும் உரையாடியதன் அடிப்படையில், குறிஞ்சாக்கேணி பிரதேசத்தில் 20 மீற்றர் தூரத்துக்காவது இறங்குதுறை ஒன்றை அமைக்கவேண்டிய தேவைப்பாடு காணப்படுகின்றது. அவ்வாறு அமைத்தால் ஓரளவுக்காவது அதில் பயணிக்கக்கூடிய சூழல் ஏற்படும். ஆகையால், கௌரவ அமைச்சர் அவர்கள் இந்த விடயத்தில் கவனம் செலுத்த வேண்டும். குறிப்பாக, அந்தப் பிரதேசத்தில் இருக்கின்ற மக்களுடைய போக்குவரத்தையும் செலவழிக்கப் பட்டுள்ள 70 மில்லியன் ரூபாயையும் கவனத்திற்கொண்டு, அந்தப் போக்குவரத்தைச் சிறந்த முறையில் மேற்கொள்வதற் காக அங்கு 20 மீற்றர் தூரத்துக்காவது இறங்குதுறையை அமைப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அந்தப் படகுப் பாதையில் 4-5 பேர் வேலை செய்கின்றார்கள். அவர்களும் மிகவும் கஷ்டத்தின் மத்தியிலே வேலை செய்கின்றார்கள். தங்களுடைய அத்தியாவசிய தேவைகளைக்கூட நிறைவேற்றிக்கொள்ள முடியாத ஒரு சூழலிலேதான் அவர்கள் வேலை செய்கின்றார்கள். அதன் காரணமாக அவர்களுக்கும் அந்தப் பிரதேசத்தில் இருக்கின்ற மக்களுக்கும் இடையில் பல்வேறு பிரச்சினைகள் ஏற்படுகின்றன. அந்தப் பிரச்சினைகளுக்குத் தீர்வு வழங்குவதற்காக இன்னும் 2-3 ஊழியர்களை அந்தச் சேவையில் ஈடுபடுத்துவதற்கும் குறித்த போக்குவரத்து வசதிகளை இலகுபடுத்துவதற்குமான நடவடிக்கைகளை கௌரவ அமைச்சர் அவர்கள் முன்னெடுக்க வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, 'நல்லாட்சி' அரசாங்க காலத்தில் எல்லா மாகாணங்களிலும் தொழிற் பயிற்சிக் கல்லூரியை ஆரம்பிப்பதற்கான அனுமதி 2017ஆம் ஆண்டு யூன் மாதம் 20ஆம் திகதி அமைச்சரவையில் பெறப்பட்டு, வேலைகளும் ஆரம்பிக்கப்பட்டன. கிழக்கு மாகாணத்தில் அந்தக் கல்லூரியை திருகோணமலை மாவட்டத்தில் அமைப்பதென தீர்மானம் எடுக்கப்பட்டு, அதற்கான நடவடிக்கைகளும் எடுக்கப்பட்டன. குறிப்பாக, கிண்ணியா பிரதேச செயலாளர் பிரிவின் உப்பாறு கிராம சேவையாளர் பிரிவில் இதனை அமைப்பதற்காக 12 ஏக்கர் காணி LRCஇனால் அடையாளப்படுத்தப்பட்டு, அதை அமைப்பதற்கான நடவடிக்கைகளும் எடுக்கப்பட்டன. 2018ஆம் ஆண்டு வரவு செலவுத்திட்டத்தில்கூட 50 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கப்பட்டு ஆரம்பக்கட்ட வேலைகளும் முன்னெடுக்கப்பட்டன. 2025ஆம் ஆண்டு டிசம்பர் 10ஆம் திகதி நடைபெற்ற அமைச்சரவைக் கூட்டத்தில், தொழிற்கல்வி அமைச்சின் கீழிருக்கின்ற மேற்படி காணி சுற்றுலாத்துறை சம்பந்தமான கல்வி நிறுவனம் ஒன்றை அமைப்பதற்கு வழங்கப்பட்டிருக்கின்ற விடயம் வெளிக்கொண்டுவரப்பட்டு இருக்கின்றது.

அமைச்சரவையில் எடுக்கப்பட்ட தீர்மானங்கள் உட்பட இவ்விடயம் சம்பந்தமான அனைத்து ஆதாரங்களும் என்னிடம் இருக்கின்றன. அவற்றை நான் ஹன்சாட் பதிவுக்காகச் ***சமர்ப்பிக்கின்றேன்.**

எல்லா மாணவர்களும் பல்கலைக்கழகத்துக்குத் தெரிவாக மாட்டார்கள். அவ்வாறு பல்கலைக்கழகத்துக்குத் தெரிவாகாத மாணவர்களுக்காக உருவாக்கப்படுகின்ற இந்த நல்ல விடயத்தில் ஏன் மாற்றத்தை ஏற்படுத்த வேண்டுமென நாங்கள்

---

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

கேட்கின்றோம். ஏனென்றால், அந்தப் பிரதேசத்தில் இன்னும் பல ஏக்கர் காணிகள் காணப்படுகின்றன. அவற்றை சுற்றுலாத்துறைக்குப் பெறக்கூடிய வாய்ப்புகள் இருக்கின்றன. இது எந்த அரசாங்கத்தால் ஆரம்பிக்கப்பட்டாலும், மக்களு டைய தேவைக்காக ஆரம்பிக்கப்பட்ட ஒரு விடயமாகும். ஆகையால், இந்த விடயத்தில் கவனம்செலுத்தி, அதற்கான தீர்வை அரசாங்கம் வழங்க வேண்டும்.

இது சம்பந்தமாக நாங்கள் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரான கௌரவ பிரதம அமைச்சர் அவர்களுக்கு எழுத்துமூலம் வேண்டுகோள் ஒன்றை அந்த நேரத்தில் வழங்கியிருந்தோம். அதனைக் கருத்திற்கொண்டு அந்தப் பிரதேசத்தில் அந்தக் கல்லூரியின் செயற்பாடுகளை முன்னெடுப்பதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும். 2018ஆம் ஆண்டுக்குப் பிறகு ஏற்பட்ட கொவிட் தொற்று, பொருளாதார நெருக்கடி என்பன காரணமாக அந்த விடயத்தை முன்னெடுத்துச் செல்ல முடியாத ஒரு சூழல் காணப்பட்டது. ஆகையால், தற்போதைய அரசாங்கம் அந்த வேலையை இடைநிறுத்தாமல், சிறந்த முறையில் அந்தக் கட்டிடத்தை உருவாக்குவதற்கான நடவடிக்கைகளை எடுக்க வேண்டுமென இந்த இடத்தில் நான் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று ஒவ்வொரு பிரதேசத்திலும் 'பிரஜா சக்தி' என்ற அமைப்பு எந்த அடிப்படையில் அமைக்கப்படுகின்றன என்ற கேள்வி காணப்படுகின்றது. இன்று சனாதிபதி மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்களாக இருந்தாலும் சரி, அமைச்சர்களாக இருந்தாலும் சரி, ஆளும் தரப்பைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர்களாக இருந்தாலும் சரி, தங்களிடம் அரசியல் இல்லை என்றும் தாங்கள் நேர்மையாக மக்களுக்குச் சேவையாற்றுகின்றோம் என்றும் பல இடங்களில் சொல்லி வருவதைப் பார்க்கின்றோம். இவ்வாறு சொல்லப்படுகின்ற நிலையில், இன்று ஒவ்வொரு பிரதேசத்திலும் என்ன நடைபெறுகின்றது என நாங்கள் கேட்க விரும்புகின்றோம். இன்று 'பிரஜா சக்தி' என்ற அமைப்பு மூலம் ஒவ்வொரு GN Divisionக்கும் ஒரு தலைமைத்துவம் வழங்கப்படுகின்றது. இந்தத் தலைமைத்துவம் எந்த அடிப்படையில், யாருக்கு, எதற்காக வழங்கப்படுகின்றது என்பதை நாங்கள் சிந்திக்க வேண்டும்.

கடந்த உள்ளூராட்சி மன்றத் தேர்தலில் NPP சார்பில் போட்டியிட்ட வேட்பாளர்களைத்தான் ஒவ்வொரு GN Divisionகௌும் தலைவர்களாக நியமித்து இருக்கிறார்கள். ஒரு வட்டாரத்தில் இன்னும் இரண்டு அல்லது மூன்று GN Divisions வந்தால், அந்த GN Divisionsக்கும் அவர்களுக்காக குரல்கொடுக்கின்ற அல்லது அவர்களின் பதிவுகளை பதிவேற்றுகின்ற media நண்பர்களையும் அதில் இணைத்துக் கொண்டு இருக்கிறார்கள். இவ்வாறு அவர்களுடைய கட்சியை அரசியல் ரீதியாக வளர்த்துக்கொள்வதற்கான ஒரு முன்னெடுப்பாகத்தான் நாங்கள் இந்தப் 'பிரஜா சக்தி' என்ற அமைப்பைப் பார்க்கின்றோம்.

அந்தந்த வட்டாரத்தில் வென்ற வேட்பாளர்கள் இருக்கிறார்கள்; RDS இருக்கிறது. அதேபோல, அந்தந்தப் பிரதேசத்தில் உள்ளூராட்சி மன்றத் தவிசாளர்கள், உப தவிசாளர்கள் இருக்கிறார்கள். இந்த நிலையில், இவ்வாறானதொரு பிரதிநிதித்துவத்தை உருவாக்கி, இன்று அரசியலை யார் நடத்துகின்றார்கள் என்பதைப் பார்க்க வேண்டும். எந்தவோர் அரசாங்கமும் செய்யாத ஓர் அரசியலை, எந்தக் கட்சியும் செய்யாத ஓர் அரசியலை இன்று NPP அரசாங்கம் செய்துகொண்டு இருக்கின்றது. நாங்கள் இதை 'பிரஜா சக்தி' என்று சொல்வதைவிட, தேசிய மக்கள் சக்தியின் கிளை என்றுதான் சொல்ல வேண்டும். இன்று எங்களுடைய திருகோணமலை மாவட்டத்தில் காணப்படுகின்ற கச்சேரி மற்றும் பிரதேச செயலகங்களை பெலவத்தையிலுள்ள கட்சிக் காரியாலயத்தின் கிளையாக - sub-branchஆக - மாற்றி, அதன்மூலம் அரசியல் செய்துகொண்டு இருக்கின்றார்கள்.

"ஜனநாயகத்தைப் பாதுகாப்போம்", "அரசியலுக்கு அப்பால் மக்களுக்குச் சேவை செய்வோம்" என்றெல்லாம் நீங்கள் சொன்னீர்கள். ஆகையால், தயவுசெய்து ஊடகங்களுக்குக் கருத்துத் தெரிவிப்பதை, ஏனையவர்களை விமர்சிப்பதை விட்டுவிட்டு, மக்களுக்கு நல்ல சேவையை வழங்குவதற்கான நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அந்தந்தப் பிரதேசங்களில் இருக்கின்ற மக்கள் பிரதிநிதி களுக்குரிய கௌரவத்தை வழங்க வேண்டும். இன்று எங்களுடைய மாவட்டத்தில் எந்தவொரு வட்டாரத்திலும் உங்களுடைய கட்சியைச் சேர்ந்தவர்கள் வெற்றியீட்டவில்லை. அதை மனதில் வைத்துக்கொண்டு, அவர்களுக்குப் பதவிகளை வழங்க வேண்டும் என்பதற்காக ஜனநாயகத்துக்கு காலால் உதைக்கின்ற இவ்வாறான செயற்பாடுகளை நீங்கள் முன்னெடுக்கின்றீர்கள். எதிர்க்கட்சி உறுப்பினராக இருந்தாலும், அபிவிருத்தி சார்ந்த நல்ல விடயங்களை என்றும் ஆதரிப்போம். எனவே, ஜனநாயகத்தை மதித்து மக்களுடைய பிரதிநிதிகளுக்கு உரிய இடத்தை நீங்கள் வழங்க வேண்டு மெனக் கேட்டு, எனது உரையை முடித்துக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Manjula Suraweera Arachchi. You have nine minutes.

[අ.භා. 1.42]

**ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මිනිසුන්ගේ ජීවිතවල ආරක්ෂාව, මාර්ග පද්ධතියේ ආරක්ෂාව සම්බන්ධයෙන් ඇති විශේෂ පනතක් යටතේ ගෙනෙන නියෝග සම්බන්ධයෙන් තමයි අද අපි විවාද කරන්නේ. අපි දන්නවා, 2020 වසරේ ඉඳලා 2025 ජූනි 30 දක්වා කාල පරාසය තුළ මේ රටේ මාරක අනතුරු 13,048ක් වාගේම බරපතළ අනතුරු 37,999ක් සිද්ධ වෙලා තිබෙන බව. සුළු තුවාල සහිත වුණත් අනතුරු 50,893ක් පසුගිය වසර කීපය තුළ සිදු වෙලා තිබෙනවා. ඒත් එක්කම අලාභ හා දේපළ හානි පමණක් සිදු වූ අනතුරු 32,053ක් සිදු වෙලා තිබෙනවා. මේ අනතුරු සියල්ල අතරේ වටිනා ජීවිත කුසුම් 13,714ක් අපට අහිමි වෙලා තිබෙනවා. මේ තත්ත්වය බරපතළ ඛේදවාචකයක් බවට පත් වෙලා තිබෙනවා. මේ වෙනකොට රටේ සිදු වන අනතුරුවල ස්වරූපය බැලුවාම අපට පෙනෙනවා, සමස්ත රිය අනතුරුවලින් සියයට 53ක්ම රියදුරන්ගේ වැරැදි නිසා සිදු වන බව. මෑත කාලයේ ප්‍රවණතාවක් බවට පත් වෙමින් තිබෙනවා, රියදුරන්ගේ නොසැලකිලිමත්කම වාගේම ඔවුන් මත්පැන්වලට, විශේෂයෙන්ම අයිස්, කංසා, හෙරොයින්, මත් පෙති වැනි ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම මත අනතුරු සිදු වීම. ඒ හේතුවෙන් අහිංසක මිනිස්සුන්ගේ, පදිකයින්ගේ, පාසල් දරුවන්ගේ ජීවිත බිලි ගනිමින් තිබෙනවා.

විශේෂයෙන්ම මෑත කාලයේ කරන ලද පරීක්ෂණයක ප්‍රතිඵලයක් විධියට පණිවුඩයක් ඇවිල්ලා තිබෙනවා, රිය අනතුරු සිදු කිරීම හේතුවෙන් කොළඹ රියැදුරන් අත්අඩංගුවට ගත්තාට පසුව ඒ අයගෙන් සියයට 45කට ආසන්න ප්‍රමාණයක් අයිස්වලට ඇබ්බැහි වුණු අය කියලා. ඒත් එක්කම ප්‍රවණතාවක් විධියට රියැදුරන් අතරින් සියයට 25කට ආසන්න ප්‍රමාණයක් කංසා, නැත්නම් ගංජාවලට ගොදුරු වෙමින් තිබෙනවා. ලෝකයේ අනෙක් රටවලට වඩා වෙනත් ප්‍රවණතාවකට යමින් සිදු වන මේ විනාශයන් නිසා එක පැත්තකින් වටිනා ජීවිත විශාල ප්‍රමාණයක් බිලි ගනිමින් පවතිනවා. එලෙස අහිමි වන ජීවිතවලට වටිනාකමක්, මිලක් නියම කරන්න බැහැ වාගේම මේ වනකොට රටේ දළ දේශීය නිෂ්පාදනයෙන් විශාල පංගුවක් මේ අනතුරු නිසාවෙන් බරපතළ ලෙස අපෙන් උදුරා ගනිමින් ඉන්නවා.

විශේෂයෙන්ම අපි දන්නවා, මේ අනතුරුවලින් මිනිස්සු මිය යාම නිසා මානව ප්‍රාග්ධනය අපට අහිමි වෙන බවත්, දළ දේශීය නිෂ්පාදනයට එය සෘජුවම බලපාන බවත්. වයස අවුරුදු 15ත්, 60ත් අතර වැඩ කළ හැකි මට්ටමේ හැම ජීවිතයක්ම වටිනවා වුණත්, මේ අනතුරු හේතුවෙන් මානව ප්‍රාග්ධනය අහිමි වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබෙනවා. ඒත් එක්කම අපේ රටට අවශ්‍ය, රටේ වැදගත් කාර්යයන්වල යෙදී ඉන්න පුහුණු ශ්‍රමිකයින්ගේ අහිමි වීමත් මේ තුළ සිද්ධ වෙමින් තිබෙනවා.

මේ අනතුරුත් එක්ක ඇති වුණු තත්ත්වයන් නිසා සෞඛ්‍ය ක්ෂේත්‍රයට ඒ අය වෙනුවෙන් අධික බරක් දරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම මේ අනතුරු නිසා රෝහල්ගත වෙලා ඉන්න අයට ප්‍රතිකාර කිරීම සඳහා විශේෂයෙන්ම වසරකට රුපියල් බිලියන 40ත්, 50ත් අතර මුදල් ප්‍රමාණයක් වැය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. එය දළ දේශීය නිෂ්පාදනයෙන් විශාල පංගුවක්. ඒත් එක්කම මේ අනතුරු හේතුවෙන් දේපළ හානි සිදු වනවා වාගේම යටිතල පහසුකම්වලටත් බරපතළ හානියක් සිදු වනවා. ඒ අනුව, විදුලි කණු සහ ටෙලිෆෝන් කණු කැඩී යෑම, පාරවල්, බෝක්කු කැඩී යෑම වාගේ කාරණා නිසාත් වසරකට රුපියල් බිලියන 60ක්, 70ක් අතර මුදල් ප්‍රමාණයක් විනාශ වෙමින් තිබෙන බව අපි දකිනවා.

අපි දන්නවා, සෑම රුපියල් 100ක්ම උපයනකොට එයින් රුපියල් 3ක නැත්නම් රුපියල් 4ක මුදල් ප්‍රමාණයක්, එහෙම නැත්නම් දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 3ත්, සියයට 4ත් අතර ප්‍රමාණයක් මේ අනතුරු නිසා රටට අහිමි වෙමින් තිබෙන බව. මේක හරියට "දිට්වා" සුළි කුණාටුවත් එක්ක 2026 වසර ගොඩනඟන්න දළ දේශීය නිෂ්පාදනයෙන් පංගුවක් විධියට මුදල් ගන්න එක හා සමානයි. දීර්ඝ කාලයක් තිස්සේ මේ තත්ත්වය ප්‍රවණතාවක් බවට පත් වෙමින්, අනතුරු නිසා වටිනා ජීවිත, දේපළ විනාශ වෙනකොට ජනතාව ගෙවන බදු මුදල්, නිෂ්පාදනයේ වටිනාකම් අනවශ්‍ය පරිදි නාස්ති වීමක් සිදු වනවා.

මේ රට නිවැරදි පැත්තට ගොඩනඟන්න අදාළ වන මුදල් ප්‍රමාණයන් වෙන් කරන්න තිබෙන ඉඩ පවා අපට මේ නිසා අහිමි වෙමින් තිබෙනවා. ඒ නිසා ආණ්ඩුව මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරලා තිබෙනවා. ඒ අනුව, අලුත් පනත් කෙටුම්පත් සහ නීති සම්මත කරමින් මේ රට ශිෂ්ට සම්පන්න තැනකට ගෙනෙන්නත්, රියැදුරන්, පාසල් දරුවන් ඇතුළු සියලු දෙනා රකින වැඩ පිළිවෙළක් හදන්නත් ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය යෝජනා කිරීම සම්බන්ධයෙන් අපි ස්තුතිවන්ත වෙනවා.

ඒත් එක්කම මම මේ වෙලාවේදී විශේෂ කාරණයක් කියන්න ඕනෑ. විශේෂයෙන්ම ආපදා තත්ත්වයත් එක්ක බිඳ වැටුණු දිස්ත්‍රික්කයක් තමයි, නුවරඑළිය දිස්ත්‍රික්කය. බොහෝ දෙනෙක් කිව්වා, තවම මොනවත් වෙලා නැහැ, වන්දි ගෙවලා නැහැ, රුපියල් 25,000 දීමනාව ගෙවලා නැහැ, රුපියල් 50,000 දීමනාව ගෙවලා නැහැ, පාසල් දරුවන්ට රුපියල් 15,000 දීමනාව දීලා නැහැ කියලා. ඒ වාගේ සංවාදත් මම පසුගිය දවස්වල අහගෙන හිටියා. මහ පොළොවේ ජීවත් වන අය නොවෙයි, ඒ විධියට සංවාද, විවේචන කළේ. වෙන කොහේ හරි තැනක කියන දෙයක්, එහෙම නැත්නම් මාධ්‍යයෙන් කියන දෙයක් අල්ලාගෙන මහ පොළොවට බැහැපු නැති අය අපට විවේචන ටිකක් ඉදිරිපත් කරලා තිබුණා. අපි ආණ්ඩුව හැටියට කියන්න කැමැතියි, මේ වනකොට නුවරඑළිය දිස්ත්‍රික්කයේ 8,127කට රුපියල් 25,000 දීමනාව ලබා දීලා තිබෙන බව. එය, සියයට සියයක ප්‍රමාණයක්. ඒ වාගේම රුපියල් 50,000 දීමනාව 1,190කට ලබා දීලා තිබෙනවා. පාසල් දරුවන්ට ලබා දෙන රුපියල් 15,000 දීමනාව 1,306ක් සඳහා ලබා දීලා තිබෙනවා. මේ වෙනකොට ඒ දීමනාව සියයට සියයක්ම දීලා තිබෙනවා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගාවන්ට හානි වුණු 3,274කගේ ගිණුම්වලට මුදල් බැර කරලා තිබෙනවා.

නුවරඑළිය දිස්ත්‍රික්කය ගත්තොත්, විවිධ ක්ෂේත්‍රවලට අදාළ කර්මාන්ත 668ක් විනාශ වෙලා තිබුණා. ඉන් කර්මාන්ත අමාත්‍යාංශයට සම්බන්ධ 173දෙනෙකු අතරින් 143දෙනෙකුට මුදල් ප්‍රදානය කරන්න අදාළ සියලු කටයුතු මේ වෙනකොට සූදානම් කර තිබෙනවා.

ආණ්ඩුව මේ වන විට "දිට්වා" සුළි කුණාටුවෙන් පීඩාවට පත්වෙච්ච ජනතාවට අදාළ සහන දෙනවා වාගේම හානියට පත්වෙච්ච ප්‍රදේශ යළි ස්ථාපිත කිරීමට අදාළවත් දැවැන්ත මෙහෙයුමක් කරමින් ඉන්නවා. අපි දන්නවා, ඒ ආපදාවේදී පාරවල් විශාල ප්‍රමාණයකට හානි වුණා. රුපියල් බිලියන 69.2කට ආසන්න මුදල් ප්‍රමාණයක් වැය වෙනවා, ඒවා යථා තත්ත්වයට පත් කිරීමේ ආරම්භක පියවර ගන්න. එහිදී රුපියල් බිලියන 55කට ආසන්න මුදල් ප්‍රමාණයක් අවශ්‍යයි මධ්‍යම පළාත යථා තත්ත්වයට පත්කර ගන්න, ආරම්භක කටයුතු කරගෙන යන්න. ඒ සියලු කාරණාත් එක්ක "දිට්වා" ප්‍රහාරයට පිළිතුරු දෙන්න 2026 අවුරුද්දට අදාළව ආණ්ඩුව පැත්තෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කරන්න මේ වෙනකොට සූදානම් වෙලා ඉන්නවා; ඉදිරි කටයුතු සූදානම් කරමින් තිබෙනවා.

අපි දන්නවා, දුම්රිය මාර්ග යථා තත්ත්වයට පත් කරන්න අදාළ කටයුතු මේ වන විට කරමින් ඉන්න බව. SLTB බස් ටික ප්‍රවාහනයේ යොදවමින් ඉන්නවා. පාසල් ටික ආරම්භ කරමින් ඉන්නවා. ඒ වාගේම ඉදිරියේදී පැන නැඟෙන තවත් විශේෂ ගැටලු පිළිබඳව මහ පොළොවේ - බිමෙහි - යථාර්ථයත් එක්ක ගළපමින් කරන්න පුළුවන් සියලුම දේ කරන්න සූදානම් වෙලා ඉන්නවා. යළි පදිංචි කිරීම්වලට අදාළ වැඩකටයුතුත් අපි ඉදිරියේදී ආරම්භ කරන්න සූදානම් වෙලා තිබෙනවා. සම්පූර්ණයෙන්ම හානියට පත් 700කට ආසන්න නිවාස ප්‍රමාණයක් වෙනුවෙන් නිවාස වැඩ පිළිවෙළක් පටන් ගන්න අපි සූදානම් වෙලා තිබෙනවා. මේ විධියට තවත් පිම්මක් ලෙස රට ඉස්සරහට යන්න බලපාන සියලු දේවලට අපි මැදිහත් වෙන අතරේ, අපි රියැදුරන්ගෙන් විශේෂයෙන් ඉල්ලා සිටිනවා, ජනතාවගේ ජීවිත ආරක්ෂා කරන ගමන් රටේ ජනතාව වෙනුවෙන් තමන්ගේ වගකීම් හරියට ඉෂ්ට කරන්න කියලා. ජාතික ධනයට, දළ දේශීය නිෂ්පාදනයේ පංගුවට හරිහැටි දායක වෙන්න නම්, රියැදුරන් ලෙස තමන්ගේ කාර්යය හරියට කරලා මුදල් ප්‍රමාණ භාණ්ඩාගාරයේ ඉතිරි කරන්න. ඒවා රටේ සංවර්ධනය සඳහා ඉදිරියේදී යොදා ගන්න පුළුවන්. මෙම වැදගත් අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Ajith P. Perera. You have seven minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Chanaka Madugoda to the Chair?

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. (Prof.) Chrishantha Abeysena - Minister of Science and Technology)
Sir, I propose that the Hon. Chanaka Madugoda do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. CHANAKA MADUGODA took the Chair.*

[අ.භා. 1.53]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ සාකච්ඡාවට ගැනෙන ඉතා වැදගත් මේ රෙගුලාසි අනුමත කරමින්, එහි ඇති වැදගත්කම පිළිබඳව නැවත අවධාරණය කරමින් මට ලැබුණු සීමිත කාලය තුළ වැදගත් කාරණා තුනක් ගැන ඉතා කෙටියෙන් කරුණු දක්වන්න මම කැමැතියි.

අපේ රටේ බලශක්ති ක්ෂේත්‍රය රටේ ආර්ථිකයෙන් තුනෙන් පංගුවක් විතර වෙනවා. අපේ රටේ බලශක්ති ක්ෂේත්‍රය තුළ විදුලි උත්පාදනය සඳහා වැඩිම බරක් තිබෙන ලක්විජය ගල් අඟුරු විදුලි බලාගාරයට ගල් අඟුරු සැපයීමේ ටෙන්ඩරය පිළිබඳ දැවැන්ත ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ඒ ටෙන්ඩරය පිළිබඳ ප්‍රශ්නය මතු වෙනකොටම අපි නිරීක්ෂණය කළා, යම් සමාගමක් වෙනුවෙන් ටෙන්ඩර් කොන්දේසි උල්ලංඝනය කරනවා, ටෙන්ඩර් කොන්දේසි වෙනස් කරනවා, දින වෙනස් කරනවා, ඒ හරහා අමුතු දෙයක්, වෙනස් දෙයක්, වෙනදා නොවිච්ච දෙයක් සිද්ධ වෙන බව. බලාපොරොත්තු වුණු විධියටම ඒ ටෙන්ඩරය දිනාගත්ත සමාගම අද මේ රටට ගෙනැල්ලා තිබෙන්නේ, නියමිත ප්‍රමිතියෙන් තොර ගල් අඟුරු. දකුණු අප්‍රිකාවෙන් ගෙනාවත්, ඒ ගල් අඟුරුවලින් නිෂ්පාදනය කළ හැකි විදුලිය ප්‍රමාණය අපි බලාපොරොත්තු වෙච්ච ටෙන්ඩරයේ තිබුණු කොන්දේසිවලට වඩා අඩුයි. නිෂ්පාදනය කරන්නේ, අඩු විදුලිය ප්‍රමාණයක්. වැඩි ගල් අඟුරු ප්‍රමාණයක් වැය වෙනවා. මේකෙන් රුපියල් කෝටි දහසකට ආසන්න පාඩුවක් සිද්ධ වෙන බවට ඇස්තමේන්තු කර තිබෙනවා.

වංචාවක් සිද්ධ වුණු බව පැහැදිලියි. දූෂණයක් සිද්ධ වුණු බව පැහැදිලියි. ඒකට වගකිව යුත්තේ කවුද? සමස්ත ආණ්ඩුවම වගකියන්න ඕනෑද, බලශක්ති විෂයභාර ඇමතිවරයා වගකියන්න ඕනෑද?

ජනාධිපතිවරයාව, ඇමතිවරයාව මුළා කරලා නිලධාරින් කරපු වංචාවක්ද, නැත්නම් මේ ඔක්කෝම එකතු වෙලා කරපු එකක්ද? මේ ප්‍රශ්නය නිරාකරණය කර ගන්න තිබෙනවා, රටට. අල්ලස, දූෂණය තුරන් කිරීමට පොරොන්දු වෙලා, ඒ පිළිබඳව දිවුරලා, "අපි වෙනස්" කියලා බලයට ආපු මේ රජය මේ රටේ ප්‍රධානතම, බලගතුම, වැඩිම මිලක් තිබෙන ටෙන්ඩරය පිළිබඳව දැවැන්ත දූෂණයක් තමයි සිද්ධ කරලා තිබෙන්නේ. මම මේ කථාව කියන්නේ මම ඒ වගකිව යුතු ධුරය දරපු කාලයේ එකම නඩුවක්වත් නැතුව, එකම පැමිණිල්ලක්වත් නැතුව ගල් අඟුරු මිලදී ගැනීමේ ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අතිශය පිරිසිදුව කරන්නට නායකත්වය දීපු කෙනෙක් හැටියටයි. ඒ වාගේම පාර්ලිමේන්තුවේ බලශක්ති අනුකමිටුවේ සභාපතිවරයා හැටියට. අපි මේ ගැන විමර්ශනය කරනවා. වගකිවයුත්තා කවුද කියලා හොයනවා. ඒක අපේ වගකීමක්; යුතුකමක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ අධිකරණ ක්ෂේත්‍රය අපේ පුරවැසියාගේ අයිතියට අතිශයින්ම බලපානවා. අධිකරණ ක්ෂේත්‍රයේ සිදුවුණු පත්වීම් ගැන, මාරුවීම් ගැන, උසස්වීම් ගැන බැරෑරුම් සාකච්ඡාවක් විශේෂයෙන්ම නීතිඥ ප්‍රජාව තුළ ඇති වෙලා තිබෙනවා. ශ්‍රී ලංකා නීතිඥ සංගමය 2025 දෙසැම්බර් මාසයේ 29වෙනි දා ගරු ජනාධිපතිතුමා අමතා ලිපියක් යවනවා, මහෙස්ත්‍රාත්වරුන් සහ දිසා විනිසුරුවරුන් මහාධිකරණ පත්වීම් සඳහා පත් කරද්දී, අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය විධිමත්ව සිදු විය යුතු බව අවධාරණය කරලා. ජ්‍යෙෂ්ඨත්වය වැදගත්. ජ්‍යෙෂ්ඨත්වය පමණකින්ම උසස්වීම් දිය යුතු නැහැ. නමුත් ඒ ජ්‍යෙෂ්ඨත්වය නොතකා කටයුතු කරනවා නම්, මොකක්ද ප්‍රමිතිය, මොකක්ද ක්‍රියාදාමය, මොකක්ද වැඩ පිළිවෙළ, මොකක්ද ලකුණු දෙන ක්‍රමය, මොකක්ද තෝරා ගන්නා ක්‍රමය කියන කාරණා ගැන විනිවිදභාවයෙන් යුතුව කටයුතු කළ යුතු බව ශ්‍රී ලංකා නීතිඥ සංගමය -මේ රටේ ඉන්න 20,000කට ආසන්න නීතිඥ ප්‍රජාව නියෝජනය කරන ශ්‍රී ලංකා නීතිඥ සංගමය- පක්ෂ, පාට භේදයක් නැතුව තමන්ගේ තීරණය ගරු ජනාධිපතිතුමාට දැනුම් දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ රටේ පාර්ලිමේන්තුවේ විපක්ෂය හැටියට 2025 නොවැම්බර් මාසයේ මේ ප්‍රශ්නය නිරීක්ෂණය කළා. විනිශ්චයකාරවරුන් ගණනාවකගේ ජ්‍යෙෂ්ඨත්වය නොතකා පත් කිරීම් කරපු වෙලාවේ විශේෂයෙන්ම විනිශ්චයකාරවරුන් තුළ සහ මේ රටේ අධිකරණ ක්ෂේත්‍රයේ ඇති වුණු ඒ බලවත් වූ කම්පනය මහජන නියෝජිතයන් වශයෙන් අපටත් දැනුණා. මේ පිළිබඳව ප්‍රවේශමෙන් විමර්ශනය කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීමට අපි යෝජනාවක් ඉදිරිපත් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 (ඇ) ව්‍යවස්ථාව අනුව මහජනතාවගේ අධිකරණ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවටයි. පාර්ලිමේන්තුව තමයි ඒ බලය අධිකරණය වෙත පවරලා තිබෙන්නේ. අධිකරණය ක්‍රියාත්මක වෙන්නේ පාර්ලිමේන්තුවෙන් ලැබුණු බලය පිට. අධිකරණය ක්‍රියාත්මක වෙන්නේ පාර්ලිමේන්තුවෙන් වෙන් කරන මුදල් පිට. අධිකරණය පිළිබඳ මූල්‍ය සම්පත් සැපයීමේ වගකීම, අධීක්ෂණයේ වගකීම අපට තිබෙනවා. ඒ නිසා තමයි මේ පාර්ලිමේන්තුව කිසිම පුද්ගලයෙකුගේ නමක් සඳහන් කරන්නේ නැතුව, විශේෂිත පත් කිරීමක් ගැන කථා කරන්නේ නැතුව, අනාගතයේ උසස්වීම්, මාරුකිරීම් පිළිබඳ මේ කටයුතු විනිවිදභාවයෙන් සහ නියමාකාරයෙන් සිදුවීම සහතික කිරීම සඳහා වන මේ නිගමනයන්වලට එළඹෙන්න, නිර්දේශ කිරීම් සිදු කරන්න අවශ්‍ය කරන විශේෂ කාරක සභාවක් ඉල්ලා සිටියේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වෙනකොට මේ යෝජනාව ඉදිරිපත් කරලා මාස දෙකකට වැඩියි. අඩුම ගාණේ මේ පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට මේ යෝජනාව ඉදිරිපත් කරන්නට කථානායකතුමා අසමත් වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, නියමිත කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම මේ පිළිබඳව ගරු කථානායකතුමාගෙන් පාර්ලිමේන්තුවේ විමසා සිටි විට එතුමා සඳහන් කළා, එතුමා එය සලකා බලන බවත්, නියෝගයක් දෙන බවත්. නමුත් මට හැඟෙනවා, මට දැනෙනවා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

යම් අනීතික දෙයක් කරන්නට යම් අයුතු බලපෑමක් පිට සූදානම් වෙනවා කියලා. මේක පළමුවෙනි වතාව නොවෙයි. මීට කලිනුත්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

පාර්ලිමේන්තුවේ ලේකම් මණ්ඩලයේ මතයට පිටින් ගිහිල්ලා, පාර්ලිමේන්තු සම්ප්‍රදායට පිටින් ගිහිල්ලා, නීතියට පිටින් ගිහිල්ලා විශ්වාස භංග යෝජනාවක් ප්‍රතික්ෂේප කළා. මම කථානායකතුමාට කියනවා, කථානායකතුමනි, නැවත වරක් ඒ වරද කරන්න එපා. අපේ ඉවසීමේ සීමාව යම් තැනක නතර වෙනවා. මේ අධික ප්‍රමාදය, නොගැළපෙන ප්‍රමාදය, මේ රටේ වැදගත්ම කාරණයක් ගැන යුක්තිය පසිඳලීම පිළිබඳව පාර්ලිමේන්තුවට තිබෙන බලය, ජනතාවට තිබෙන බලය පිළිබඳව අපි ප්‍රශ්න කරන විට ඒ සඳහා අවස්ථාව නොදී ඔබ මේ විශේෂ කාරක සභාව ප්‍රතික්ෂේප කරනවා නම්, ඒක බරපතළ වරදක් කියන එකත් ඒ වරද ඔබතුමා කළොත්, ඒක ඔබතුමාගේ තනතුරටත් අගෞරවයක් බවත් මම කියන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අමතර විනාඩි දෙකක් තිබෙනවා. කථා කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද විශේෂ දවසක්. අපගේ කල්‍යාණ මිත්‍ර ලසන්ත වික්‍රමතුංග මැතිතුමා මරා දමලා අද වන කොට වසර 17ක් වෙනවා. ලසන්ත වික්‍රමතුංග කියන්නේ සාමාන්‍ය කෙනෙක් නොවෙයි. ඔහු මේ රටේ දේශපාලනයේ හිටපු කෙනෙක්. ඔහු මේ රටේ හිටපු අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ පෞද්ගලික ලේකම් වශයෙන්ද කටයුතු කරපු කෙනෙක්. ඔහු වෘත්තියෙන් නීතිඥවරයෙක්. ඔහු මේ රටේ පාර්ලිමේන්තු මැතිවරණයකට තරග කරපු කෙනෙක්. ඔහු මේ රටේ ඉතාම බලසම්පන්න පුවත් පතක් වන "The Sunday Leader" පුවත් පතේ එවකට කර්තෘවරයායි. ඒ වාගේම ඔහු බරපතළ දූෂණ ගැන හෙළිදරව් කරන්නට ගවේෂණාත්මක මාධ්‍යවේදියෙකු වශයෙන් කටයුතු කරපු, මේ රටත්, ලෝකයත් දන්නා මාධ්‍යවේදියෙක්. දේශපාලන හේතු මත දූෂකයන් විසින් එතුමාව මරා දමා අදට අවුරුදු 17යි. එතුමා මිය ගිය අවස්ථාවේ එතුමාගේ මෘත ශරීරය ඔසවාගෙන ගිය ඒ පෙළපාළියේ; ඒ අවමංගල්‍ය පෙරහැරේ ඉදිරියෙන්ම බැනරයක් දකුණු අතින් අරගෙන කිලෝමීටර 2ක් පමණ ගිය පුද්ගලයා වශයෙනුයි මම මේ කථාව කියන්නේ. ඒ බැනරයෙන් අපි කිව්වා, යමක්. ඒ, "ඝාටකයා ඝාතකයා!" කියලා. ඒ ඝාතනය කළේ කවුද කියලා අපි කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මතක තබා ගන්න, ලසන්ත වික්‍රමතුංගගේ ඝාතනය පිළිබඳව යුක්තිය ඉටු කරනවා කියලා බලයට ආපු ආණ්ඩු ඒක කරන්න අසමත් වෙලා තිබෙනවා. වර්තමාන ජනාධිපතිතුමාත්, වර්තමාන ආණ්ඩුවත් තමන්ගේ ප්‍රධාන මැතිවරණ පොරොන්දුවක් හැටියට විධිමත් වූ පොරොන්දුවක් දී තිබෙනවා, ලසන්ත වික්‍රමතුංග ඝාතනයේ වග කිව යුතු තැනැත්තන් අධිකරණය ඉදිරියට ගෙනැවිත් නීතිය අනුව කටයුතු කරනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පොරොන්දුව ඉටු කරන්නට අසමත් වෙනවා නම්, නැවත නැවතත් අසමත් වෙනවා නම්, ඒක මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ලබන බලවත් වූ පරාජයක්. 2/3ක බලයක් තිබෙන, විධායක ජනාධිපතිකම තිබෙන, කිසිම බාධාවක් නැතුව යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමය ක්‍රියාත්මක කරන්න පුළුවන් මේ ආණ්ඩුවටත් ලසන්ත වෙනුවෙන් යුක්තිය ඉටු කරන්න බැරි නම්, කවදාවත් ලසන්තට යුක්තියක් ඉෂ්ට වෙන්නේ නැහැ කියන ඒ කනගාටුදායක කාරණයත් මේ අවස්ථාවේ සඳහන් කරමින්, යුක්තිය, සාධාරණය සහ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්, මාධ්‍ය නිදහස වෙනුවෙන් ජීවිතය පරිත්‍යාග කරපු ලසන්ත වික්‍රමතුංග මැතිතුමාට නිවන් සුව ලැබේවා කියාත් ප්‍රාර්ථනා කරමින් මම නතර වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.02]

**ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගැසට් පත්‍ර 2ක පළ කරන ලද මෝටර් වාහන පනත යටතේ වූ නියෝග සම්බන්ධයෙන් අද පැවැත්වෙන මෙම විවාදයේදී අදහස් දැක්වීම සඳහා මටත් අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කලින් කථා කරපු මන්ත්‍රීතුමා සඳහන් කළා, වසර 17කට පෙර ඝාතනයට ලක් වුණු ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංගයන් පිළිබඳව. අපි විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, 2015-2019 කාලයේ යහ පාලන රජය පැවතුණු බවත්, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා ඒ ඝාතකයන් අත්අඩංගුවට ගැනීමට එතුමන්ලාට ඒ කාලයේ ඇති තරම් ඉඩ කඩ තිබුණු බවත්. අද වන විට එම සිදුවීම වෙලා වසර 17ක් ගත වී තිබෙනවා. විශේෂයෙන්ම මේ රජය විශේෂ මැදිහත්වීමක් කරමින් ඉන්නවා කිසිදු දේශපාලන බලහත්කාරකමකින් තොරව, ඔහුගේ ඝාතනයට සම්බන්ධ වුණු ඒ ඝාතකයන් අත් අඩංගුවට ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ප්‍රවාහන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අදහස් දක්වද්දී මා සඳහන් කරන්න කැමැතියි, අප විසින් ඒ හා සම්බන්ධ භෞතික සම්පත් සංවර්ධනය සිදු කරන්න ඕනෑ බව. ඒ වාගේම, අප විසින් ප්‍රවාහන ක්ෂේත්‍රය හා සම්බන්ධ මානව සම්පත ද සංවර්ධනය කරන්න ඕනෑ. භෞතික

[ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා]

සම්පත් හා මානව සම්පත් කියන දෙකේම සංවර්ධනයේ ප්‍රතිඵලයක් වශයෙන් තමයි අපට සමස්ත ප්‍රවාහන ක්ෂේත්‍රයේ සංවර්ධනයක් ඇති කර ගන්න පුළුවන් වන්නේ.

හම්බන්තොට දිස්ත්‍රික්කය ගත්තොත්, අපි පසුගිය වසර තුළ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් 11ක් පැවැත්වුවා, එම දිස්ත්‍රික්කය හා සම්බන්ධ ප්‍රවාහන ක්ෂේත්‍රය ඇතුළු සංවර්ධන යෝජනා පිළිබඳව අදහස් ලබා ගන්න සහ අදාළ ක්‍රියාමාර්ග ගන්න. එම සම්බන්ධීකරණ කමිටු රැස්වීම් 11න් කිසිම එකකට එම දිස්ත්‍රික්කය නියෝජනය කරන විපක්ෂයේ මන්ත්‍රීවරු සහභාගි වුණේ නැහැ. එම දිස්ත්‍රික්කයේ විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු දෙදෙනෙක් ඉන්නවා. ඒ තමයි, ඩී.වී. චානක මන්ත්‍රීතුමා සහ දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා. නමුත් මේ දෙදෙනාගෙන් කිසිවෙක් එම රැස්වීම් 11න් එකකටවත් ආවේ නැහැ. එතුමන්ලා මෙතැනට ඇවිල්ලා එම දිස්ත්‍රික්කයේ සංවර්ධනය ගැන විවිධ අවස්ථාවල විවිධ මත පළ කළාට, එම සම්බන්ධීකරණ කමිටු කිසි එකකට ඒ දෙදෙනාගෙන් කිසිවෙක් ආවේ නැහැ.

ඒ වාගේම, එම දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන ගත්තාම, හම්බන්තොට මහ නගර සභාවේ බලය තිබෙන්නේ, එහි නගරාධිපතිවරයා හැටියට ඉන්නේ සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරයෙක්. විපක්ෂ නායකතුමා මෙවර පළාත් පාලන මැතිවරණයට කලින් අවස්ථා ගණනාවකදී සඳහන් කළා, ඒ ගොල්ලන්ට ඒ ආයතනවල බලය ආවොත් ලෝකයේ තිබෙන දියුණු රටවල තිබෙන පළාත් පාලන ආයතනත් එක්ක සම්බන්ධ කරලා, ඒ පළාත් පාලන ආයතන දියුණු කර ගන්න කටයුතු කරනවා කියලා. ඒ කථාව කියලා දැන් මාස ගණනක් වෙනවා. අපි දන්නේ නැහැ, හම්බන්තොට නගර සභාව ලෝකයේ මොන නගර සභාවත් එක්කද සම්බන්ධ කළේ, කොහොමද ඒක දියුණු කරන්න සැලසුම් කරන්නේ කියලා.

පසුගිය වසර ගත්තාම, හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාර්ග පද්ධතිය සංවර්ධනය කර ගැනීම සඳහා විශේෂයෙන්ම මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ මාර්ග නඩත්තු කරන්න රුපියල් මිලියන 400ක්, මාර්ග වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 354ක්, ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 367ක්, කඩිනම් මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 607ක්, ඒ වාගේම, දුර්වල පාලම් ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 25ක් වෙන් කර තිබුණා. "නගමු පුරවර" පාලම් ව්‍යාපෘතිය සඳහාත් මුදල් වෙන් කළා. ඒක ටිකක් සුවිශේෂියි. පසුගිය රජයන් විසින් ඉදිකිරීම් අතර මග නවතා දමා තිබුණු පාලම් 13ක් තිබෙනවා. වසර ගණනාවක් තිස්සේ ඒ පාලම්වල යකඩ දිරාපත් වෙමින් යනවා. අපි ආණ්ඩු බලය ලබාගෙන පළමු අවුරුද්ද තුළම ඒ පාලම් 13 ප්‍රතිසංස්කරණය කරලා මිනිසුන්ට යන්න පුළුවන් තත්ත්වයට හදන්න විශාල වෙහෙසක් දරමින් ඉන්නවා. අපි දැනටමත් එක පාලමක භෞතික වැඩ ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම, ඉදිරි සති දෙක ඇතුළත අපි බලාපොරොත්තු වෙනවා තවත් පාලම් 3ක වැඩ කටයුතු අවසන් කරලා ඒ පාලම් 13හිම වැඩ පුළුවන් ඉක්මනින් අවසන් කරන්න.

ඒ වාගේම, දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන වැඩසටහනෙන් රුපියල් මිලියන 233ක වැඩ, නඩත්තු වැඩසටහන් යටතේ රුපියල් මිලියන 67ක වැඩ, වෙනත් ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 79.2ක වැඩ, ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ රුපියල් මිලියන 171ක වැඩ අවසන් කරමින් තිබෙනවා. ඒ වාගේම, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව හරහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන පළමු අදියර යටතේ අපි මාර්ග 28ක වැඩ රුපියල් මිලියන 74කට වැඩි මුදලකින් අවසන් කර තිබෙනවා. ඒ වාගේම, ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන දෙවන අදියර යටතේ අපි රුපියල් මිලියන 268කට වඩා වැඩි මුදලක් වියදම් කරමින් තවත් මාර්ග 46ක වැඩ අවසන් කර තිබෙනවා. මෙන්න මේ විධියට අපි එම දිස්ත්‍රික්කය තුළ භෞතික වශයෙන් විශාල සංවර්ධනයක් පසුගිය වසර තුළ සිදු කළා. අපි හිතනවා, භෞතික සංවර්ධනය විතරක් මදි කියලා. එම නිසා ප්‍රවාහන ක්ෂේත්‍රය හා සම්බන්ධ මානව සම්පතත් ඉදිරියට ගැනීමට අප කටයුතු කළ යුතුයි.

වර්තමානය වනකොට මත්ද්‍රව්‍ය සම්බන්ධ අනතුරු විශාල වශයෙන් වැඩි වෙමින් පවතින බව අපි දන්නවා. විශේෂයෙන්ම හම්බන්තොට දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගෙන වැටලීම් සිදු කරමින් අයිස්, හෙරොයින්, ගංජා කිලෝ සිය ගණනින් අත්අඩංගුවට ගනිමින් ඉන්නවා. පොදුවේ හැම ක්ෂේත්‍රයක් ඔස්සේම පැතිරෙන මත්ද්‍රව්‍ය ප්‍රවාහන ක්ෂේත්‍රයටත් ඇවිල්ලා තිබෙනවා. පොදුවේ මහ ජනතාව අතර විශාල සංවාදයක් ගොඩනැඟී තිබෙනවා, විශේෂයෙන්ම දුර ගමන් සේවා සඳහා සම්බන්ධ වන රියැදුරන් මත්ද්‍රව්‍ය භාවිත කරනවා කියලා. ඒක සංඛ්‍යා දත්ත මඟිනුත් ඔප්පු වෙනවා. 2023 වර්ෂය ගත්තොත්, රිය අනතුරු 24,894ක්; මාරක රිය අනතුරු 2,231ක්, මියගිය ගණන 2,341ක් වාර්තා වෙලා තිබෙනවා. මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් වූ රිය අනතුරු 1,193යි. 2024 වර්ෂය ගත්තොත්, රිය අනතුරු 25,299ක්; මාරක රිය අනතුරු 2,403ක්, මියගිය ගණන 2,521ක් වාර්තා වෙලා තිබෙනවා. මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් වූ රිය අනතුරු 759යි. 2025 නොවැම්බර් දක්වා ගත්තොත්, රිය අනතුරු 24,758ක්; මාරක රිය අනතුරු 2,128ක්, මියගිය ගණන 2,275ක් වාර්තා වෙලා තිබෙනවා. මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් වූ රිය අනතුරු 670යි. එහෙම නම් මත්ද්‍රව්‍ය කියන්නේ, රිය අනතුරුවලට බලපාන ප්‍රධාන හේතුවක්. අපි හිතනවා, මේක අපට වළක්වා ගත හැකි හේතුවක් කියලා. අප එය වළක්වා ගැනීමේ අරමුණින් විවිධ අණ පනත්, විවිධ නීති රීති ගෙනෙමින්, දැනුවත් කිරීමේ වැඩසටහන් ඇතුළු බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් තිබෙනවා. මෙයින් එක් වැඩසටහනක් හැටියට ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය මඟින් වෛද්‍යවරුන්, කාර්ය මණ්ඩලය සහ ඒ අවශ්‍ය උපකරණ සහිතව විශේෂ ජංගම බස් රථයක් යොදවා රියැදුරන් මත්ද්‍රව්‍ය භාවිත කරමින් රිය ධාවනය කරනවාද, නැද්ද කියලා නිරීක්ෂණය කරන්න කටයුතු යොදා තිබෙනවා. ගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේ ඉඳලා අපි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරමින් සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

**ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)

මම ඉක්මනින් අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි අද මට්ටක්කුලිය ඩිපෝව කේන්ද්‍ර කරගෙන බස් රථවල රියැදුරන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි බලාපොරොත්තු වෙනවා භෞතික සංවර්ධනයෙන් රට ඉදිරියට ගෙන යනවා වාගේම, මානව සම්පත් සංවර්ධනය තුළිනුත් ඉදිරියට ගෙන යන්න. අපි

බලය ඉල්ලූ මොහොතේ අපි කිව්ව විධියටම මේ අවුරුදු 5 අවසන් වෙනකොට මේ රටේ, මේ සමාජයේ හැම ක්ෂේත්‍රයක්ම වෙනස් කරනවා. ඒ වෙනස් කරන ක්ෂේත්‍ර අතරට ප්‍රවාහන ක්ෂේත්‍රයත් එකතු කරමින් දැවැන්ත පිම්මක් ඉදිරියට යන්න අපි කටයුතු කරමින් ඉන්න බව ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජේ.සී.අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.10]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මෝටර් වාහන පනත යටතේ ගෙනෙන නියෝග ඉදිරිපත් කරලා තිබෙනවා. මීට අදාළ සංඛ්‍යාලේඛන ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා, දැන්. දිනෙන් දින සිදුවන මාර්ග අනතුරු ඉතා ඉහළ මට්ටමකට ඇවිල්ලා තිබෙනවා. අද පාසල් දරුවන් ඇතුළු ගොඩක් අයට නිස්කාරණයේ ජීවිත හානිවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගැසට් පත්‍ර බැලුවාම පෙනෙනවා, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් තමයි මේ අණපනත් ඉදිරිපත් කරන්නේ කියලා. මේ ගොඩක් අනතුරු දිහා බැලුවාම පෙනෙන දෙයක් තමයි, මත්ද්‍රව්‍ය පාවිච්චිය නිසා තමයි මේ අනතුරු සිද්ධ වෙන්නේ කියලා. අපේ හිටපු කථානායකතුමාගෙන් සිද්ධ වූ අනතුර අවස්ථාවේත් අපි දැක්කා පොලීසිය ක්‍රියා කරපු ආකාරය. අපි බීලා යනවා නම් එවෙලේම බැලුමක් පුම්බලා ඒ වාර්තාව ගන්න ඕනෑ. නමුත්, පහුව දා, එහෙම නැත්නම් පැය 24ක් ගිහිල්ලා, පැය 48ක් ගිහිල්ලා ඒක පරීක්ෂා කළාය කියලා ඒකෙන් ප්‍රතිඵලයක් ලැබෙන්නේ නැහැ. අපි මේ තිබෙන තත්ත්වය එක්ක අනිවාර්යයෙන්ම මේවාට නීති ගෙනෙන්න ඕනෑ. හැබැයි, අපි ඉහළ ඉඳන්ම ආදර්ශයක් දෙන්න ඕනෑ. තමුන්නාන්සේලා බලයට ආවේ මේවාට ආදර්ශයක් දෙනවා කියලා, මේවා වැරදියි කියලා. නමුත්, මහජනතාවට දැන් ඒ විශ්වාසය ගැන විශාල ලෙස ගැටලු ගණනාවක් ඇවිල්ලා තිබෙනවා, එක පැත්තකින් නොවෙයි, හැම අංශයකින්ම. ඒ කෙසේ වෙතත්, මම පැහැදිලිවම කියනවා මේ සඳහා තිබෙන අණපනත් දැඩිව ක්‍රියාත්මක කරන්න ඕනෑය කියලා. ඒ සඳහා අවශ්‍ය පහසුකම පොලීසියට ලැබෙන්න ඕනෑ. මොකද, අන්තිමට මේ නීතිය ක්‍රියාත්මක කරන්නේ පාරේ ඉන්න පොලිස් නිලධාරින් නිසා. ඒ නිලධාරින්ට හරියට රාජකාරිය කරන්න ඉඩ ලැබෙන්නේ නැත්නම් මේවා ඉෂ්ට කරගන්න ලැබෙන්නේ නැහැ. දැන් අර සිද්ධියත් එක්ක බැලුවාම අන්තිමට පොලිස් නිලධාරින් වැරදිකාරයෝ බවට පත් වුණා. ඒ නිසා මම පැහැදිලිවම කියන්න ඕනෑ, අපි කොච්චර නීති ගෙනාවත්, මේ පාර්ලිමේන්තුවෙන් කොච්චර අණපනත් සම්මත කළත් ඒවා ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වටපිටාව, ඒ විනය ඇති කළේ නැත්නම් ඒකේ ප්‍රතිඵලයක් ගන්න ලැබෙන්නේ නැහැ කියලා. ඒ නිසා ආණ්ඩුවේ ද, විපක්ෂයේ ද කියලා නැතිව අපි කවුරුත් විශ්වාස කරනවා මේ අනතුරු වළක්වා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්න ඕනෑ කියලා. හැම පැත්තෙන්ම පියවර ගන්න ඕනෑ.

ඒ සඳහා තව පැත්තකින් මාර්ග පිළිබඳවත් බලන්න ඕනෑ. මාර්ග හොඳ තත්ත්වයෙන් පවතින මාර්ග බවට පත් කර ගන්න ඕනෑ. ඒ වාගේම වේග සීමා ගැන දැනුවත් කරන්න ඕනෑ. අද හතරමං හන්දියක් ගත්තාම ඒ ස්ථානයේ අවශ්‍ය traffic lights නැත්නම් අනතුරු වැඩි වෙනවා. ඉස්සර අපි පොඩි කාලයේ - පාසල් යන කාලයේ- දැක්කා "නවතිනු" කියලා බෝඩ් එකක් ගහලා තිබුණා. දැන් හතරමං හන්දියක එහෙම එකක් නැහැ. ඒ බෝඩ් එක හතර පැත්තෙන්ම දාලා තිබුණා. ඒ නිසා මෙන්න මේවා පිළිබඳවත් අවධානය යොමු කරලා ඒ අවශ්‍ය පියවර ගන්න ඕනෑ. මාර්ග සංවර්ධන අධිකාරිය වාගේම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, ප්‍රාදේශීය සභා හා නගර සභා මේවාට අවශ්‍ය පියවර ගන්න ඕනෑ කියන එකත් මතක් කරනවා.

ඒ වාගේම රියැදුරන් සම්බන්ධයෙන් දැඩිව නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ අය මත්ද්‍රව්‍ය භාවිත කරලා යනවා නම් ඒවා නතර කරන්න ඕනෑ. මොකද ගොඩක් අවස්ථාවල අපි දැක්කා, මගී ප්‍රවාහනය කරන බස් රථවලින් අනතුරු සිදු වුණාම එක්කෝ ඒ රියදුරන් බීලා හිටියා, නැත්නම් මත්ද්‍රව්‍ය අරගෙන හිටියා. ඉතින් ඒක විශාල ප්‍රශ්නයක්. මොකද, මගී ප්‍රවාහනය කිරීම සඳහා ඒ රියැදුරන්ට විශේෂ සුදුසුකම් තිබෙන්න ඕනෑ. ඒවා වළක්වන වැඩ පිළිවෙළ පොලීසිය හරහා ක්‍රියාත්මක කරන්න වෙනවා. මොකද, ඒවා බලන්න පාරේ ඉන්නේ පොලිස් නිලධාරින් නිසා.

ඒ වාගේම මේ අනතුරුවලින් වැඩි ප්‍රමාණයක් සිදු වෙලා තිබෙන්නේ ත්‍රිවීල් රථවලින්, නැත්නම් මෝටර්සයිකල්වලින්. අවුරුදු පහක් අරගෙන බැලුවොත් -2020 ඉඳලා 2025 වෙනකල් බැලුවොත්- ඒ හැම අවුරුද්දකම වැඩිම අනතුරු සංඛ්‍යාවක් සිදු වෙලා තිබෙන්නේ ත්‍රිවීල් රථ සහ මෝටර්සයිකල් කියන දෙකෙන්. මේ අනතුරු සිදුවන්නේ සමහර අවස්ථාවල නියමානුකූලව ලයිසන් එකක් නැතුව පදවන අයගෙන් වෙන්න පුළුවන්. ඒ වාගේම, හරි පුරුද්දක් නැතුව පදවන අයගෙන් වෙන්නත් පුළුවන්. නොසැලකිලිමත්භාවය තමයි මාර්ග අනතුරුවලට ප්‍රධාන කාරණයක් බවට පත් වෙලා තිබෙන්නේ.

ඒ වාගේම තමයි මත්ද්‍රව්‍ය භාවිත කර වාහන පැදවීම. අයිස් කියන මත්ද්‍රව්‍යය ගොඩක් අය භාවිත කරනවා. අනතුරු සිදු වුණාට පසුව මාධ්‍ය වාර්තාවල සඳහන් වෙලා තිබෙනවා එවැනි මත්ද්‍රව්‍ය අරගෙන බස් රථ සහ ට්‍රක් රථ පදවපු අය පිළිබඳව. දැනට වසරකට විතර පෙර බොරැල්ල කනත්ත හන්දියේ ට්‍රක් රථයක් ජීවිත ගණනාවක් යට කරගෙන ගියා. බැලුවාම හේතුව මොකක්ද? එයා මත්ද්‍රව්‍ය භාවිත කරලා සහ දවස් ගණනක් අධිකව වෙහෙස වෙලා වැඩ කරලා.

විශේෂයෙන්ම තව කියන්න ඕනෑ කාරණා කිහිපයක් තිබෙනවා. ලෝක බැංකු වාර්තාව අනුව මේ රටේ දුප්පත්කම එන්න එන්නම වැඩි වෙලා තිබෙනවා. ජනතාවගෙන් තුනෙන් එකක් ඉතාම දුප්පත් තැනට පත් වෙලා තිබෙනවා. ඒ සඳහා මේ රජය ගන්නා පියවර ගැන අපට පැහැදීමට බැහැ. වසරක් ගත වෙලාත් ඒ සඳහා අවශ්‍ය පියවර අරගෙන නැහැ. දැන් ඒ තත්ත්වය එන්න එන්නම වැඩි වෙලා තිබෙනවා. පසු ගිය සුළි කුණාටුවෙන් පස්සේ තත්ත්වය ඊට වඩා භයානකයි. විශාල පිරිසක් සුළි කුණාටුවට මුහුණ දුන්නා. ඒ නිසා සමහර අයගේ නිවාස සම්පූර්ණයෙන් අහිමි වෙලා තිබෙනවා. ඒ වාගේම ජලයට අහු වෙච්ච අයගේ සියලු සේසතම ගහගෙන ගිහිල්ලා තිබෙනවා. ඒ අයට රුපියල් 25,000ක් දුන්නා කියලා ගොඩක් මන්ත්‍රීවරු කිව්වා. ඒක හොඳයි. නමුත් රුපියල් 25,000ක් දීලා ගහගෙන ගිය සියලු දේපළවලට වටිනාකමක් දෙන්න පුළුවන්ද? නිවසකට ලක්ෂ 50ක් දෙනවා කියලා කථා කළත් අද වෙනකොට ඒවා ලැබෙන්නේ කාටද? ඒ කියන දේවල් නිසියාකාරයෙන් ක්‍රියාත්මක වෙන්න හරි ක්‍රමයක් තවම සකස් වෙලා නැහැ කියන එක පැහැදිලිවම කියන්න ඕනෑ. ඒ වාගේම නාය ගිහිල්ලා තිබෙන්නේ ගමේ ගෙවල් 10ක් නම්, ඉතුරු ගෙවල්වල ඉන්න අයටත් නිවාසවලින්

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

අයින් වෙන්න  කියනවා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගත්තත් ඒ වාගේ. ඒ අයින් වෙන්න කියලා තිබෙන නිවාසවලට මොනවාද කරන්නේ කියන එක ගැන හරි උත්තරයක් තවම ලබා දීලා නැහැ. ඒක නිසා ඒ නාය ගිය ප්‍රදේශවල ජනතාව ලොකු අසරණභාවයකට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන් ඒ සම්බන්ධයෙන් රජයේ අවධානය යොමු කරන්න ඕනෑ.

විපක්ෂය දිගින් දිගටම ආණ්ඩුවට කිව්වා ආධාර සමුළුවක් කැඳවන්න කියලා. ඒ හරහා ඒ හානි සිදු වුණු අයට අවශ්‍ය සහයෝගය ලෝකයෙන් ලබා ගන්න තිබුණා. නමුත් මේ වෙනකල් රජය අසමත් වෙලා තිබෙනවා, ඒ ආධාර සමුළුවක් කැඳවා ගන්න. දැන් අර රජයේ ගිණුමකට මුදල් දාන්න කියලා තිබෙනවා. මේ හානියත් එක්ක බලන කොට දැනට ලැබිලා තිබෙන ඒ මුදල් ප්‍රමාණයේ විශාල වෙනසක් තිබෙනවා. අපට බිලියන හතක්, අටක් ලැබිලා තිබෙනවා. ලෝක බැංකු වාර්තාව අනුව මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න ශ්‍රී ලංකා රුපියල් බිලියන එක්දහස් ගණනක් ඕනෑ. මේ ඇති වෙලා තිබෙන තත්ත්වය තුළ රටේ ජනතාව නැවත ගොඩනහන්න, ජීවත් කරවන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියලා තමයි අපි ආණ්ඩුවට කියන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සාගරිකා අතාවුද මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.18]

**ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சாகரிகா அதாவுத)
(The Hon. (Mrs.) Sagarika Athauda, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක් සංවර්ධනය වෙන්නට නම් රටක ආර්ථික සංවර්ධනය, මානව සංවර්ධනය, සෞඛ්‍ය, ජීවන තත්ත්වය, සතුට, සමාජ සාධාරණත්වය කියන මේ සියලු ගුණාංගවලින් ඒ රට පෝෂණය වෙන්න ඕනෑ. එතකොට තමයි අපි රටක් සංවර්ධිත රටක් විධියට දකින්නේ. ජාතික ජන බලවේගය රජයේ ඉලක්කය මේ ගුණාංග වර්ධනය කරමින් අපේ රට වේගවත් සංවර්ධන ඉලක්ක කරා හඹාගෙන යාමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය වර්ෂය කියන්නේ වේගවත් සංවර්ධනයක් වෙනුවෙන් බොහොම කෙටි කාල සීමාවක් තුළ අපි කැපවීමෙන් කටයුතු කරපු වර්ෂයක්.

කෑගල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළව රජය මහාමාර්ග අමාත්‍යාංශයට වෙන් කරලා තිබෙනවා, මාර්ග ව්‍යාපෘති 203ක් වෙනුවෙන් රුපියල් මිලියන 245.5ක්. ප්‍රතිශතය සියයට 100ක් විධියට සංවර්ධනය කළ මාර්ග දුර ප්‍රමාණය කිලෝමීටර 26ක්. මේ මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා කෑගල්ල දිස්ත්‍රික්කය සඳහා වෙන් කළ මුදල පමණයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක් භෞතිකව සංවර්ධනය වෙනකොට මාර්ග පද්ධතිය යාවත්කාලීනව සකස් වෙන්න ඕනෑ; ප්‍රවාහන ක්ෂේත්‍රය දියුණු වෙන්න ඕනෑ.

මේ සියලු ප්‍රතිපත්ති එක්ක තමයි අපේ රජය ක්‍රියාත්මක වෙන්නේ. පසුගිය කාලසීමාවේ වැඩි වශයෙන් මාර්ග සංවර්ධනය වෙනුවෙන් අපි මුදල් යෙදෙව්වා. ඒ වාගේම එහි හරි ප්‍රතිඵලයක් ලැබෙන්නට නම් සුරක්ෂිත ප්‍රවාහන ක්ෂේත්‍රයක් තිබෙන්න ඕනෑ කියලා අපි විශ්වාස කරනවා. ඒ අරමුණින් තමයි මෝටර් වාහන පනතේ වගන්තිවලට අදාළව වාහන ධාවනයේදී රියැදුරන් පිළිපැදිය යුතු කරුණු, අධිවේගී මාර්ග භාවිතයේදී මාර්ග ආරක්ෂණ ක්‍රමවේද සම්බන්ධයෙන් නියෝග එකතු කරමින් ගැසට් නිවේදන නිකුත් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාර්ගයක් කියන්නේ රජයකට විතරක් අයිති දෙයක් නොවෙයි. මාර්ගයක් භාවිත කරන්න නම් එය භාවිත කරන රියැදුරන් ඉන්න ඕනෑ, වාහන හිමියන් ඉන්න ඕනෑ, පදිකයන් ඉන්න ඕනෑ, ඒ වාගේම රජය. මේ කණ්ඩායම් හතරම ඒකාබද්ධ වුණොත් තමයි මාර්ග භාවිත කරන එහෙම නැත්නම්, මාර්ග පරිහරණය කරන්නන් බවට පත් වෙන්නේ. රජයකට මාර්ග පද්ධතිය නිසි ලෙස සංවර්ධනය කිරීමෙන්වත්, නීති රීති සකස් කිරීමෙන්වත් අනතුරු අවම කර ගන්නට හැකියාවක් නැහැ.

අපි නිරන්තරයෙන් කථා කරනවා, ලෝකයේ දියුණු ප්‍රවාහන ක්ෂේත්‍රයක් තිබෙන රටවල් ගැන. උදාහරණයක් හැටියට සිංගප්පූරුව, ස්විට්සර්ලන්තය, ජර්මනිය වාගේ රටවල්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා ඒකාබද්ධ ප්‍රවේශ තුළින් තමයි අපි බලාපොරොත්තු වන, අපි අපේක්ෂා කරන ඒ වාගේම ඒ රටවල් දැනට ක්‍රියාත්මක කරන ගුණාත්මක ප්‍රවේශය අරගෙන තිබෙන්නේ. උදාහරණයක් විධියට ගත්තොත්, ජපානය කියන්නේ, අපි දකින විධියට සංස්කෘතික අතින් බොහොම දියුණු රටක්. ඒ රටේ නීති පිළිපැදීම කියන්නේම සංස්කෘතියේ කොටසක්. ස්වීඩනයේ ක්‍රියාත්මක කරනවා, "Vision Zero" කියලා  policy එකක්. එක මිනිසෙකුටවත් මැරෙන්න නොදීමේ අරමුණින් මාර්ග ආරක්ෂණ ක්‍රමවේදයක්, ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වන ආකාරයක් එවැනි රටවල දකින්න ලැබෙනවා. මේ සියල්ල ක්‍රියාත්මක කරන්නට නම් රජයන්ට අවශ්‍ය සහයෝගය ලබා දෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලසීමාව ගත්තොත්, අපේ රටේ අනතුරුවල නිරන්තර වර්ධනයක් තමයි  දිගින් දිගටම දකින්න ලැබෙන්නේ. විශේෂයෙන්ම 2020 සිට 2025.07.31 දින දක්වා වූ සංඛ්‍යාලේඛන මගේ අතේ තිබෙනවා. මාරක අනතුරුවලින් 2020දී 2,363ක්; 2021දී 2,513ක්; 2022දී 2,538ක්; 2023දී 2,341ක්; 2024දී 2,521ක්; 2025 ජුලි 31 දක්වා පමණක් 1,438ක් මිය ගිහිල්ලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මිය යන්නේ මේ රටේ මිනිස්සු. මැරෙන මිනිස්සු කියන්නේ, මේ රටේ පවුල් ඒකක නඩත්තු කරන අය වෙන්න පුළුවන්; ගෙදරක  තාත්තෙක් වෙන්න පුළුවන්, සහෝදරයෙක් වෙන්න පුළුවන්, අම්මෙක් වෙන්න පුළුවන්, දරුවෙක් වෙන්න පුළුවන්. පවුල් ඒකකවල මේ පුරවැසියන් තමයි නොසැලකිලිමත්කම නිසා හෝ අපරීක්ෂාකාරීකම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා මියැදෙන්නේ. වළක්වා ගතයුතු මරණ වළක්වා ගන්නට නම් මේ රටේ නීති රීති පද්ධතිය ශක්තිමත් වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංවේදීම කාරණය තමයි මේ මරණවලින් වැඩි ප්‍රමාණයක් යතුරු පැදිකරුවන් සහ පදිකයන් වීම. මෙවැනි මරණයක් සිද්ධ වුණොත් ඒ පවුල්වලට අත් විඳින්න සිද්ධ වන බේදවාචකය මොන වාගේද කියලා අපි දන්නවා. අධිකරණ ක්ෂේත්‍රයේදී අපි දකිනවා, තාත්තා මිය ගියාට පස්සේ රක්ෂණ වන්දි ලබා ගන්න ඒ අය විඳින මහන්සිය, දරුවන්ගේ අනාගතය ගොඩ නහන්න මව්වරුන්ට  දරන්න සිද්ධ වෙන මහන්සිය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2024 ජනවාරි සිට සැප්තැම්බර් වනකල් මේ රටේ සිදු වුණු 18,394ක් වූ රිය අනතුරු අතරින් තාක්ෂණික දෝෂ නිසා රිය අනතුරු සිද්ධ වෙලා තිබෙන්නේ 18යි, කාලගුණ හේතු නිසා රිය අනතුරු වෙලා තිබෙන්නේ 75යි, ඒ වාගේම යාන්ත්‍රික දෝෂ නිසා රිය අනතුරු වෙලා තිබෙන්නේ 98යි. 18,394කින් ඉතාම සුළු ප්‍රමාණයක් තමයි අපට පාලනය කරගත නොහැකි හේතු නිසා රිය අනතුරු වෙලා තිබෙන්නේ. ඉතිරි රිය අනතුරු බොහොමයකට බලපා තිබෙන්නේ අපරික්ෂාකාරී රිය පැදවීම්, බීමත්කම, වැරදියට ඉස්සර කිරීම, රථ වාහන නීති කඩ කිරීම්, අධික වේගය, පදිකයන්ගේ නොසැලකිලිමත්කම වැනි දේවල්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරියට මෙවැනි අනතුරු වළක්වා ගන්න නම් නීති ප්‍රතිසංස්කරණ අවශ්‍යයි කියන කාරණය සම්බන්ධයෙන් මම මේ සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි. ඒ වෙනුවෙන් තමයි අපේ රජය මේ ක්‍රියාමාර්ග අරගෙන තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, මාර්ග ආරක්ෂණය සහ මාර්ග සංවර්ධනය ගැන දිගින් දිගටම කථා කරපු නිසා, නව රජය විධියට මාර්ග ආරක්ෂණය වාගේම අපි මේ සඳහා නව වැඩ සටහන් මාලාවක් ක්‍රියාත්මක කරනවාය කියන කාරණයත් ඔබතුමාගේ අවධානයට යොමු කරන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවර ලංකා ගමනාගමන මණ්ඩලයට රියැදුරන් සහ කොන්දොස්තරවරුන් බඳවා ගැනීමේ කටයුතු සිදු වෙනවා. කියන්න සතුටුයි, ඉතිහාසයේ පළමුවැනි වතාවට කොන්දොස්තරවරියන් 25දෙනෙක් බඳවා ගන්න මේ රජය අවශ්‍ය කටයුතු සකස් කරලා තිබෙනවා. ඒ වාගේම මෙහි ඉදිරි පියවරක් විධියට දුම්රිය දෙපාර්තමේන්තුවේ තනතුරු සඳහා සුදුසු කාන්තාවන් බඳවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ගත් ගනිමින් ඉන්නවා. ඒ අනුව මේ රටේ සංවර්ධනය වෙනුවෙන් නීති රීති පද්ධතියත් ශක්තිමත් විය යුතුයි කියන කාරණයත් අවසාන වශයෙන් කියමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.25]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මෝටර් වාහන පනත යටතේ වන නියෝග පිළිබඳව තමයි අද සාකච්ඡා කරන්න තිබෙන්නේ. ඒ වාගේම මේ හා සම්බන්ධ තවත් රෙගුලාසි කිහිපයක් තිබෙනවා. මේ නියෝගවලට පුංචි කාරණාවක් ඇතුළත් කරන්න ආණ්ඩුවට අමතක වෙලා තිබෙනවා. "ආණ්ඩුවේ සහ ආණ්ඩුවේ නොවන" කියන එකත් මේ නියෝගවලට ඇතුළත් කරන්න ඕනෑ. මොකද, මෝටර් වාහන පනත කොයි ආකාරයෙන් ක්‍රියාත්මක වුණත්, එහිදී බරපතළම ප්‍රශ්නය එන්නේ පොලීසියටයි කියන එක අපි දැක්කා. මත්ද්‍රව්‍ය සම්බන්ධව කථා කළත් එහෙමයි. මොකද, අවසානයේ පොලීසිය තමයි හිරේ යන්නේ. ආණ්ඩුවේ කෙනෙක් ගියාම ඔහු හිරේ යන්නේ නැහැ, පොලීසියෙන් ආණ්ඩුවේ කෙනෙක්ව ඇල්លුවාම ඒ පොලීසියේ කෙනා හිරේ යනවා. එම නිසා මේක වෙනස් විය යුතුයි කියලා මම පළමුවෙන්ම යෝජනා කරනවා. මොකද, ඒක තමයි යථාර්ථයක් විධියට රටේ සිද්ධ වෙන්නේ.

ඒ වාගේම මේ රටේ සිදු වන ආපදා සම්බන්ධයෙන් කථා කරනකොටත් මේ කාරණාවත් එක්ක සම්බන්ධ වෙලාම කථා කරන්න ඕනෑ. ආපදා සම්බන්ධයෙන් මම ඊයේ ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් ප්‍රශ්න කිහිපයක් ඇහුවා. හැබැයි, ඒ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දුන්නේ නැහැ. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවාට සහ මහා පරිමාණ කර්මාන්තකරුවාට ආපදාවලින් සිදු වූ ව්‍යසනය ගැන තමයි මම ඒ ප්‍රශ්නවලින් ඇහුවේ. ඔවුන් මුහුණ දී තිබෙන ප්‍රශ්න නිරාකරණය කර ගන්නේ කොහොමද, නැත්නම් වන්දියක් ලබා දෙන්නේ කොහොමද, එසේත් නැත්නම් ඔවුන්ගේ ව්‍යාපාර ඉස්සරහට අරගෙන යන්න රජය උදව් කරන්නේ කොහොමද කියලා තමයි මම ඇහුවේ. එතකොට අග්‍රාමාත්‍යතුමිය ප්‍රකාශ කළා, ජනාධිපතිතුමාගේ කාර්යාලයෙන් විමසලා පිළිතුරු ලබා දෙන්නම් කියලා. මේකෙන් අපට පෙනෙන්නේ, ආපදාවට ලක් වුණු මේ රටේ ව්‍යාපාරිකයා ආරක්ෂා කර ගන්න, මේ රටේ නිෂ්පාදකයා ආරක්ෂා කර ගන්න, මේ රටේ කර්මාන්තකරුවා ආරක්ෂා කර ගන්න මේ ආණ්ඩුව ඇතුළේ තවම වැඩ පිළිවෙළක් නැහැ කියන එකයි. එහෙම වැඩ පිළිවෙළක් නැහැ. ඒ නිසා තමයි මගේ ප්‍රශ්නවලට ඒ වෙලාවේ පිළිතුරු දෙන්න බැරි වුණේ. එහෙම නැතුව මේ වෙනකොට හරියට වැඩ පිළිවෙළක් සකස් කරලා තිබුණා නම්, ඒ වැඩ පිළිවෙළ හදලා අවසන් කරලා තිබුණා නම්, ඒ ගැන ඊයේ කියන්න තිබුණා. හැබැයි, ඒක කිව්වේ නැහැ.

ඊළඟට මම විශේෂයෙන් මතක් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. සුළි කුණාටුව නිසා හානි වූ නිවාස ගැන කථා කරද්දී ජනාධිපතිතුමා මෙතැනදී කිව්වා, තහඩුවක් ගියත් රුපියල් ලක්ෂ 10ක් දෙනවා කියලා. ගෙයක් හදාගන්න ලක්ෂ 50යි, ඉඩමක් ගන්න ලක්ෂ 50යි, ඒ විධියට ලක්ෂ 100ක් දෙනවා කිව්වා. මේ ආකාරයෙන් කථා කළත්, දැන් දවසින් දවස කරන කථාවලදී ඒ ගණන් ලක්ෂ 5 ගණනේ, ලක්ෂ 10 ගණනේ අඩුවෙලා, දැන් කියනවා පුළුවන් නම් දැන් ලක්ෂ 5ක් අරගෙන තමන්ගේ වැඩේ කර ගන්න කියලා. එහෙම නැත්නම් කාලයක් බලාගෙන ඉන්න කියලා කියනවා. කාලයක් කියන්නේ, තව අවුරුද්දක්ද, දෙකක්ද, අවුරුදු තුනක්ද කියලා දන්නේ නැහැ. මොකද, සමහර අයගේ ඉඩම් තිබෙනවා, ඒවා පදිංචි වෙන්න සුදුසු නැහැ. මෙච්චර කාලයක් ගිහිල්ලත් ඔවුන්ට ඉඩම් දෙන්නේ කොතැනින්ද කියලා තෝරා බේරාගෙන නැහැ. ඒගොල්ලෝ එතෙක් කඳවුරුවල ඉන්න ඕනෑ. පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුවේ කරතිව් කියන ප්‍රදේශය වතුරෙන් යට වීම නිසා කණ්ඩායමක් කඳවුරකට වෙලා ඉන්නවා. ඒ ප්‍රදේශයේ වතුර පිරිලා තිබෙනවා. හැබැයි, ඒ ප්‍රශ්නයට විසඳුමක් සකස් කිරීම තවම අවසන් කරලා නැහැ. ඒ ප්‍රශ්නය අවසන් කරලා එම ජනතාවට කියන්න ඕනෑ. හැබැයි, එහෙම දෙයක් සිද්ධ වෙලා නැහැ. එම නිසා තව දවස් කිහිපයක් ගියොත් ලක්ෂ 5ත් නැතිව යන්න පුළුවන් කියලා අපි ජනතාවට කියනවා. ලක්ෂ 5ත් නැතුව ගියොත්, අවසානයේ ජනතාවට මහ පාර තමයි අයිති වෙන්නේ කියන කාරණයත් මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ දවස්වල අධ්‍යාපන අමාත්‍යාංශය ගැන, නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල module එකේ ප්‍රශ්නය සහ website එකේ ප්‍රශ්නය ගැන බරපතළ ප්‍රශ්න ටිකක් ඇහෙනවා. අපි ආණ්ඩුවට පැහැදිලිව කියනවා, ඒ website එක ඇතුළත් කළේ හිතා මතාමයි, මේ ආකාරයෙන් වැඩ සිද්ධ වෙනවා කියලා දැනගෙනමයි කළේ කියලා. මොකද, මේ websites පිටුපස ලෝකයේ විශාල සංවිධාන ඉන්නවා. ඒ

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

සංවිධාන ඉතා ධනවත් සංවිධාන. ඒගොල්ලෝ මේවාට විශාල වශයෙන් මුදල් වියදම් කරනවා.

ඒ නිසා මේ website එක දැම්මත් එකයි, නොදැම්මත් එකයි, එළියට ගත්තත් එකයි, පාවිච්චි කළත් එකයි. හැබැයි, මේක සමස්ත ජනතාවටම ප්‍රදර්ශනය කිරීම සහ මෙය අනුගමනය කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළ දැනට සමාජයේ කථා කරලා ඉවරයි. ළමයින්ගේ පාඩමක් හැටියට තිබෙන ඒ අදාළ පිටුව ගලවලා අයින් කළා කියලා දැන් වැඩක් නැහැ. පිට කවරය ගිහින් ඉවරයි; බලලා ඉවරයි; පෙන්වලා ඉවරයි. දැන් පිටුව ගලවලා වැඩක් නැහැ. පිටුව බලන්න ඉස්සෙල්ලා මේගොල්ලන් පිට කවරය පෙන්නුවා. මේගොල්ලන් මේ website එක ඇතුළට දැම්මේත් හිතාමතා, එළියට ගත්තේත් හිතාමතා සහ අද ඒක අවසන් කරන්න යන්නේත් හිතාමතා. ඒ මාර්ගයෙන් දැන් තව කණ්ඩායමක් සූදානම් වනවා, ආණ්ඩුව අස්සේ බෙදීමක් ඇති කරලා අග්‍රාමාත්‍යතුමියගේ තැනට ගහලා අපේ මාර්ගයෙන් ඒකත් වෙනස් කරගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ තව කාරණාවක් තිබෙනවා. අපි දැන් අනතුරු ගැන කථා කළා නේ. අනතුරක් සිද්ධ වෙලා යමෙකු රෝහලකට ගෙනිච්චාම ජාතික ධනය වැය කරලා තමයි ඒ කෙනාට සම්පූර්ණ සත්කාර කරන්නේ, එහෙම නැත්නම් බෙහෙත් කරන්නේ. ඒකට විශාල මුදලක් වියදම් වෙන බව පෙනෙනවා, හරියට ගණන් හදලා බැලුවොත්.

ඊළඟට අපි දකිනවා, බාල බෙහෙත් පිළිබඳ ප්‍රශ්නය. බාල බෙහෙත් සම්බන්ධව කෙහෙළිය රඹුක්වැල්ලගේ ප්‍රශ්නයේ ඉඳලා අපි දිගින් දිගටම NMRA එක ගැන ගොඩක් ප්‍රශ්න කථා කළා. මම දැන් අලුත් කථාවක් කියන්න ඕනෑ. ඖෂධ ඇගැයීම් සම්බන්ධව පවතින කමිටුවේ ඉන්නවා, මහාචාර්ය රෝහිණී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය. එතුමියට අපි ගරු කරනවා. එතුමිය මේ රටට විශාල සේවාවක් කරලා තිබෙනවා. හැබැයි, දැන් එතුමියගේ වයස අවුරුදු 79යි. අවුරුදු 79ක් වන මෙතුමියව තවම ඒ කමිටුවේ තියාගෙන ඉන්නේ ඇයි? ඔයගොල්ලන්ගේ ආණ්ඩුවට සම්බන්ධකම් තිබෙන -ජනාධිපතිතුමාට හෝ වෙන කාට හෝ සම්බන්ධකම් තිබෙන- දක්ෂ මිනිස්සු නැද්ද, මේවායේ වැඩ කරන්න? මේවා පරණ අයම අල්ලාගෙන ඉන්න ඕනෑද? ඊළඟට NMRA එකේ සභාපතිවරයා ගැන අපි කිව්වා. බාල බෙහෙත් ගෙනාපු ආයතනය සම්බන්ධව පරීක්ෂණ කරද්දී, ඉන්දියාවට ගිහිල්ලා පරීක්ෂණ කටයුතු කරන්න ඕනෑ කියලා යෝජනා කරද්දී, පරීක්ෂණ කරන්න ඕනෑ නැහැ කියන යෝජනාව ගෙනාවේ NMRA එකේ සභාපති වෛද්‍ය ආනන්ද. ඒ වෛද්‍යවරයා මොනවාද මේ කරන්නේ? දැන් මේක අස්සේ අලුත් කථාවක් එනවා. සමහර බෙහෙත් වර්ග තිබෙනවා, ඒවා එළියේ ෆාමසිවල තිබෙනවා. එහෙම නැත්නම් වෙනම ගන්න තිබෙනවා. මේක සිද්ධ වුණේ කොහොමද? මේක සිද්ධ වන්නේ baggage හරහායි. එහෙම නැත්නම් කල්පිටිය, මන්නාරම ප්‍රදේශයේ විශේෂයෙන් smuggling කරන කණ්ඩායමක් හරහා මේ රටට ඉන්දියාවෙන් බෙහෙත් ගෙනෙනවා. මේ බෙහෙත්වලට මිල නියාමනයක්වත්, කිසි දෙයක් නැහැ. හැබැයි, මේවා කරන්න ඉඩ දීලා තිබෙනවා. අපි වගකීමෙන් කියනවා, මේ සියල්ල සිද්ධ කරන්නේ NMRA එකේ සම්බන්ධතාවක් ඇතිවයි කියන එක. ඒ නිසා මේ ඇමතිවරයාත් මතක තබාගත යුතුයි, කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිවරයාට වෙච්ච දේ එතුමා කරගන්නේ නැතිව ඉන්න නම්, මේ ඉන්න නිලධාරින්ගේ සහ සභාපතිවරුන්ගේ වැරදි ක්‍රියා අනුමත නොකර ඒ අයට විරුද්ධව මේ අවස්ථාවේ යම් කිසි ආකාරයකින් ක්‍රියාත්මක විය යුතුයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවර සිද්ධ වෙච්ච විනාශය වෙනුවෙන් පිට රට ඉන්න අයගෙන් ආධාර ගොඩක් ලැබුණා. හැබැයි, ඉතාලියේ ඉන්න ශ්‍රී ලාංකිකයින් පාස්පෝට් එකක් හදන්න Embassy එකට භාර දුන්නාම අවුරුද්දක් ගිහිල්ලාත් පාස්පෝට් එක ලැබුණේ නැති අය ඉන්නවා. ඒ අය තමන්ට පාස්පෝට් එක ලැබුණේ නැතත්, ලංකාව වෙනුවෙන් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට, එහෙම නැත්නම් තමුන්නාන්සේලා අලුතින් හදලා තිබෙන වැඩසටහනට මුදල් එවලා තිබෙනවා. හැබැයි, තමුන්නාන්සේලා පෙරළා ඒ අයට ඒ උපකාරය කරනවාද කියන ප්‍රශ්නය මතු වෙලා තිබෙනවා. ඉතාලියේ ශ්‍රී ලාංකිකයින් විශාල ප්‍රමාණයක් ඉන්නවා. මාස දෙකෙන්, තුනෙන් එහෙම නැත්නම් මාස එකහමාරෙන් දෙන්න පුළුවන් පාස්පෝට් එක මාස හතක්, අටක්, අවුරුද්දක් සමහර වෙලාවට අවුරුදු එකහමාරක් යනකම් ඇදගෙන යනවා. මේ ගැන බලන්න කෙනෙක් නැහැ; අහන්න කෙනෙක් නැහැ. සමහර වෙලාවට මේ ප්‍රශ්නයට නිවැරදිව පිළිතුරු දෙන්නේත් නැහැ. ආණ්ඩුව මේවා නිවැරදි කරන්න ඕනෑ. ආණ්ඩුව නිවැරදි ගමන් මාර්ගයක නොගියොත්, ඉදිරි කාලය තුළ තමුන්නාන්සේලාට බරපතළ චෝදනා එක්ක බරපතළ ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිද්ධ වනවා කියන එක මම විශේෂයෙන් මතක් කරනවා. ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෆස්මින් ෂරීෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.34]

**ගරු ෆස්මින් ෂරීෆ් මහතා**
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෝටර් වාහන පනත යටතේ ගෙනෙන නියෝග ගැන කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

මුලින්ම මම කියන්න ඕනෑ, දැන් මත්ද්‍රව්‍ය භාවිතය හුඟක් වැඩි වෙලා තිබෙන හින්දා තමයි හුඟක් තැන්වල ප්‍රශ්න ඇතිවන්නේ කියන එක. රියැදුරන් මත්ද්‍රව්‍ය බීලා ගිහිල්ලා වාහන හප්පනවා. එක්කෙනෙක් මත්ද්‍රව්‍ය බීලා ගිහිල්ලා වාහන හප්පනකොට අහිංසක මිනිස්සුත් ඒකෙන් අනතුරට පත් වෙලා පීඩාවට පත් වනවා. අපි ඉදිරි කාලයේදී මේක නතර කරන්න ඕනෑ. මේකට පසුගිය කාලයේ ආණ්ඩුව පාලනය කරපු අයත් ඇත්තටම වග කියන්න ඕනෑ. "මත්ද්‍රව්‍ය පාවිච්චි කළොත් මේ වාගේ අනතුරු වෙන්න පුළුවන්, ඒ හින්දා ඔයාලා මත්ද්‍රව්‍ය භාවිතයෙන් ඉවත් වෙන්න" කියලා දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළවල් මේචවර කාලයකට ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ වුණාට අපේ රජය පොලීසිය මාර්ගයෙන් හැම නගරයකම ඒ වාගේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා.

මට වෙලාව තිබෙන නිසා ගම්පොල ගැනත් කථා කරන්න ඕනෑ. මම ගම්පොල ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. මාවනැල්ල ප්‍රදේශයේ මන්ත්‍රී කෙනෙක් මේ සභාවේ අසත්‍ය ප්‍රකාශ කළා, 1,000ක් මැරුණා, 500ක් මැරුණා කියලා. සමහර විට ඒ අය පාලනය කරපු ගම්පොල නගර සභාවේ හිටපු නගරාධිපතිලාගේ, ඒ වාගේම උපසභාපතිලාගේ ක්‍රියා කලාපය නිසා තමයි ඇත්තටම ගම්පොල නගරය ගංවතුරෙන් ආපදාවට පත් වුණේ කියලා මම විශේෂයෙන් සඳහන් කරන්න කැමැතියි. මොකද, වාරිමාර්ගයක් තිබෙනවා නම් ඒ දෙපැත්තේ අඩි 17

බැගින් තිබෙන්න ඕනෑ. ගම්පොල නගරයේ තිබෙන ප්‍රධාන වාරිමාර්ගවල දෙපැත්තේ අඩි 17ක් තියා අඟල් 17ක්වත් නැහැ. ඒකට එක හේතුවක් තමයි, නගර සභා පාලනය කරපු නගරාධිපතිලා, උපනගරාධිපතිලා තමන්ගේ යාළුවන්ටත්, ඥාතීන්ටත් ඉඩකඩම් ලබා දීම සහ සමහර අය මුදල්වලටත් ඉඩකඩම් ලබා දීම. දැන් ඒ වාරිමාර්ග කිසි දෙයක් නැහැ. ඒවා නිසා තමයි ඇත්තටම ගංවතුරෙන් ගම්පොල නගරය වැඩි වශයෙන් හානියට පත් වුණේ.

තව මන්ත්‍රී කෙනෙක් ඊයේ පෙරේදා යම් ප්‍රකාශයක් කරලා තිබුණා. ගම්පොල නගරය ගැන ඉතා ආදරයෙන් කථා කරපු විරුද්ධ පක්ෂ නායකතුමා මේ ගැන හිතන්න. සජබයේ ඉන්න ඒ අයගේම නගරාධිපති අපේ ඉරුක මැතිතුමා එදා ප්‍රකාශ කළා, අපට උදවු කළේ මාලිමා ආණ්ඩුවයි, ෆස්මින් ෂරීෆ් මන්ත්‍රීතුමායි, නලින් හේවගේ නියෝජ්‍ය ඇමතිතුමායි කියලා. ඒ අයගේ විරුද්ධ පක්ෂ නායකයා ඇවිල්ලා සෙල්ෆි ගහපු එක හැරුණාම වෙන කිසි දෙයක් දුන්නේ නැහැ. ඒ වාගේම මම වගකීමෙන් මේ කාරණයත් ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ නගරාධිපතිතුමා විරුද්ධ පක්ෂ නායකයාගෙන් JCB ටිකක්, ඒ වාගේම ට්‍රැක්ටර් ටිකක් ඉල්ලලා එතුමාට SMS එකක් දැම්මා. ඒකට "Done" කියලා ප්‍රකාශ කළා විතරයි, ඒ කිසිම දෙයක් ලබා දුන්නේ නැහැ.

මම ආඩම්බරයෙන් කියන්න කැමැතියි, අපේ රතු හමුදාවේ ජේවීපී කොල්ලෝ කෙල්ලෝ ඇවිල්ලා තමයි ගම්පොල නගරය අපට සුද්ධ කරලා දුන්නේ කියලා. අපි විශේෂයෙන්ම කියන්න ඕනෑ, ඒ සඳහා හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමාගේ ප්‍රධානත්වයෙන් කණ්ඩායමක් ඇවිල්ලා තිබුණා, ඒ වාගේම අපේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී නලීම් මැතිතුමාගේ කණ්ඩායමකුත් ඇවිල්ලා තිබුණා කියලා. ඒ අය උදවු කළා. එක්සත් ජාතික පක්ෂයෙන් හෝ සජබයෙන් ලොකු කණ්ඩායමක් ආවේ නැහැ. අපි සුද්ද-බුද්ද කරලා සියලු දේ කළාට පස්සේ අවසාන දවස් දෙකේ එතැන media shows දාලා ඒ වාගේ වැඩ නම් කළා.

මෙතැන ගම්පොල ප්‍රදේශයේ තව මන්ත්‍රී කෙනෙක් ඉන්නවා. ඒ තාත්තලා, පුතාලා අවුරුදු 30ක්, 40ක් දේශපාලනය කළාට ඒ අයගේ ආසනය කොතැනින්ද පටන් ගන්නේ, කොතැනින්ද ඉවර වෙන්නේ කියලාවත් දන්නේ නැහැ. ඒ වාගේම People's Leasing and Finance එක පිටුපස තිබෙන නාවලපිටිය ආසනයට අයිති කොටසක් ගම්පොලට අයිතියි කියලා මෙතැන පම්පෝරි ගහලා ගියා. ඊළඟට, NBRO එකෙන් ඇවිල්ලා අපට උදවු කළේ නැහැ කියලා විරුද්ධ පක්ෂ ඒකාබද්ධව ගම්පොල picket එකක් කළා. ඇත්තටම ඒ අය දැනගන්න ඕනෑ, ලංකාවෙන්ම 60ක වාගේ පිරිසක් තමයි NBRO එකේ ඉන්නේ කියන එක. ඒක අපේ වරදක් නොවෙයි. ඔබතුමන්ලා අවුරුදු ගණනක් රට පාලනය කළා. ඔබතුමන්ලා දැනගන්න ඕනෑ, මේ ලංකාවට NBRO නිලධාරින් ඕනෑ, ඒ අය පත් කරන වැඩේ කරලා තිබුණා නම් අද මේ වාගේ තත්ත්වයක් ඇති වන්නේ නැහැ කියන එක. ඒ වාගේම මම කියන්න ඕනෑ, අපි රුපියල් 25,000 දීමනාව ගම්පොල උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 4,612කට දීලා තිබෙන බව. ඒ වාගේම රුපියල් 50,000 දීමනාව 1,494කට දීලා තිබෙනවා. ඊළඟට, ඉස්කෝල ළමයි 195කට ආධාර ලබා දීලා තිබෙනවා. මිය ගිය 11දෙනෙකු වෙනුවෙන් නෑදෑයින්ට රුපියල් ලක්ෂ 10 ගණනේ දීලා තිබෙනවා.

ඒ වාගේම ආපදාවට පත් වුණු සහ ආර්ථික වශයෙන් අමාරු තත්ත්වයක ඉන්න 18,099කට අපි වියළි ආහාර ලබා දීලා තිබෙනවා. බිස්නස් කරන 1,810කට ආධාර ලබා දීලා තිබෙනවා. 1,332කට ඇඳුම් පැළඳුම් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම පාසල් ළමයි 1,500කට අපි පොත්පත් ලබා දීලා තිබෙනවා. මට මේ ගැන කියන්න කාල වේලාව නැති හින්දා මේ ආපදා තත්ත්වය සම්බන්ධයෙන් විස්තර ඇතුළත් ලේඛනය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ඊළඟට, මම තවත් කාරණයක් කියන්න ඕනෑ. අම්බුලුවාව ගැන දැන් ලොකු ජනතා විරෝධයක් ඇවිල්ලා, එය ආණ්ඩුවට පවරා ගන්න කියලා ඉල්ලීමක් තිබෙනවා. අපේ රජය තුළින් අනිවාර්යයෙන් ඒක ජනතාවගේ අයිතියට පත් කරලා, ඒකෙන් ලැබෙන ආදායම ගම්පොල ජනතාව වෙනුවෙන් ඉදිරියේදී වියදම් කරනවා.

තව මන්ත්‍රීවරයෙක් කිව්වා, ලසන්ත වික්‍රමතුංග මාධ්‍යවේදියා ගැන. ඇත්තටම මම කියන්න කැමැතියි, ඒ අය මැරිලා ඉපදිලා වාගේ තමයි අද ඇවිල්ලා ඒ ගැන කථා කරන්නේ කියන එක. යහ පාලන ආණ්ඩුව තිබුණා. ඒ යහ පාලන ආණ්ඩුවේ කට්ටිය මොනවාද කළේ? ඇයි, ලසන්ත වික්‍රමතුංගගේ ඝාතනය ගැන හෙව්වේ නැත්තේ? ඒ වාගේම තාජුඩීන්ගේ ඝාතනය ගැන හෙව්වේ නැත්තේ ඇයි?

මේ දවස්වල මුස්ලිම් ජනතාව අතර ලොකු බියක් ඇති කරලා තිබෙනවා, බොරු ප්‍රචාරයක් කරලා, Jeddahහි Consul General ගැන. මේ ඉන්න සමහර මුස්ලිම් මන්ත්‍රීවරු හැමදාම මුස්ලිම් ජනතාව බියට පත් කරනවා. හැබැයි, මම වගකීමෙන් කියන්න කැමැතියි, අපි ජාතිවාදී රජයක් නොවෙයි කියන එක. ඕනෑම රජයකින් පොඩි පොඩි අඩුපාඩු සිදු වෙන්න පුළුවන්. අපි ඒවා නිවැරදි කරගෙන ඉදිරියට යනවා. මුස්ලිම් ජනතාවගේ මිනී ටික පත්තු කරන්න උදවු කරපු මේ මුස්ලිම් නායකයෝ කියන කණ්ඩායම තමයි බොරුවට කඳුළු හෙළන්නේ කියන එක මම හැමදාම කියනවා.

ඒ වාගේම මම තවත් දෙයක් කියන්නම්. මේ මුස්ලිම් නායකයෝ යයි කියා ගත්ත කණ්ඩායම මුස්ලිම් ජනතාව වෙනුවෙන් මොනවාද කරලා තිබෙන්නේ? මුස්ලිම් ව්‍යාපාරිකයින් ගම්පොල ඉන්නවා. ඒ අයගේ ව්‍යාපාරවලට ඇත්තටම මේ ආපදා තත්ත්වය හේතුවෙන් ලොකු හානියක් වුණා. රජයෙන් කරන්න පුළුවන් සියලු උදවු ගම්පොල ජනතාව වෙනුවෙන් විතරක් නොවෙයි, මුළු ලංකාවේම ආපදාවට පත් වුණු සියලු ජනතාව වෙනුවෙන් ඉටු කරන්න අපි කැමැතියි. ඒ වාගේම මම කියන්න ඕනෑ, මුට්ටියේ තිබුණොත් තමයි හැන්දට එන්නේ කියන එක. මුට්ටියේ තිබෙන දෙයින් උපරිම වශයෙන් අපේ රජයෙන් ඒ අය වෙනුවෙන් කටයුතු කරලා තිබෙනවා. ඉදිරියේදී තවදුරටත් මුට්ටිය පිරුණොත් ඔබතුමන්ලාට උදවු කරන්න අපි කැමැතියි කියමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කේ. ඉලංකුමාරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[பி.ப. 2.42]

**ගරු කේ. ඉලංකුමාරන් මහතා**
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றையதினம் நடைபெறுகின்ற மோட்டார் வாகனச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு பெருமகிழ்ச்சி அடைகின்றேன்.

உண்மையிலே இந்த ஒழுங்குவிதிகளானது நாட்டு மக்களைப் பாதுகாப்பதற்காகவே உருவாக்கப்பட்டு இருக்கின்றது. இந்த நாட்டில் வீதி விபத்து காரணமாக தினசரி பலர் உயிரிழந்துகொண்டு இருக்கின்றார்கள்; அங்கவீனம் அடைந்துகொண்டு இருக்கின்றார்கள். வீதி விபத்துகளுக்குப் பெரும்பாலும் காரணமாக இருப்பது போதைப்பொருள் பாவனையாகும். பொலிசாரால் அடையாளங்காண முடியாத போதைப்பொருட்கள் எமது நாட்டுக்குள் ஊடுறுவியதன் காரணமாக குறிப்பாக முன்னைய ஆட்சியாளர்களால் மக்களின் மனங்களை மாற்றுவதற்காகவும் மக்களைத் திசை திருப்புவதற்காகவும் நாடு பூராவும் போதைப்பொருள் விநியோகிக்கப்பட்டதால் இன்று நாடு போதைப்பொருளில் சிக்குண்டு, அதிலிருந்து மீளமுடியாமல் தவித்துக்கொண்டு இருக்கின்றது. பல சாரதிகள் போதைப்பொருளைப் பாவித்துவிட்டு சட்டத்துக்கு விரோதமான வகையில் வாகனங்களைச் செலுத்துகின்றார்கள். எனினும், அதனைப் பொலிசாரால் உறுதிப்படுத்த முடியாமல் இருக்கின்றது. அதற்கான சட்டங்கள் பூரணமாக இயற்றப்படாமல் இருந்தன. இன்று அதற்குத் தேவையான சட்ட ஏற்பாடுகள் கொண்டுவரப்பட்டு இருக்கின்றன.

முன்னைய காலங்களில் மதுபானம் அருந்திவிட்டு வாகனம் செலுத்துபவர்களை பொலிசாரால் இனங்காணக் கூடியதாக இருந்தபோதிலும், ஐஸ், 'குடு', கஞ்சா போன்ற போதைப்பொருளைப் பாவித்துவிட்டு வாகனம் செலுத்துபவர்களை இனங்காணவும் உறுதிப்படுத்தவும் முடியமால் இருந்தது. மொழிநடை, உடல்மொழி என்பவற்றின்மூலம் அவ்வாறானவர்களைப் பொலிசாரால் இனங்காண முடிந்தாலும், அவர்களைத் தண்டிக்க முடியாமல் இருந்தது. ஏனெனில், அவர்கள் போதைப்பொருள் பாவித்ததை உறுதிப்படுத்த போதியளவு சட்ட ஏற்பாடுகள் இல்லாமல் இருந்தது. இன்றையதினம் கொண்டுவரப்பட்டுள்ள ஒழுங்குவிதிகள்மூலம் எதிர்வரும் காலத்தில் ஐஸ், 'குடு', கஞ்சா போன்றவற்றைப் பாவித்துவிட்டு வாகனத்தைச் செலுத்துபவர்களை இனங்கண்டு உறுதிப்படுத்தக் கூடியதாக இருக்கும். இதன் பயன் இயன்றவு மக்களைச் சென்றடையும்.

போதைப்பொருளின் பிடியிலிருந்து நாட்டை விடுவிக்க வேண்டும் என்பதற்காக எமது அரசாங்கம் திடசங்கற்பத்துடன் செயற்பட்டுக்கொண்டு இருக்கின்றது. எனினும், சில சாரதிகள் போதைப்பொருள் பாவனைக்கு அடிமையாகி இருக்கிறார்கள். அவர்களை இனங்கண்டும் சட்டத்தால் தண்டிக்க முடியாமல் இருந்தது. இந்த ஒழுங்குவிதிகளிலுள்ள ஏற்பாடுகள்மூலம் அவர்களை உமிழ்நீர் பரிசோதனைக்கு உட்படுத்த முடியும். அதேபோல், குருதிப் பரிசோதனைக்கும் உட்படுத்த முடியும். போதைப்பொருள் பாவித்திருப்பதை உடல்மொழிமூலம் இனங்கண்டால், அவர்களை வைத்தியப் பரிசோதனைக்கு உட்படுத்தி, அவர்களுக்கு எதிராக சட்ட நடவடிக்கை எடுப்பதற்கான அதிகாரங்கள் இந்த ஒழுங்குவிதிகள்மூலம் பொலிஸ் திணைக்களத்துக்குக் கிடைக்கும். இதன்மூலம் நாட்டில் போக்குவரத்துச் சேவை சிறந்த முறையில் இடம்பெறுமென்ற திடமான நம்பிக்கை இருக்கின்றது.

2025ஆம் ஆண்டில் கிட்டத்தட்ட 1,960 பேர் விபத்துகளால் உயிரிழந்து இருப்பதுடன், 3,700க்கும் மேற்பட்ட பயங்கர விபத்துகளும் ஏற்பட்டு இருக்கின்றன. இவற்றுக்கான காரணங்களை எடுத்துப் பார்த்தால், போதைப்பொருள் பாவனையே பெரும்பாலான விபத்துகளுக்கு காரணமாக இருந்திருக்கிறது. போதைப்பொருளைப் பாவித்தவர்கள் வீதிகளில் வாகனத்தைச் செலுத்த முடியாது. மதுபோதையில் வாகனத்தைச் செலுத்துபவர்களை இனங்காண்பதற்கான - tests பண்ணுவதற்கான - கருவிகள்தான் இருக்கின்றன. இந்த ஒழுங்குவிதிகளிலுள்ள சட்ட ஏற்பாடுகள்மூலம் கஞ்சா, ஐஸ் போன்ற போதைப்பொருளைப் பாவித்துவிட்டு வாகனங்களைச் செலுத்துபவர்களை blood testsக்கு உட்படுத்தி, அதை உறுதிப்படுத்தி, அவர்களுக்குத் தண்டனை பெற்றுக்கொடுக்க முடியும்.

இன்று எமது நாடு டிஜிற்றல் மயமாகி வருகின்றது. இன்று அமைச்சர் அவர்கள் கூறினார்கள், GovPay ஊடாக அபராதத்தைச் - fineஐச் - செலுத்தினால், இந்த இடத்தில் இந்த fine செலுத்தப்பட்டதென என்றும் பதிவில் இருக்கும் என்று. அது மாத்திரமன்றி, எந்த இடத்தில் குற்றங்கள் நடைபெறுகின்றன என்பதை இனங்காண்பதும் இலகுவாக இருக்கும். எமது நாட்டில் டிஜிற்றல் முறைமூலம் fine செலுத்துவதன் ஊடாக எந்தெந்தப் பிரதேசத்தில் அதிகளவான குற்றங்கள் நடைபெற்றிருக்கின்றன என்பதை இலகுவாக அறியக்கூடிய வாய்ப்புகளை எமது அரசாங்கம் ஏற்படுத்தி வருகின்றது.

எமது வட மாகாணத்தில் இடம்பெறும் பெரும்பாலான வாகன விபத்துகள் 'டிப்பர்' உடன் சம்பந்தப்பட்டவையாகத்தான் இருக்கின்றன. காரணம், அங்கு சட்டவிரோத தொழில்கள் அதிகரித்து இருக்கின்றன. மாபியாக்கள், மண் கடத்தல் காரணமாக யாழ்ப்பாணத்தில் அதிகளவான விபத்துகள் 'டிப்பர்' ஊடாகத்தான் ஏற்படுகின்றன. அது மாத்திரமன்றி, 'டிப்பர்' சாரதிகளும் போதைப்பொருளுக்கு அடிமையாகி இருக்கிறார்கள். சிந்தனையை திசை திருப்புவதற்கும் மனித வளத்தைச் சுரண்டுவதற்கும் அங்குள்ள இளைஞர்களைப் போதைப்பொருளுக்கு அடிமையாக்கி இருக்கிறார்கள். இதற்கு ஒருசில அரசியல்வாதிகளும் உடந்தையாக இருந்திருக்கிறார்கள்.

கிளிநொச்சியில் எந்தவித தொழிற்சாலையும் இல்லாமலிருந்தது. யுத்தம் முடிந்து 16 ஆண்டுகளாகியும் யாரும் அது பற்றி கதைக்கவில்லை. ஆனால், அந்தப் பிரதேசத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற பாராளுமன்ற உறுப்பினர் ஒருவர், கசிப்புப் பாவனையைக் குறைப்பதற்காக கிளிநொச்சிக்கு bar தேவையென மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில் கூறியிருந்தார். இன்று கிளிநொச்சி பிரதேசம் பூராவும் bar காணப்படுகின்றது. அந்தப் பாராளுமன்ற உறுப்பினர் அங்கு தொழிற்சாலைகள் வேண்டுமெனக் கேட்கவில்லை. எதிர்வரும் 21ஆம் திகதி கிளிநொச்சி பிரதேசத்தில் பரந்தன் இரசாயனத் தொழிற்சாலைக்கு அடிக்கல் நாட்டி, அதனை மீள ஆரம்பிப்பதற்கான பணிகளை முன்னெடுக்க இருக்கின்றோம்.

எமது இளைஞர்கள் தொழில்வாய்ப்பு இல்லாமை நிமித்தம்தான் போதைப்பொருளுக்கு அடிமையாகின்றார்கள். எமது பிரதேசத்தில் நல்ல தொழிற்சாலைகளை உருவாக்குவோமானால் அங்குள்ள இளைஞர்களுக்கு வேலைவாய்ப்புகளை வழங்க முடியும். கடந்த காலத்தில் வடக்கு மாகாணத்தில் எந்த வகையிலும் தொழிற்சாலைகள்

ஆரம்பிக்கப்படவில்லை. நாங்கள் ஆட்சிக்கு வந்தபிறகு ஆனையிறவு உப்பளத்தை மீள ஆரம்பித்திருக்கிறோம். நான் மேற்கூறியதுபோன்று, எதிர்வரும் 21ஆம் திகதி பரந்தன் இரசாயனத் தொழிற்சாலைக்கு கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர் அடிக்கல் நாட்ட இருக்கிறார். அதனூடாக வட மாகாண இளைஞர்களுக்கு வேலைவாய்ப்பு உருவாகப் போகின்றது.

தீவுப் பகுதியில் கடல்சார் போக்குவரத்துதான் மேற்கொள்ளப்படுகின்றது. குறிப்பாக, குறிகட்டுவானிலிருந்து வேலனைக்கு அதிகளவான சுற்றுலாப் பயணிகள் வந்து செல்கின்றார்கள். அங்கு வாகனங்களைக் கொண்டுசெல்ல முடியாமல் இருந்தது. படகில்தான் செல்ல வேண்டும். எமது அரசாங்கம் ஆட்சிக்கு வந்த பிறகு, வாகனங்களை ஏற்றிக்கொண்டு செல்லக்கூடிய வகையில் ferry - படகுப் பாதையை - அமைத்து வருகின்றது. கடந்த அனர்த்த நேரத்திலும் அந்த வேலைகள் இடைநிறுத்தப்படாமல் நடைபெற்றன. அதேபோல், பயணிகள் நயினாதீவுக்கு படகுப் பாதை ஊடாக தமது வாகனத்தைக் கொண்டு செல்லக்கூடிய வகையில் வெகுசீக்கிரம் வசதிகள் ஏற்படுத்தப்பட இருக்கின்றன. இவ்வாறு நாங்கள் போக்குவரத்தை இலகுபடுத்துகின்றோம்.

முன்னைய அரசாங்கம் எமது பிரதேசத்துக்கு 'எழுதாரகை' என்ற படகைக் கொள்வனவு செய்து தந்தது. அந்தப் படகை 3 மாதங்கள்தான் பாவித்தோம். அதன்பிறகு அது இயங்கவில்லை; பழுதடைந்துவிட்டது. இவ்வாறான செயற்பாடுகள்தான் முன்னைய ஆட்சியாளர்களால் ஏற்படுத்தப்பட்டன. ஆனால், எங்களது ஆட்சியாளர்கள் அந்தப் பிரதேசத்துக்கு என்ன தேவை என்பதை உணர்ந்து, ஒவ்வொரு செயற்பாட்டையும் செய்து வருகின்றனர். குறிப்பாக, தீவுப் பகுதியில் வீதிகள் சேதமடைந்திருந்தன. அதிகளவு நிதியை ஒதுக்கி அவற்றைப் புனரமைத்தோம். முன்னைய அரசாங்கம் தீவுப் பகுதிகளிலுள்ள வீதிகளை இனங்காணவில்லை. ஆனால், எமது அரசாங்கம் தீவுப் பகுதிகளின் தேவைகளை உணர்ந்து, அவற்றையும் ஏனைய பிரதேசங்களுக்கு ஒப்பாக முன்னேற்றுவதற்கு கடின முயற்சி செய்து வருகின்றது. அந்த வகையில், எமது அரசாங்கம் நெடுந்தீவு பிரதேசத்தில் எரிபொருள் நிரப்பு நிலையத்தை ஸ்தாபிக்கின்றது. நாங்கள் வட மாகாணத்தில் மூன்று பொருளாதார மத்திய நிலையங்களை ஸ்தாபித்து இருக்கிறோம். இதனூடாகத் தொழில்வாய்ப்புகளை வழங்கி, தவறான திசையில் செல்லும் எமது இளைஞர்களை நல்ல திசைக்கு மாற்ற முடியுமென நம்புகின்றோமெனக் கூறி, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නීතිඥ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 09ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.49]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අද දවසේ කරුණු කිහිපයක් මතු කරන්න බලාපොරොත්තු වනවා. විශේෂයෙන්ම අපේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන ගරු ඇමතිතුමාත් ඉන්න නිසා මම මූලික වශයෙන් කියන්න කැමැතියි, වාහන සන්තකය පැවරීම සම්බන්ධව. වාහන සහ මෝටර් බයිසිකල් ලියාපදිංචිය ගත්තාම පසුගිය කාල වකවානුවේ අපි දැක්කා සන්තකය පැවරීමේ කටයුතු පළාත් කාර්යාලවලිනුත් කෙරුණා. සාමාන්‍යයෙන් සහකාර හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයෙක් යටතේ තමයි පළාත් කාර්යාල තිබුණේ. ඔබතුමන්ලාගේ කාර්යාල පහක් තිබුණා. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ගම්පහ, කුරුණෑගල, යාපනය, අනුරාධපුර හා හම්බන්තොට කියන දිස්ත්‍රික්ක පහේ කාර්යාල පහක් තිබුණා. කොළඹ සිදු කරන හැම කටයුත්තක්ම එම කාර්යාලවලින් සිදු වුණා. හැබැයි ගරු ඇමතිතුමනි, දැන් එම දිස්ත්‍රික්කවල, එම ආයතනවල වාහන සන්තකය පැවරීමේ කටයුතු සිදු කරන්නේ තෝරා ගත් කාණ්ඩවලට පමණයි. මම ඉල්ලීමක් කරනවා, තෝරා ගත් කාණ්ඩ සඳහා පමණක් වාහන සන්තකය පැවරීමේ කටයුතු ඒ ආයතනවලට දෙන්නේ නැතුව ඒ සියලු කාර්යාලවලට පෙර පරිදි කටයුතු කරන්න දෙන්න කියලා.

දැන් බලන්න, "G", "H" හා "J" අකුරුවලින් එන 64 - 65, 31 - 32 කාණ්ඩයේ වාහන ප්‍රධාන කාර්යාලයේ ලියාපදිංචි කරන්නේ. ඇයි ඒවා ප්‍රධාන කාර්යාලයේ පමණක් ලියාපදිංචි කරන්නේ? ඒවා පළාත් කාර්යාලවල ලියාපදිංචි කරන්න පුළුවන්. හැබැයි, ඒවා අද ප්‍රධාන කාර්යාලයේ ලියාපදිංචි කරන්නේ, ඒවා තමයි අර ගෙඩි විධියට ගෙනැල්ලා දෙන ඒවා. මොකද, ගෙඩි විධියට ගෙනැල්ලා දෙන ඒවායේ මුදල් ටික යන්නේ ප්‍රධාන කාර්යාලයේ කිහිපදෙනෙක් අතට. ඔබතුමන්ලාට දූෂණය නවත්වන්න ඕනෑ නම්, කරන්න තිබෙන පළමු දේ තමයි වාහන ලියාපදිංචිය කරන එක, විශේෂයෙන්ම සන්තකය පැවරීමේ කටයුතු ඒ පළාත් ටිකට දෙන්න. එහෙම දුන්නාම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ කෙරෙන හොරකම, මහා වංචාව හා දූෂණය සම්පූර්ණයෙන් නතර වනවා. අනෙක් කාරණය තමයි, ඒ ස්ථානවල ආයතන ප්‍රධානියෙක් ලෙස කොමසාරිස්වරයෙක් පත් කර තිබුණා. නමුත්, පළාත් කාර්යාලවල එම කටයුත්ත දැන් ක්‍රියාත්මක නොවන තැනට පත් වෙලා තිබෙනවා. මෙම සීමා කිරීම් රජයේ ආදායම්වලට විශාල වශයෙන් බලපානවා.

දෙවැනි කාරණය තමයි, වාර්ෂික ආදායම් බලපත්‍ර ලබා ගන්න නිකුත් කරන ලිපිය පිළිබඳ කාරණය. සමහර අය වාර්ෂික බලපත්‍ර ගාස්තු ගෙවා නොමැති නම් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලිපියක් ලබා ගන්න ඕනෑ. දැන් යාපනයේ ඉන්න මනුස්සයාත් එනවා කොළඹින් ඒ ලිපිය ගන්න. දුෂ්කර පළාත්වල ඉන්න මිනිසුන්ට කොළඹට ඇවිල්ලා ඒ ලිපිය ගන්න සිදු වනවා. ගරු ඇමතිතුමනි, වාහනයේ පොත තිබෙනවා නම්, දූම් වාර්තාව, අයිතිකරුගේ හැඳුනුම්පත හා මෙතෙක් ආදායම් බලපත්‍ර ලබා නොගැනීමට හේතුව දක්වලා දෙන ලිපියට ඕනෑ තැනකින් එම ලිපිය දෙන්න පුළුවන්. කොළඹටම එන්න ඕනෑ නැහැ. කරුණාකරලා මේ ගැන විශේෂයෙන්ම සලකා බලන්න කියලා මම ඉල්ලනවා. මොකද, මට ආරංචි වන හැටියට දැනටමත් රුපියල් 3,000 ඉඳලා රුපියල් 50,000 දක්වා මුදල් ගන්නවා, අවුරුදු ගණනක් ආදායම් බලපත්‍රය නොගත් කට්ටියට එම ලිපිය ගන්න. ඒකට කොළඹටම එන්න ඕනෑ. ඒ ලිපිය නිකුත් කිරීමට ඒ ඒ පළාත් කාර්යාලවලට දෙන්න පුළුවන්. දෙපාර්තමේන්තුවේ කටයුතු link කරලා තිබෙන නිසා කරුණාකරලා එම වැඩ පිළිවෙළ හදලා දෙන්න කියන ඉල්ලීම මම කරනවා.

ඊළඟ කාරණය තමයි, වාහන සඳහා අංක තහඩු නිකුත් කිරීම අත්හිටුවා තිබීම. අද එය දැවැන්ත ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. 2023 වර්ෂයේ තමයි එම වැඩ පිළිවෙළ සකස් කළේ. තිබුණාට වැඩිය ඒකේ සියයට 62ක පමණ මිල වැඩිවීමක් වුණා. ඔබතුමන්ලා දැන් එය නතර කරලා තිබෙනවා. හැබැයි, මේ වනකොට මේ රටේ ලක්ෂ තුනකට වැඩිය වාහන ධාවනය වනවා A4 කොළය ගහගෙන.

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

කිසිම අංක තහඩුවක් නැහැ, නිකම් නොම්මරයක් ගහගෙන දුවනවා. අංක තහඩු ගහන්න කිසිම වැඩ පිළිවෙළක් නැහැ. ඇමතිතුමා පත් වෙලා අවුරුද්දක් වෙනවා. තවම මේ ක්‍රියාදාමය සකස් කරගන්න බැරිව ගියා. අපි අහන්න කැමැතියි, මොකක්ද මේකට ගන්නා පියවර කියලා. වාහන ලක්ෂ 3ක් පමණ අද පාරේ දුවනවා A4 කොළයක නොම්මරය ගහගෙන. මෙච්චර කාලයක් තිබුණු අර අංක ගහපු තහඩු ටික දැන් නැහැ. ඉතින්, ඕනෑ හොරකමක් කරන්න පුළුවන්; ඕනෑ වංචාවක් කරන්න පුළුවන්; මිනිහෙකුට වෙඩි තියලා යනකොටවත් දන්නේ නැහැ. හොරකම් කරලා යද්දී ඒ නොම්මරය ගලවලා වෙන එකක් ගහගන්න පුළුවන්. ඕනෑ සෙල්ලමක් කරන්න පුළුවන්. මේ ආණ්ඩුව පත් වෙලා දැන් අවුරුද්දක් ගතවෙලා තිබෙනවා. කරුණාකර මේකට වැඩ පිළිවෙළක් හදන්න. ඒ විතරක් නොවෙයි, මේකට වග කියන්න ඕනෑ නිලධාරින්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගන්න. මේකට යන වියදම සියයට 25කට විතර අඩු කරගන්න ඔබතුමන්ලා දැන් වැඩකටයුතු කරනවාය කියලා අපට ආරංචියි. හැබැයි, සියයට 62ක් විතර ගෙවන්න මේ කොම්පැනි එක්ක තීන්දු ගත්ත නිලධාරින්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගන්න. මේක ඇතුළේ ඉන්නවා ඒ අය. ඒ ගත්ත ක්‍රියාමාර්ගවලට අදාළ වෙන්නේ කවුද කියලා සොයා බලන්න. පළමු කාරණය හැටියට මම ඒක මතක් කරනවා.

දෙවැනි කාරණය හැටියට මම විශේෂයෙන් මතක් කරන්න කැමැතියි, දැන් අධ්‍යාපනය පිළිබඳව මතුවෙලා තිබෙන තත්ත්වය. මේ ආයතනයේ ඉංග්‍රීසි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුර 2021 ඉඳලා පුරප්පාඩු වෙලා තිබෙනවා. 2013 ඉඳලා මේ තනතුරේ වැඩ බලන්නේ ආචාර්ය දර්ශන සමරවීර. ඔහු තවමත් මේ තනතුරේ කටයුතු කරනවා. ඔහු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරට අදාළ සුදුසුකම් සපුරන්නේ නැතිව සිටිනකොටත් 2021 වර්ෂයේ වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුර ලබාගෙන තිබෙනවා. ඒ වාගේම අධ්‍යක්ෂවරයෙක් නැතිව තමයි ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරගෙන යන්නේ. ඒ වාගේම, ඔහු තමයි සම්පූර්ණයෙන්ම මේ ඉංග්‍රීසි modules හදලා තිබෙන්නේ. ඔහු මේ සඳහා ගෙන්වා ගන්නේ කවුද? අනුරාධපුරයේ ඉන්න teachersලා ටිකක් ගෙන්වලා තමයි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර තිබෙන්නේ. මේකේ ඉංග්‍රීසි දෝෂ තිබෙනවා ඇතිවෙන්න. මේ අය අනුරාධපුරයේ නිසා ඔවුන් ඉංග්‍රීසි දන්නේ නැහැ කියලා මම කියන්නේ නැහැ. නමුත්, මේකට අදාළ වන සුදුසුකම් සහිත ගුරුවරු ටිකක් ගෙනැල්ලා මේ වැඩේ කළා නම් තමුන්නාන්සේලාට අද රටෙන්ම බැණුම් අහන්න වෙන්නේ නැහැ. අනික් එක තමයි, විශේෂයෙන්ම මේ දර්ශන සමරවීර මහත්මයා පිළිබඳව අද වනතෙක් කිසිම පරීක්ෂණයක් සිදු කර නැහැ. තමුන්නාන්සේලා තමයි මෙතුමාව ස්ථිර විධියට පත් කෙරුවේ. එතුමා ජාතික ජන බලවේගයේ වැඩ කරපු කෙනෙක්. එතුමාගේ දියණිය පන්නල ප්‍රාදේශීය සභාවෙන් ඡන්දය ඉල්ලුවා. අද දර්ශන සමරවීර ගැන කිසිම කථාවක් නැහැ, CID එක. CID එක අනික් මිනිස්සු අල්ලන්න සොයනවා, දවස ගානේ අරගෙන යනවා, කට උත්තර ගන්නවා. හැබැයි, දර්ශන සමරවීර සද්ද නැතුව ඉන්නවා. ඒ නිසා කරුණාකර මේ සම්බන්ධව තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරන්න.

අනික් කාරණය මේකයි. මේ ලිංගික අධ්‍යාපනය සහ ලිංගිකත්වය කියන කාරණය ආණ්ඩුව පටලාගෙන තිබෙන්නේ. දැන් මේකේ තිබෙනවා, "Think Equal" කියලා ලෝක සංවිධානයක්. CID එකට අපි කියනවා, කරුණාකර මේක හොයන්න. මේකේ තිබෙනවා "The Grassrooted Trust" කියලා තව ආයතනයක්, ලංකාවේ. එහි ඉන්නේ හාන්ස් බිලිමෝරියා. ඔහු බැඳලා ඉන්නේ පබා දේශප්‍රිය මහත්මියව. මේගොල්ලන් මොකද කරන්නේ? ඒකත් එක්ක ලංකාවේ propaganda එකක් තිබෙනවා *"Bakamoono"* කියලා. මේ, සමරිසි ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන ආයතන; මේවාට සහයෝගය දෙන ආයතන. ඒ වාගේම, "Grassroots Fund" කියලා එකක් තිබෙනවා. ඒකෙන් තමයි stand-up එක කළේ, සමරිසි කට්ටියව ගෙන්වලා මාසයක විතර සෙල්ලමක් දැම්මේ. ඊළඟට, "Dabindu Collective" කියලා සංවිධානයක් තිබෙනවා. "Dabindu Collective" එකට සල්ලි දෙන්නේ කවුද? මේ "Think Equal" එකෙන් "The Grassrooted Trust" එකට ඇවිල්ලා, එතැනින් "Grassroots Fund" එකට ඇවිල්ලා, "Dabindu Collective" එකට සල්ලි යනවා. "Dabindu Collective" එකේ මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියකුත් ඉන්නවා. මම ඒ නම් කියන්න යන්නේ නැහැ. ලෝකයේ අවුරුදු 16ට අඩු අයට සාමාන්‍යයෙන් මේ වාගේ websitesවලට යන්න ඉඩ දෙන්නේ නැහැ. ලෝකයේ අනෙක් රටවල තත්ත්වය එහෙමයි. USAවල COPPA කියලා නීතියක් තිබෙනවා, strangersලාට සම්බන්ධ කරන්නේ නැහැ බාලවයස්කරුවන්. ඒ වාගේම, දෙමාපියන්ගේ අවසරයකින් තොරව ජීව දත්ත upload කරන්න දෙන්නේ නැහැ. හැබැයි, ලංකාවේ තමුන්නාන්සේලා මේකට ඉඩ දීලා තමයි දැන් මේ ක්‍රියාවලිය කළේ. United Kingdomවල - එංගලන්තයේ - Children's Code කියලා එකක් තිබෙනවා. ඒක අනුව කිසිම වෙලාවක අවුරුදු 16ට අඩු ළමයින් මේ strangersලා එක්ක, වෙනත් අය එක්ක සම්බන්ධ කරන්න දෙන්නේ නැහැ. EU එකේ European Law එකේ තිබෙනවා, GDPR කියලා. ඒකෙත් මේ වාගේම තත්ත්වයක් තිබෙන්නේ. ෆින්ලන්තයේ online platformsවලට යන්න දෙන්නේ නැහැ. යනවා නම්, classrooms අතර ගුරුවරුන්ගේ moderated platform එකක් තිබෙනවා, ඒ හරහා යන්න ඉඩ දීලා තිබෙනවා.

හැබැයි, තමුන්නාන්සේලා මොකක්ද කළේ? මේ මිතුරු සමාජවලට යන්න ඉඩ දුන්නා. ඒකෙන් තමයි දැන් මේ විනාශය පටන් අරගෙන තිබෙන්නේ. ලිංගික අධ්‍යාපනය ලබා දීමයි, ලිංගිකත්වයට සහයෝගය දීමයි කියන්නේ, දෙකක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තවත් එක විනාඩියක් අරගෙන කියන්න කැමැතියි, විනිසුරුවරුන්ගේ උසස්වීම් සහ මාරු කිරීම් සම්බන්ධ කාරණය ගැන. අපි ඒ සම්බන්ධව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් ඉල්ලලා දැන් මාස එකහමාරක් දෙකක් විතර වෙනවා. මේ වනතුරු තමුන්නාන්සේලා ඒ සම්බන්ධව කිසිම පියවරක් අරගෙන නැහැ. දැන් නැවතත් උසස්වීම් ක්‍රියා පටිපාටියක් පටන් ගෙන තිබෙනවා. මේ රටේ විනිශ්චයකාරවරුන්ට මේවා ගැන කියන්න තැනක් නැහැ. විනිශ්චයකාරවරුන්ට ගිහිල්ලා කථා කරන්න තිබෙන්නේ තමන්ව පත් කළ මිනිසුන්ටම පමණයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4වන ව්‍යවස්ථාව අනුව මේ රටේ අධිකරණ බලය ක්‍රියාත්මක කළ යුත්තේ මේ පාර්ලිමේන්තුවයි. ඒ නිසා පාර්ලිමේන්තුවට අයිතියක් තිබෙනවා මේ සම්බන්ධව සොයා බලන්න. සාධාරණයක් ඉටු වෙලා තිබෙනවාද, මොකක්ද ක්‍රමවේදය, ඒගොල්ලන් පත් කරන ක්‍රියාදාමය මොකක්ද, උසස්වීම් ලබා දෙන පටිපාටිය මොකක්ද යනාදිය ගැන සොයා බලන්න අපි පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් ඉල්ලුවා. ආණ්ඩුව තවම ඒක හංගාගෙන ඉන්නවා. කරුණාකර ඒ සම්බන්ධව ඉතාම ඉක්මනින් අවශ්‍ය පියවර ගන්න කියා ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටිමින්, මට වෙලාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දිනේෂ් හේමන්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.00]

**ගරු දිනේෂ් හේමන්ත මහතා**
(மாண்புமிகு தினேஷ் ஹேமந்த)
(The Hon. Dinesh Hemantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රවාහන, මහාමාර්ග අමාත්‍යාංශය විසින් ජාතික වශයෙන් වැදගත් වන සංශෝධන දෙකක්, එහෙම නැත්නම් මෝටර් වාහන පනත යටතේ වන නියෝග පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති අවස්ථාවේ ඒවා ගැන සාකච්ඡා කරන එක මඳකට පැත්තකින් තියලා සංවර්ධනය සම්බන්ධයෙන් වන සංකල්පය ලෝකය ඉදිරියට ආවේ කොහොමද කියන එක ගැන විග්‍රහයක් කරන්න මට පුංචි අවස්ථාවක් දෙන්න.

ලෝකයේ මිනිස්සු මුලදී කල්පනා කළා, දියුණුව කියලා කියන්නේ ආර්ථික වර්ධනය, එහෙම නැත්නම් තමන්ගේ ගොඩ ක්‍රමක්‍රමයෙන් වැඩි කර ගන්න එක කියලා. නමුත් කල් යනකොට තේරුණා භෞතික වශයෙන් ගොඩ වැඩි කරගෙන හරියන්නේ නැහැ, ප්‍රමාණාත්මක වර්ධනයට අමතරව ගුණාත්මක වටිනාකමකුත් එකතු වෙන්න ඕනෑ කියලා. ඒ අනුව "වර්ධනය" කියන සංකල්පයෙන් එහාට ගිහිල්ලා "සංවර්ධනය" කියන සංකල්පය ලෝකය ඉස්සරහට අරගෙන ආවා. අද වන කොට - වර්තමානය වන කොට- හඳුනාගෙන තිබෙනවා, තීරණය කරලා තිබෙනවා, මනුෂ්‍යයා තමන්ගේ ආර්ථික සංවර්ධනය විතරක් ඉස්සරහට අරගෙන ඇවිල්ලා හරියන්නේ නැහැ, පාරිසරික, සමාජයීය සහ ආර්ථික කියන පැතිකඩ තුනම තුලිතව ඉස්සරහට අරගෙන ආවොත් තමයි තිරසර සංවර්ධනයකට, එහෙම නැත්නම් චිරස්ථායී සංවර්ධනයකට යන්න හැකියාව ලැබෙන්නේ කියලා. ලෝකය අද සංකල්පයක් විධියට විශ්වාස කරන දේ තමයි, තිරසර සංවර්ධනය ලෙස සැලකිය යුත්තේ, අනාගත පරම්පරාවේ පරිභෝජන අවශ්‍යතා, පරිභෝජන හැකියා අහිමි නොවන විධියට වර්තමාන පරම්පරාව තමන්ගේ දියුණුව කරා ගමන් කිරීම වන බව.

මා මෙම මාතෘකාව ගැන කියන්න හේතුවක් තිබෙනවා. පසුගිය කාලයේ -අතීතයේ- මේ රටේ මාරුවෙන් මාරුවට බිහි වුණු ආණ්ඩු හැම වෙලේම උත්සාහ කළා ඔන්න ඔය කියන පැතිකඩ තුනෙන් ආර්ථික පැතිකඩ, එහෙම නැත්නම් ආර්ථික සංවර්ධනය තමයි රටේ සංවර්ධනය කියලා මහ ජනතාවට ඒත්තු ගන්වන්න. සමාජයීය වශයෙන් සහ පාරිසරික වශයෙන් අදාළ සංවර්ධනය අරගෙන එනකොට ගන්න සිදු වන ක්‍රියාමාර්ග ජනප්‍රිය නොවන හින්දා, ඒ ක්‍රියාමාර්ගවලින් තමන්ගේ ඡන්ද පදනමට, තමන්ගේ මනාප ලැයිස්තුවට, මනාප ඡන්දවලට වන හානිය ගැන දැකලා ඒ පැතිකඩ දෙක හෙවත් පාරිසරික සහ සමාජයීය කියන පැතිකඩ දෙක ගැන අවධානය යොමු නොකොට ආර්ථික වශයෙන් පුළුවන් තරම් රට ඉස්සරහට අරගෙන යන්න අවශ්‍ය කරන ක්‍රියාමාර්ග ගැනීම විතරයි පසුගිය කාලයේ සිද්ධ වුණේ. කඳු මුදුන කපලා හෝටලය ඉදි කරන කොට, එහෙම නැත්නම් ඉවුර කපලා ගොඩනැඟිල්ල හදන කොට, ගං ඉවුරේ පස් පුරවලා ජනාවාස බිහි කරන කොට, වැව්තාවුල්ලේ කර්මාන්තශාලා ඉදි කරන කොට, නගරයේ ප්‍රධාන ඇළ වේළි, එහෙම නැත්නම් ජල බැස්මවල් හරස් කරලා ගොඩනැඟිලි ඉදි කරන කොට ඒක තමයි සංවර්ධනය කියලා ජනතාවට පෙන්නුවේ. එකී සංවර්ධනය පෙන්නලා ජනතාවගේ ඇස් නිලංකාර කරලායි තිබුණේ. අවුරුදු 150ක්, 200ක්, 300ක් ක්‍රමක්‍රමයෙන් ඉස්සරහට අරගෙන ආපු සංවර්ධනය, එහෙම නැත්නම් ආර්ථික සංවර්ධනය පසුගිය දවස් දෙකතුනක එක වර්ෂාපතනයකින් ආපස්සට හරවා තිබෙනවා. ඩොලර් බිලියන 4.1ක්, එහෙම නැත්නම් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4ක වාගේ ප්‍රමාණයක් රටට අහිමි කරන්න පරිසරයට, එහෙම නැත්නම් ස්වභාව ධර්මයට ගියේ දවස් දෙකක තුනක වාගේ කාලයක්.

ස්වභාව ධර්මය අපට පණිවුඩයක් දීලා තිබෙනවා. ඒ තමයි, "ආර්ථිකය ගැන විතරක් හිතලා ඔයා ඉස්සරහට යන්න හදනවා නම්, මම මගේ පංගුව ගන්න දෙපාරක් හිතන්නේ නැහැ. මම මගේ සීමාව ලකුණු කරන්න මට ලැබෙන පළමුවැනි අවස්ථාවෙන්ම ක්‍රියාත්මක වෙනවා" කියන පණිවුඩය. ඒ නිසා පරිසරයට ආදරය කරන, සමාජයට ආදරය කරන, අනෙකාට ආදරය කරන, අනෙකාගේ සහකම්පනය දැනෙන, ජාතියක් විධියට ශ්‍රී ලාංකීය ජාතියට ආදරය කරන, අවසාන වශයෙන් ගත්තොත් ලෝකයට ආදරය කරන, මනුෂ්‍යත්වයට ආදරය කරන මනුස්සයෙකු බිහි කරන සමාජයීය වෙනස කරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා අප කියන්න ඕනෑ, ජනතාවට ප්‍රිය කරන, රටේ ජනතාවට ඇත්තටම ආදරය කරන, දුන්නු ජන වරමේ වගකීම හරි විධියට ඉෂ්ට කරන ආණ්ඩුවක් විධියට ජනප්‍රිය නොවුණත්, නිවැරැදි වන නිසා දෙපාරක් හිතන්නේ නැතුව අපි නිවැරැදි තීරණ ගන්නවා කියන එක. ඒකේ දිගුවක් විධියට තමයි අද දවසේ ඉදිරිපත් කර තිබෙන මේ නියෝගවලට අදාළ තීන්දුත් අප ගත්තේ. අද අපට සිද්ධ වෙලා තිබෙනවා, මේ සමාජ පරිවර්තනයට අවශ්‍ය කරන ඍජු තීන්දු, එහෙම නැත්නම් නිවැරැදි තීන්දු දිගින් දිගටම අරගෙන ඉදිරියට යන්න. අද දවසේ විපක්ෂයේ සමහර කථාවලින් කියැවුණා, "ජනප්‍රිය නොවුණත්, නිවැරැදි නිසා ඒ අවශ්‍ය තීන්දු ගන්න අපි අපේ සහාය දෙනවා" කියලා. අපි හිතනවා, අද දවසේ එසේ කියපු විපක්ෂය ඒ කථාව වචනවලට සීමා නොකොට, අනාගතයේදීත් අප මෙවැනි ඍජු තීන්දු ගන්න කොට, තමන්ගේ ඡන්ද පෙට්ටි, ඡන්ද පංගුව ගැන හිතන්නේ නැතුව අපත් එක්ක ඍජුව, හරි විධියට හිටගෙන ඒවාට සහාය දක්වයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පොදු කාරණයෙන් ටිකක් එළියට ගිහින්, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පසුගිය ආපදා තත්ත්වය අවස්ථාවේ මාතලේ දිස්ත්‍රික්කයට දුන්නු සහයෝගය සම්බන්ධයෙන් විශේෂ පැහැදිලි කිරීමක් කරන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. අපි 2025 වසරේදී රුපියල් මිලියන 777ක - දළ වශයෙන් රුපියල් කෝටි 77ක - වාගේ මුදලක් වියදම් කරලා, ග්‍රාමීය මාර්ග 23ක් හැදීම ආරම්භ කළා. අපි ඒවායෙන් මාර්ග 10ක වැඩ අවසන් කළා. මාර්ග 12ක වැඩ පටන් අරගෙන කරගෙන යනවා. තව එක මාර්ගයක් තිබෙනවා. අපි ලබන මාසය වන කොට ඒකේ වැඩත් පටන් ගන්නවා. මෙසේ ව්‍යසනයක් වෙලා තිබෙන අවස්ථාවේදීත් අපි අපේ සංවර්ධන ක්‍රියාමාර්ග ඒ විධියටම ඉස්සරහට අරගෙන ඇවිත් තිබෙනවා.

ආපදා තත්ත්වය ගැන කථා කරනවා නම්, ප්‍රධාන වශයෙන් මාර්ග සංවර්ධන අධිකාරියට - RDA එකට - අයත් "AB" මාර්ග 16ක් හානියට පත් වුණා. ඒවායෙන් මාර්ග තුනක් හැරුණු කොට, ඉතිරි සියලු මාර්ග ප්‍රවාහනයට සුදුසු මට්ටමට ගෙන එන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා. එහිදී උකුවෙල-ඇල්කඩුව මාර්ගය, මාතලේ ඉලුක්කුඹුර හරහා ලග්ගල මාර්ගය සහ මොරගහකන්ද මාර්ගය කියන මාර්ග තුන විතරක් දැනට තාවකාලිකව ඉදි කරමින් යනවා. ඒවායෙන් ඉලුක්කුඹුර-ලග්ගල පාර මේ දවස්වල ඉදි වෙමින් යනවා. මොරගහකන්ද පාර සඳහා විකල්ප මාර්ගයක් තිබෙනවා. උකුවෙල-ඇල්කඩුව මාර්ගය ඉදිරි මාසයක වාගේ කාලයක් ඇතුළත ඉඩම් අත්පත් කරගෙන ඉදි කිරීමට බලාපොරොත්තු වෙනවා.

[ගරු දිනේෂ් හේමන්ත මහතා]

ඒ වාගේම විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ ආපදා තත්ත්වය හමුවේ විපක්ෂයේ සියලු කණ්ඩායම් තමන්ගේ දේශපාලන මතය, තමන්ගේ දේශපාලන පංගුව බේරා ගන්න ගම් නියම්ගම් සිසාරා ගිය බව. ආඳාවල රජ්ජම්මන පාලම කැඩිලා ගියා. මිනිස්සුත් එක්ක එකතු වෙලා, හමුදාවේ ශක්තිය, ජනතාවගේ ශක්තිය, අදාළ ව්‍යාපාරික ප්‍රජාවගේ හා ප්‍රාදේශීය සභාවල ශක්තිය ආදි සියලු බලවේග එකතු කරගෙන අපි දවස් තුනක් වාගේ කාලයක් ඇතුළත ඒ පාලම හැදුවා. විපක්ෂයේ අය අප හදපු ඒ පාලමෙන් එගොඩ වෙලා ආඳාවල උඩගම ගම්මානයට ගිහිල්ලා, එහි තිබුණු කඳවුරු දෙකට ගිහිල්ලා ඒ ජනතාවගේ සැප දුක ඇහුවා. එසේ සැප දුක අහන්න එතුමන්ලා ගිය ඒ පාර අවුරුදු 40ක් තිස්සේ හදලා තිබුණේ නැහැ. අවුරුදු 40කට පස්සේ ගිය අවුරුද්දේ අපි රුපියල් මිලියන 55ක් වෙන් කරලා, දෙසැම්බර් මාසයේ වැඩ පටන් ගන්න නියමිතව තිබුණු පාරක් තමයි එය. තමන්ගේ පියාගේ උරුමයෙන් මේ දේශපාලන පිටියට ආපු, පාර්ලිමේන්තුවට ආපු පුතාලා, බෙබිලා වෙනත් කරන්න දෙයක් නැති තැන, තමන්ට හදා ගන්න බැරි වෙච්ච, අප හදපු ඒ පාරෙන් ඒ කඳවුරුවලට ගිහින් කරුණු විමසා තිබෙනවා, "මොනවාද තිබෙන අඩු පාඩු? ඇයි තවම පදිංචි කළේ නැත්තේ?" කියලා. 2012 අවුරුද්දේ ඔය වාගේම විපතක් වෙලා, ඒ ප්‍රදේශයේ පවුල් 35ක් අවතැන් වෙලා තිබෙනවා. ඒ පවුල් එතැනින් ඉවත් කරන්න කියලා දුන්නු නියෝගය එදා නොසලකා හැර තිබෙනවා. එම නිසා 2012 ඉඳන් මේ දක්වා ඒ පවුල් එතැනින් ඉවත් කර ගන්න හැකියාවක් ලැබී නැහැ. මෙහිදී හිනාවට ලක් වන කාරණය තමයි ඒ පවුල් 35 මෙවරත් අවතැන් වෙලා එහි සිටීම. අඩුම ගණනේ පුංචි එවුන්ට ටොෆියක්, සීනි බෝලයක්වත් අරගෙන යන්නේ නැතුව තමයි, අප අර දවස් දෙකතුනකින් අමාරුවෙන් හදපු පාරවල ගිහිල්ලා ඒ පවුල්වලින් දුක සැප විමසා ඇවිත් තිබුණේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මම තවත් කරුණක් කියන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු දිනේෂ් හේමන්ත මහතා**
(மாண்புமிகு தினேஷ் ஹேமந்த)
(The Hon. Dinesh Hemantha)
මට තවත් තත්පර 30ක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම, මැටිහක්ක රයිතලාවල පාලම කැඩිලා ගියා. අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව තිබෙන්නේ සමගි ජන බලවේගයේ පාලනය යටතේයි. නමුත්, දේශපාලනය කියන එක අපි අවශ්‍ය අවස්ථාවලදී කළාට, විපතට පත් වෙච්ච මිනිසුන් එක්ක අපට දේශපාලනයක් නැහැ. අපට තිබෙන්නේ, අපේ සමස්ත ජනතාවට එක වාගේ බෙදා හදා දීමේ ආදරණීය හැඟීමයි, වුවමනාවයි.

මැටිහක්ක, රයිතලාව පාලම කැඩිලා සතියක් යන්නට කලින් අපේ බිමල් රත්නායක ඇමතිතුමා Bailey bridge එකක් එතැනට එවලා තිබුණා. මොකද, ප්‍රාදේශීය සභාවට ඒ පාලම කවදාවත් තනියම හදාගන්න බැරි නිසා. ජනතාවගේ දුක දන්නා, නියම සැබෑ නායකයන් විධියට RDA එකේ නොවන පාලමක් ප්‍රථම වතාවට ප්‍රාදේශීය සභාවට වෙන්කර දීලා තිබෙනවා.

අවසාන වශයෙන් මේ කාරණයත් මම කියන්න ඕනෑ. පොතක්, කොළයක් අරගෙන ගිහිල්ලා ප්‍රශ්න ලියාගත්ත විපක්ෂ නායකතුමාට අතහැරිලා තිබෙනවා, තමන්ගේ ප්‍රාදේශීය සභාවේ කොහිලවත්ත පාලම කැඩිලා තිබෙන බව. ඒ පාලම හැදීම වෙනුවෙන් මේ පාර්ලිමේන්තුවේදී වචනයක්වත් කිව්වේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි. මීට වඩා කාලය ලබා දෙන්න අපහසුයි.

**ගරු දිනේෂ් හේමන්ත මහතා**
(மாண்புமிகு தினேஷ் ஹேமந்த)
(The Hon. Dinesh Hemantha)
හොඳයි, මම කථාව අවසන් කරනවා. මට කාලය ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, අවස්ථාව ලබා දුන්නාට.

මට විනාඩියක කාලයක් ඇති. කලින් විපක්ෂයේ මන්ත්‍රීතුමෙක් කිව්වා, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ online පහසුකම තිබෙන කාර්යාල පහක වාහන ලියාපදිංචි කිරීමේ ගැටලුවක් තිබෙනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ සෑම වර්ගයකම වාහන ලියාපදිංචි කරන්න ඉඩ දෙනවා. නමුත්, 32, 64, 65, G, J, H කියන කාණ්ඩවලට ඉඩ දෙන්නේ නැහැ. ඒකට හේතුව, එම කාණ්ඩ ලංකාවේ වාහන වංචාවලට අධික ලෙස යොදා ගන්නා කාණ්ඩ වීම. ඒ නිසා ඒ තැන්වල විතරක් නොවෙයි, කොළඹ නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයේත් one-day service එකවත් මේවාට ලබා දෙන්නේ නැහැ. මොකද, මේවා තුළින් තමයි අතිවිශාල වාහන වංචා සිදුවෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි ඒක නතර කරලා තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් ගැටලුවකුත් මතුවුණා. එතුමා ඒ ගැන දන්නවාද කියලා මම දන්නේ නැහැ. එතුමා ඒ ගැන දන්නවා වෙන්නත් පුළුවන්, නොදන්නවා වෙන්නත් පුළුවන්. අපි එවැනි වංචාවලට සම්බන්ධ වුණු නිලධාරියෙක් ළඟදී මාරු කළා. ඒ හේතුව නිසා තමයි අපි මේකට ඉඩ නොදෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.10]

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று எனக்கு வழங்கப்பட்டுள்ள வாய்ப்பைப் பயன்படுத்தி மலையகம் தொடர்பான முக்கிய சில விடயங்கள் சம்பந்தமாக கருத்துத் தெரிவிக்க விரும்புகின்றேன்.

பெருந்தோட்டத் தொழிலாளர்களின் சம்பளப் பிரச்சினை! 1,750 ரூபாய் அடிப்படைச் சம்பளம் தோட்டத் தொழிலாளர்களுக்கு வழங்கப்படுமென அரசாங்கம் ஓர் அறிவிப்பை விடுத்திருந்தது. சனவரி மாதம் 10ஆம் திகதியில் இருந்து கணக்கிடப்பட்டு, பெப்ருவரி 10ஆம் திகதி தோட்டத் தொழிலாளர்களின் கைகளுக்கு இந்தச் சம்பளம் கிடைக்குமென்றும் செல்லப்பட்டது. மேலும், 200 ரூபாய் பெருந்தோட்ட நிறுவனங்களின் ஊடாகவும் 200 ரூபாய் அரசாங்கத்தின் வரவு செலவுத்திட்ட நிதி ஒதுக்கீட்டின் ஊடாகவும் வழங்கப்படுமெனவும் தெரிவிக்கப்பட்டிருந்தது. இதிலுள்ள சில விடயங்களை தயவுசெய்து முழுமையாகக் கண்காணிக்குமாறு நான் அரசாங்கத்திடம் கேட்டுக் கொள்கின்றேன்.

இதுவரைக்கும் பெருந்தோட்ட நிறுவனங்கள் தத்தமது துரைமாருக்கும் தோட்ட முகாமையாளர்களுக்கும் இது சம்பந்தமான எந்தவிதமான circularஐயும் அனுப்பவில்லை. தயவுசெய்து, இவ்விடயம் சம்பந்தமான circularஐ அவர்களுக்கு அனுப்பிவையுங்கள்! Circularஐ அனுப்பினால்தான் சம்பளம் வழங்கப்படுமென தோட்ட முகாமையாளர்கள் சொல்லிக்கொண்டு இருக்கின்றார்கள். அதேநேரத்தில், இன்னொரு விஷயமும் இருக்கின்றது. அண்மையில் கௌரவ அமைச்சர் வசந்த சமரசிங்ஹ அவர்கள் இதே சபையில் என்னிடம், எக்காரணம் கொண்டும் norm கூட்டப்படாதென உறுதியாகச் சொல்லியிருந்தார். உதாரணத்துக்கு, ஒரு தோட்டத்தில் 18 கிலோகிராம் கொழுந்து எடுத்தால், அதுதான் norm. மறைமுகமாகவோ சரி, வெளிப்படையாகவோ சரி, சம்பளத்தைக் கூட்டுவதால் அந்த 18 கிலோகிராம் 22 கிலோகிராமாக மாறிவிடக் கூடாது. அதுமட்டுமல்ல, ஞாயிற்றுக்கிழமை மற்றும் விடுமுறை நாட்களில் தோட்டத்தில் வேலைசெய்கின்ற தொழிலாளர்களுக்கு ஒன்றரை நாளுக்குரிய சம்பளம் வழங்கப்படும். அதாவது, அவர்களுக்கு ஒன்றரை மடங்கு சம்பளம் கிடைக்கும்.

நாங்கள் இன்னொரு விஷயமும் கேள்விப்பட்டோம். இது மலையகத்தில் குறிப்பாக, தோட்டத் தொழிலாளர்கள் மத்தியில் அதிருப்தியை உருவாக்கி இருக்கின்றது. இதற்கும் அரசாங்கம் கட்டாயம் ஒரு பதிலைக் கொடுக்குமென நான் எதிர்பார்க்கின்றேன். அதாவது, மேற்குறிப்பிட்ட ஒன்றரை நாளுக்குரிய சம்பளம் வழங்கும் செயன்முறையைச் செய்ய இனிமேல் விடமாட்டார்கள். அதேபோன்றுதான் சலுகைகள் சம்பந்தப்பட்ட விடயமும். இன்றைக்கு அவர்களுக்கு எந்தெந்த சலுகைகள் இருக்கின்றதோ, அவை வழமைபோல தொடர்ச்சியாக அவர்களுக்கு வழங்கப்பட வேண்டும். தொழில் அமைச்சு கட்டாயம் கண்காணிப்புக் குழுவொன்றை நியமித்து, தோட்டத் தொழிலாளர்களுக்கு இந்தச் சம்பளம் நியாயமான முறையில் சென்றடைவதை உறுதிப்படுத்த வேண்டுமென்ற கோரிக்கையை நான் விடுக்கின்றேன். அந்த நம்பிக்கையில்தான் நான் எதிர்க்கட்சியில் இருக்கின்ற ஓர் உறுப்பினராக இருந்தும் வரவு செலவுத்திட்டத்துக்கு ஆதரவாக வாக்களித்தேன்.

மக்கள் இந்த அரசாங்கத்தின்மீது அதிகளவு நம்பிக்கை வைத்திருக்கிறார்கள். அந்த நம்பிக்கைக்குத் துரோகம் செய்யக்கூடாதென நான் நினைக்கின்றேன். இந்தச் சம்பளத்தை உறுதிப்படுத்தும் வகையில், அரசாங்கமானது சம்பள நிர்ணய சபை - Wages Board - மூலமாக 1,750 ரூபாய் அடிப்படைச் சம்பளத்தை வர்த்தமானிமூலம் வெளியிட்டால் கட்டாயம் மக்களுக்கு நம்பிக்கை ஏற்படும். அதேமாதிரி, பெருந்தோட்ட நிறுவனங்களால் இங்கேயும் அங்கேயுமென ஓட முடியாது. 2020இலாக இருக்கட்டும், 2024இலாக இருக்கட்டும், நான் அமைச்சராக இருந்த காலப்பகுதியில் அதிகமான சம்பளத்தைப் பெற்றுக்கொடுத்து இருக்கின்றேன். அப்பொழுது, நிறைய இடங்களிலுள்ள பெருந்தோட்ட நிறுவனங்கள் தான்தோன்றித்தனமான முறையில் முகாமையாளர்கள் மூலமாகப் பல்வேறு இடங்களில் பல்வேறு பிரச்சினைகளை உருவாக்கின. குறித்த வர்த்தமானியை - Gazetteஐ - வெளியிட்ட பிற்பாடுதான் பெருந்தோட்ட நிறுவனங்களை அடக்க முடிந்தது. எனவே, தயவுசெய்து தொழில் அமைச்சின் ஊடாக சம்பள நிர்ணய சபையைக் கூட்டி, குறித்த வர்த்தமானியை வெளியிடுமாறு கோரிக்கை விடுக்கிறேன்.

இன்றைக்கு இன்னொரு பிரச்சினையும் இருக்கிறது. அதாவது, தோட்டத் தொழிலாளர்களுக்கு 1,750 ரூபாய் அடிப்படைச் சம்பளம் வழங்கப்படுமென சொன்னவுடன், உண்மையிலேயே இலாபமடைகின்ற பெருந்தோட்ட நிறுவனங்கள் நஷ்டத்தை மட்டும் காட்டுகின்றனவே தவிர, இலாபத்தைக் காட்டுவதில்லை. அவை இலாபத்தை மறைமுகமாக வைத்திருக்கின்றன. அரசாங்கம் தோட்டத் தொழிலாளர்களுக்கு 1,750 ரூபாய் நாட்சம்பளம் வழங்குவதாகச் சொன்னதை நான் வரவேற்கிறேன். அதேநேரத்தில், இலாபம் ஈட்டுகின்ற பெருந்தோட்ட நிறுவனங்கள் இன்றைக்குப் பல்வேறு பகுதிகளில் குறிப்பாக தெனியாய, கேகாலை போன்ற பகுதிகளில் எல்லாத் தொழிலாளர்களையும் அவசர அவசரமாக outgrower systemக்கு மாற்றுகின்றன. ஒரு பெருந்தோட்டத்தை outgrower systemமூலம் நடத்துவதா அல்லது நாட்கூலி முறைமூலம் நடத்துவதா என்பது அந்தப் பெருந்தோட்ட நிறுவனத்தின் பிரச்சினை! எனக்கு outgrower system சம்பந்தமாக எந்தப் பிரச்சினையும் கிடையாது. அது தொடர்பில் எனக்கு இருப்பது சிறியதொரு குறைபாடுதான். ஏனெனில், அது regulated கிடையாது; it is not regulated. இதனால் இன்றைக்கு உடபுஸ்ஸல்லாவையில் ஒரு கிலோகிராமுக்கு 70 ரூபாய் வீதம் கொடுக்கிறார்கள். அதேநேரம், கேகாலையில் ஒரு கிலோகிராமுக்கு 40 ரூபாய் வீதம் கொடுக்கிறார்கள். தெனியாயவில் ஒரு கிலோகிராமுக்கு 60 ரூபாய் வீதம் கொடுக்கிறார்கள். இவை எல்லாவற்றுக்கும் ETF, EPF கிடையாது. இதன்மூலம் தொழிலாளர்களுடைய உழைப்பை பெருந்தோட்ட நிறுவனங்கள் சுரண்டிக்கொண்டு இருக்கின்றன. Outgrower systemக்கு முற்றுப்புள்ளி வைக்க வேண்டுமென நான் சொல்லவில்லை. ஆனால், இதை அரசாங்கத்தின் கட்டமைப்புக்குள் கொண்டுவர வேண்டும். இன்றைக்குப் பெருந்தோட்ட நிறுவனங்கள் காலத்துக்கு ஏற்றமாதிரி மாற வேண்டுமென நினைக்கின்றன.

தொழிலாளர்களின் உழைப்பைப் பயன்படுத்தி, அவர்களுக்கு உழைப்புக்கேற்ற ஊதியத்தை வழங்காமல் வளர வேண்டுமென அல்லது மாற வேண்டுமென நினைக்கின்றன. அது தப்பென நான் சொல்கின்றேன். எனவே, outgrowerஐ streamline பண்ணுவதற்கு அரசாங்கம் கட்டாயம் முயற்சிகளை எடுக்குமென நான் எதிர்பார்க்கின்றேன்.

சமீபத்தில் ஏற்பட்ட புயல் மற்றும் வெள்ளம் காரணமாக பல்வேறு பகுதிகள் சேதமடைந்து இருப்பதுடன், நிறைய பாதிப்புகளும் ஏற்பட்டிருக்கின்றன. இந்தத் தருணத்தில் நான் ஒரு விஷயத்தைச் சொல்ல விரும்புகின்றேன். 25,000 ரூபாய் நிவாரணம் வழங்குகின்ற திட்டமாக இருக்கட்டும் அல்லது 50,000 ரூபாய் நிவாரணம் வழங்குகின்ற திட்டமாக இருக்கட்டும், இந்த நிவாரணம் மலையகத்தின் சில

[ගරු ජීවන් තොන්ඩමන් මහතා]

பகுதிகளுக்குக் கிடைக்கவில்லை என்ற பாரிய குற்றச்சாட்டு இருக்கிறது. சிறிது நேரத்துக்கு முன்னர் ஆளும் தரப்பைச் சேர்ந்த ஓர் உறுப்பினர் சொல்லியிருந்தார், கிட்டத்தட்ட 8,127 நபர்களுக்கு இந்த 25,000 ரூபாய் கிடைத்திருப்பதாக. இது சம்பந்தமாக எனக்குள் ஒரு கேள்வி இருக்கிறது. நான் உரையாற்றி முடிந்த பின்னர், குறித்த உறுப்பினர் அல்லது அமைச்சர் அவர்கள் இதற்கு பதில் சொல்லலாம். 8,127 நபர்கள் என்றால், கிட்டத்தட்ட 2,000 குடும்பம். ஆனால், சனாதிபதி மூலமாக அங்கீகரிக்கப்பட்ட DMC reportஇன்படி, கிட்டத்தட்ட 6,691 குடும்பங்கள் இருக்கின்றன. அதன்படி பார்த்தால், கிட்டத்தட்ட 20,000 நபர்கள்! நுவரெலியா மாவட்டத்தில் கிட்டத்தட்ட 20,000 நபர்கள் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். எனவே, இது சம்பந்தமான ஒரு தெளிவுபடுத்தல் கட்டாயம் தேவை. நான் மறுபடியும் செல்கின்றேன், 8,000 நபர்களுக்கு 25,000 ரூபாய் நிவாரணம் வழங்கப்பட்டு இருக்கிறது.

நுவரெலியா மாவட்டத்தில் இருக்கின்ற கிராம சேவகர்களாக இருக்கட்டும் அல்லது AGAஆக இருக்கட்டும், நிறைய இடங்களில் வேலை செய்கிறார்கள். நான் இல்லையென்று சொல்லவில்லை. நான் இந்தச் சபையில் கொத்மலை சம்பந்தமான விடயத்தை இரண்டு முறை எழுப்பியிருந்தேன். அதாவது, அங்கிருக்கின்ற சில அரச அதிகாரிகள் அங்குள்ள மக்களை வேண்டுமென்றே சரியாக கவனிப்பதில்லை என்று கூறியிருந்தேன். நான் இந்த விடயத்தை முதல் தடவை எழுப்பிய பிற்பாடு, முழுமையாகவே அங்கிருக்கின்ற அரச அதிகாரிகள் அங்குள்ள மக்களை கண்டுகொள்ளவில்லை. நான் இரண்டாவது முறை எழுப்பிய பிற்பாடு, வேண்டுமென்றே அந்த மக்களைக் கஷ்டத்துக்கு ஆளாக்குகிறார்கள். நான் இந்த விடயத்தை எழுப்புவது இதுதான் கடைசி முறை. இதற்குப் பிறகும் பிரச்சினை வந்தால், அந்த மக்கள் கட்டாயம் வீதிக்கு இறங்குவார்கள். நான் இந்த விடயத்தை மறுபடியும் மறுபடியும் இந்த சபையில் எழுப்பியும் எந்தவித முன்னேற்றமும் இல்லை. பழிவாங்கும் நோக்கில்தான் சில அதிகாரிகள் வேலை செய்கிறார்கள். ஓரிரண்டு பேரால் முழு அரச இயந்திரத்துக்குமே கெட்ட பெயர் வருகின்றதென்றால், அது தவறான விஷயம்! ஆகவே, இதையும் நீங்கள் கருத்தில் எடுத்திருப்பீர்களென நான் எதிர்பார்க்கின்றேன்.

திரும்பவும் தங்களுடைய வீடுகளுக்குப் போகலாம் அல்லது இருந்த இடங்களுக்குச் செல்லலாம் என்று என்று அனர்த்தம் காரணமாக இடம்பெயர்ந்த மக்களிடம் NBRO சொல்கிறது. தற்போதைய நிலைமையில், எப்படி அந்த மக்கள் திரும்பவும் தங்களது இருப்பிடங்களுக்குச் செல்ல முடியும்? பல்வேறு இடங்கள் மண்சரிவுக்கு உள்ளாகியிருக்கின்றன. குறிப்பாக, அவர்களுடைய வீடுகள் மண்சரிவால் பாதிக்கப்பட்டு இருக்கின்றன. இந்தத் தருணத்தில் நாங்கள் சிந்தித்துப் பார்க்க வேண்டும், இது சம்பந்தமாக மாற்று இடம் இருக்கின்றதா என்று. பெருந்தோட்ட மக்களுக்கான காணி தொடர்பில் மாண்புமிகு சனாதிபதி அவர்கள் ஒரு விடயத்தைச் சொல்லியிருந்தார். அதை என்னால் ஏற்றுக்கொள்ள முடியாது. அன்று நடைபெற்ற மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் மாண்புமிகு சனாதிபதி அவர்கள் சொல்லியிருந்தார், 1 1/2 இலட்சம் குடும்பங்களுக்கு கிட்டத்தட்ட 9 இலட்சம் ஏக்கர் தேவை என்று. அதன்படி பார்த்தால், ஒரு குடும்பத்துக்கு 6 பேர்ச்சஸ்தான் கிடைக்கும். 1 1/2 இலட்சம் குடும்பங்களுக்கும் தலா 10 பேர்ச்சஸ் காணி தேவை. இன்றைக்குப் பெருந்தோட்ட நிறுவனங்களிடம் 204,000 ஹெக்டெயார் காணி இருக்கிறது.

**ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
கௌரவ உறுப்பினர் அவர்கள் இதற்கான பதிலை மட்டும் சொல்லட்டும். அதற்குப் பிறகு, நான் எனது கருத்தைச் சொல்கிறேன்.

**ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා.

**ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)
ගරු තොන්ඩමන් මන්ත්‍රීතුමා මතු කරපු ප්‍රශ්නය ගැන කථා කළොත්, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ආපදාවට පත් වෙච්ච අපේ සහෝදර ජනතාව වෙනුවෙන් -8,127 දෙනෙකුට- රුපියල් 25,000ක මූලික දීමනාව ලබා දීලා තිබෙනවා. දිසාපතිතුමියගේ වාර්තාවට අනුව ඒ මුදල් සියයට සියයක්ම ලබා දීලා තිබෙනවා. රුපියල් 50,000 දීමනාව 1,190 දෙනෙකුට ලබා දීලා තිබෙනවා. පාසල් දරුවන්ට ලබා දෙන රුපියල් 15,000 දීමනාව 1,306 දෙනෙකුට ලබා දීලා තිබෙනවා. දිසාපතිතුමිය සියයට සියයක් සහතික කරලා තිබෙනවා, ඒ මුදල් ලබා දීලා තිබෙනවා කියලා. සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල හෝ බිම් මට්ටමේ හෝ ගැටලු තිබෙනවා නම්, ඒ පිළිබඳව සොයා බලා කටයුතු කරන්න දේශපාලනඥයන් විධියට, නිලධාරීන් විධියට අපි සූදානම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථාව කරගෙන යන්න.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
கௌரவ உறுப்பினர் அவர்களே, இந்த விடயத்தில்தான் எனக்குப் பிரச்சினையே இருக்கிறது. நான் சொல்கின்ற தரவுகள் தனிப்பட்ட ரீதியாகச் சேகரிக்கப்பட்ட தரவுகள் கிடையாது. குறிப்பாக, இலங்கை தொழிலாளர் காங்கிரஸின் தரவுகள் கிடையாது. DMC எனப்படுகின்ற Disaster Management Centreஇன் தரவுகள்! 6,691 குடும்பங்கள் பாதிக்கப்பட்டு இருக்கும்போது, 8,127 நபர்களுக்குத்தான் அந்த 25,000 ரூபாய் வழங்கப்பட்டு இருப்பதாகச் சொல்கிறீர்கள். இது தொடர்பில் எனக்குச் சிறிய சந்தேகம் இருக்கிறது. இன்றைக்கு உங்களுடைய கணக்குப்படி, பாக்கி கிட்டத்தட்ட 14,000 பேர் இருக்கிறார்கள். அரச அதிகாரிகள் மூலம் இவர்களுடைய வீடுகள் முழுமையாகப் பாதிக்கப்பட்டு இருப்பது கண்டறியப்பட்டுள்ளதாக நீங்கள் சொல்கின்றீர்கள்.

அதையும் ஏற்றுக்கொள்வோம். அப்படியே வைத்துக்கொள்வோம்.

ஆனால், நீங்கள் சொல்கின்றீர்கள், நூற்றுக்கு நூறு சதவீதம் வழங்கப்பட்டு இருக்கின்றது என்று. அப்படியென்றால், பாக்கியாக இருக்கின்ற மக்கள்? என்னுடைய கருத்தை ஏற்று, அது பற்றி ஆராயுமாறுதான் நான் சொல்கிறேன். அவ்வளவுதான்! தவறு இருந்தால், அப்புறம் பாருங்கள்! அவ்வளவுதான் விஷயம்! இன்றைக்கு இடைத்தங்கல் முகாம்கள் எல்லாம் பாடசாலைகளில் இருக்கின்றன. அந்தப் பாடசாலைகளை மீண்டும் ஆரம்பிக்கும்போது, அங்குள்ள மக்கள் எங்கே போவார்கள்? அதற்காக நான் ஆலோசனை ஒன்றை வழங்க விரும்புகின்றேன். பாடசாலைகள் ஆரம்பிக்கப்படத்தான் போகின்றன. அங்கு இருக்கின்ற மக்களுக்கு பெருந்தோட்ட நிறுவனங்களுக்குக் கீழுள்ள இடத்தில் மாற்று நிலத்தை வழங்கினாலே அவர்கள் போய் விடுவார்கள். NGOsஆக இருக்கட்டும், வெளிநாட்டு அரசாங்கங்களாக இருக்கட்டும், புயல் மற்றும் வெள்ளத்தால் பாதிக்கப்பட்ட மக்களுக்கு -

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු තොන්ඩමන් මන්ත්‍රීතුමා මතු කරපු ප්‍රශ්නය පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න මට විනාඩියක් ලබා දෙන්න.

ගරු මන්ත්‍රීතුමනි, ගෙවල් සම්පූර්ණයෙන්ම කැඩිච්ච අයට, NBRI reports අවශ්‍ය නැති කුරුණෑගල, අනුරාධපුර, පුත්තලම වාගේ දිස්ත්‍රික්කවල ජීවත්වෙන අයට ගෙවල් හැදීම සඳහා රුපියල් ලක්ෂ 50ක් ලබා දීම අපි හෙට දිනයේදී ආරම්භ කරනවා. ජනාධිපතිතුමාගේ සහභාගිත්වයෙන් හෙට දිනයේ අනුරාධපුරය සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල ස්ථාන 4ක ඒ කටයුතු ආරම්භ කරනවා. ඒ වාගේම කෑගල්ල සහ අපේ මේ ගරු මන්ත්‍රීතුමා ජීවත්වෙන මධ්‍යම පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ - බදුල්ලේ නව ආසන සංවිධායකතුමාට මම සුබ පතනවා - කොපමණ පිරිසකට අලුතින් නිවාස අවශ්‍යද, තමන් හිටපු තැනම තමන්ට නිවස හදාගන්න බැරිද, එහෙම නැත්නම් ඒගොල්ලන්ට නිවාස දෙන්නේ කොතැනින්ද කියන එක සොයා බලන්න අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්තුමා මාතලේ, නුවර, නුවරඑළිය, බදුල්ල සහ කෑගල්ල යන දිස්ත්‍රික්ක සියල්ලටම එනවා. එතුමා, 11වැනි දා උදේ 9ට නුවරඑළියට එනවා. අවශ්‍ය නම් ඔබතුමන්ලාටත් ඒ අවස්ථාවට සහභාගි වෙන්න පුළුවන්. එතැනදී හරියටම කථා කර ගන්න පුළුවන්, කොපමණ ප්‍රමාණයකට තමන් ඉන්න ප්‍රදේශයේම ගෙවල් හදාගන්න පුළුවන්ද, townshipsවලට යන්න වෙනවාද, flats ගොඩක් හදන්න වෙනවාද, ගෙවල් තනි තනි විධියට හදන්න පුළුවන්ද කියලා. එතුමා මේ ගැන කථා කරන්න හැම දිස්ත්‍රික්කයකටම එනවා. ගරු ජනාධිපතිතුමා ඒ පිළිබඳව අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්තුමාට නියෝග දීලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ගරු සභානායකතුමනි. ගරු තොන්ඩමන් මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරලා අවසන් කරන්න.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
நன்றி, கௌரவ அமைச்சர் அவர்களே!

எதிர்வரும் 11ஆம் திகதி நாங்கள் கட்டாயம் அதில் கலந்துகொள்வோம். இந்தப் புயலின் பாதிப்பு காரணமாக பெருந்தோட்டப் பகுதியில் இருக்கின்ற NBRIஇன் அதிகாரி களுக்கு நிறைய வேலைகள் இருப்பதனால், அவர்களால் எல்லா இடங்களுக்கும் ஒரே சமயத்தில் போக முடியவில்லை. பாதிக்கப்பட்ட பல பகுதிகளுக்கு இன்னும் NBRI officers போகாமல் இருக்கிறார்கள். அதனால்தான் நாங்கள் சொல்கின்றோம், பெருந்தோட்ட நிறுவனங்களுடன் பேசி பாதிக்கப்பட்ட மக்களுக்கு மாற்று இடத்தைக் கொடுக்குமாறு. NGOsஆக இருக்கட்டும், donorsஆக இருக்கட்டும், வெளிநாட்டு அரசாங்கங்களாக இருக்கட்டும், அங்கு வந்து வீடுகளைக் கட்டுகின்ற பணியைத் தொடங்க முடியும். காசு அரசாங்கத்திடமிருந்து வரட்டும்; வீடு வரட்டும். வடக்கு, கிழக்கில் இந்திய அரசாங்கம் 28,000 வீடுகளைக் கட்டியிருக்கிறது. எனினும், மலையகத்தில் 4,000 வீடுகளைக் கட்டுவதற்கு 10 வருடங்கள் சென்றிருக்கிறது. இதுதான் எங்களுக்கு இருக்கின்ற பெரிய பிரச்சினை!

உங்களுடைய அரசாங்கத்தால் கடந்த இரண்டு வருடங்களில் எத்தனை வீடுகள் முழுமையாகக் கட்டிமுடிக்கப் பட்டு இருக்கின்றன என்பதைச் சொல்ல முடியுமா? முடியாது! தப்பு வந்து உங்கள் மேலயோ, எங்கள் மேலயோ கிடையாது. அங்கு வாழுகின்ற மக்களுக்குக் காணி உரிமை கிடையாததுதான். காணி உரிமை இல்லாத பட்சத்தில் பெருந் தோட்ட நிறுவனங்கள் அந்த மக்களுக்குச் சொல்கின்றன, " நீங்கள் தோட்டத்தில் வேலைசெய்தால் நாங்கள் உங்களை மனிதனாக மதிப்போம். தோட்டத்தில் வேலை செய்யவில்லை என்றால் நாங்கள் உங்களைக் கைகழுவிவிடுவோம்" என்று. எங்களுடைய மக்களுக்கு அடையாளம் இல்லை. அதனால் தான் நாங்கள் மாற்று இடம் சம்பந்தமான ஆலோசனை முன்வைக்கிறோம். இது ஓர் அனர்த்தம்தான். எனினும், இதை ஒரு வாய்ப்பாகப் பயன்படுத்தி எங்களுடைய மக்களுக்குக் காணியை வழங்கினால், நாளைக்குப் பிரச்சினைகள் வராது என்பதைத்தான் நான் சொல்ல வருகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Sir, please give me one more minute.

கௌரவ அமைச்சர் அவர்களே, எனக்கு உங்கள்மீது நிறைய மரியாதை இருக்கிறது. உங்களுக்கும் என்னைப் பற்றி நன்றாகவே தெரியும்! நான் உங்களிடம் சிறியதொரு கோரிக்கையை முன்வைக்கிறேன். நீங்கள் உங்களுடைய உறுப்பினர்களுக்கு அவ்வப்போது பாடம் எடுக்க வேண்டும்.

[ගරු ජීවන් තොන්ඩමන් මහතා]

திரும்பத் திரும்ப என்னை விமர்சிப்பதால் வேலை நடக்கப் போவது கிடையாது. திரும்பத் திரும்ப என்னுடைய தனிப்பட்ட வாழ்க்கையைப் பற்றி பேசுவதால் எந்த வேலையும் நடக்கப் போவது கிடையாது. இங்கு இருக்கின்ற ஆளுங்கட்சியைச் சேர்ந்த எல்ல உறுப்பினர்களுக்கும் நான் ஒரு விடயத்தைச் சொல்கிறேன். நீங்கள் சபைகளை அமைக்கும்போது, மறை முகமாக எல்லோரும் ஆதரவு கொடுப்பார்கள். அன்றைக்கு காங்கிரஸும் ஜீவன் தொண்டமானும் மட்டும்தான் வெளிப்படையாகச் சொன்னார்கள், "நாங்கள் உங்களுக்கு ஆதரவு வழங்குகிறோம்" என்று. பல்வேறு பகுதிகளில் சபைகளை அமைப்பதற்கு மறைமுகமாக ஆதரவு கொடுத்தவர்கள் இன்றைக்கு திரும்பவும் அந்தந்தக் கட்சிகளில் ஒன்றும் தெரியாத மாதிரி உட்கார்ந்து இருக்கிறார்கள். நாங்கள் வெளிப்படையாக சபைகளை அமைப்பதற்கு உங்களுக்கு ஆதரவு அளித்தோம். மலையகத்தில் ஒரு பகுதியிலேனும் நாங்கள் உங்களைத் தோற்கடிக்க விடவில்லை. அதற்குக் காரணம், மக்கள் உங்கள்மீது வைத்திருக்கின்ற நம்பிக்கைதான். உங்களுடைய உறுப்பினர்கள் இதைக் கருத்திலெடுக்க வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු දේවානන්ද සුරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.26]

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෝටර් වාහන (මත් ද්‍රව්‍ය) නියෝග ප්‍රකාශයට පත් කරන 2025.09.04 දිනැති අංක 2452/40 දරන ගැසට් නිවේදනය හා මෝටර් වාහන (අධිවේගී මහා මාර්ග) නියෝග ප්‍රකාශයට පත් කරන 2025.09.25 දිනැති අංක 2455/29 දරන ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර විවාද කරන අවස්ථාවේ එම විවාදයට සම්බන්ධ වීමට අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුට ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම නියෝගවල ප්‍රධානම අරමුණ තමයි අපේ රටේ ජනතාව ආරක්ෂා කිරීම සහ ඒ වෙනුවෙන් මැදිහත් වීම. විශේෂයෙන්ම අපේ රටේ ප්‍රචණ්ඩ ක්‍රියාවලට වඩා රිය අනතුරුවලින් මිනිසුන් මිය යන බව අපි කවුරුත් දන්නවා. එවැනි දරුණු ඛේදවාචකයකට තමයි අපේ රටේ ජනතාව පත් වෙලා තිබෙන්නේ. උදෑසන එළියට බහින පුද්ගලයා; තැනැත්තා, එහෙම නැත්නම් මහියා හවස ගෙදර එනවාද, නැද්ද කියන කුකුස, සැකය, සංකාව ජීවත්ව ඉන්න මිනිසුන් තුළ ගොඩ නැඟුණු වටපිටාවක් තමයි තිබෙන්නේ. එම නිසා තමයි විශේෂයෙන්ම 2011දී, එහෙම නැත්නම් 2012දී වාගේ හඳුන්වා දුන් සමහර ගැසට් නිවේදනවලට අලුත් නියෝග එකතු කරලා අපේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රය ඇතුළේ සිදු වන මහා දැවැන්ත අපරාධයන් වළක්වා ගැනීම සඳහා නීතිමය ප්‍රතිපාදන සකස් කරන්න වර්තමාන ආණ්ඩුවට සිද්ධ වෙලා තිබෙන්නේ. ඒක, ශිෂ්ට සම්පන්න රාජ්‍යයක් කරා යන ගමනේදී අපට පැවරෙන ප්‍රධාන කොන්දේසියක් කියන එක අපි විශ්වාස කරනවා. මොකද, විශේෂයෙන්ම කඳුළු වෙනුවට සිනහව පුරවා ගත් මිනිස්සු සහිත, දැනුමෙන් සහ කුසලතාවන්ගෙන් පරිපූර්ණ මිනිස් සමාජයක් ඉලක්ක කර ගෙන තමයි අපි මේ ගමන ඉස්සරහට යමින් සිටින්නේ. හැබැයි මේ විවාදවලට, සංවාදවලට ඇහුම්කන් දෙනකොට දේශපාලනය කරන අපට දැනෙනවා, මේ පැත්තේ සිටින විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් සමහරු මේ වෙනකොට කපන්න බැරි අත ඉඹිනවා වාගේ වැඩක නියැළෙනවා කියන එක, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ ගොල්ලෝ කථාව පටන් ගන්නකොට "මේ රෙගුලාසි හොඳයි, ඒත් ..." කියලා තමයි පටන් ගන්නේ. "ඒත්..." කියලා පටන් අරගෙන දී ගෙන; දී ගෙන; දී ගෙන යනවා, ඒ ගොල්ලෝ කරපු අඩුපාඩුකම් ටික මකා ගන්න.

1948 වසරේ ඉඳලා මේ රට පාලනය කළේ අපිද? අද වනකොට මේ රට මේ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ ඇයි? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1948 වනකොට අපි ආර්ථික වශයෙන් දෙවැනි වෙලා හිටියේ ජපානයටයි. ඒ වෙනකොට චීනය තිබුණේ කොතැනද? ඉන්දියාව තිබුණේ කොතැනද? මැලේසියාව තිබුණේ කොතැනද? ඉන්දුනීසියාව තිබුණේ කොතැනද? තායිලන්තය තිබුණේ කොතැනද? හැබැයි, අද වනකොට ලංකාව තිබෙන්නේ කොතැනද? අර රටවල්; ආසියාවේ අනෙක් රටවල් තිබෙන්නේ කොතැනද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බංග්ලාදේශය, නේපාලය පවා සමහර ක්ෂේත්‍රවලදී අපට වඩා ඉහළින් ඉන්නවා.

හැබැයි, මේ රට 1948 වර්ෂයේ ඉඳලා පාලනය කළේ අපි යැයි හිතමින් මෙතැන අදහස් දක්වන විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් මෙහෙම ඇඟිල්ල දික් කරන්නේ සම්පූර්ණයෙන්ම කාටද? ඒකට අපට කියන්න තිබෙන්නේ, තක්කඩිකම කියලා. මෙතෙක් පැවති රජයන්වල තිබුණු අඩුපාඩු ටික වර්තමාන රජය නිවැරදි කරගෙන ශිෂ්ටත්වය කරා ගෙන යන වෙලාවක් තමයි මේක.

රටක් විදියට අපි සර්ව සම්පූර්ණයෙන්ම බංකොලොත් රාජ්‍යයක් බවට පත් වෙලායි තිබුණේ. අපේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රය නන්නත්තාර කරලායි තිබුණේ. මාර්ග පද්ධතියම විනාශ කරලායි තිබුණේ. අධ්‍යාපන ක්ෂේත්‍රය ඇතුළු හැම එකක්ම විනාශ කරලායි තිබුණේ. එවැනි වටපිටාවක් තුළ දේශපාලනය කර එහි ඕනෑම විපතක් තමන්ගේ සැපතක් බවට පත් කරගත් දේශපාලන සංස්කෘතියක් තමයි ඒ අය මේ රටට හඳුන්වා දී තිබුණේ. ඒ වාගේම ජනතාවට ලැබෙන ඕනෑම සැපතක් විපතක් බවට පත් කරන දේශපාලන භූමිකාවක් තමයි අද විපක්ෂයේ මන්ත්‍රීවරුන් ඉටු කරමින් ඉන්නේ. ඒගොල්ලන් මේ රටට හඳුන්වා දුන්නේ, එවැනි දේශපාලනයක්. ඕනෑම විපතක් තමන්ගේ සැපතක් බවට පත් කර ගනිපු, ජනතාවට ලැබෙන ඕනෑම සැපතක් විපතක් බවට පත් කරපු, ඉතිහාසයේ මේ රට පාලනය කරපු පාලක කණ්ඩායමක් තමයි අද විපක්ෂයේ ඉන්නේ. ඒගොල්ලන් හරි දක්ෂයි, විවේචනවලට. ඒගොල්ලන් හරි දක්ෂයි, ජාතික ජන බලවේගයේ වර්තමාන රජය ගෙන යන මේ ප්‍රතිපත්තිවලට එරෙහිව විවේචන එල්ල කරන්න. ඒ නිසා හැම දේකටම මොන යම් දෙයක් හෝ කියනවා. "හොඳයි, ඒත් මෙහෙමයි" කියනවා. "රුපියල් 25,000 දෙන එක හොඳයි, ඒත්,-" කියලා නතර කරනවා. "රුපියල් 50,000 දෙන එක හොඳයි, ඒත්,-" කියලා නතර කරනවා. "අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හොඳයි, ඒත්,-" කියලා නතර කරනවා. හැබැයි, මේ ආණ්ඩුව එහෙම නැහැ; කථා දෙකක් නැහැ. "ඒත්" කියලා කථා දෙකක් තිබෙන්න බැහැ නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒත් නොවෙයි, මේක හොඳම තමයි. අපි මේ රට ශිෂ්ටත්වය කරා අරගෙන යනවාම තමයි. මොකද, මිනිස්සු වෙනුවෙන්ම තමයි අපි දේශපාලනය කරමින් ඉන්නේ.

මීට පෙර කථා කරපු ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා, ලසන්ත මැතිතුමාගේ මරණය ගැනත් කථා කළා. හැබැයි, 2015 ඉඳලා 2019 වෙනකල් මේ රට පාලනය කළේ කවුද? ඒ ශ්‍රේෂ්ඨ මාධ්‍යවේදියාගේ අවමංගල්‍ය පෙරහැරේදී බැනර් එක ඉස්සරහින්

අරගෙන ගියේත් ඒ මන්ත්‍රීවරයාලු. ඒගොල්ලන් ප්‍රදර්ශන චරිත තමයි. ඒගොල්ලන් ප්‍රදර්ශනයට, මිනිස්සු අන්දන්න බොහොම කැමැතියි. හැබැයි, බැනර් එක අරගෙන ගිය ඒ මන්ත්‍රීවරයා - එවකට ඇමතිවරයා- ලසන්තගේ මරණය සම්බන්ධයෙන් අඩුම තරමේ මොකක්ද කළේ? පරීක්ෂණ කටයුතුවලට අදාළ කරන ලිපි ලේඛනවත් ආරක්ෂා කරගන්න බැරි වෙච්ච වටපිටාවක් තමයි 2015-2019 කියන්නේ. දැන් මෙතැන ඇවිල්ලා රටේ ජනතාව අන්දන්න හදනවා, ජාතික ජන බලවේගයේ වර්තමාන ආණ්ඩුව ඒ සමීක්ෂණ යට ගහලා කියලා. අපි එතුමන්ලාට, ඒ වාගේම කුහකත්වයෙන් අපට ඇඟිල්ල දික් කරන, විවේචන ඉදිරිපත් කරන ඒ කණ්ඩායමට මේ කාරණය කියන්න කැමැතියි. මේ රටේ ජනතාව අපට බලය දුන්නා. අපි ඒ බලය ගන්න මේ රටේ ජනතාවට මතවාදයක් ප්‍රකාශයට පත් කළා. ඒ විතරක් නොවෙයි. මේ රට විනාශ කරපු, මේ රටට හානි කරපු, එහෙම නැත්නම් අපේ රටේ ඉතිහාසගත මාධ්‍යවේදීන් මර්දනය කරපු, මාධ්‍යවේදීන්ගේ අත පය කුඩු කරපු අයට විතරක් නොවෙයි, ඒ සකලවිධ ද්‍රෝහීන්ට දඬුවම් දෙනවා; ඔවුන් නීතියේ ආධිපත්‍යයට යටත් කරනවා කියන එක අපි ඒගොල්ලන්ට කියන්න කැමැතියි. අපි ඒ දේ කරනවා. මොකද, අපි ඒ දේ නොකළොත්, ඒ දේ කරන්න වෙනත් දේශපාලන පක්ෂයක් මේ රටේ බිහි වෙන්නේ නැහැ. ඒ සකලවිධ කුමන්ත්‍රණකරුවන්ම තමයි විපක්ෂය වශයෙන් අද ඇවිල්ලා, එකට ඉඳගෙන ජාතික ජන බලවේගය ඉලක්ක කරගෙන, ඇඟිල්ල දික් කරලා විවිධ කතන්දර සහ මතිමතාන්තර ගොඩනහන්න උත්සාහ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බී. ආරියවංශ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.35]

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා මෝටර් වාහන පනත යටතේ ගෙනෙන ලද නියෝග පිළිබඳව විවාද කරන මේ මොහොතේ අපි සඳහන් කරන්න ඕනෑ, රිය අනතුරුවලින් විශාල පිරිසක් සෑම වර්ෂයකම මිය යන බව. 2025 වර්ෂය ගත්තොත්, 2,700ක් මිය ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම තමයි අත පය කැඩිලා අංගවිකලභාවයට පත් වෙච්ච විශාල පිරිසක් සිටිනවා. මාර්ගවල තිබෙන විශාල අඩුපාඩු නිසාත්, ඒ වාගේම රියදුරන්ගේ නොසැලකිලිමත් බව නිසාත් සිදුවන රිය අනතුරු නිසා අපේ රටට විශාල හානියක් සිදු වෙලා තිබෙනවා. ඉතින්, මේ නීති රෙගුලාසි මඟින් මේවා මැඩපැවැත්වීමට කටයුතු කිරීම අපේ රටට ඉතාම වාසිදායක වනවා. පසුගිය දිනක අපි දැක්කා, සාමාජ මාධ්‍ය හරහා ප්‍රදර්ශනය වුණා, අධිවේගී මාර්ගයේ කන්ටේනර් රථයක් වෙනත් වාහනයකට ඉස්සර කරන්න යනකොට ඒ වාහනයට වෙට්ටුවක් දාලා ඒ කන්ටේනර් රථය යන ආකාරය. ඒ වාහනය බොහොම අමාරුවෙන් තමයි බේරෙන්නේ. ඒ වාගේ තත්ත්වයකදී මේ නීති ඉතා වැදගත් වනවා.

ප්‍රවාහන ඇමතිතුමා සභාවේ ඉන්න නිසා මම සඳහන් කරන්න ඕනෑ, ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ විශේෂයෙන්ම ලංගම ඩිපෝ තුළ අද විශාල දූෂණ, වංචා සිදු වෙන බව. උදාහරණයක් විධියට ගත්තොත්, මා සිටින ඇඹිලිපිටිය ප්‍රදේශයේ ඇඹිලිපිටිය ඩිපෝව 2019දී ලාභ ලැබුවා; රුපියල් මිලියන 35ක් ඉතුරු කරලා තිබුණා. 2019න් පසුව ආණ්ඩු මාරු වනකොට වෙනත් කණ්ඩායමක් වෘත්තීය සමිති හදාගෙන, ඒ වෘත්තීය සමිති හරහා ඒ හිටපු අයගේ තනතුරු ලබාගෙන, ඒ දක්ෂ නිලධාරින් අයින් කරලා -පැත්තකට දාලා- ඒ අය ඩිපෝව පාලනය කරන්න යෑම තුළ අද ඒ ඩිපෝවේ කටයුතු කඩන් වැටිලා තිබෙනවා. අද බස් රථ ධාවනය කරන්න බැරි තත්ත්වයට ඒ ඩිපෝව පත් වෙලා තිබෙනවා. නමුත් ජාතික ජන බලවේග ආණ්ඩුව එදා කිව්වේ, අපි ආ හැටියේ මේවා නවත්වනවා; මේ දූෂණය නවත්වනවා; නාස්තිය නවත්වනවා; මේවා ගොඩගන්නවා කියලායි. එහෙම කියපු ඔබගේ ආණ්ඩුව බලයට ඇවිල්ලාත් දැන් අවුරුද්දයි මාස කිහිපයක් වනවා. නමුත් අපි දකිනවා, ඒ දේවල් ඊට එහාට ගිහිල්ලා තිබෙන බව. අද ඒවායේ නාස්තිය, දූෂණය වැඩි වෙලා මේ වනකොට අතුරු මාර්ගවල බස් රථ ගමනාගමනය පවා නැවතිලා තිබෙනවා.

විශේෂයෙන් කොළොන්න ප්‍රදේශයේ සූරියකන්ද, බුත්කන්ද වාගේ අතුරු මාර්ගවල බස් රථ ධාවනයත් මේ වන විට නතර වෙලා තිබෙනවා. මොකද, ඒ බස් රථවලට අවශ්‍ය අමතර කොටස් ලබා ගැනීමේදී විශාල වංචා, දූෂණ සිදු වනවා. ලංගම බස් රථයක් repair කරලා පාරට දැම්මාම සතියක් හරියට ධාවනය වන්නේ නැහැ. පෞද්ගලික අංශයේ බස් repair කරලා පාරට දැම්මාම හොඳට ධාවනය වනවා. ඒවා හොඳ ආදායම් ලබනවා. අද ගොඩකවෙල ඩිපෝවටත් මේ තත්ත්වයමයි උදා වෙලා තිබෙන්නේ. ඔබගේ වෘත්තීය සමිතිය මඟින් තමයි ඒ ඩිපෝව මේ වනකොට පාලනය කරන්නේ. අද ඒ ඩිපෝවෙන් කෙරෙන ග්‍රාමීය බස් රථ සේවා 8ක් නැවතිලා තිබෙනවා. ඒ වාගේම දුර ගමන් සේවා බස් රථ 4ක් නතර වෙලා තිබෙනවා. ඉතින් මේ තත්ත්වය මඟ හරවා ගැනීම සඳහා ගරු ඇමතිතුමා විශේෂයෙන් මේ සඳහා මැදිහත් වන්න. මොකද, රත්නපුර දිස්ත්‍රික්කය තුළ බලංගොඩ, කලවාන, රත්නපුර, ඇඹිලිපිටිය, ගොඩකවෙල වශයෙන් බස් ඩිපෝ 5ක් තිබෙනවා. ඉතින් මේ පවතින තත්ත්වය ගැන අපි සම්බන්ධීකරණ කමිටුවේදී කථා කළා. එදා මේ සම්බන්ධීකරණ කමිටුවේදී තීරණයක් ගත්තා, මාස 6න් මේ ඩිපෝ දියුණු කරනවා කියලා. නමුත් අපි දන්නවා, මේ වනකොට අධිවේගී මාර්ගවල ධාවනය වන බස් රථ සේවා පවා නැවතිලා තිබෙන තත්ත්වයට එම ඩිපෝවල කටයුතු පත්ව තිබෙන බව. විශේෂයෙන් පාසල් දරුවන්ගේ, ග්‍රාමීය ජනතාවගේ ප්‍රවාහන කටයුතු සඳහා සමහර මාර්ගවල එක බස් රථයයි වැඩ කරන්නේ. දවසකට ගමන් වාර දෙක යන්නේ ඒ එක බස් රථය. සමහර වෙලාවට ඒ බස් රථයත් සති ගණන් නතර වෙලා තිබෙනවා. එතකොට කිලෝමීටර 6, 7 ඒ අය පයින් තමයි යන්නේ. ඒ වාගේ තත්ත්වයකට අද ඒ ජනතාව පත් වෙලා තිබෙනවා. ඒ නිසා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ඒ බස් ඩිපෝ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරලා ඒවා දියුණු කරන වැඩ පිළිවෙළක් ගේන්න කියලා මම මේ අවස්ථාවේ ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම මාර්ග පද්ධතිය ගත්තොත්, ඉතාම දුර්වල මාර්ගත් ඒ ප්‍රදේශවල තිබෙනවා. එහිදී ගොඩකවෙල ගැන මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. අද වනකොට බිබිලේගම හරහා පාලම්කොට්ට, වේත්තිලකන්ද කියන මාර්ගය ඉතාම අබලන් තත්ත්වයට පත් වෙලා තිබෙනවා. බස් රථයක් යන්නේත් මහට. ඉතුරු කොටසේ බස් රථය ධාවනය කරන්න බැහැ. *[බාධා කිරීමක්]* ඒක පළාත් සභා මාර්ගයක්. ඒ මාර්ගය සංවර්ධනය විය යුතුයි. මොකද, ඒ ප්‍රදේශවල ජනතාවට ගොඩකවෙලට පැමිණෙන්න කිලෝමීටර 6ක, 7ක දුර ප්‍රමාණයක් පයින් යන්න සිදු වෙලා තිබෙනවා; විශේෂයෙන් රෝහලකට පැමිණෙන්න. ඒ නිසා මේ පිළිබඳවත් දැඩි අවධානයක් යොමු කරන්න කියලා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

[ගරු බී. ආරියවංශ මහතා]

ගරු ඇමතිතුමනි, එළවලු සහ පලතුරු ප්‍රවාහනය සම්බන්ධව මීට කලිනුත් අපි කථා කරලා තිබෙනවා. විශේෂයෙන්ම එළවලු සහ පලතුරු ප්‍රවාහනයේදී විශාල ප්‍රමාණයක් නාස්ති වෙනවා. ඒ කියන්නේ, සියයට 35කට වැඩි ප්‍රමාණයක් නාස්ති වෙනවා. ඒ නිසා අපේ ගොවියාට එළවලු සහ පලතුරු වෙළෙඳාමෙන් ලැබෙන්නේ ඉතාම සුළු මුදලක්. ඒවා අළෙවියේදී ගොවියාට ලැබෙන්නේ රුපියල් 100ක් වැනි මුදලක් කියා අපි හිතමු. නමුත්, ඒවා මිලදී ගැනීමේදී රුපියල් 300ක් වැනි මුදලකට පමණ තමයි පාරිභෝගිකයාට ගන්න වෙන්නේ. ඒ කියන්නේ, 1ට 3ක් විතර ගෙවා තමයි එළවලු සහ පලතුරු පාරිභෝගිකයාට ලබා ගන්න සිදු වෙලා තිබෙන්නේ. මේකට හේතුව තමයි, ප්‍රවාහන පහසුකම් නැතිකම. ඇඹිලිපිටිය ප්‍රදේශයේ සිට කෙසෙල් කැන් එක ලොරියක ගොඩ ගහලා පටවා ගෙන එන අයුරු අපි දැක තිබෙනවා. එළවලුත් එහෙමයි. ඒවා ලොරිවල පටවා ගෙන එන්නේ. එම භෝග විනාශ වීම තුළ මේ රටේ ආහාර හිඟයක් ඇති වෙනවා වාගේම අධික මිලට පාරිභෝගිකයාට ඒවා මිලදී ගැනීමටත් සිදු වෙනවා.

ගරු ඇමතිතුමනි, පෙරේදා දිනයේදී මම සිංහරාජය පිළිබඳව ප්‍රශ්නයක් ඉදිරිපත් කරලා ඒ ගැන කථා කළා. අපේ පරිසර ඇමතිතුමා ඒ සඳහා උත්තර ලබා දුන්නා. ඒ අවස්ථාවේදී මම ඇහුවා, විශේෂයෙන්ම වනසතුන්ට වන හානිය පිළිබඳව. විශේෂයෙන්ම දිවියන් සහ සිංහරාජයේ සිටින ගෝනුන් ආරක්ෂා කර ගන්න වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා මම එදා ඇහුවා. ඒ අවස්ථාවේදී ඇමතිතුමා කිව්වා, සිංහරාජ වනාන්තරය ආරක්ෂා කරනවා වාගේම වනසතුන් පවා ආරක්ෂා කරනවා කියලා. නමුත් මම කියන්න කැමැතියි, ඊයේ දිනයේදී ගාල්ල, නෙළුව, දෙල්ලව තේ වත්තක තිබුණු මන්දකට හසු වෙලා දිවියෙක් මිය ගිය බව. පසුගිය වර්ෂයේ දිවියන් 20ක් පමණ මිය ගොස් තිබුණා. ඒ සතුන්ගෙන් 7ක්ම මිය ගොස් තිබුණේ මදුවලට හසු වෙලා. ඒ කියන්නේ, සතුන් දඩයම් කිරීම සඳහා සිංහරාජය අවට ගම්වල සිටින අය උපක්‍රම යොදනවා. මොකද, රාත්‍රී කාලයේ සතුන් එළියට එනවා. ඒ සතුන් දඩයම් කිරීම සඳහා යොදන ලද ඒ උපක්‍රමවලට හසු වෙලා මේ වාගේ සතුන් පවා විනාශ වෙනවා. මේ තත්ත්වය තුළ අද වනවිට අපේ රටේ සිටින ඉතා දුර්ලභ ගණයේ දිවියන් ආදී වනසතුන් විශාල වශයෙන් විනාශ වෙනවා. ඒ නිසා මේ ගැනත් විශේෂ අවධානය යොමු කරන්න කියලා පරිසර ඇමතිතුමාට දැනුම් දෙන ගමන්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

[අ.භා. 3.44]

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෝටර් වාහන පනත යටතේ සාදන ලද අංක 2452/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ සහ අංක 2455/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ඉතාම කාලෝචිත නියෝග අද දින ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය ගරු බිමල් නිරෝෂන් රත්නායක මැතිතුමා විසින් අනුමතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවා. ඒ සම්බන්ධව අදහස් දක්වන්න ලැබීම වැදගත් අවස්ථාවක් ලෙස මා සලකනවා.

විශේෂයෙන්ම රටක දියුණුව මනින ප්‍රධාන මිනුම් දණ්ඩක් තමයි ප්‍රවාහනය කියන්නේ. එය මිනිස්සුන්ට අවශ්‍ය සේවා සැපයීම සඳහා නිර්මාණය වෙලා තිබෙන විශේෂ ක්ෂේත්‍රයක්. මම හිතන විධියට, මෙය කාලෝචිත මාතෘකාවක්. මිනිස්සු තමන්ගේ පහසුව වෙනුවෙන්, රටක සංවර්ධනය වෙනුවෙන් වාගේම රටේ ඉදිරිය වෙනුවෙන් නිර්මාණය කර ගත් අංශයක් තමයි, ප්‍රවාහනය කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු ලක්ෂ ගණනකට පෙර සිටි මිනිසුන් තමන්ගේ ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගත්තේ තම දෙපයින්. මම හිතන විධියට ඒ මිනිසුන් දවසකට හැතැප්ම 10ක්, 15ක් පමණ ඇවිද්දා. ඊට පසුව මිනිස්සු ටිකෙන් ටික දියුණුවට පත් වෙද්දී රෝදය සොයා ගත්තා. විශේෂයෙන්ම 18වන සියවස විතර වෙනකොට යුරෝපය තුළ ඇති වුණු කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් මත ඩේම්ලර් නමැති ඉංජිනේරුවා විසින් මෝටර් රථයක් නිර්මාණය කළා. පයින් ගමන් ගිය මිනිසුන් පසු කාලීනව push-cycle එකෙන් යන්න පටන් ගත්තා.

අද වනවිට ඉතා දියුණු මට්ටමේ, නවීන පන්නයේ, විවිධ පහසුකම් සහිත රේන්ජ් රෝවර්, ෆෙරාරි වාගේ විවිධ වර්ගයේ වාහන නිර්මාණය වෙලා තිබෙනවා.

ප්‍රවාහනය කියන්නේ, අපි මිනිසුන් විධියට සාමාන්‍යයෙන් හොඳ ජීවන තත්ත්වයක් නිර්මාණය කර ගන්න, කාලය ඉතුරු කර ගන්න භාවිත කරන පහසුකමක්, ඒ වාගේම රටේ සංවර්ධනය මනින්නත් යොදා ගන්නා මිනුම් දණ්ඩක්. ටිකෙන් ටික මේ ක්‍රියාවලියේ දියුණුවත් එක්කම මිනිස්සු සංකීර්ණ වෙන්න පටන් ගත්තා. මිනිසුන්ගේ සිතුම් පැතුම් වෙනස් වුණා. මිනිස්සු කාර්ය බහුල වුණා. විශේෂයෙන්ම මෝටර් රථයක ගමන් කරනකොට ඔවුන්ට විවිධ සිතුවිලි ඇති වෙන්න පටන් ගත්තා. ඒ අනුව, ඔවුන්ගේ මනස වෙනස් වුණා.

අතීතයේදී අපේ ප්‍රවාහන අවශ්‍යතා වෙනුවෙන් අපි දෝලා, ඉදෝලි, කුණම්, තවලම්, ගැල් වාගේ දේවල් භාවිත කර

තිබෙනවා. මෙහෙම තිබියදී විශේෂයෙන්ම අපේ රට තුළ හික්මුණු, විනයගරුක, නීතියට අවනත, අනෙක් පුද්ගලයින් කෙරෙහිත් තමා හා සමානව හිතන, තව කෙනෙක් පරයා නොයන හොඳ විනයක් සහිත මිනිහෙක් නිර්මාණය කර ගන්න අපට අවශ්‍ය වුණා. එතැනදී අපට රටක නීතිය අත්‍යවශ්‍ය වෙනවා. නමුත්, අද වනවිට අපේ රටේ රථ වාහන භාවිත කරන, රථ වාහන පදවන අපේ රියැදුරන්ගේ හැසිරීම මොන වාගේද කියලා අපි දකිනවා. තමන් තුළ තිබෙන්න ඕනෑ විනයගරුක බව, හික්මීම, ඉවසීම වැනි ගුණාංග අපේ රියැදුරන් තුළ තිබෙනවා ද කියලා ප්‍රශ්නයක් අපට තිබෙනවා. විශේෂයෙන්ම අපි දකිනවා, විවිධ පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිත කරලා රිය පදවන අවස්ථා. මෙතැනදී ප්‍රධාන වශයෙන් කතිකාවට එන්නේ අරක්කු පානය කර රිය පැදවීමයි. නමුත්, අරක්කු විතරක් නොවෙයි, අයිස්, ගංජා, හෂීස් වැනි මත්ද්‍රව්‍ය භාවිත කරලා සමහර රියැදුරන් රථ වාහන ධාවනය කරනවා. විශේෂයෙන්ම පොලිසියේත් වැඩි අවධානයක් යොමු වෙලා තිබෙන්නේ අරක්කු පානය කරලා රථ වාහන ධාවනය කරනවා ද, නැද්ද කියලා සොයා බැලීම සඳහා විතරයි. මේ ක්‍රියාවලිය නිසා විශේෂයෙන්ම රථ වාහන තුළ ගමන් කරන මගීන් විතරක් නොවෙයි, මහ පාරේ ගමන් කරන පදිකයන්ට පවා විශාල වශයෙන් ජීවිතවලින් වන්දි ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා.

මම නියෝජනය කරන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කය. මේ දිස්ත්‍රික්කයේ අලව්ව සහ පොල්ගහවෙල අතර යාන්ගල්මෝදර කියලා දුම්රිය හරස් මාර්ගයක් තිබෙනවා. විනයක් නැති, ඉවසීමක් නැති, හික්මීමක් නැති, දරා ගැනීමක් නැති රියැදුරෙකුගේ සහ කොන්දොස්තරවරයෙකුගේ ක්‍රියාකාරකම් නිසා 2005 අප්‍රේල් මාසයේ 27වැනි දා යාන්ගල්මෝදර දුම්රිය හරස් මාර්ගයේදී විශාල අනතුරක් සිද්ධ වුණා. එම අනතුරින් මිනිස් ජීවිත 45කට ආසන්න ප්‍රමාණයක් අපේ රටට අහිමි වුණා. ඒ වාගේම, 2025 වර්ෂයේදී කතරගම ඉඳන් කුරුණෑගල දක්වා ගමන් කළ රාත්‍රී බස් රථයත් ගැරඬිඇල්ල ප්‍රදේශයේදී අනතුරට ලක් වුණා. මට මතක හැටියට, ඒ අනතුරින් ජීවිත 22කට ආසන්න ප්‍රමාණයක් අහිමි වුණා. මේ, අපේ රටේ අනාගතය; අපේ රටේ සංවර්ධනය. ඒ නිසා මිනිස්සු මේ සිදු කරන යම් යම් ක්‍රියාකාරකම් නිසා, ඔවුන් තමන්ගේ පියවි සිහියෙන් තොරව රථ වාහන ධාවනය කිරීම නිසා සිද්ධ වෙන්නේ මිනිස් ජීවිත විශාල වශයෙන් විනාශ වෙන එකයි; මිනිස් ජීවිත අපට අහිමි වෙන එකයි. රිය අනතුරු හේතුවෙන් දිනකට ජීවිත 7කට ආසන්න ප්‍රමාණයක් නැති වෙනවා. "දිට්වා" සුළි කුණාටුවෙන් සිද්ධ වෙච්ච හානියට වඩා, සුනාමියෙන් සිද්ධ වෙච්ච හානියට වඩා වැඩි හානියක් රිය අනතුරු නිසා සිද්ධ වෙනවා. පුද්ගලයෙකුගේ ජීවිතයක තිබෙන වටිනාකම අපට මිල කරන්න බැහැ. ඒ නිසා දැවැන්ත විනාශයක් මේ ක්‍රියාවලිය තුළින් සිද්ධ වෙලා තිබෙනවා. විශේෂයෙන්ම විනයගරුක බවකින් තොරව, හික්මීමකින් තොරව, මත්ද්‍රව්‍ය භාවිත කිරීමෙන් රථ වාහන ධාවනය කිරීම නිසා විශාල විනාශයක් සිද්ධ වෙනවා. ඒ නිසා වග කිවයුතු ආණ්ඩුවක් හැටියට "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉලක්ක කරගෙන කටයුතු කිරීමේදී අපට පැවරිලා තිබෙන ප්‍රධාන වගකීමක් තමයි, අන්න ඒ මිනිසුන්ගේ ජීවිත ආරක්ෂා කරලා දෙන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා තමයි අපි අද මෙන්න මේ විධියට නියෝග ඉදිරිපත් කරන්නේ.

විශේෂයෙන්ම අපේ රටේ පොදු ප්‍රවාහනය සඳහා ලංකා ගමනාගමන මණ්ඩලයේ - SLTB එකේ - බස් රථ සහ පෞද්ගලික බස් රථ භාවිත කරනවා. ඒ වාගේම, අපේ රට තුළ පාසල් ළමුන් ප්‍රවාහනය කරන වෑන් රථ භාවිත වෙනවා. සාමාන්‍ය ජනතාව තමන්ගේ ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගන්න එවැනි රථ වාහන භාවිත කරනවා. ඒ වාගේම ත්‍රී වීලර් රථ, කාර්යාල සේවකයින් ප්‍රවාහනය කරන රථ ද තිබෙනවා. 1980 දශකයේ විතර අපේ රටට ගෙනාපු පොදු ප්‍රවාහනය සඳහා යොදා ගන්නා වාහන මුලින්ම යොදවන්නේ දූර ගමන් සේවා සඳහායි. ඊළඟට, එම වාහන යොදවන්නේ පළාත් අතර ධාවනය කිරීම සඳහායි. ඉන්පසුව, එම වාහන පළාත තුළ ධාවනය කිරීම සඳහා යොදවනවා. ඊළඟට, එම වාහන ගම තුළ ධාවනය කිරීම සඳහා යොදවනවා. අවසානයේදී අපි දකිනවා, 1980 දශකයේ නිෂ්පාදනය වුණු බස් රථ පාසල් දරුවන් ප්‍රවාහනය කරන රථ බවට පත් වෙලා තිබෙන ආකාරය. 1980 ගණන්වල නිෂ්පාදනය වෙච්ච 60- වාහන, 61- වාහන පාසල් දරුවන් ප්‍රවාහනය කරන රථ බවට පත් වෙලා තිබෙනවා.

අපි මෙතැනදී අවධානය යොමු කළ යුතු දෙයක් තමයි, වාහන තුළ තිබෙන තත්ත්වය. එම වාහනවල තත්ත්ව පරීක්ෂණය කෙරෙහි අපි අවධානය යොමු කරන්න ඕනෑ. මේ බස් රථ අනිවාර්යයෙන්ම යෝග්‍යතාව පිළිබඳ පරීක්ෂණයකට ලක් කළ යුතුමයි. එහෙම වුණොත් තමයි අපිට මේ රටේ මිනිසුන්ගේ ජීවිත ආරක්ෂා කර ගන්න පුළුවන්කම ලැබෙන්නේ. මේ සම්බන්ධයෙන් අපට කුරුණෑගල දිස්ත්‍රික්කයේත් හොඳ උදාහරණ කිහිපයක්ම තිබෙනවා. විශේෂයෙන්ම යාන්ගල්මෝදර අනතුරින් වාගේම ගැරඬිඇල්ලේදී සිදු වූ බස් රථ අනතුරිනුත් යම් ජන කොටසක් මිය ගියා. කුලියාපිටිය ප්‍රදේශයේ සිසුන් ප්‍රවාහනයට යොදා ගත්ත පාසල් වෑන් රථයක් පසුගිය දවසක ටිපර් රථයක් සමඟ ගැටුණා. උදේ පාන්දර පාසලට යන්න ගිය දරුවෝ ඒ වෑන් රථය තුළ සිටියා. එම අනතුරින් ඒ වෑන් රථයේ හිටපු සමහර දරුවන්ගේ ජීවිත අහිමි වුණා. ඒ නිසා මෙවැනි අනතුරු සිද්ධ වෙන්නේ මත්ද්‍රව්‍ය නිසා පමණක්ම නොවෙයි. අනිවාර්යයෙන්ම මේ වාහනවල යෝග්‍යතාව අපි බලන්න ඕනෑ. ඒ වාගේම වාහනය මහා මාර්ගය තුළ ධාවනය කරන්න සුදුසු ද, නැද්ද, බ්‍රේක් තිබෙනවා ද කියාත් සොයා බලන්න ඕනෑ.

ගරු අමාත්‍යතුමා උදේ ඒ ගැන පැහැදිලි කිරීමක් කළා, මේ වාහන පිළිබඳ අනිවාර්යයෙන් පරීක්ෂණයක් කරන්න ඕනෑ කියලා. රියැදුරන් පිළිබඳව විතරක් නොවෙයි, වාහන පිළිබඳවත් හොඳ තත්ත්වයක් තිබෙන්න ඕනෑ.

මේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් ග්‍රාමීය මාර්ගවල බස් රථ ධාවනය කිරීම අපි මේ ජනවාරි 01වෙනි දා ආරම්භ කළා. ඒ වාගේම ජනවාරි මාසයේ 01වෙනි දා මාර්ග 77ක් කාපට් කිරීමට හෝ කොන්ක්‍රීට් කිරීමට පටන් ගත්තා. ලංකාවේ වැඩිම වැය බරක් මේ කටයුතු වෙනුවෙන් පසුගිය වසරේ දරා තිබෙනවා. නියෝජ්‍ය අමාත්‍ය ගරු ප්‍රසන්න ගුණසේන මැතිතුමා පැහැදිලි කළා, ප්‍රාග්ධන වියදම සියයට 90කට එහා, ඒ කියන්නේ ලංකා ඉතිහාසයේ වැඩිම ප්‍රාග්ධන වියදමක් දරන ලද්දේ පසුගිය 2025 අවුරුද්දේ බව. මිලියන 5,000කට ආසන්න වැය බරක් දරලා මාර්ග කාපට් කිරීම සහ කොන්ක්‍රීට් කිරීම අපි පටන් ගත්තා. අපි ප්‍රවාහන ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් දැවැන්ත වැඩ ප්‍රමාණයක් ආරම්භ කරලා තිබෙනවා. විශේෂයෙන්ම මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත-මීරිගම කොටසේ, පොතුහැර-රඹුක්කන කොටසේ අපි වැඩ පටන් අරගෙන තිබෙනවා. ඒ වාගේම තමයි කුරුණෑගල-දඹුල්ල අධිවේගී මාර්ගය නිර්මාණය කිරීමට අවශ්‍ය ශක්‍යතා අධ්‍යයන පිළිබඳ හොයා බලා ඉඩම් අත්පත් කර ගැනීම්, ඒ වෙනුවෙන් වන්දි ගෙවීම්, ඒ සඳහා අවශ්‍ය මුදල් වෙන් කිරීම සඳහා මේ අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා.

"දිට්වා" සුළි කුණාටුව නිසා විනාශ වෙච්ච මාර්ග විශාල ප්‍රමාණයක් අපි දැක්කා. මා නියෝජනය කරන්නේ වාරියපොළ ආසනය. ඝන අඩි 110,000ක ජල ධාරිතාවක් තත්පරයකට නිකුත් වෙනකොට එය ලංකා ඉතිහාසයේ ජලාශයකින් නිකුත් වෙච්ච වැඩිම ජල දහරාව විධියට අපිට හිතන්න පුළුවන්. මම නියෝජනය

[ගරු සුජීව දිසානායක මහතා]

කරන ආසනය හරහා ප්‍රධාන ගංගාධාර තුනක් ගලනවා. එනම්, දැදුරු ඔය, මගුරු ඔය සහ කොලමුණු ඔය. ලංකාවේ එකම මැතිවරණ බල ප්‍රදේශය, ප්‍රධාන ගංගා තුනෙන් වට වෙච්ච. මේකෙන් අපේ ග්‍රාමීය මාර්ග 116ක් විනාශ වුණා. අපි මේ වෙනකොට ඒ ග්‍රාමීය මාර්ග 116ම හදලා ඉවරයි. විශේෂයෙන්ම අපේ වාරියපොළ ප්‍රාදේශීය සභාවට, කුරුණෑගල මාර්ග සංවර්ධන අධිකාරියේ - RDA එකේ - නිලධාරි මහත්වරුන්ට මම විශේෂ ස්තුතියක් ප්‍රදානය කරන්න ඕනෑ. මේ ව්‍යසනය නිසා වාරියපොළ, ගනේවත්ත මාර්ගයේ, දැදුරු ඔය පාලම අසලින් සම්පූර්ණයෙන්ම පාර ගලවාගෙන ගියා. ඒ, අඩි 40කට වඩා ගැඹුරක් සහිත අඩි 60ක පමණ දිග කොටසක්. දෙසැම්බර් මාසයේ 21වෙනි දා වන විට එය හදන්නයි තක්සේරු කරලා තිබුණේ. නමුත්, දෙසැම්බර් 14වෙනි දා වෙනකොට ජනතාවට භාවිත කරන්න පුළුවන් ආකාරයට මේ මාර්ගය නිර්මාණය කළා. ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා සපුරන්න මේ විධියට වැඩ කිරීම සම්බන්ධයෙන් විශේෂයෙන්ම මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරින්ට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි මහනුවර දිස්ත්‍රික්කයට, ඒ වාගේම මාතලේ දිස්ත්‍රික්කයට අපි මේ කටයුතුවලදී සහයෝගය දැක්වූවා. අපේ ප්‍රධාන මාර්ග ටික හදලා ඉවර කරලා තිබෙනවා. මේ වෙනකොට අපේ ග්‍රාමීය මාර්ග සියල්ලක්ම වාගේ හදලා ඉවර කරලා තිබෙනවා. අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්තුමාගේ ඉල්ලීම පරිදි, අපේ සභාව සතුව තිබුණු බැකෝ යන්ත්‍ර, JCB යන්ත්‍ර අපි මේ වෙනකොට මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රදේශයට යවලා තිබෙනවා. ඒ වාගේම මාතලේ දිස්ත්‍රික්කයේ අම්බොක්ක, කොස්වත්ත වාගේ ප්‍රදේශවල වාරිමාර්ග වාගේම මාර්ග ඉදි කරන්න අපේ ශ්‍රමය යොදවලා තිබෙනවා. අද දවසේ මේ විවාදය තුළ අපි සාකච්ඡා කරන මේ මාතෘකාව ඉතාම කාලෝචිත බව ප්‍රකාශ කරමින්, මට අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.54]

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டிலுள்ள முக்கியமானதோர் அமைச்சான போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சுடன் தொடர்புடைய மோட்டார் வாகனச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பில் இன்று நாங்கள் விவாதித்துக் கொண்டு இருக்கின்றோம். ஒரு நாட்டில் வளர்ச்சி ஏற்படுவதற்கு போக்குவரத்து, நெடுஞ்சாலைகளுடன் தொடர்புடைய அமைச்சு மிக முக்கியமானது. இந்த அமைச்சுடன் இணைந்ததாக நகர அபிவிருத்தியும் இருக்கின்றது. மக்கள் நன்மை அடையக்கூடிய அமைச்சாகவும் இந்த அமைச்சு இருக்கின்றது. மக்கள் நன்மை அடையக்கூடிய பணிகளைச் செய்தால் மரணித்ததற்குப் பிறகும் புண்ணியம் கிடைக்குமென பொதுவாக எல்லா மார்க்கங்களிலும் சொல்லப்படுகின்றது. அது போன்றுதான் இந்த அமைச்சு இருந்துகொண்டு இருக்கின்றது. இந்த அமைச்சுக்குப் பொறுப்பான அமைச்சர் அவர்கள் அரசாங்கத்தின் முக்கிய ஒரு நபராக இருந்து நல்ல பல பணிகளைச் செய்துகொண்டு இருக்கின்றார்.

கடந்த அனர்த்த நிலைமையின்போது, கௌரவ அமைச்சர் அவர்கள், பிரதி அமைச்சர் அவர்கள், அமைச்சின் அதிகாரிகள், RDAஇன் அதிகாரிகள் என அனைவருமே போக்குவரத்து சார்ந்த விடயங்களைச் சீர்செய்வதில் பெரும் பங்காற்றி இருந்தார்கள். அதற்காக அவர்கள் அனைவருக்கும் எமது மக்கள் சார்பாக நன்றி சொல்லக் கடமைப்பட்டு இருக்கின்றேன். நான் கிழக்கு மாகாண சபையில் வீதி அபிவிருத்தி, நெடுஞ்சாலைகளுக்குப் பொறுப்பான அமைச்சராக இரண்டு தடவை பதவி வகித்து பணி செய்திருக்கிறேன். அந்த அடிப்படையில், நல்ல பணிகளைத் தொடர வேண்டுமென நான் உங்கள் அனைவரையும் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, உங்களிடம் முன்வைக்கின்ற கோரிக்கை என்னவெனில், மட்டக்களப்பிலிருந்து பொத்துவில் வரை புகையிரதப் பாதையை அமைப்பதற்கான திட்டத்தை நீங்கள் உங்களுடைய காலத்தில் வகுக்க வேண்டும் என்பதைத்தான். நான் இந்தப் பாராளுமன்றத்தில் உறுப்பினராக இருக்கும்வரை அக்கோரிக்கையை முன்வைத்துக் கொண்டிருப்பேன். இக்கோரிக்கையை நான் உங்களிடம் முதலாவது தடவை முன்வைத்தபோது, 'ஐயோ!' என்று தலையில் கைவைத்து, "අවුරුදු පහක් මුදල් වෙන් කෙරුවත් මඩකලපුව-පොතුවිල් railway එක හදන්න බැහැ" කියලා ඔබතුමා කිව්වා. ඊට පස්සේ මම කිව්වා, පසුගිය රජය කාලයේ - මන්සූර් නියෝජ්‍ය ඇමතිතුමාගේ කාලයේ - මුදල් වෙන් කරලා මේ project එක පටන් ගත්තා කියලා. මම එහෙම කිව්වාම ඔබතුමා කිව්වා, "මම ඒක ඔළුවට ගන්නම්" කියලා. හැම meeting එකකම මම ඒ ගැන කථා කරනවා. ඔබතුමා මේ අමාත්‍යාංශයේ ඇමති ධුරයේ ඉන්න කොට ඒක කරන්න පුළුවන්. සමහර විට අමාත්‍යාංශය වෙනස් වෙන්නත් පුළුවන්. එහෙම නැත්නම් උසස් වෙලා වෙනත් place එකකට යන්න පුළුවන්. ඔබතුමා ආණ්ඩුවේ දෙවැනි, තුන්වැනි place එකේ ඉන්න නිසා මම ඔබතුමාගෙන් මේ ඉල්ලීම කරන්නම්. නැඟෙනහිර පළාතේ මිනිසුන්ගේ බලාපොරොත්තුවත් මඩකලපුව සිට පොතුවිල් වෙනකල් railway එක හදලා දෙන්න කියන එකයි.

எனவே, நீங்கள் அதற்கான திட்டங்களை வகுக்க வேண்டும். நான் இந்த விடயம் தொடர்பில் அமைச்சசார் ஆலோசனைக் குழுவில் சமர்ப்பித்த முன்மொழிவுடன் தொடர்புடைய கடிதத்தின் பிரதியை இந்தச் சபையில் ***சமர்ப்பிக்கின்றேன்**.

இந்தக் கடிதத்தில், இதுவரை அமைச்சினால் மட்டக்களப்பிலிருந்து பொத்துவில் வரை புகையிரதப் பாதையை நீடிக்கும் கருத்திட்டமென்று முன்வைக்கப்படவில்லை என்றும் அவ்வாறானதொரு கருத்திட்டம் முன்வைக்கப்பட்டால் அது தொடர்பில் நடவடிக்கை எடுப்பதாக புகையிரத பொது முகாமையாளர் அறிக்கையிட்டு இருப்பதாக குறிப்பிடப்பட்டு இருக்கிறது.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

அண்மையில் நாங்கள் பாராளுமன்றத்தில் ஈரான் நாட்டின் தூதுவரைச் சந்தித்துப் பேசினோம். அப்போது அவர், இலங்கையில் நீர்ப்பாசனம் மற்றும் போக்குவரத்து வசதிகளைச் செய்வதற்கு உதவி செய்வதாகச் சொன்னார். கௌரவ அமைச்சர் அவர்களே, வெளிநாட்டு நிதிகளைப் பெற்று மேற்கொள்கின்ற திட்டத்துக்குள் நீங்கள் இதனைக் கொண்டுவாருங்கள்! நாகரிகம் வளர்ச்சியடைந்து இருக்கின்ற இந்தக் காலத்தில்கூட, பொத்துவில், பானம, லகுகலையிலிருந்து மட்டக்களப்புக்குச் செல்வதற்கு புகையிரத சேவையைப் பயன்படுத்த முடியாமல் இருக்கின்றது. இந்தப் பகுதியில் பொத்துவில் மாத்திரமல்ல, சிங்கள, தமிழ், முஸ்லிம்கள் வாழுகின்ற நிறையப் பிரதேசங்கள் இருக்கின்றன. கௌரவ அமைச்சர் அவர்களே, உங்களுடைய காலத்தில் இதனை மேற்கொள்வதற்கான திட்டங்களைத் தீட்டி, வெளிநாட்டு நிதி உதவிமூலம் மேற்கொள்வதற்குரிய ஏற்பாடுகளைச் செய்தால், எங்களால் முடியுமான அளவு முஸ்லிம் நாடுகளின் தூதுவர்களைச் சந்தித்து நிதி உதவிகளைப் பெற்றுத்தர முடியும். இதனை நீங்கள் உங்களுடைய பதவிக் காலத்தில் செய்வீர்களேயானால், உங்களுக்கு நற்பெயர் கிடைக்கும்; நன்மை கிடைக்கும். நாங்கள் அடிமட்ட மக்களோடு இருப்பதனால், அவர்களின் உணர்வு என்ன என்பதைத்தான் இங்கு சொல்ல வருகின்றேன். கடந்த அரசாங்கத்தினர் ஏமாற்றினார்கள். நீங்கள் புரிந்துணர்வோடு இந்த விடயத்தை அணுகி, மட்டக்களப்பிலிருந்து பொத்துவில் வரை புகையிரத சேவையை விஸ்தரிக்கும் திட்டத்தை மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

நான் இன்னுமொரு விடயத்தைச் சொல்ல வேண்டும். நீங்கள் அம்பாறை மாவட்டத்துக்கு அதிகளவான பணிகளைச் செய்திருக்கிறீர்கள். நான் கிழக்கு மாகாணத்தின் வீதி அபிவிருத்தி அமைச்சராக இருந்தபொழுது, தெஹியத்த கண்டியில் இருந்து 33 கிலோமீற்றர் தூரமுடைய வீதியை அமைத்துக் கொடுத்தேன். நீங்கள் அங்குவந்தபொழுது, அதைப் பார்வையிட்டீர்கள். මම නැඟෙනහිර පළාත් සභාවේ මාර්ග සංවර්ධන ඇමතිතුමා විධියට ඉන්න කාලයේ දෙහිඅත්තකණ්ඩිය මිනිස්සුන්ට ඒ මාර්ගය හදලා දුන්නා. එහි සියයට 100ක් සිංහල මිනිස්සු ජීවත් වෙනවා. අපි කවදාවත් ජාති භේද ඇති කරන්නේ නැහැ. එතුමන්ලාට දුන්නා. ඒක ඔබතුමා දැක්කා. அப்பொழுது, நீங்கள் எமது அம்பாறை மாவட்டத்திலுள்ள அதிகளவான கிராமிய பாலங்கள் மற்றும் வீதிகளைப் புனரமைத்துத் தந்தீர்கள். அதேபோல், இன்னும் நிறையப் பணிகளை எங்களுடைய மக்களுக்குச் செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். බස්නාහිර පළාතට වඩා දුෂ්කර ග්‍රාමීය මාර්ග තිබෙන්නේ අම්පාර දිස්ත්‍රික්කයේ කියලා මම ඔබතුමාට කියන්න කැමැතියි.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் அங்கு வந்தபோது விசேட கூட்டமொன்று நடைபெற்றது. சம்மாந்துறையில் 82,000 பேர் வாழ்கின்றார்கள். அந்தக் கூட்டத்தில் அவர்கள் உங்கள் முன்னிலையிலே சொன்னார்கள், கடந்த அரசாங்க காலத்தில் தற்காலிகமாக கல்முனைக்கு எடுத்துச் செல்லப்பட்ட சம்மாந்துறைக்குச் சொந்தமான உப டிப்போவை மீளப் பெற்றுத்தருமாறு. சம்மாந்துறை மக்களுடைய போக்குவரத்துக்குத் தேவையாக இருக்கின்ற அந்த உப டிப்போவை சம்மாந்துறைக்கு மீளப் பெற்றுத்தரும்படி அப்பிரதேசத்தைச் சேர்ந்த ஆளும் கட்சி, எதிர்க்கட்சி உறுப்பினர்கள் எல்லோரும் சென்னோம். அப்பொழுது நீங்கள் அதிகாரிகளுக்குச் சொன்னீர்கள், ඒ ප්‍රදේශයේ ඉන්න සියලු මන්ත්‍රීතුමන්ලා එකඟ වන නිසා ඒ ඩිපෝව නැවත සමන්තුරේට දෙන්න කියලා. නමුත් තවම නැහැ. அப்பிரதேசத்தைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர்கள் எல்லோரும் ஒருமித்துக் கோருவதால் அதனை உடனடியாக மீள வழங்குமாறு கௌரவ அமைச்சர் அவர்கள் சொல்லியிருப்பதாக அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்தில் சொல்லியிருக்கிறார்கள். நீங்கள்தான் எங்களுடைய போக்குவரத்து அமைச்சர். அது நீங்கள் மட்டும்தான்; வேறு எவரும் இல்லை.

ඔබතුමා විතරයි ප්‍රවාහන ඇමතිතුමා. වෙන කවුරුවත් නැහැ. ඒ නිසා අපි මහජන නියෝජිතයෝ හැටියට ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ගරු අතම්බාවා මන්ත්‍රීතුමා ගිය සුමානේ ගිහිල්ලා පොඩ්ඩක් ශුද්ධ කරලා එතැන පටන් ගත්තා කිව්වා. නමුත් තවම ලියුම ආවේ නැහැ. තවම ලියුම හම්බ වෙලා නැහැ. පොදු වැඩවලට අපි එකඟ වෙනවා. ඔබතුමා දන්නවා නේ. අම්පාර දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, රටේ කෙරෙන පොදු වැඩවලට අපි එකඟ වෙනවා. ඒක නිසා කරුණාකරලා ඒ ඩිපෝව ආයේ සමන්තුරේට දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

නැඟෙනහිර පළාත් සභාවේ මාර්ග සංවර්ධන හා වාරිමාර්ග ඇමතිතුමා විධියට හිටපු කාලයේ මම ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට ගියා, පාරක් විවෘත කරන්න. එහේ තිබුණු, මූතූර් වේදත්තීව් - මජිඩ්පුරම් කියන ප්‍රදේශයේ දෙමළ, මුස්ලිම් මිනිස්සු ජීවත් වුණා. ඒ කාලයේ ඒ ගම්මානය ඇතුළේ Navy එකේ කට්ටිය තමයි හිටියේ; යන්න දුන්නේ නැහැ. මම ඇහුවා, ඇයි කියලා. මම හිතන විධියට, ඒ 2013 වර්ෂයේ. ඒගොල්ලන් කිව්වා, "යන්න දෙන්නේ නැහැ, ත්‍රස්තවාදී ප්‍රශ්නයක් නිසා" කියලා. අපිට ඉඩම්වල ඔප්පු තිබෙනවා කියලා කිව්වා. මම එතැනදී නාවික හමුදා නිලධාරිතුමාට විශේෂයෙන් කථා කරලා ඒ ගම්මානය හැදුවා. එහේ 115කට විතර ගෙවල් දුන්නා; විදුලිය දුන්නා; පාසල් දුන්නා; ස්වයං රැකියාවලට අවශ්‍ය දේවල් දුන්නා. මගේ අමාත්‍යාංශය යටතේ දෙන්න පුළුවන්කම තිබුණු නිසා ඒවා දුන්නා. හැබැයි, ගඟෙන් එහා පැත්තට යන්න ඒගොල්ලන්ට මොකුත් තිබුණේ නැහැ. පොඩි ඔරුවකින් තමයි ඒගොල්ලන් ගියේ. ඊට පස්සේ මගේ පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශයෙන් ferry එකක් දැම්මා. පසු ගිය කාලයේ RDA එක පාලමක් දාන්න estimate එකක් හදලා ඔක්කොම කළා. නමුත් ඊට පස්සේ ඒක return වුණා.

ඒ, මූතූර් වේදත්තීව් - මජිඩ්පුරම් කියන්නේ දෙමළ සහ මුස්ලිම් මිනිස්සු ජීවත් වෙන ප්‍රදේශයක්. මම ජනාධිපති ඡන්දය ඉල්ලන්නේ නැහැ නේ. මම ත්‍රිකුණාමලයේ ඒ මිනිස්සු වෙනුවෙන් මේ ඉල්ලීම කරන්නේ, ඒ අය දුප්පත් මිනිස්සු හින්දා. ඒ දුප්පත් මිනිස්සු ඡන්දය දෙන කොට කාට ඡන්දය දෙනවාද කියලා අපි දන්නේ නැහැ නේ. මොකද, ඒ මිනිස්සු ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ; මම අම්පාර දිස්ත්‍රික්කයේ. අපේ අෂ්රොෆ් හිටපු ඇමතිතුමා එක දෙයක් කිව්වා. මම උදාහරණයක් හැටියට ඒක කියන්නම්. මොකද, මේ සභාවේ අලුත් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා ඉන්නවා. අෂ්රොෆ් ඇමතිතුමා කිව්වා, "ඔයගොල්ලෝ හීනයක් දකිනවා නම් ලොකුවට දකින්න ඕනෑ" කියලා. கனவு காண்பதென்றால், பெரிதாகக் காணுமாறு எங்களுடைய தலைவர் மர்ஹூம் அஷ்ரப் அவர்கள் சொல்லியிருக்கிறார்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

அது மாத்திரமல்ல, அரசியல் செய்யும்போது ஏழைகளின் மனம் நோகாதபடி நடந்து கொள்ளுமாறும் அவர்களுக்கு உதவி செய்யுமாறும் அவர் சொல்லியிருக்கிறார். எனவே, கௌரவ அமைச்சர் அவர்களும் பிரதி அமைச்சர் அவர்களும் அமைச்சின் உத்தியோகத்தர்களும் தமிழர், முஸ்லிம்கள், சிங்களவர் என்ற பேதமில்லாமல் அனைவருக்கும் இந்த அமைச்சினூடாகப் பணி செய்ய வேண்டுமெனக் கேட்டு விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.03]

**ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෝටර් වාහන පනත යටතේ ගෙන එන මෙම නියෝග ඉතාම කාලෝචිත අවශ්‍යතාවක් හැටියට මම දකිනවා.

මෙය ගරු ප්‍රවාහන, මහාමාර්ග ඇමතිතුමාගේ විෂය නිසා මම මේ විෂය ගැන පොඩ්ඩක් කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හලාවත, ජයබිම, සුසානභූමි පාරේ පාලමක් ඉදි කරමින් තිබුණා. ඒ පාලම හදන එක කෝටි දෙකහමාරකට estimate කරලා දැනට සියයට 50ක වැඩ නිම කරලා තිබෙනවා. එහි වැඩ භාගෙට නැවතිලා නිසා ඒ පාලමේ වැඩ නිම කරලා දෙන්න කියලා ඒ සියලුම ජනතාව ඉතා කාරුණිකව ඉල්ලා සිටිනවා. ඒ කටයුතු අධීක්ෂණය කරලා බලන්න.

ඒ වාගේම කල්පිටිය මුහත්තුවාරම් පාරේත් පාලමක් ඉදි කරමින් තිබුණා. ඒක මුහුද සහ කළපුව දෙකම එකතු වෙන තැන. එතැන සිංහල මාධ්‍ය ඉස්කෝලයක් සහ දෙමළ මාධ්‍ය ඉස්කෝලයක් වශයෙන් පාසල් දෙකක් තිබෙනවා. ඒ ස්ථානය tourismවලටත් වැදගත් ස්ථානයක්. ඒ පාලමේ වැඩත් භාගෙට නැවතිලා තිබෙනවා. ඒකත් අධීක්ෂණය කරලා බලලා අවශ්‍ය කටයුතු කරන්න කියලා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කරඹ-උඩප්පුව පාර කිලෝමීටර 25ක් විතර වෙනවා. ඒක PRDA පාරක්. ඒ පාර ගංවතුරට යට වීම නිසා බෝක්කු ඔක්කොම කැඩිලා ගිහිල්ලා තිබෙනවා. ඒක ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දෙන පාරක්. ඉදිරියේදී ඒකත් සංවර්ධනය කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු ජනාධිපතිතුමා පුත්තලම ඉස්පිරිතාලය වැඩිදියුණු කිරීමට දරන උත්සාහය සම්බන්ධයෙන් මම එතුමාට ස්තුතිය පුද කරනවා. ඒ වාගේම පුත්තලම ග්‍රාමීය ආයුර්වේද රෝහලක් තිබෙනවා. දැනට විශාල ජනගහනයක් ඒකෙන් බෙහෙත් ගන්නවා. නමුත්, එම රෝහලට අවශ්‍ය පහසුකම් නැහැ. එහි ඉන්න doctorsලා, කාර්ය මණ්ඩලය උනන්දුවෙන් වැඩ කරනවා. නමුත් එම රෝහලට අවශ්‍ය පහසුකම් නැති නිසා එය මූලික රෝහලක්. නැත්නම් දිස්ත්‍රික් රෝහලක් බවට පරිවර්තනය කරනවා නම් හොඳයි. එතකොට පුත්තලමට විතරක් නෙවෙයි වාසි ලැබෙන්නේ. පුත්තලම අවට ඉන්නවා විශාල ජනගහනයක්. පුත්තලම, ආනමඩුව, වනාතවිල්ලුව, කරුවලගස්වැව, කල්පිටිය ප්‍රදේශවල වෙසෙන ජනතාව ආයුර්වේද වෙදකමට පුරුදු වෙලා ඉන්නවා. එහි ඉන්න කාර්ය මණ්ඩලයත් උනන්දුවෙන් වැඩ කරනවා. එම නිසා එම රෝහලට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම මම තව එක ඉල්ලීමක් කරනවා. UDA එක පටන් ගත්තු වැඩක් තියෙනවා. ඒක, ජල යෝජනා ක්‍රමයක්. ඒ කියන ජල යෝජනා ක්‍රමයට අදාළව කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විශේෂයෙන්ම මදුරන්කුලිය, විරුකොඩේ, කනමූල, කඩයාමොට්ට ප්‍රදේශවල දැනට බට lines ඔක්කොම එළලා තිබෙනවා. දැනට මඩ වතුර තමයි බොන්නේ, ඒ ජනතාව. ඒක ඉඟිනිමිටිය ජල යෝජනා ක්‍රමයට අයිති එකක්. මම හිතන විධියට ඒක 2018 වර්ෂයේ ආරම්භ කරපු යෝජනා ක්‍රමයක්. දේශපාලනයෙන් තොරව ජනතාවට එහි කටයුතු නිම කර දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

වාහන ගෙන්වීම ගැනත් විශේෂයෙන්ම කියන්න ඕනෑ. දැන් වාහන ගෙන්වනවා. වාහන ගෙන්වන කට්ටිය ඔක්කොම දැන් හිර වෙලා ඉන්නවා. මේ ආර්ථික තත්ත්වයත් එක්ක දැන් වාහන විකිණෙන්නේ නැහැ. මාස 3කින් register කළේ නැත්නම් DMT එක ඒකට වෙනම fine එකක් ගහනවා. ඒ වාහන ගෙන්වන කට්ටියට මාස 3 සීමාව මාස 6 කරලා දෙනවා නම් හොඳයි. දැනට වාහන ගෙන්වා තිබෙන අය bank loans, වෙනත් loans වර්ග අරගෙන තමයි වාහන ගෙනැල්ලා තිබෙන්නේ. ඇත්තටම ඒ පිළිබඳව යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ Districts 25ක් තිබෙනවා. ඔබතුමන්ලාගේ සංඛ්‍යාලේඛන අරගෙන බලන්න, සැලැස්මවල් - plans - අරගෙන බලන්න, ඒ දිස්ත්‍රික්ක 25 අතරින් පුත්තලම දිස්ත්‍රික්කය තමයි ආර්ථිකය පැත්තෙන් වැඩියෙන්ම විනාශ වෙච්ච දිස්ත්‍රික්කය. එහේ ජනතාව අතර ගොවි ජනතාව ඉන්නවා; අනෙක් පැත්තෙන් ලුණු කර්මාන්තය, ඉස්සෝ කර්මාන්තය, මාළු කර්මාන්තය, කොහු කර්මාන්තය ආදී කර්මාන්ත කරන ජනතාවත් ඉන්නවා. පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම ආසනය තුළ කෙරෙන එම කර්මාන්ත විශාල වශයෙන් හානියට ලක් වුණා. අපි කියන්නේ නැහැ, ඔබතුමන්ලා සහනාධාර දුන්නේ නැහැ කියලා. සහනාධාර ලබා දෙනවා වාගේම ඒ කර්මාන්ත නැවත ශක්තිමත් කරන්න අවශ්‍ය පහසුකම් ආණ්ඩුවක් හැටියට ලබා දෙන්න කියලාත් ඉල්ලා සිටිනවා.

හැම තිස්සේම කථා කරනවා, පුත්තලම, කරතිව්, වනාතවිල්ලුව, සිංගනාගවිල්ලුව කියන ප්‍රදේශ ගැන. ඒවා වතුරෙන් යට වෙලා තිබෙනවා. දැනුත් වතුරෙන් යට වෙලා තිබ්යදී තමයි ඒ ජනතාව එහේ ඉන්නේ. ආණ්ඩුව යම් යම් ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ක්‍රියාමාර්ග අරගෙන නැහැ කියලා මම කියන්නේ නැහැ. හැකි ඉක්මනින් අවශ්‍ය අනෙකුත් ක්‍රියාමාර්ග අරගෙන ඒ ජනතාවට යම්කිසි සහනයක් ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

සුළි කුණාටුව සහ ගංවතුර පැවැති කාලයේදී විශේෂයෙන්ම රාජ්‍ය නිලධාරින් ගොඩක් වැඩ කළා. ඒගොල්ලන් වැඩ කළේ නැහැ කියලා අපි කියන්නේ නැහැ. ඒ අවස්ථාවේ ග්‍රාම නිලධාරි මහත්තුරු, DO මහත්තුරු, ගොවිජන සේවා මහත්තුරු, සමෘද්ධි නිලධාරි මහත්තුරු වැඩ කළා.

ඒ කට්ටිය රෑ දවල් බලන්නේ නැතුව වැඩ කළා. එහෙම වැඩ කළාට ඔවුන්ට දීමනාවක් ලැබුණේ නැහැ. පඩිය හම්බවුණා. ඒ කට්ටිය වැඩි වෙලාවක් වැඩ කළා. ඒකට යම් කිසි දීමනාවක් දුන්නොත්, ඉදිරියේදී ඒ නිලධාරින් හොඳින් වැඩ කරයි කියන කාරණයත් කියන්න ඕනෑ.

විශේෂයෙන්ම කල්පිටිය ප්‍රදේශයේ ඊයේ ලොකු උද්ඝෝෂණයක් තිබුණා. කල්පිටිය කියන්නේ, විශාල ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයට ස්ථිර ප්‍රාදේශීය ලේකම්වරයෙක් නැහැ. වැඩ බලන - acting - ප්‍රාදේශීය ලේකම්වරයෙක් ඉන්නේ. කල්පිටිය පොලීසියේ OICවරයාත් acting ඉන්නේ. කල්පිටියේ "නිර්මල මාතා" කියලා හොඳ සිංහල ඉස්කෝලයක් තිබෙනවා. ඒ ඉස්කෝලෙට විදුහල්පතිවරයෙක් නැහැ. ඒ හැම තැනම පරිපාලන දුර්වලතා තිබෙනවා. ඇත්තටම ඒවා කවුරු හරි plan කරලා කරනවාද දන්නේ නැහැ. ආණ්ඩුවක් හැටියට ඔබතුමන්ලා මේ ගැන විමසලා බලන්න. වැඩ බලන නිලධාරින් තමයි කල්පිටිය නගරයේ හැම ආයතනයකම ඉන්නේ. ඒක ප්‍රධාන නගරයක්. එම නිසා ඒ ආයතනවලට ස්ථිර නිලධාරින් පත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. Acting නිලධාරින්ට හරියට වැඩ කරන්න බැහැ. ඒ අය කියනවා, "අපට වගකීමක් ගන්න බැහැ" කියලා. මම ඒ තැන්වලට ගිහිල්ලා තිබෙනවා. එම නිසා ස්ථිර ප්‍රාදේශීය ලේකම්වරයෙක් පත් කරන්න ඕනෑ, පොලීසියට ස්ථිර OIC කෙනෙක් පත් කරන්න ඕනෑ, ඒ වාගේම කල්පිටිය "නිර්මල මාතා" ඉස්කෝලෙට හොඳ විදුහල්පතිවරයෙක් පත් කරන්න ඕනෑ. එහෙම දැම්මොත් හොඳයි. මේ සම්බන්ධ තොරතුරු ජනාධිපතිතුමාටත් යවලා තිබුණා. එම නිසා කල්පිටිය ප්‍රදේශයේ දියුණුව සඳහා ඉදිරියේදී කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමින්, මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා ඇතුළු සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ධනුෂ්ක රංගනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.10]

**ගරු ධනුෂ්ක රංගනාත් මහතා**
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මේ ගරු පාර්ලිමේන්තුවේ විවාදයට ගනු ලබන මෝටර් වාහන පනතේ විධිවිධාන යටතේ පනවන ලද නියෝග පිළිබඳව අදහස් දැක්වීම සඳහා අවස්ථාවක් ලබා දීම පිළිබඳව මම ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අදාළ ප්‍රස්තුතයට එන්න කලින්, රත්නපුර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් ලංගමය ගැන කියපු කාරණා පිළිබඳව මම පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. ඔව්, අපි දන්නවා, එතුමා කිව්වා වාගේ ලංගමය, නැත්නම් SLTB එක ගැටලු රැසක් මධ්‍යයේ ක්‍රියාත්මක වන ආයතනයක් බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි fantasy එකක නොවෙයි ඉන්නේ. ආණ්ඩු බලය ගත්තාට පස්සේ අපි SLTB එක - ශ්‍රීලංගමය - හදලා මාර සුපිරි තැනකට ගෙනැල්ලා තිබෙනවා කියලා අපි කියන්නේ නැහැ. ඒක හදලා අවසන් කර තිබෙනවා කියලා අපි fantasy එකක නැහැ. හැබැයි, අපට වුවමනාවක් තිබෙනවා, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ඉතාම හොඳ ආයතනයක් විධියට ගොඩනහන්න. ඒ සඳහා අමාත්‍යාංශය විධියටත් අපි මැදිහත් වීමක් කරමින් යනවා. එහි ප්‍රතිඵල ක්‍රමානුකූලව ලැබෙමින් පවතින මොහොතක තමයි අපි මේ ඉන්නේ. අපි ඇත්ත පිළිගන්නවා. එහි යම් ගැටලු තිබෙනවා. ඒ මන්ත්‍රීතුමා කිව්වා වාගේ රත්නපුර දිස්ත්‍රික්කයේ වාගේම, කළුතර දිස්ත්‍රික්කයේත් එවැනි ප්‍රශ්න තිබෙන ඩිපෝ 5ක් තිබෙනවා. එම නිසා ශ්‍රීලංගමය තුළ ඇතිවෙලා තිබෙන ගැටලු නිරාකරණය කිරීම සඳහා අපි හොඳ අධ්‍යයනයක් කළා. අපි දැක්කා, ශ්‍රීලංගමයේ බස් රථ ඇණියේ ගැටලුවක් තිබෙනවා. ඒකට අදාළව බස් රථ ගෙන්වන්න කටයුතු කරමින් ඉන්නවා. ඒ විතරක් නොවෙයි, සේවක ගැටලුවකුත් තිබෙනවා. කොන්දොස්තරවරු, රියැදුරුවරු හිඟකමේ ගැටලුවක් තිබෙනවා. ඒ සඳහා නව බඳවා ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් යනවා. ඒවා දැන් අවසාන අදියරේ තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි, තාක්ෂණික ගැටලුත් තිබෙනවා. විශේෂයෙන්ම මෝටර් රථ කාර්මික ශිල්පීන් ඇතුළු තාක්ෂණික හැකියාව තිබෙන ශිල්පීන්ගේ අඩුවක් තිබෙනවා. ඒ තනතුරුවලට අදාළව බඳවා ගැනීම් ඉදිරියේදී කරනු ලබනවා. මෝටර් රථ කාර්මිකයන් 288ක්, වැද්දුම් ශිල්පීන්, එහෙම නැත්නම් තහඩු පැස්සුම්කරුවන් 52ක්, වාහන විදුලි අංශයට අදාළව කාර්මික ශිල්පීන් 42ක්, පොම්ප ක්‍රියාකරුවන්, ඉංජිනේරුවරු 28ක්, යාන්ත්‍රික ශිල්පීන් 19ක් බඳවා ගැනීමට කටයුතු කරනවා. රටටම බලපාන විධියට තාක්ෂණික හැකියාව සහිත කණ්ඩායමක් බඳවා ගැනීමට අපි කටයුතු කරනවා.

ඒ වාගේම බස් රථ ඇණියේ අඩුවක් තිබෙනවා. ඒකටත් විසඳුම් දෙනවා. ශ්‍රමිකයන්ගේ, නැත්නම් කම්කරුවන්ගේ අඩුවක් තිබෙනවා. ඒකටත් විසඳුම් ලබා දෙන්න මැදිහත් වෙමින් ඉන්නවා. ඒ වාගේම එහි ඇති සුවිශේෂී තත්ත්වයක් පිළිබඳවත් මම මතක් කරන්න ඕනෑ. මෑත ඉතිහාසය ගත්තොත්, කොන්දොස්තරවරු බඳවා ගැනීමේදී අපි හොඳ වැඩක් ක්‍රියාත්මක කරමින් ඉන්නවා.

ඒ තමයි, කාන්තාවන් 25දෙනෙක් කොන්දොස්තරවරියන් විධියට බඳවා ගැනීමට කටයුතු කිරීම. අපි ලංගමයේ තිබෙන අඩුපාඩු හොඳට සොයා බලමින් ඒකට මැදිහත් වෙමින් ඉන්නවා. අවුරුද්දක් තිස්සේ ඒකට සෘජු මැදිහත්වීමක් කරමින් ඉන්නවා. ඒ නිසා අපි හිතනවා, මේ ආයතනය ගොඩ නහන්න පුළුවන් කියලා. හැබැයි, අපි ෆැන්ටසියක නැහැ මේක හදලා ඉවරයි කියලා. නමුත් හදන්න ඕනෑ කියන බලාපොරොත්තුව ඇතිව වැඩ කරමින් ඉන්නවා. ඒකට අදාළව අපි අද දවසේත් ශ්‍රීලංගමයේ ඉන්න නිලධාරින් ඇතුළු වැඩ කරන සියලුදෙනාට ආරාධනා කරනවා, "අපි මේ ආයතනය ගොඩ නහමු, මේක ගොඩ නහන්න පුළුවන් ආයතනයක්. ඒ නිසා අපි හැමෝම මැදිහත් වෙමු" කියලා. දේශපාලන අධිකාරිය විධියට අපිත් උපරිමයෙන් ඒ සඳහා මැදිහත් වෙන බව සඳහන් කරමින්, අපි ඔවුන්ටත් ආරාධනා කරනවා මේක හදන්න දායක වෙන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංගමය කියන්නේ දේශපාලන අතකොළු ගොඩක් ඉන්න තැනක්. ඒ නිසා අපි බොහොම පරිස්සමට මැදිහත් වෙමින් ඉන්නවා. හැබැයි, හිතා මතාම මේ වැඩ පිළිවෙළ කඩාකප්පල් කිරීමේ දේශපාලන අරමුණ තිබෙන අය ඉන්නවා. මේක ගොඩ දමන්න ඉන්න නිලධාරින්ට අපි උදවු කරනවා වාගේම, දේශපාලනික වශයෙන් මේ වැඩ පිළිවෙළ කඩාකප්පල් කරන්න මැදිහත් වෙන අයට ගන්න පුළුවන් ක්‍රියාමාර්ග ගන්න අපි සෘජු ලෙස මැදිහත් වෙමින් ඉන්නවා. අපි මේ ආයතනනය ගොඩ දමනවා. එතුමාට ඒක මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 4.01ට මට වට්ස්ඇප් පණිවුඩයක් ආවා. ඒක අවශ්‍ය නම් මම screenshot එකක් අරගෙන සභාගත කරන්නම්. මේ වට්ස්ඇප් පණිවුඩය කළුතර දිස්ත්‍රික්කයේ Regional Managerගෙන් - RMගෙන් - එන්නේ. එහි සඳහන් වෙනවා, "සර්, අවුරුද්දකට පස්සේ කළුතර ඩිපෝවේ වැටුප අතිරේක මුදල් නොගෙන ගෙව්වා. සර්ට ස්තුතියි, උදවු කළාට." කියලා. ඒ කියන්නේ වැටුප් ගෙවා ගන්න එකත් ඒගොල්ලන්ට සතුටුදායක දෙයක්. අවුරුද්දකට පස්සේ අතිරේක මුදල් ගන්නේ නැතිව වැටුප් ගෙවන්න පුළුවන් මට්ටමට මේ ආයතනය ඇවිත් තිබෙනවා. ඒ නිසා දැන් අපි කරගෙන යන්නේ

[ගරු ධනුෂ්ක රංගනාත් මහතා]

මහ ලාභයක් - ලාභ ගන්න තැන් තිබෙනවා - උපයනවාට වඩා තිබෙන පාඩුව අවම කරගෙන යම් තැනකට ගන්න කටයුතු කිරීමයි. අපි දැන් මේ ආයතනයට මැදිහත් වෙන්න සූදානම් සහ ඉදිරියටත් මැදිහත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ජනවාරි පළමුවැනි දා මුළු ලංකාවම ආවරණය වන පරිදි මෙතෙක් බස් රථ ධාවනය නොවූ ග්‍රාමීය මාර්ග 40ක ලංගමයේ බස් රථ භාවිත කරමින් නව ගමන් වාර 40ක් ආරම්භ කරනු ලැබුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට, අද දවසට අදාළ කරුණ දෙසට හැරුණොත්, අපේ රට වඩා වේගයෙන් සංවර්ධනය කළ යුතු සහ වඩා වේගයෙන් සංවර්ධනය වෙන රටක්. මේ ගමන් මඟේදී ප්‍රවාහන සහ මහාමාර්ග ක්ෂේත්‍රයට වැඩි කර්තව්‍යයක් තිබෙනවා. අපි ජනතාවට වඩා සුරක්ෂිත, වඩා සුවපහසු ප්‍රවාහන පද්ධතියක් අත්පත් කර දීම වෙනුවෙන් මැදිහත් වෙමින් ඉන්න කාල පරිච්ඡේදයක් මේක. අපි භෞතිකව ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාළ දේවල් ගොඩ නඟනවා වාගේම ඒ සෑම පැතිකඩක් පිළිබඳවම සොයමින් ඉන්නවා. ඊකට අදාළව දැනට තිබෙන නීතිවල අඩුපාඩු මඟහරවා ගනිමින්, ඒ නීතිවලට තවත් දේවල් එකතු කරමින් ජනතාවට සුරක්ෂිත ප්‍රවාහන සේවයක් අත්පත්කර කරදීම වෙනුවෙන් අපි කටයුතු කරමින් යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2020-2025 කාල පරිච්ඡේදයේ අපේ රට තුළ රිය අනතුරු නිසා ජීවිත විශාල ප්‍රමාණයක් හානියට පත් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම මාර්ග අනතුරු නිසා ජීවිත අහිමි වූ සංඛ්‍යාව ගත්තොත්, පදිකයන් 2024 වර්ෂයේ 815යි; 2025.07.31 වෙනකොට 455යි. යතුරුපැදිකරුවන් 2024දී 781යි; 2025.07.31 වෙනකොට 446යි. පසුපැදිකරුවන් 2024දී 194යි; 2025.07.31 වෙනකොට 98යි. පාපැදිකරුවන් 2024දී 186යි; 2025.07.31 වෙනකොට 114යි. රියැදුරන් 2024දී 202යි; 2025 ජූලි වෙනකොට 100යි. මගීන් 2024දී 307යි; 2025.07.31 වෙනකොට 203යි. ඒ අනුව 2024දී 2,501කුත්, 2025.07.31 වෙනකොට 1,438කුත් ජීවිත මේ විධියට නැති වෙලා තිබෙනවා. අපි සිටින්නේ ස්වාභාවික ව්‍යසනයක් සිදු වෙච්ච කාල පරිච්ඡේදයක කියලා අපි දන්නවා. මේ ස්වාභාවික ව්‍යසනවලට වඩා හැම දාම පවතින ව්‍යසනයක් ලෙස මේ මාර්ග අනතුරු හඳුන්වා දෙන්නට පුළුවන්.

විශේෂයෙන්ම අධිවේගී මාර්ග පද්ධතිය තුළ සිදු වෙන මේ වාගේ අනතුරුවලදී ජීවිතවලට සිදුවන හානිය අවම කර ගැනීම සඳහා තමයි ආසන පටි පැළඳවීම අනිවාර්යය කරලා තිබෙන්නේ. ඒ වාගේම මත්පැන් සහ මත්ද්‍රව්‍ය වාගේ දේවල් භාවිත කරමින් වාහන පදවන එක නතර කරගන්න අවශ්‍යතාවක් තිබෙනවා. මත්පැන් භාවිත කරලා යන අය පමණයි පසුගිය දවස්වල ආරක්ෂක දැලට හසු වුණේ කියලා අපි දැක්කා. විශේෂයෙන්ම ඉදිරියේදී මත්ද්‍රව්‍ය ගනිපු කරපු අයත් නීතියේ රැහැනට හසු කරගන්න කටයුතු කරමින් තිබෙනවා. මේ නීතිය සක්‍රියව ක්‍රියාත්මක කළ යුතුයි කියා අපි නැවත වතාවක් මතක් කරලා දෙන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ අපේ රටට විශාල ස්වාභාවික ව්‍යසනයක් සිදු වුණා. මේ ව්‍යසනය තුළ විශේෂයෙන්ම ප්‍රවාහන සහ මහාමාර්ග ක්ෂේත්‍රය වැඩි ආපදාවකට ලක් වුණා. ඒ නිසාම එම ආපදාවට ලක් වෙච්ච ප්‍රදේශ නැවත වටයකින් ගොඩනඟාගන්න අපිට සිද්ධ වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුළු ලංකාවේම දිස්ත්‍රික්ක 4කට, 5කට ආසන්න ප්‍රමාණයක් හැර අනෙකුත් බොහොමයක් දිස්ත්‍රික්කවලට විශාල ව්‍යසනයක් සිද්ධ වුණා කියලා අපි දන්නවා. ඒ නිසා අපට එම ජනතාව අත්හැරලා ගමන් කරන්න හැකියාවක් නැහැ. විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙකු විධියට අපිට ඒ දිස්ත්‍රික්ක අත්හැරලා ගමනක් නැහැ කියලා මම කියනවා. ඒ නිසා ආපදාවලට ලක් වෙලා තිබෙන එම දිස්ත්‍රික්කත් ගොඩනඟාගෙන සමස්ත රටම එක තැනකට, එක විධියකට ගොඩනඟාගන්න අපි සූදානම් වෙමින් ඉන්නවා. විශේෂයෙන්ම මහාමාර්ග අමාත්‍යාංශය, ප්‍රවාහන අමාත්‍යාංශය මේකට මැදිහත් වෙනවා වාගේම, කළුතර දිස්ත්‍රික්කයේ ජනතාව විධියට පසුගිය කාලයේ අපිත් මේකට මැදිහත් වෙමින් හිටියා. නුවරඑළිය ප්‍රදේශවල ඇති වූ ආපදා තත්ත්වයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමට විශේෂයෙන්ම මාර්ග සංවර්ධන අධිකාරියත් ඍජුවම මැදිහත් වෙමින් ඒ ජනතාවට සහයෝගය ලබා දුන්නා. ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයේ ජනතාව විධියට අපි ලබන 10වැනි දා දහසක පමණ පිරිසක් සම්බන්ධ වෙලා නුවරඑළිය ප්‍රදේශයේ ඒ ජනතාවට අපෙන් යම්කිසි සහයෝගයක් ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සුවිශේෂී තත්ත්වයන් යටතේ අපි හැමෝටම මේ රට ගොඩනඟා ගැනීම වෙනුවෙන් අවංක වුවමනාවක්, අවංක අවශ්‍යතාවක් තිබෙනවා. ඒ වෙනුවෙන් අපි මහන්සි වෙනවා, වැඩ කරනවා. ඒ වාගේම ඒ සඳහා එකතු වෙන්න කියලා සියලු ජනතාවටත් ආරාධනා කරමින්, මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිය පළ කරමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඉලෙයියතම්බි සිරිනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[පි.ව. 4.21]

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)

வணக்கம்! கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, போதைப்பொருளைப் பயன்படுத்திவிட்டு வாகனம் ஓட்டுபவர்களை அடையாளங்கண்டு பாதுகாப்பான போக்குவரத்துச் சேவையை ஏற்படுத்துவதற்கும் அதிவேக நெடுஞ்சாலைகளில் வீதி விபத்துகளால் ஏற்படும் பாதிப்பைக் குறைப்பதற்கு மோட்டார் வாகனங்களில் பயணிப்போர் ஆசனப் பட்டிகளை அணிவதற்குமாகக் கொண்டுவரப் பட்டுள்ள மோட்டார் வாகனச் சட்டத்தின் கீழான ஒழுங்கு விதிகள் தொடர்பான விவாதத்தில் எனக்கும் உரையாற்று வதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

இன்றைய தினம் கொண்டுவரப்பட்டுள்ள இரண்டு ஒழுங்குவிதிகள் ஊடாக நாட்டில் பாதுகாப்பான போக்குவரத்து நடைமுறையை உருவாக்குவதற்கு ஏற்பாடுகள் செய்யப்பட்டு இருக்கின்றன. 2025ஆம் ஆண்டு 2,507 பேரும் 2024ஆம் ஆண்டு 2,300 பேரும் வீதி விபத்துகளால் பாதிக்கப்பட்டு இறந்திருக்கிறார்கள். அது மாத்திரமன்றி, 30,000க்கும் மேற்பட்டோர் காயமடைந்து இருக்கிறார்கள். இதிலிருந்து நாங்கள் விளங்கிக்கொள்ளவேண்டிய விடயம் என்னவெனில், பாதுகாப்பான போக்குவரத்து சவாலான ஒரு விடயமாக இருக்கின்றது என்பதைத்தான். இதற்குப் பல காரணங்கள் முன்வைக்கப்படுகின்றன.

போக்குவரத்து தொடர்பில் வலுவான சட்டங்கள் இருந்தாலும்கூட, அதிலுள்ள ஓட்டைகள் மற்றும் அவற்றை உரிய முறையில் நடைமுறைப்படுத்தாமை, போதைப் பொருளைப் பயன்படுத்திவிட்டு வாகனங்களைச் செலுத்துதல், வாகனங்களை அதிக வேகத்துடன் செலுத்துதல், தரமற்ற வாகனங்களைப் பயன்படுத்தல், மிக வேகமாக வாகனத்தைச் செலுத்த வேண்டுமென்ற பேரவா என்பவற்றின் ஊடாக உயிராபத்துகளும் காயங்களும் ஏற்படுகின்றன. அது மாத்திர மன்றி, இழப்புகளையும் சந்திக்கவேண்டி இருக்கின்றது. மேலும், நிரந்தரமாக அங்கவீனமடைதல், தங்கி வாழவேண்டிய நிலைமை என்பனவும் ஏற்படுகின்றன. மேற்குறித்த சட்ட ஏற்பாடுகள்மூலம் உயிராபத்துக்களையும் காயமடைதலையும் தடுப்பதற்கு மேற்கொள்கின்ற நடவடிக்கைகளை நாம் வரவேற்கின்றோம். இதற்கப்பாலும், பல விடயங்களை முன்னிலைப்படுத்திச் செய்யவேண்டிய தேவை இருக்கின்றது. பாதுகாப்பான போக்குவரத்தை உறுதிப்படுத்துவதற்குத் தரமான வாகனங்களைப் பயன்படுத்த வேண்டும். அத்துடன், தரமான போக்குவரத்து முறைமைகளை மேம்படுத்த வேண்டிய தேவையும் இருக்கின்றது. இவை படிப்படியாகச் செய்யப்பட வேண்டிய விடயங்களாக இருந்தாலும், முக்கியத்துவம் அளித்து செய்யப்பட வேண்டியவை. வருடாந்தம் அல்லது குறிப்பிட்ட காலப்பகுதியில் வாகனங்களைப் பரிசீலித்து பழுதடைந்த, பாவிக்க முடியாத வாகனங்களைப் பாவனையிலிருந்து அகற்றவேண்டிய தேவை இருக்கின்றது.

பாதுகாப்பான மற்றும் சொகுசான போக்குவரத்து நடைமுறைகளை அரச திட்டத்தினூடாகக் கொண்டு செல்வதற்கான ஏற்பாடுகள் பாரியளவில் எமது வட, கிழக்குப் பிரதேசத்தில் குறிப்பாக, மட்டக்களப்பு மாவட்டத்தில் காணப்படவில்லை. SLTB ஊடாக கொழும்புக்குச் செல்வதற்கான பல ஏற்பாடுகள் முன்னர் இருந்தபோதிலும், தற்போது இல்லாமல் இருக்கின்றது. போக்குவரத்து சார்ந்த நெருக்கடிகளைத் தவிர்ப்பதற்காக எமது மட்டக்களப்பு மாவட்டத்தில் புகையிரத சேவையை வலுப்படுத்த வேண்டிய தேவை இருக்கின்றது. கடந்த ஆண்டில் மட்டக்களப்புக்கான புகையிரத சேவையானது மட்டுப்படுத்தப்பட்ட அளவில் காணப்பட்டதுடன், அதை மேற்கொள்வதில் பல இடர்பாடு களும் காணப்பட்டன. குறிப்பாக, அந்தப் புகையிரத சேவையிலிருந்த AC வசதி கொண்ட பெட்டிகள் அகற்றப்பட்டு இருக்கின்றன. அது மாத்திரமன்றி, அதன் நேர மாற்றம் மிக நெருக்கடியான சூழ்நிலையை உருவாக்கியிருக்கின்றது.

சக பாராளுமன்ற உறுப்பினர் கௌரவ ஸ்ரீநேசன் ஐயா அவர்கள் கூறியதுபோன்று, Sri Lanka Railways பாரியளவு வருமானத்தை இழப்பதற்கு, மட்டக்களப்புக்கான புகையிரத சேவையைத் தரமானதாகவும் முறையாகவும் நடத்தாமல் இருப்பதும் ஒரு காரணமாக இருக்கின்றது. இந்த விடயத்தில் பாரிய சந்தேகங்கள் இருப்பதை மக்களின் பேச்சுகள் மூலமாக அறிய முடிகின்றது. இதன் பின்னணியில் இருப்பவர்கள் யார்? மட்டக்களப்புக்கான புகையிரத சேவையை முறையாக நடைமுறைப்படுத்தாமல் இருப்பதற்கான காரணம் என்ன? வருடாந்தம் பல மில்லியன் ரூபாய் வருமானத்தை ஈட்டித் தருகின்ற இந்தச் சேவையானது, நாளொன்றுக்கு 700க்கும் மேற்பட்ட பயணிகள் பயன்படுத்துகின்ற இந்தச் சேவை யானது, தற்போது 250 பயணிகள் பயணம் செய்யக்கூடியதாக மட்டுப்படுத்தப்பட்டு இருப்பதற்கான காரணம் என்ன? நாங்கள் இது தொடர்பில் Sri Lanka Railwaysஇன் பொது முகாமையாளரிடம் கேட்டபோது, அதற்கான தேவை இல்லை அல்லது பயணிகளின் எண்ணிக்கை குறைவாக இருப்பதாகக் கூறினார்.

மட்டக்களப்பு, அம்பாறை மாவட்டங்களிலுள்ள பெருமளவான மக்கள் இந்தப் புகையிரத சேவையைத்தான் நம்பியிருந்தார்கள். அது மாத்திரமன்றி, அங்குள்ள பல அரச அதிகாரிகள் இந்தச் சேவை ஊடாகத்தான் பணியிடங்களுக்குச் சென்றார்கள். ஆனால், இன்று இந்தச் சேவை மட்டுப்படுத்தப்பட்டு இருக்கின்றது. இதற்கு அண்மையில் ஏற்பட்ட அனர்த்தம் ஒரு காரணமாக இருந்தாலும்கூட, அதற்கு முன்னரே AC வகுப்புச் சேவைகள் நிறுத்தப்பட்டு இருக்கின்றன. நாங்கள் இது சம்பந்தமாக பலமுறை கோரிக்கை விடுத்திருக்கிறோம். கௌரவ அமைச்சர் அவர்களும் இது சம்பந்தமாக உறுதியளித்திருக்கிறார். மிக விரைவாக இந்தச் சேவையை மீள ஆரம்பிப்பதன்மூலம் மக்களுக்கு வசதியானதும் பாதுகாப்பானதுமான சேவையை வழங்க முடிவதுடன், அதிகளவு வருமானத்தை ஈட்டுகின்ற ஒரு துறையாக இந்தத் துறையை மாற்றியமைக்கவும் முடியும். ஏனெனில், மட்டக்களப்பு, அம்பாறை மாவட்ட மக்களுக்கு புகையிரதப் போக்குவரத்து சார்ந்து மட்டக்களப்பு புகையிரத நிலையம் மாத்திரம்தான் இருக்கின்றது. இந்தப் புகையிரத நிலையத்துடன் தொடர்புடைய சேவைகளை மட்டுப்படுத்தும்போது பாரிய சந்தேகங்கள் எழுகின்றன. குறிப்பாக, இதற்கு தனியார் போக்குவரத்துத் துறையினரின் அழுத்தங்கள் இருக்குமோ? என்ற ஐயப்பாடு மக்கள் மத்தியில் இருக்கின்றது. ஆகவே, இதனை உடனடியாக நிவர்த்தி செய்யவேண்டிய பொறுப்பு அல்லது இதனுடன் தொடர்புடைய பணிகளை ஆரம்பிக்கவேண்டிய பொறுப்பு உரிய திணைக்களத்துக்கு இருக்கின்றது. கௌரவ அமைச்சர் அவர்கள் இந்த விடயத்தில் மிகுந்த கரிசனைகொள்ள வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

மேலும், போதைப்பொருளைப் பாவித்துவிட்டு வாகனம் செலுத்துபவர்களின் ஓட்டுநர் உரிமத்தை இரத்துச் செய்வதன் மூலமும் ஆசனப்பட்டி அணிந்து வாகனத்தைச் செலுத்த வைப்பதன் மூலமும் பாதுகாப்பான பயணத்தை உறுதிப்படுத்த வேண்டிய தேவையிருக்கின்றது. குறிப்பாக, பாடசாலை சேவைகள், பொதுச் சேவைகளின் பாதுகாப்பை உறுதிப்படுத்த வேண்டிய தேவையிருக்கின்றது. ஓட்டுநர்கள் போதைப் பொருளைப் பாவித்துவிட்டு உயிர்களுக்கு ஆபத்தை ஏற்படுத்தும் வகையில் வாகனத்தைச் செலுத்துவதைத் தடுப்பதற்காகக் கொண்டுவரப்பட்டு இருக்கின்ற இந்த ஒழுங்குவிதியை நாம் உண்மையிலேயே வரவேற்கின்றோம்.

சுகாதாரத்துறைக்கு மிகவும் நெருக்கடியாக மாறி இருக்கின்ற RTAs எனப்படுகின்ற Road Traffic Accidentsமூலம் 2,500க்கும் மேற்பட்டோர் உயிரிழந்து இருப்பதுடன், 30,000க்கும் மேற்பட்டோர் காயமடைந்து இருக்கிறார்கள். இவர்களுடைய வைத்தியச் செலவுக்கு அரசாங்கம் பாரிய தொகையைச் செலவு செய்யவேண்டி இருப்பதால், இது அரசாங்கத்துக்கு மிகவும் நெருக்கடியாக மாறி இருக்கின்றது. எனவே, அரசாங்கம் இன்று கொண்டுவந்து இருக்கின்ற ஒழுங்குவிதிகளை நாங்கள் ஆதரிப்பதோடு, எதிர்காலத்தில் பாதுகாப்பான பயணத்தை மேற்கொள்வதற்குரிய மேலதிக வசதிகளை ஏற்படுத்திக் கொடுக்க வேண்டுமெனவும் கேட்டுக் கொள்கின்றேன். மேலும், பழுதடைந்த வாகனங்களையும் தரமற்ற வாகனங் களையும் பயன்படுத்துவதைத் தடுப்பதற்கான பொறிமுறை ஒன்றையும் உருவாக்க வேண்டும். ஏனென்றால், பல இடங்களில் விபத்துகள் நடைபெறுவதற்குத் தரமற்ற வாகனங்களும் காரணமாக இருக்கின்றது. எனவே, இவ்வாறான செயற்றிட்டங்களை முன்கொண்டு செல்வதற்கு நாங்கள் ஆதரவு வழங்குகின்ற அதேநேரம், எங்களுடைய மாவட்டத்துக்கான புகையிரத சேவையை மிக விரைவாக சீர்செய்து தர வேண்டுமெனவும் கேட்டுக் கொள்கின்றேன்.

[ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා]

இன்று போக்குவரத்து அமைச்சுடன் தொடர்புடைய விவாதம் நடைபெறுவதால் இன்னுமொரு விடயத்தையும் சொல்கின்றேன். அதாவது, SLTB ஊடான சேவைகளை மட்டக்களப்பு மாவட்டத்தில் பாரியளவில் முன்னெடுக்க வேண்டும். ஏனெனில், எமது மாவட்டத்தில் பின்தங்கிய பகுதிகளில் இதன் சேவைகளைத் தொடர்ச்சியாகவும் சீராகவும் கொண்டுசெல்வதில் பாரிய இடர்பாடுகள் காணப்படுகின்றன. வாழைச்சேனையில் இருக்கின்ற பஸ் டிப்போவை புனரமைத்து, வாகரைப் பகுதிக்கான சேவையை மேம்படுத்தி னால், பின்தங்கிய பகுதிகளில் இருக்கின்ற மக்களின் போக்குவரத்துத் தேவைகளைப் பூர்த்திசெய்யக் கூடியதாக இருக்கும். கஷ்ட நிலையிலுள்ள மக்கள் பொதுப் போக்கு வரத்தையே நம்பியிருக்கிறார்கள். எனவே, மட்டக்களப்பு மாவட்டத்தில் SLTBஇன் சேவையை மேம்படுத்துவதற்குச் சிறப்பானதொரு திட்டத்தை மாவட்ட அபிவிருத்திக் குழுவின் ஊடாக மேற்கொள்வதற்கான ஆலோசனையை கௌரவ அமைச்சர் அவர்கள் வழங்க வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன். ஏனெனில், அனர்த்த காலங்களிலும் சரி, நெருக்கடியான காலங்களிலும் சரி, மக்கள் SLTBஇன் சேவையையே நம்பி இருக்கிறார்கள். எனவே, இந்த விடயங்களைக் கருத்திற்கொண்டு, மிக விரைவாக உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். மக்களின் உயிருக்குப் பாதுகாப்பளிக்கக் கூடிய இவ்வாறான ஒழுங்குவிதிகளுக்கு நாம் ஆதரவு அளிப்பதோடு, தொடர்ந்தும் மக்களுக்கு உகந்த, பாதுகாப்பான, சொகுசான சேவையை வழங்குவதற்குரிய நடவடிக்கைகளை முன்னெடுக்க வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ප්‍රගීත් මධුරංග මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.30]

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අති විශේෂ ගැසට් පත්‍ර දෙකක් මඟින් පළ කරනු ලැබූ, මෙච්චර කාලයක් නිකුත් කරලා නොතිබුණු, මෝටර් වාහන පනත යටතේ නිකුත් කරන්න අවශ්‍යව තිබුණු නියෝග පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා පවත්වන මේ විවාදයේදී කථා කරන්නට ලැබීම මට හිමි වූ මහඟු අවස්ථාවක් කියා මා හිතනවා. ඒ අති විශේෂ ගැසට් පත්‍ර දෙකෙන් 2452/40 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් මත්ද්‍රව්‍ය භාවිත කරනු ලබන රියැදුරන් හඳුනා ගැනීම, පරීක්ෂා කිරීම සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය නීතිමය විධිවිධාන හඳුන්වා දී ඇති අතර, ඒ හරහා මත්ද්‍රව්‍ය භාවිතකොට රිය පැදවීම වළක්වා ශ්‍රී ලංකාවේ මාර්ග ආරක්ෂාව තහවුරු කිරීමට අපි කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ එක්කම 2455/29 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අධිවේගී මාර්ගවල වාහන ධාවනය කිරීමේදී සියලුම ආසනවල ගමන් ගන්නා තැනැත්තන් ආසන පටි පැළඳීම අනිවාර්යය කර තිබෙනවා. ඒ තුළින් අධිවේගී මාර්ගවල ධාවනය වන රථ වාහනවලින් සිදු වන අනතුරු නිසා ජීවිත හානි සහ බරපතළ තුවාල සිදු වීම අවම කිරීමටත්, එමඟින් මාර්ග ආරක්ෂාව තහවුරු කිරීමටත් හැකියාවක් පවතිනවා.

මෙච්චර කාලයකට මෝටර් වාහන පනත යටතේ මෙවන් නියෝග නිකුත් කරලා තිබුණේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක් විධියට ගත්තාම ලංකාව තුළ මේ වෙද්දි වර්ෂයකට පුද්ගලයින් ලක්ෂයක් අතරින් 11දෙනෙක් රථ වාහන අනතුරු මඟින් මිය යනවා. නමුත් ලෝකය ගත්තොත් එහෙම පුද්ගලයින් ලක්ෂයකට 10දෙනෙක් හෝ ඊට අඩු ගණනක් තමයි රථ වාහන අනතුරුවලින් මිය යන සාමාන්‍ය - benchmark එක - වෙන්නේ. නමුත් ලංකාවේ ඒක 11ක් වාගේ වැඩි අගයක් ගන්නවා. ඉතින් නියෝග පනවා, නීති පනවා මේ දේවල් කරනවාට වඩා සියලු ජනතාවගේ වගකීමක් වනවා, මෝටර් වාහන අනතුරු මඟින් රට තුළ සිදු වන ජීවිත හානි ප්‍රමාණය, දේපළ හානි ප්‍රමාණය අවම කර ගැනීම.

අපි ගත්තොත් 2020-2025 දක්වා ලංකාව තුළ රථ වාහන අනතුරු 142,932ක් සිදු වෙලා තිබෙනවා. ඒ සිදු වෙච්ච රථ වාහන අනතුරුවලදී පුද්ගල මරණ 14,551ක් සිදුවෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අගය අවුරුද්දකට සාමාන්‍යයක් විධියට අරගෙන බැලුවොත්, මාර්ග අනතුරු නිසා 2,910ක් මිය ගිහිල්ලා තිබෙනවා; දිනකට ගත්තොත් 7.9ක් - පුද්ගල මරණ 8ක් පමණ- සිදු වනවා. ඒ වාගේම තවත් පිරිසක් මෙහිදී ආබාධිත තත්ත්වයට පත් වනවා. ඒ තුළ පවුල් සංස්ථාව අසරණභාවයට පත් වනවා. මොකද, පවුලේ ප්‍රධානියාට මොකක් හරි අනතුරක් වුණොත්, මිය ගියේ නැතත් සදාකාලික ආබාධිත තත්ත්වයට පත් වුණොත්, ඒ පවුල් සංස්ථාව අස්ථාවරභාවයට පත් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සිදු වන අනතුරු පිළිබඳව බැලුවාම ඉන් සියයට 86ක්ම සැහැල්ලු වාහනවලින් සිදු වන අනතුරු. රක්ෂණ සමාගම්වල details අරගෙන බලද්දී පෙනෙනවා, සියයට 86ක්ම අනතුරු light vehicles නිසා සිදු වන බවත්; සියයට 10.3ක් heavy vehicles නිසා සිදු වන බවත්; මීට අමතර වෙනත් හේතු නිසා සියයට 3.70ක් සිදු වන බවත්. ඉතින් මේ අනුව රථ වාහන අනතුරු නිසා රටේ මානව සම්පත විශාල වශයෙන් විනාශයට පත් වනවා; අහිමි වනවා. 1983-2009 දක්වා ලංකාවේ තිබුණු සිවිල් යුද සමයේදී සිදු වෙච්ච විනාශයටත් වඩා වැඩි විශාල විනාශයක් මහ තොටේදී රථ වාහන අනතුරු නිසා සිදු වනවා. ඒ වාගේම ඒක "දිට්වා" සුළි කුණාටුවෙන් වෙච්ච හානියටත් සමානයි. මොකද, මේ අහිමි වන ජීවිත වටිනාකමකින් ලඝු කරන්න බැරි වුණාට සාමාන්‍යයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් - GDP එකෙන් - සියයට 4ක විශාල හානියක් වාර්ෂිකව ආර්ථිකයට සිදු වනවා, මහා මාර්ගවල සිදු වන අනතුරු හේතුවෙන්.

ඒ නිසා ඇත්තටම මේක නීතියක් වශයෙන් ගන්නවාටත් වඩා සියලුදෙනා තමන්ගේ වගකීමක් විධියට ගන්න ඕනෑ. මොකද, මේ අනතුරු නිසා ජීවිත අහිමි වන්නේ හෝ සදාකාලික ආබාධිත තත්ත්වයට පත් වන්නේ, අපේම දියණියකගේ, අපේම පුතණුවෙකුගේ, අපේම දෙමව්පියන්ගේ, එහෙම නැත්නම් අපේම ආදරණීය කෙනෙකුගේ වෙන්න පුළුවන්. මේ දේ අද වෙන කෙනෙකුට වුණාට හෙට අපට වෙන්න පුළුවන්.

මේ අපරීක්ෂාකාරී රිය ධාවනය නිසා සිදු වන මරණත් එක්ක ගත්තාම, අද උදේ ගෙදරින් එළියට බහින පුද්ගලයා නැවත හවසට ගෙදර එනකම් ජීවිතය විශ්වාස නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒකට මම හේතුවක් කියන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2024දී සිදු වෙච්ච මුළු මාර්ග අනතුරු සංඛ්‍යාව 25,299ක්. ඉන් අනතුරු 13,581ක්ම වෙලා තිබෙන්නේ

අන්තරායදායක ලෙස සහ නොසැලකිල්ලෙන් රිය පැදවීම නිසායි. ඒත් එක්කම 2025දී සිදු වෙච්ච අනතුරු 24,758න් 15,211ක්ම වෙලා තිබෙන්නේ මේ අපරීක්ෂාකාරී රිය ධාවනය නිසායි. ඒත් එක්කම 2024 අවුරුද්ද ගත්තොත්, රිය අනතුරු නිසා වාහනයක ධාවනයේ නොයෙදෙන පාරේ ගමන් ගන්න අය -පදිකයින්- 815කගේ දිවි අහිමි වෙලා තිබෙනවා. ඒ වාගේම 2025 නොවැම්බර් 30 වෙනකම් මේ හේතුවෙන් 720කගේ දිවි අහිමි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තුළ අපි කථා කරනවා, අධිවේගී මාර්ගවල ගමන් ගන්නා රථවල සියලු මගීන් seat belt එක පළඳින්නට ඕනෑ කියලා. මේවා නිකම් කියන කථා නොවෙයි. මේවා විද්‍යාත්මකව තහවුරු වෙච්ච සත්‍යයන්. මොකද, seat belt එක පැළඳීම මඟින් අනතුරකදී මරණය සිදුවීමට තිබෙන අවදානම සියයට 40ත්, 60ත් අතර ප්‍රමාණයකින් අඩු කර ගැනීමට හැකියාවක් තිබෙනවා. ඒත් එක්කම මාරාන්තික තුවාල - fatal injuries - සිදු වන එක සියයට 50කින් අඩු කර ගැනීමට හැකියාවක් තිබෙනවා, seat belt එක පළඳා සිටීම තුළින්. ඒත් එක්කම අධිවේගී මාර්ගයක සාමාන්‍යයෙන් පැයට කිලෝමීටර් 80ක, 100ක වේගයෙන් ගමන් කරන වාහනයක අපි යද්දී යම් අනතුරකට ලක් වුණොත්, මේ අනතුර නිසා මේ වාහනයේ වේගය ක්ෂණිකව බින්දුවට හෝ ඒ ආසන්න ඉතා අඩු අගයකට පත් වනවා. එසේ වීම නිසාම මේ වාහනයේ තිබෙන ගම්‍යතාවත් ක්ෂණිකව අඩු වනවා.

මේ ගම්‍යතාව අඩු වීම නිසා අධික බලයක් හට ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අධික බලය හට ගන්න වෙලාවේදී අපි seat belt එක පැළඳගෙන නොසිටියොත් එම පුද්ගලයා ඉදිරියේ ඇති බාධකයක ගැටීමට ගත වන කාලය වැඩියි. හැබැයි, seat belt එක පැළඳගෙන සිටියොත් seat belt එකෙන් secure වන නිසා බාධකයක ගැටීමට ගත වන කාලය අඩු වීම තුළින් ඒ පුද්ගලයාට සිදු වන injury එක අඩු වනවා. නමුත්, seat belt එක පැළඳගෙන නොසිටියොත් හට ගන්නා අධික බලය නිසා බාධකයේ ගිහින් වේගයෙන් වැදුණාම ඒ පුද්ගලයාට සිදු වන හානිය වැඩියි. ඊට්ත් වඩා බරපතළම දේ මේකයි. ඉදිරි ආසනවල අය seat belts පැළඳගෙන සිටියත් පිටුපස ආසනයේ seat belt එක පැළඳගෙන නොසිටින කෙනා සාමාන්‍යයෙන් විශාල බලයක් සමඟම ඉදිරියට ඇදී යාම නිසා seat belts පැළඳගෙන ඉන්න කට්ටියටත් ලොකු අනතුරක් මේ හරහා සිදු වන්නට පුළුවන්. ඒ හරහා මරණීය තුවාල සිදු වන්නට වාගේම වාහනයෙන් එළියට විසි වෙන්නටත් පුළුවන්. මෙවැනි තත්ත්ව වළක්වා ගැනීමට අධිවේගී මාර්ග තුළ විතරක් නොවෙයි, වාහනවල ගමන් ගන්නා සෑම විටම seat belt එක පැළඳගෙන ගමන් කරන්නට පුළුවන් නම් ඉතා හොඳයි. අපේ රටේ ජනතාවට මා යෝජනා කරනවා, seat belt එක අනිවාර්යයෙන්ම පැළඳගෙන වාහනවල ගමන් කරන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, seat belts පැළඳීම මෙන්ම මත්ද්‍රව්‍ය පානය නොකර ඉතා සුරක්ෂිත, සුපරීක්ෂාකාරී රියැදුරෙකු ලෙසින් වාහන ධාවනය පෞද්ගලික ආරක්ෂාව සඳහා විතරක් නොවෙයි, එය සාමාජීය වගකීමක්ද වනවා. කෙනෙක් තමන්ගේ ලාභය ගැන හිතලා තවත් කෙනෙකුගේ ජීවිතය අවදානමකට පත් නොකළ යුතුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම තමන්ගේ යහපත සඳහා තවත් කෙනෙකුට අයහපතක් කරන්නට හොඳ නැහැ. ඒ නිසා මම ඉතා ආදරයෙන් ඉල්ලා සිටිනවා, අධිවේගී මාර්ගයේ ගමන් කරන වාහනවල වාගේම පොදු මගී ප්‍රවාහන සේවාවල, පාසල් ළමුන් ප්‍රවාහනය කරන සහ කාර්යාල සේවකයින් ප්‍රවාහනය කරන වාහනවල මත්පැන් පානය කරන රියැදුරන් ඉන්නවා නම් අනිවාර්යයෙන්ම ඒ අය ඒවායින් ඉවත් කරන්න කියලා. ඒත් එක්කම ඒ සියලු වාහනවල ගමන් කරද්දී seat belts පැළඳීමෙන් මඟින් සියලුදෙනාගේ ජීවිත සුරක්ෂිත කරන්නට වැඩකටයුතු කරන්න කියාත් මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම මේ අණපනත් සම්මත කිරීම තුළින් ඒවා නියාමනය කරන අධිකාරින්ට එම කටයුතු නියාමනය කිරීමටත් විශාල හැකියාවක් ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් ගම්පහ දිස්ත්‍රික්කය ගැනත් කාරණා කිහිපයක් මම කියන්න කැමැතියි. ගම්පහ දිස්ත්‍රික්කයට පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය - PRDA එක- යටතේ රුපියල් මිලියන 1,333.7ක ප්‍රතිපාදන 2025 වර්ෂය තුළ ලැබිලා තිබෙනවා. එම නිසා අපි ඒ වැඩකටයුතු අවසන් කරමින් තිබෙනවා. ඒ එක්කම මාර්ග සංවර්ධන අධිකාරිය යටතේත් අපේ දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 2,227.7ක් ලැබිලා තිබෙනවා. ඒ තුළින් අපි සියලු මාර්ග සංවර්ධනය කිරීමේ කටයුතු කරගෙන යනවා.

පසුගිය කාලයේ දිගටම ආර්ථික වශයෙන් ලාභදායී නොවන මාර්ගවල බස් ධාවනය සීමා කරලා තිබුණා. එවැනි මාර්ග 18ක අපි නැවත බස් ධාවනය කරන්න කටයුතු කරනවා. ඒ සඳහා දැනටමත් අපි වැඩකටයුතු කරමින් සිටිනවා. ඒ අනුව අපි ජනවාරි 01වැනි දා සිට ගම්පහ දිස්ත්‍රික්කය තුළ තිබෙන එවැනි මාර්ග 5ක නැවත බස් ධාවනය කරවන්න වැඩකටයුතු පටන් ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගම්පහ දිස්ත්‍රික්කය තුළ ලංගම ඩිපෝ 9ක් තිබෙනවා. එම ඩිපෝ 9ම ගැටලුවක් නැතුව දැන් self-sustainable depots තත්ත්වයට පත් කරනවා. මොකද, විශාල වශයෙන් දේශපාලන සුළි කුණාටු හමාගෙන ගිය ඩිපෝ 9ක් තමයි අපට තිබුණේ. ප්‍රවාහන අමාත්‍යාංශයෙන් අපට ලබා දුන් සහායත් එක්ක ඒ ඩිපෝ දැන් ඉතා හොඳ තත්ත්වයට පත් කරමින් තිබෙනවාය කියමින්, වෙලාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුති කරමින් මා නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු උපුල් කිත්සිරි මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සංජීව රණසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SANJEEWA RANASINGHA left the Chair, and THE HON. UPUL KITHSIRI took the Chair.*

[අ.භා. 4.42]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට මොහොතකට කලින් කථා කළ කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීතුමාගේ කටින් කියැවුණා, "සර්" කියලා කථා කළාය කියා. හොඳයි. "සහෝදරයා" දැන් "සර්" වෙච්ච එක ගැන අපට සන්තෝෂයි. "සහෝදරයා" මේ සැරේ "සර්" වුණා. හොඳයි නේද? ඔබතුමන්ලා දියුණු වෙලා. මම මේ වෙලාවේදී ඒ කාරණයත් මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද හැම කෙනාගෙන්ම කියැවුණා, SLTB එක සහ බස් ගැන.

"දිට්වා" සුළි කුණාටුව නිසා බස් විශාල ප්‍රමාණයකට හානි සිද්ධ වුණා. මම ප්‍රවාහන ඇමතිතුමාට - සභානායකතුමාට - යෝජනා කරනවා, SLTB එක මීට වඩා දියුණු කරන්න බස් ගෙනෙන්න කියලා. හැම තැනටම බස් දමන්න පුළුවන්. මේක හොඳ වැඩක්, කරන්න පුළුවන් නම්. අර cabs 1,600ක් ගෙන්වන එක නවත්වලා, ඒ මුදල්වලින් රටේ අහිංසක ජනතාවට යන්න බැරි පාරවල ධාවනය කරන්න කොට, තනි දොරේ බස් ටිකක් -දිග බස් නොවෙයි; දොර දෙකේ බස් නොවෙයි- ගෙනැල්ලා, SLTB එකත් දියුණු කරලා, ප්‍රවාහන පද්ධතිය දියුණු කරන්න කියලා මම යෝජනා කරනවා, අපේ ප්‍රවාහන ඇමතිතුමාට.

ඊළඟ කාරණය මේකයි. මේ අර්බුදය අස්සේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය ගෙනාවා. ඔයගොල්ලන් ඒක reverse කරන්නේ නැහැ කියලා හැම වෙලාවේදීම කියනවා. ඔයගොල්ලන් ඒක reverse කරන්නේ නැහැ. ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමනි, ඊයේ මට නුගේගොඩ අනුලා විද්‍යාලයේ දරුවෙකුගේ දෙමාපියෙක් කථා කළා. දෙමාපියන්ට smart board එකක් ගෙනැත් දෙන්න කියනවා. රුපියල් ලක්ෂ තුනහමාරක් හෝ රුපියල් ලක්ෂ හතරක් වනවා, ඒ smart board එක. 6 ශ්‍රේණියේ එක් පන්තියකට smart board එකක් ගෙනාවොත්, ඒකට දෙමාපියන්ට රුපියල් 8,000ක් වැය වනවා. මම නිකම් ගණන් හදලා බැලුවාම, එක් ළමයෙකුට රුපියල් 8,000ක් ඒ වෙනුවෙන් වැය වනවා. මේක අනුලා විද්‍යාලයේ දෙමාපියන්ට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, අර එහා පැත්තේ ඉන්න නියෝජ්‍ය ඇමතිතුමාගේ ප්‍රදේශයේ තිබෙන සොරණාතොට විද්‍යාලයට smart board එකක් ගෙනෙන්න ගියොත් ඒක ප්‍රශ්නයක්; බුදුගේකන්ද මහා විද්‍යාලයට smart board එකක් ගෙනෙන්න ගියොත් ඒක ප්‍රශ්නයක්. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරනවා වාගේම මිනිස්සුන්ගේ සාක්කුවටත් ප්‍රතිසංස්කරණය ගෙනෙනවා. ඩොලර් මිලියන 300කට නේ, මේ පරිප්පුව දෙන්නේ. ඩොලර් මිලියන 300ක් සඳහා නේ, මේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය ආවේ. අපේ ආණ්ඩුව කාලයේත් මේ ඩොලර් මිලියන 300ක කුත්තු වැඩේ ආවා. දැන් අගමැතිතුමියට ඒ කුත්තුව ගිහිල්ලා. ඒකට තමයි මේ try කරන්නේ. මේවා කරනකොට මිනිස්සු අමාරුවේ වැටෙන විදියට වැඩ නොකළ යුතුයි. Smart board එකක් රුපියල් ලක්ෂ තුනහමාරක් වාගේ වෙනවා. මේ සිද්ධිය වුණේ නුගේගොඩ අනුලා විද්‍යාලයේ. මම නම කියලාම තමයි ඒ කාරණය ගැන කියන්නේ. ඒ කාරණයත් මේ වෙලාවේදී මම මතක් කරන්න ඕනෑ.

ඊළඟ කාරණය තමයි, රටට ලැබෙන විදේශ ආයෝජන. ඔයගොල්ලන්ට විදේශ රටවල ඉඳලා ඇවිල්ලා තමයි ජනතාව ඡන්දය දුන්නේ. අපේ "බිග් කුච්චන්" අයියා කිව්වා නේ, ඩොලර් මිලියන 500ද, 50 ගාණේද කොහේද එවනවා කියලා, ඒ කාලයේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

හොඳයි, මම "ටක්" ගාලා කථා කරන්නම්.

ඊශ්‍රායලයේ රැකියාවලට යවන කට්ටියට දැන් ඔයගොල්ලන්ගේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් අලුත් නීති පනවනවා. Website එකේ දමනවා, කෘෂිකර්ම, කම්කරු වාගේ රැකියා පිළිබඳව. ඒ නිසා ඔක්කොම ඒ website එකෙන් ඉල්ලුම් කරනවා. කොහොම හරි ඊශ්‍රායලයට යන්න බලාපොරොත්තුවෙන් ඉන්න අය රැකියා තුන හතරකට අයදුම් කරනවා. කොහොම හෝ ඊශ්‍රායලයට යන්න අර රැකියාවටත් දානවා, මේ රැකියාවටත් දානවා, කම්කරු රැකියාවටත් දානවා, කෘෂිකර්ම පැත්තටත් දානවා, මොනවා හරි දානවා. මේ ආණ්ඩුව ආවාට පස්සේ දැන් මේක නතර කරලා තිබෙනවා. ඒ නිසා දැන් රැකියා දෙකකට වඩා website එකෙන් ඉල්ලුම් කරන්න බැහැ. දහස් ගණනක් -4,000ක් විතර- ඉන්නවා, මේ website එකෙන් ඊශ්‍රායලයේ රැකියාවලට යන්න ඉල්ලුම් කරන්න බැරි මිනිස්සු. බංග්ලාදේශයට මේ වාගේ ප්‍රශ්නයක් නැහැ. ඊශ්‍රායලයට යන්න නම් වයස අවුරුදු 25ක් වෙන්න ඕනෑ. බංග්ලාදේශයට වයස අවුරුදු 23න් යන්න පුළුවන්. ඒ වාගේම බංග්ලාදේශයට ගැහැනු, පිරිමි දෙගොල්ලන්ම යනවා. විවාහ වෙලා ඉන්නවා නම් ජෝඩු පිටින් යනවා. අද බංගලි කට්ටිය තමයි ලෝකයේ වැඩියෙන්ම විදේශ ආයෝජන ගෙනෙන්නේ, බංග්ලාදේශයට. අද බංග්ලාදේශයට වෙන ආදායමක් නැහැ. හැබැයි, අපේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් කරන මහ ඔළමොට්ටළ වැඩ නිසා මේ රටට ගෙනෙන විදේශ ආදායම සම්පූර්ණයෙන්ම නවතිනවා, මුදල් නියෝජ්‍ය ඇමතිතුමනි. ඒක නිසා මේ සම්බන්ධව වහාම පියවර ගන්න. දැන් මේ website එකේ රැකියා දෙකකට විතරක් අයදුම් කරන්න පුළුවන් විදියට තිබෙන්නේ. එහෙම කරන්නේ ඔයගොල්ලන්ගේ කට්ටිය යවලා අර ඉන්න මිනිස්සු කපා හරින්නද දන්නේ නැහැ. ඒ ගැනත් මේ වෙලාවේදී මම මතක් කරන්න ඕනෑ.

ඊළඟ කාරණය මම හැම දාම කියන එකක්. WHO එක කියලා තිබෙනවා, ලංකාවේ නීති විරෝධී මත්පැන් පානය සියයට 300කින් වැඩිවෙලා තිබෙනවා කියලා. ඒ පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මේ රටේ සමස්ත මත්පැන් භාවිතයෙන් සියයට 37ක් නීති විරෝධී මත්පැන්. මම මේ කාරණය දිගින් දිගටම කිව්වා. රජයෙන් නීත්‍යානුකූලව නිෂ්පාදනය කරන අරක්කු බෝතලය රුපියල් 2,000ට ජනතාවට ලබා දෙන්න.

බොන මිනිහා කොහොමත් බොනවා. දැන් වයික්කාලේ 5ක් මැරුණා, 7ක් මැරුණා, බණ්ඩාරගම මැරුණා. මේ රටේ මේ වෙනකොට නීති විරෝධී මත්පැන් හින්දා 50කට වැඩිය මැරිලා තිබෙනවා. මම මේක දිගින් දිගටම කිව්වා, රුපියල් 2,000ට

---

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

බෝතලේ දෙන්න පුළුවන් ආණ්ඩුවට. ඒක දෙන්න බැරිකමක් නැහැ. මේ ගැන මම අපේ ආණ්ඩුව කාලයේත් තර්ක කළා. මම දැන් මේ ආණ්ඩුවටත් කියනවා. ආයේ චාමර සම්පත්ගේ ආණ්ඩුවක් එනකම් ඉන්න එපා මේක දීලා දාන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් අවසන් කරන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
අපේ ආණ්ඩුවක් ඇවිල්ලා දෙනකම් ඉන්න එපා. ඔබතුමන්ලා ජනතාවට පොරොන්දු දීලා ඇවිල්ලා දැන් හොම්බ බිම ඇනගෙන ඉන්න එකේ අඩුම ගාණේ අරක්කු බෝතලය හරි අඩු කරලා ජනතාවට දීලා ඔය හොම්බ ටිකක් කෙළින් කර ගන්න. දැන් හොම්බ බිම ඇනිලා නේ තිබෙන්නේ. ඒක නිසා මේක අඩු කරලා හරි වැඩක් කළා කියලා පෙන්වන්නකෝ. ඒක හරි අඩු කරන්නකෝ. නැත්නම් මිනිස්සු නීති විරෝධී මත්පැන් බීලා මැරෙනවා. ඊයේ පෙරේදා පුත්තලම් දිස්ත්‍රික්කයේ කී දෙනෙක් මැරුණාද? ඒ, කුලී වැඩට ගිය මිනිස්සු, *[බාධා කිරීමක්]* ඒකයි ඒ මිනිස්සු මැරුණේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මම මීට වැඩිය කථා කරන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට මම කථා කරනකොට හරි හදිස්සියි, නවත්වන්නමයි බලන්නේ. කමක් නැහැ, ඔබතුමා නවත්වන්න. මම කියන්න තිබෙන ටික කියලා ඉවරයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා වැඩිපුරත් විනාඩි එකහමාරක් ගත්තා.

මීළඟට, ගරු දිනිඳු සමන් හෙන්නායක නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.49]

**ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා (තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தினிந்து சமன் ஹென்நாயக்க - இளைஞர் விவகாரங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Dinindu Saman Hennayake - Deputy Minister of Youth Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ අපේ ආණ්ඩුව සුවිශේෂී ගැසට් නිවේදන දෙකක් මේ සභාවට ඉදිරිපත් කර තිබෙනවා. රථ වාහනවලට අදාළ අංක 2455/29 දරන ගැසට් නිවේදනය ඇතුළේ අධිවේගී මාර්ගවල ගමන් ගන්නා මෝටර් වාහනවල seat belts දැමීමට අදාළ මූලික රෙගුලාසි කිහිපයක් ඇතුළත් කරලා තිබෙනවා. අනෙක් ගැසට් නිවේදනය වන අංක 2452/40 දරන ගැසට් නිවේදනය තුළ මත්ද්‍රව්‍ය භාවිත කර මෝටර් රථ පැදවීමේදී ඒ ගත යුතු පියවරවලට අදාළ රෙගුලාසි ඇතුළත් කර තිබෙනවා. විශේෂයෙන්ම අපේ පොලීසියේ මහත්වරුන්ට සහ වෛද්‍යවරුන්ට ඒ සම්බන්ධ කටයුතුවලදී අදාළ පහසුකම් සැපයීම සහ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි කරන අයට අදාළ වන රෙගුලාසි කිහිපයක් මෙහි ඇතුළත් කර තිබෙනවා.

අපට මේ ගැසට් නිවේදන වැදගත් වන්නේ වෙන දෙයක් නිසා නොවෙයි. අපට දැන් විපක්ෂයේ අඳෝනා හඬවල් සැහෙන ප්‍රමාණයක් ඇහෙනවා. මේ ගැසට් නිවේදන ගහන්න ඕනෑ නැහැ මත්ද්‍රව්‍ය භාවිත කරන්න දිරි දෙමින්. අපි මත්ද්‍රව්‍ය ගැන කථා කරන්නේම මත්ද්‍රව්‍ය මේ රටේ ව්‍යසනයක් බවට පරිවර්තනය වෙලා තිබෙන නිසා. මත්ද්‍රව්‍ය භාවිත කරන්න දිරි දෙන විපක්ෂයකට අපි කියනවා මෙවැනි ගැසට් නිවේදන අත්‍යවශ්‍ය වෙලා තිබෙන්නේ ඔබතුමන්ලාගේ කාලයේ කළ ක්‍රියාවල ප්‍රතිඵල විධියට බව. අපි දැක්කා ඒ කාලයේ නීතිය වල් වැදිලා තිබුණු විධිය, නීති ක්‍රියාත්මක කරන්න ගිය නිලධාරින්ට අත්වෙලා තිබුණු ඉරණම. ඒ සියල්ල නිසා මේ කාරණා යටපත් වෙලා තිබුණේ. ඒ නිසා අපට සිද්ධ වෙලා තිබෙනවා මත්ද්‍රව්‍ය වැරදි සිදු කරන පුද්ගලයන්ට අදාළ නීති ක්‍රියාත්මක කිරීමට ඒ අදාළ බලධාරින්ට අවශ්‍ය රෙගුලාසි සකස් කරලා දෙන්න.

ලංකාවේ සිදු වෙන මාරාන්තික රිය අනතුරුවලින් සියයට 53ක්ම සිද්ධ වෙන්නේ රියැදුරන්ගේ අනීතික ක්‍රියාකාරකම් සහ ඔවුන්ගේ විනය විරෝධී හැසිරීම් නිසා. ඒ නිසා අපි විශ්වාස කරනවා රියැදුරන්ගේ විනය විරෝධී හැසිරීමට විරුද්ධව වැඩ කළොත්, එය පාලනය කර ගත්තොත් රිය අනතුරු සැහෙන ප්‍රමාණයක් පාලනය කර ගන්න පුළුවන් වෙයි කියලා. අපට මෙවැනි මූලික රෙගුලාසි දාන්න සිද්ධ වුණේ අන්න ඒ කියන කාරණා නිසා. විශේෂයෙන්ම රියැදුරන්ට අදාළ කරන මූලික නීතියක් හදා ගන්න සහ ඔවුන්ට විනය පද්ධතියක් හදා ගන්න. අපි විශ්වාස කරනවා ඒ තුළින් අපට හොඳ ප්‍රවාහන පද්ධතියක් හදා ගන්න පුළුවන් වෙයි කියලා.

අපි දන්නවා seat belts දාන එක පොදු කාරණයක් බව. අදටත් ඒක නීතියක් විධියට තිබෙනවා කියලා අපි දන්නවා. අධිවේගී මාර්ගවල යනකොට පසුපස සීට්වල වාඩි වෙලා ඉන්න පුද්ගලයන්ට පවා seat belts දැමීම අනිවාර්ය කිරීම ඇතුළේ අපි විශ්වාස කරනවා අනතුරුවලින් ජීවිත දැවැන්ත ප්‍රමාණයක් බේරා ගන්න පුළුවන් වෙයි කියලා. අපේ රටට අදාළ කරන විනයක්, වාහන පැදවීමේදී අදාළ කරන විනය සහ හැසිරීමක් මේ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ලබා ගන්න පුළුවන් වෙයි කියා අපි බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් මත්ද්‍රව්‍ය භාවිත කරලා පොදු ප්‍රවාහනය කරන රියැදුරන් අපි ඕනෑ තරම් දැකලා තිබෙනවා. දුර ගමන් සේවා බස් රථයකට ගොඩ වුණාට පස්සේ බස් රථයේ ගමන් කරන මඟීන් බහුතරයක් ඉතා බයෙන් තමයි බස් රථයේ ගමන් කරන්නේ. බස් රථ රියැදුරන් කරන විනය විරෝධී ක්‍රියා සහ ඔවුන් මත්ද්‍රව්‍යවලට යොමුවීම වාගේ කාරණා නිසා ජීවිත දහස් ගණනක් බිලි වෙනවා. අපි දැක්කා රිය අනතුරු විශාල ප්‍රමාණයක් සිද්ධ වෙලා තිබෙනවා, බස් රථවල condition එක අධීක්ෂණය කරන්නේ නැතිව බස් ධාවනය කිරීමේ ප්‍රතිඵලයක් හැටියට. ඒ වාගේම රියැදුරන්ගේ විනය විරෝධී හැසිරීම්වල ප්‍රතිඵලයක් හැටියට රිය අනතුරු විශාල ප්‍රමාණයක් සිදු වෙලා තිබෙනවා අපි දැක්කා. දුන්හිඳ ප්‍රදේශයේ රිය අනතුරක් සිද්ධ වුණා බස් රථයේ තිරිංග - brake - පද්ධතිය පරීක්ෂා කරන්නේ නැතිව මාස ගාණක් එක දිගට බස් රථය පැදවීමේ ප්‍රතිඵලයක් හැටියට. දුන්හිඳ ප්‍රදේශයේදී තමයි ඒ රිය අනතුර සිද්ධ වුණේ.

ඒ වාගේම අපි දැක්කා, රියැදුරන් එක දිගට රිය ධාවනය කිරීමේ ප්‍රතිඵලයක් විධියට, අපරීක්ෂාකාරී ලෙස රිය පැදවීමේ ප්‍රතිඵලයක් විධියට ඇල්ල ප්‍රදේශයේදී දැවැන්ත ඛේදවාචකයක් සිද්ධ වුණු ආකාරය. ගැරඬිඇල්ල ප්‍රදේශයේදීත් ඒ වාගේ ඛේදවාචකයක් සිද්ධ වුණා. ඒ ඛේදවාචක සියල්ල පිටුපස

[ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා]

තිබෙන්නේ, රියැදුරන්ගේ විනයක් නොමැතිකම සහ ඔවුන්ට අදාළ කරන නිසි නීති පද්ධතියක් ක්‍රියාත්මක නොවීමේ ප්‍රතිඵලය. ඒ නිසා අපි විශ්වාස කරනවා, පොදු ප්‍රවාහන සේවය සාර්ථක කර ගන්න නම්, අපි ඒකට අදාළ කරන බර තැබීමක් තියන්න ඕනෑ බව. විශේෂයෙන්ම අපි අවධාරණය කරන්න ඕනෑ, අපේ රටේ දිනකට හත්දෙනෙක් රිය අනතුරු නිසා ජීවිතක්ෂයට පත් වෙනවා කියන කාරණය. අපේ රටේ අහිංසක අම්මලා තාත්තලාගේ දරුවෝ, ඒ වාගේම දරුවන්ගේ අම්මලා තාත්තලා, අපේ රටට අවශ්‍ය කරන මානව සම්පත දවසකට හත්දෙනා ගණනේ මේ රිය අනතුරු නිසා ජීවිතක්ෂයට පත් වෙනවා. මේක ඛේදවාචකයක්. මේ ඛේදවාචකය කොහෙන් හරි කෙළවර කරන්න ඕනෑ. "දිට්වා" සුළි කුණාටුවෙන් වෙච්ච හානියට වඩා වැඩි හානියක්, අපිට ආර්ථික වශයෙන් වාර්ෂිකව මේ රිය අනතුරු නිසා සිද්ධ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, ඒ රිය අනතුරුවලින් සිදු වන සමාජයීය හානිය අපිට ගණනය කරන්න බැහැ කියලා. දරුවෙකුට අම්මා කෙනෙක් නැති වුණාට පස්සේ වෙන හානිය, දරුවෙකුට තාත්තා කෙනෙක් නැති වුණාට පස්සේ වෙන හානිය; ඒ සමාජයීය හානිය අපිට ගණනය කරන්න බැහැ. හැබැයි, අපි විශ්වාස කරනවා, ඒ සමාජයීය හානිය වැඩියි, ඒ වාගේම භෞතික හානිය වැඩියි කියලා. මේ "දිට්වා" සුළි කුණාටුවෙන් වෙච්ච හානියට වඩා වැඩි හානියක් වාර්ෂිකව මේ රිය අනතුරු නිසා අපට සිද්ධ වෙනවා. ඒක නිසා අපිට සිද්ධ වෙලා තිබෙනවා, ඒ රිය අනතුරුවලට අදාළව මේ වාගේ සුවිශේෂී මැදිහත්වීමක් කරන්න.

මෙහිදී අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ, මේ අතිවිශේෂ ගැසට් පත්‍රය අපි ඉදිරිපත් කරන වෙලාවේම විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා තමන්ගේ අදහස, විපක්ෂයේ අදහස ඉදිරිපත් කළා. අපි සතුටු වෙනවා, මෙවැනි කාරණයක් සම්බන්ධයෙන් විපක්ෂය එවැනි හොඳ ස්ථාවරයක හිඳීම ගැන. මේ සම්බන්ධයෙන් විරෝධය නොපා, විපක්ෂයේ සුපුරුදු ක්‍රියාකාරකම පැත්තක තියලා, අපි ඉන්න ස්ථාවරයේම හිට ගැනීම සම්බන්ධයෙන් අපි එතුමන්ලාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ වාගේම අපි කියන්න ඕනෑ, බරපතළ ආපදා අවස්ථාවක මේ රට තිබෙන්නේ කියන එක. ඒ ආපදා අවස්ථාවට පෙර අපේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය තුළින් ඉතා සුවිශේෂී වැඩ කොටසක් කරමින් සිටියා. එක පැත්තකින් මේ රටේ මාර්ග පද්ධතිය හදන්න විශේෂ මැදිහත්වීමක් කරලා, මාර්ග පද්ධතිය වැඩි දියුණු කරන්න සුවිශේෂී මුදලක් ගිය වර්ෂයේදී අපට යොදන්න පුළුවන් වුණා. RDA එකට විතරක් ඉතිහාසයේ වැඩිම මුදලක් යොදවපු වර්ෂය හැටියට ගිය වර්ෂය හඳුන්වා දෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ජීවත් වන බදුල්ල දිස්ත්‍රික්කයට, ඒ වාගේම මොනරාගල දිස්ත්‍රික්කයට වෙන් කරපු මුදල් ප්‍රමාණ ගැනත් මම දැන් කියන්නම්. මොනරාගල දිස්ත්‍රික්කය විතරක් ගත්තොත්, 2024 වර්ෂයේ මොනරාගල දිස්ත්‍රික්කයට මාර්ග ආපදා සම්බන්ධයෙන් වෙන් කර තිබෙනවා රුපියල් මිලියන 163.49ක මුදලක්. ඒක 2025දී රුපියල් මිලියන 344.85 දක්වා වැඩි වෙනවා. දෙගුණයකට වැඩියි, වෙන් කරපු මුදල. ඒ වාගේම බදුල්ල දිස්ත්‍රික්කයට 2024දී රුපියල් මිලියන 618යි වෙන් කරන්නේ. 2025දී බදුල්ල දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 975කට වැඩියෙන් වෙන් කර ගන්න පුළුවන් වෙනවා, මේ මාර්ග යථාවත් කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න. 2025 වර්ෂය තුළ අපේ දිස්ත්‍රික්කය වැනි දුෂ්කර දිස්ත්‍රික්කවලට එවැනි විශාල මුදලක් යොදලා මාර්ග හදා ගෙන ගියපු වැඩ පිළිවෙළක් තිබුණා. ඒ වාගේම, 2025 වර්ෂය අවසාන භාගයේ "දිට්වා" සුළි කුණාටුව ආවාට පස්සේ ඒ සුළි කුණාටුවේ තිබුණු බලපෑම නිසා, රුපියල් බිලියන 68.8ක් මාර්ග කොටස් 572කට අදාළව කිලෝමීටර 1,450ක් සඳහා ඉදිරියේදී වියදම් කරන්න වෙයි කියලා අපි හිතනවා. සමස්තයක් වශයෙන් මාර්ග පද්ධතියට අදාළව විතරක් රුපියල් බිලියන 190කට වැඩි වියදමක් දරන්න සිද්ධ වෙයි කියලා අදහසක් තිබෙනවා. ඒ සියලු වියදම් දරන්න ඕනෑ. ඒ වාගේම අපි විශේෂයෙන්ම ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයට ස්තුති කරන්න ඕනෑ. අපට හැම වෙලාවේම උපදෙස් ලැබුණේ තිබුණු පාරට වඩා හොඳ පාරක් හදමු කියලා. හැමදාම ව්‍යසනයක් එද්දී හැකිළෙන, ව්‍යසනයක් එද්දී පසු බසින, මිනිස්සුන්ගේ පැත්තෙන් හිතන්නේ නැතුව, දේශපාලන අධිකාරිය පැත්තෙන් හිතන විපක්ෂය වාගේ කණ්ඩායම් ඉන්න රටක අපි කියනවා මේක අලුත් ආදර්ශයක් කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! අද දින විවාදයේ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කරගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

**ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා**
(மாண்புமிகு தினிந்து சமன் ஹென்நாயக்க)
(The Hon. Dinindu Saman Hennayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තිබුණාට වඩා හොඳ පාරක් හදන්න, තිබුණාට වඩා හොඳ විධියට ඒකට මැදිහත් වෙන්න වාගේම අපට පුළුවන් වෙලා තිබෙනවා මේ රට තිබුණාට වඩා හොඳ තැනකට යයි කියලා සුබවාදීව හිතන්න. මේ ව්‍යසනය තුළින් ජාතික ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ 11කට හානි සිද්ධ වුණා. බස්රථ 74ක් සම්පූර්ණයෙන් විනාශයට පත් වුණා. මෙතැනට ඇවිල්ලා කෑගහන්න පුළුවන්, "දිග බස් එකක් දෙනවාද, කොට බස් එකක් දෙනවාද?" කියලා. හැබැයි, මේ විනාශය වෙද්දී ඒ මහත්වරුන්ගේ තිබුණු හැසිරීම් සම්බන්ධයෙන් අපි කල්පනා කරලා බලන්න ඕනෑ. අපිට මේ සම්බන්ධව හොඳ තක්සේරුවක් තිබෙනවා. ප්‍රවාහන පද්ධතිය හදන්න ඕනෑ, ප්‍රවාහන පද්ධතිය වැඩිදියුණු කරන්න ඕනෑ, ඒ වාගේම රාජ්‍ය සේවය කාර්යක්ෂම කරමින්, සියලු අංශ ඒකාබද්ධ කරමින් ඉදිරියට යන වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ.

ඒ නිසා අපි ඒ මහත්වරුන්ට කියනවා, කැබ් රථ ගෙන්වනවා වාගේම පොදු ප්‍රවාහන සේවයත් විධිමත්ව හදන වැඩ පිළිවෙළ අප ආරම්භ කර තිබෙන බව. අපි එය අඛණ්ඩව සිදු කරනවා. ඒ නිසා කලබල වෙන්න එපා කියලා අපි විපක්ෂයේ මහත්වරුන්ට කියනවා. ඔබතුමන්ලා කලබල වෙන්න ඕනෑ නැහැ, අපි ඒකට අදාළ වැඩ පිළිවෙළ හදලා ඉවරයි.

මේ ව්‍යසනය නිසා බදුල්ල දුම්රිය මාර්ගය තැන් කිහිපයකින් ආපදාවට ලක් වෙලා තිබුණා. විශ්වාස කරන්න බැරි වුණා, කවදා ඒ මාර්ගයේ දුම්රියක් යයි ද කියලා. හැබැයි අපට පුළුවන් වුණා, ඉතාම කෙටි කාලයකදී බදුල්ලේ සිට අඹේවෙල දක්වා දුම්රිය ගමන් නැවත ආරම්භ කරන්න. බදුල්ල දුම්රිය මාර්ගය, සුවිශේෂී දුම්රිය මාර්ගයක්. මොකද, සංචාරක කර්මාන්තය දියුණු කිරීම අත්‍යවශ්‍ය කාරණයක් වෙලා තිබෙන මොහොතක ලංකාවට පැමිණෙන විදේශීය සංචාරකයන්ට දුම්රියේ ගමන් කරන්න, දුම්රියෙන් ගමනාන්තවලට යන්න, වටපිටාවේ සිරි නරඹන්න පහසුකම් සලසන වැඩ පිළිවෙළේ අත්‍යවශ්‍ය දෙයක් වෙලා තිබෙනවා, බදුල්ල දුම්රිය මාර්ගය. සංචාරක කර්මාන්තය නැවත

ගොඩ නැඟීමේදී උඩරට දුම්රිය මාර්ගය කේන්ද්‍රීය ස්ථානයක්, අප ප්‍රමුඛත්වය දිය යුතු ස්ථානයක්. අපට පුළුවන් වෙලා තිබෙනවා, හදන්න බැහැ කියපු, හදලා ඉවර කරන්න දිනයක් කියා ගන්න බැරි වෙච්ච එම දුම්රිය මාර්ගය ඉතා කෙටි කාලයකදී දුම්රිය ගමන් ආරම්භ කරන තත්ත්වයට පත් කරන්න.

ඒ වාගේම අපේ දිස්ත්‍රික්කය වන බදුල්ල දිස්ත්‍රික්කයේ මහාමාර්ග සම්බන්ධයෙනුත් කිව යුතුයි. මේ ආපදා තත්ත්වය අවසන් වූ ගමන්ම අපි ඒ මහාමාර්ග සම්බන්ධයෙන් සාකච්ඡාවක් පැවැත්වූවා. ඒ සාකච්ඡාවට සහභාගි වෙලා හිටපු සියලු නිලධාරින්ගේ අදහස වෙලා තිබුණේ, ඒ මහාමාර්ග පද්ධතිය වැඩිදියුණු කරන්න සැහෙන කාලයක් යයි කියලායි. කියන්න සතුටුයි, මේ ආපදාවට අභියෝග කරමින් අද වෙද්දී දිස්ත්‍රික්කයේ සියලු මහාමාර්ග නැවත විවෘත කරලා තිබෙනවා.

ඒ වාගේම බදුල්ල දිස්ත්‍රික්කයේ වාරි පද්ධතිය කඩා වැටිලායි තිබුණේ. වාරි ව්‍යාපෘති 1,400ක් පමණ සම්පූර්ණයෙන් අකර්මණ්‍ය වෙලායි තිබුණේ. අපි මැදිහත් වුණා; ජනතාවත් එකතු වුණා. දැවැන්ත වාරි මෙහෙයුමක් කරන්න අපි තීන්දුවක් ගත්තා, "දිට්වා පරදන අධිෂ්ඨානයේ මහා මෙහෙයුම" කියලා. එය සති දෙකක වාරි මෙහෙයුමක්. අපට පුළුවන් වුණා, ඒ ව්‍යාපෘති නැවත පණ ගන්වා ජනතාවට බත සපයන ගොවියාට ඒ සඳහා ඉඩ සලසන වැඩ පිළිවෙළ හදන්න. ඒ ප්‍රදේශයේ පාසල් 175ක් සහ පෙර පාසල් ද ඇතුළුව 225කට වැඩි ප්‍රමාණයක් ආපදාවට ලක් වෙලා තිබුණා. අද වෙද්දී ඒ සියලු පාසල්, දරුවන්ට යන්න පුළුවන් තත්ත්වයට පත් කරන්න අපට පුළුවන් වුණා. අපි පම්පෝරි ගහමින් සිටියේ නැහැ. අපි වැඩ කළා. ඔය පම්පෝරි ගහන විපක්ෂයෙන් අපි අහනවා ඔබතුමන්ලා හිටපු ආණ්ඩු කාලවල ආපදාව කළමනාකරණය කළේ කොහොමද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒගොල්ලන් හිටපු කාලයේ ආපදා කළමනාකරණය කරපු විධිය අපි දැක්කා නේ. විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ කණ්ඩායම එකතු වෙලා මේ ආපදාවේදී කරපු වැඩසටහන අනුව අපට පැහැදිලි වෙනවා, මෙවැනි ආපදාවකදී එතුමන්ලාගේ ආණ්ඩුවක් තිබුණා නම් මොකක්ද වෙන්නේ කියලා. එතුමා ග්‍රාම නිලධාරි මහත්මයා වාගේ තැනින් තැනට ගිහිල්ලා රුපියල් 25,000 ලැබුණාද කියලා අහමින් පොතේ නම ලියා ගන්නවා අපි දැක්කා. ඒකට විපක්ෂ නායකවරයෙක් ඉන්න ඕනෑ නැහැ. විපක්ෂ නායකවරයා ඒ වැඩේ කරන්න ඕනෑ නැහැ. අපි එතුමාට කියනවා, ඔය පොත පරිස්සම් කරලා තියාගන්න කියලා. මේ ආපදාවට ලක් වෙච්ච හැම කෙනාටම සහන ලබා දෙන්න දැවැන්ත සහන වැඩ පිළිවෙළක් අප හදලායි තිබෙන්නේ. අපි ඒ සඳහා රුපියල් බිලියන 500ක මුදලක් වෙන් කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් රජයට කිසිම ප්‍රශ්නයක් නැහැ. අපි ජනතාවට අවශ්‍ය කරන සහන ලබා දෙනවා. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා නම් ලිය ලියා ඉන්න. අපි වැඩ කරලා පෙන්වා තිබෙනවා, මේ වැඩසටහන ඉස්සරහට කරගෙන යන්න පුළුවන් කියලා.

ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවක් තිබුණා. ඒ සභාව 2018.04.05වන දා තමයි අවසාන වරට කැඳවා තිබුණේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා**
(மாண்புமிகு தினிந்து சமன் ஹென்நாயக்க)
(The Hon. Dinindu Saman Hennayake)
එතැන් සිට 2025.07.06වන දා අප එය කැඳවන තුරු ඒ ජාතික සභාව කැඳවා තිබුණේ නැහැ. විපක්ෂයට එය කැඳවන්න හැකියාව තිබුණේ නැහැ. ඒක තමයි එතුමන්ලාගේ කෙරුවාව. අප හිටපු කුරුණෑගල මීට පෙර ගෙවල් 70ක් නාය ගියා. ඒ අයට නැවත ගෙවල් හදලා දෙන්න අවුරුදු 4ක් ගත වුණා. ඒ වාගේම කබරගල කන්ද නාය ගියා. අපි ගිහිල්ලා තමයි ඒ අයට නිවාස හදලා දුන්නේ. ඔන්න, විපක්ෂයේ කෙරුවාව. නමුත් අද මෙතැනට ඇවිල්ලා කියනවා, මේ මේ දේවල් කරනවා කියලා. අපි කියනවා, මේ ආපදාව ඉතාම සුළු කාලයකදී කළමනාකරණය කර ගන්න අපට පුළුවන් වෙලා තිබෙන බව. අපේ රටේ මහජනතාවත්, රාජ්‍ය සේවකයනුත් ඒ සඳහා දැවැන්ත ශක්තියක් ලබා දීලා තිබෙනවා. දේශපාලන අධිකාරිය එයට නායකත්වය දීලා තිබෙනවා. ඒකේ අවසාන ප්‍රතිඵලය විධියට, අපට මේ ආපදාව සැහෙන මට්ටමකට කළමනාකරණය කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා. මේ වැඩසටහන ඇතුළේ අපි සනාථ කරනවා, අපට ඉදිරි කටයුතුත් සාර්ථකව කර ගන්න පුළුවන් වෙයි කියලා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "(203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වගන්තිය සමඟ කියවිය යුතු 141, 143, 144, 157අ, 168 සහ 190 වගන්ති යටතේ එවකට ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 සැප්තැම්බර් 25 දිනැති අංක 2455/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.12.18 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය. ඔබතුමියට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

## රජයේ ආයතනවල දිවා ආරක්ෂිත මධ්‍යස්ථාන පිහිටුවීම
### அரச நிறுவனங்களில் பகல் நேர பராமரிப்பு நிலையங்களை நிறுவுதல்
### ESTABLISHMENT OF DAY-CARE SAFE CENTRES IN GOVERNMENT INSTITUTIONS

[අ.භා. 5.03]

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ඇතැම් ප්‍රදේශවල ජීවත් වන වතු සහ නිවාස සංකීර්ණ ආශ්‍රිත පවුල්වල දරුවන් දිවා කාලය තුළ නිසි ආරක්ෂාවක් නොමැතිකමින් විවිධ අපයෝජනවලට හා විෂ මත් ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ ගොදුරක් බවට පත් වීමේ ඉඩකඩ වර්ධනය වෙමින් පවතී. දිවා කාලය තුළ දෙමාපියන් හා වැඩිහිටියන් නිවෙස්වල නොමැතිකමින් පාසල නිම වීමෙන් පසු නිවසට පැමිණෙන ළමයින්ගේ ආරක්ෂාව සඳහා නිවැරදි සොයා බැලීමේ ක්‍රමවේදයක් පවුල් සංස්ථාවට ප්‍රායෝගිකව නොමැතිකමින් හා පරිසරයේ ඇති විවිධ පරිසර හානි හා ගැටලු නිසා දරුවන්ට සිදුවන පීඩාවද අතිමහත් ය.
>
> එබැවින් පාසල නිම වීමෙන් පසු වැඩිහිටියන්ටද නැවත වගකීමෙන් දරුවන්ට මැදිහත් විය හැකි පරිදි දිවා කාලය තුළ දරුවන් රැක බලා ගන්නා පාසලක් හෝ මධ්‍යස්ථානයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ සිටින ළමා සංවර්ධන නිලධාරින් හා පරිවාස නිලධාරින්ගේ මැදිහත් වීමෙන් ඔවුන්ගේ පෞරුෂ සංවර්ධන වැඩසටහන් හා සංස්කෘතික වැඩසටහන්වලින්ද සපිරි ආරක්ෂිත මධ්‍යස්ථානයක් ලෙසට දැනට පවතින රජයේ ආයතන තුළම ස්ථාපිත කරමින් ළමා සංවර්ධනය හා ආරක්ෂාව තහවුරු කිරීමට වැඩසටහනක් හා යම් නීති පද්ධතියක් සකස් කළ යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කරන්න විශේෂ හේතුවක් තිබෙනවා. කොළඹ නගරය ගත්තත්, අනෙකුත් දිස්ත්‍රික්කවල ජනතාව තදාසන්නව ජීවත් වන, විශාල ජන සනත්වයක් තිබෙන ප්‍රදේශ ගත්තත්, වතු ආශ්‍රිත ප්‍රදේශවල වාගේම නිවාස සංකීර්ණ තිබෙන ප්‍රදේශ ගත්තත් ඒවායේ දරුවන්ට තමන්ගේ ක්‍රියාකාරකම් කරන්න තිබෙන අවස්ථාවක් හා වටපිටාවක් වාගේම ආරක්ෂාව සහිත වටපිටාවක් තිබෙනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. එවැනි වටපිටාවක් නොමැති නිසා ඒ ළමයින් නිරන්තරයෙන්ම විවිධ අපයෝජනවලට ලක් වෙනවා; ඒ වාගේම විවිධ විෂ මත්ද්‍රව්‍ය ජාවාරම්වල යෙදෙන පුද්ගලයන්ගේ ගොදුරක් බවට පත් වෙනවා. මොකද, දිවා කාලයේ පාසල් නිම වීමෙන් පසු දරුවන් රැක ගන්නා වගකිව යුතු ස්ථානයක දරුවන්ට රැඳී සිටින්න අවස්ථාවක් නැහැ. එම නිසා මේ නව රජයේ එක් වැඩ පිළිවෙළක් තමයි කිසිදු දරුවෙකු අත් නොහැර ආදරය, ආරක්ෂාව තිබෙන වටපිටාවක් සකස් කිරීම.

ඉහත කී ගැටලු නිසාම තමයි මෙවැනි යෝජනාවක් ගෙන එන්නේ; එම ගැටලු විසඳන යම් වැඩ පිළිවෙළක් බවට පත් වන විධියේ යම් නීති පද්ධතියක් සකස් කරන්න ඕනෑ කියා තීරණය කරන්නේ. අවදානම් තත්ත්වයේ පසුවන, අනාරක්ෂිත තත්ත්වයේ පසුවන දරුවන් ඉන්නවා. සමහර විට මව්පියන් දෙදෙනාම නැති දරුවෝත් ඉන්නවා. ඒ දරුවන් යම් වැඩිහිටියෙකු යටතේයි ඉන්නේ. සමහර විට ගෙදර ඉන්න වැඩිහිටියන් සියලුදෙනාම රැකියාවල නියුතු වෙලා ඉන්නවා. එම නිසා දවල් කාලයේ ඒ දරුවන්ගේ ආරක්ෂාව ගැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම තමයි සමහර දරුවන් phones වාගේ දේවලට, එහෙම නැත්නම් වෙනත් වෙනත් දේවලට ඇබ්බැහි වෙනවා. ඒ දරුවන් තම ළමා කාලය නිර්මාණශීලීව හා තම පෞරුෂ වර්ධනය වෙනුවෙන් යොදා ගන්නා පරිදි කළමනාකරණය කරන්න හා ඒ දරුවන්ට මඟ පෙන්වන්න කෙනෙක් නැහැ. විවිධ අවදානම් සහිත පරිසරයන්හි සිටින නිසාම ඒ දරුවන් සඳහා යම් වැඩ පිළිවෙළක් රජයේ වග කිව යුතු පුද්ගලයන් එක්ව සකස් කරන්න ඕනෑ.

මට ලැබී තිබෙනවා, ළමා හිමිකම් ප්‍රවර්ධන අංශයේ නිලධාරින් එකතු වෙලා හදපු වැඩසටහනක්. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලට ඉදිරිපත් කරපු එවැනි හොඳ වැඩසටහන් තිබෙනවා. ඒ වැඩසටහනුත් සැලකිල්ලට අරගෙන මෙන්න මේ කියපු අරමුණු ඉටු කර ගන්න, දරුවන්ගේ ආකල්ප වර්ධනය කරන්න, දරුවන්ට රැකවරණය සහිතව සංගීතය ඇතුළුව කලාව වාගේ දේවල් වැඩිපුර ඉගෙන ගන්න පුළුවන් විධියේ මධ්‍යස්ථාන අපට ඕනෑ වෙලා තිබෙනවා. ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය වාගේම තවත් අමාත්‍යාංශ රාශියක් එකතු කරගෙන, ඇතැම් විට පළාත් සභා පවා එකතු කරගෙන වැඩසටහනක් සකස් කරන්න ඕනෑ කියන යෝජනාව හා අවශ්‍යතාව දිගින් දිගටම එනවා. මා නියෝජනය කරන දෙහිවල ප්‍රදේශය ගත්තොත් -එවැනි ප්‍රදේශ තවත් තිබෙනවා- ඒ ඇතැම් දරුවන්ට තම නිවසේ ඇති පුංචි ඉඩ කඩ තුළ ක්‍රියාකාරකම් කරන්න විධියක් නැහැ. වර්ග අඩි සීමිත ප්‍රමාණයක් සහිත ගේ ඇතුළේ ඉන්න ඒ දරුවන් කැමැති නැහැ. ඒ වාගේම ඒ දරුවන් එළියට ගියාට පසුව ආරක්ෂිත පරිසරයක් නැහැ. එම නිසා දරුවන් විවිධ අකටයුතුවල ගොදුරක් බවට පත් වෙලා තිබෙනවා.

අපරාධකරුවෝ සමහර දරුවන් ප්‍රයෝජනයට ගන්නවා. ඒ නිසා පීඩාවට ලක් වන දරුවන් ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. සමහර මව්වරුන්ට තම දරුවන් නිවස තුළ දමා යන්න විධියක් නැහැ. ඒ නිසා දවල් කාලයේ ඒ දරුවන්ට යම් රැකවරණයක් ලැබුණොත් හොඳයි කියලා අපි හිතනවා. එහෙම වුණොත්, රැකියාවලට ගිහිල්ලා එන දෙමව්පියන්ට පවා ඒ දරුවන් ඒ මධ්‍යස්ථානවලින් අරගෙන නිවසට පැමිණෙන්න පුළුවන්. ඒ වාගේම දරුවා ඒ කාලය තුළ සතුටින් ඉන්නවා. අපි දරුවන් වෙනුවෙන් අලුත් දෙයක් නිර්මාණය කරන්න ඕනෑ. නමුත් ඒ අලුත් දෙය ඉබේ නිර්මාණය වෙන්නේ නැහැ. මේ කියන පරිසරය තුළයි එය නිර්මාණය වෙන්නේ. අලුත් දෙයක්, හොඳම දෙයක් දරුවන් වෙනුවෙන් නිර්මාණය කරන එක ලේසිත් නැහැ. හැබැයි, මේ පවතින වටපිටාව තුළ දරුවන්ට හොඳම දෙයක් නිර්මාණය කරන්න නම්, නිර්මාණශීලී වැඩ පිළිවෙළවල් බිහි වෙන්න ඕනෑ කියලායි අප හිතන්නේ. ඒවා බිහි කරන එක අපේ ආයතන සතු වගකීමක්. මේ පාර්ලිමේන්තුව හඬ නැඟිය යුත්තේ එවැනි වැඩසටහන් නිර්මාණය කරන්නයි; එවැනි නීති රීති සකස් කරන්නයි. එහෙම නොකර කකුළුවා ඇදේට යනවා කියලා සියලුදෙනාටම ඇදේට යන්න කියනවා වාගේ දරුවන්ට ඔහේ හැදෙන්න දීලා බලාගෙන ඉඳීම නොවෙයි කරන්න ඕනෑ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, මේ ගරු පාර්ලිමේන්තුව විසින් මේ සඳහා වැඩ පිළිවෙළක්, නීති පද්ධතියක් නිර්මාණය කරයි කියලා; ඒ වාගේම එයට අවශ්‍ය සහයෝගය ලබා දෙයි කියලා. මෙම යෝජනාව ගෙන ඒම සඳහා මට කාලය ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මන්ත්‍රීතුමිය.

[අ.භා. 5.09]

**ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය විසින් සභාව කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් කරන ලද යෝජනාව ඉතාම කාලෝචිත යෝජනාවක්. දරුවන් සම්බන්ධව ඉතාම උනන්දුවෙන් මැදිහත් වන ආණ්ඩුවක් නියෝජනය කරන කෙනෙකු විධියට මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

ஒருசில தோட்டப்புற மற்றும் வீடமைப்புத் தொகுதிகளில் உள்ள சிறுவர்கள் பாடசாலை நேரத்தின் பின்னரான பகல் நேரத்தில் எதிர்கொள்ளும் பாதுகாப்பின்மை தொடர்பான சபை ஒத்திவைப்பு நேரத்தின் போதான இப்பிரேரணையானது, காலத்துக்கேற்ற ஒரு பிரேரணையாகும். இந்த நாட்டின் எதிர்காலத்தைத் தீர்மானிக்கின்ற இன்றைய குழந்தைகளைப் பற்றி சிந்திக்கின்ற அரசாங்கம் என்ற அடிப்படையில், இப்படியான ஒரு பிரேரணையைக் கொண்டுவந்த கௌரவ சமன்மலீ குணசிங்ஹ அவர்களுக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்வதோடு, இதனை நான் மனப்பூர்வமாக ஆதரிக்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எங்களுடைய கௌரவ உறுப்பினர் அவர்கள் கூறியதுபோல், இன்று பல பிரதேசங்களில் தொழிலுக்குச் செல்பவர்கள் தமது குழந்தைகளை எவ்வாறு பாதுகாப்பது? என்ற வினாக்குறியுடன் வாழ்ந்துகொண்டிருக்கும் வேளையில்தான் இப்படியான ஒரு பிரேரணை இந்தச் சபைக்கு முன்வைக்கப்பட்டிருக்கிறது. எமது பிள்ளைகள் பாடசாலை விட்டுத் திரும்பி வீடுகளுக்குச் சென்றாலும், இன்றிருக்கும் நிலைமையில் அவர்களுக்கு எந்தவிதமான பாதுகாப்பும் இல்லாத ஒரு சூழ்நிலை காணப்படுகின்றது. நகரப் பிரதேசங்களிலும் சரி, கிராமப் பிரதேசங்களிலும் சரி, விசேடமாக தோட்டப் பிரதேசங்களிலும் சரி, பிள்ளைகள் பாடசாலை முடிந்து திரும்புகின்றபோது, அவர்கள் பல்வேறு பிரச்சினைகளுக்கு முகங்கொடுக்கின்றார்கள். என்ன செய்வது? எங்கு செல்வது? எப்படி நடந்து கொள்வது? என்ற பல கேள்விகள் அவர்கள் மத்தியில் எழுகின்றன. அத்தோடு, அவர்கள் பாடசாலை விட்டு வீடு திரும்பியதன் பின்னர் அவர்களுடைய தேவைகளைப் பூர்த்திசெய்து கொள்வதற்கான எந்தவித வசதியும் இருப்பதில்லை.

நான் இவ்விடத்தில் ஒரு விடயத்தைக் குறிப்பிட வேண்டும். எமது தாய்மார், தந்தைமார் காலையில் வேலைக்குச் சென்றால் மாலை நேரமே வீடுகளுக்குத் திரும்புகின்றார்கள். இந்த இடைப்பட்ட நேரத்துக்குள், அவர்களது பிள்ளைகள் பாடசாலை சென்றுவிட்டு வீடு திரும்பும்போது, இன்னோரன்ன குற்றச் செயல்களுக்கு ஆளாகின்றார்கள். இந்த சமூகத்தில் பெண் பிள்ளைகள் பாலியல் வன்புணர்வுகளுக்கு உட்படுத்தப்படுகின்றார்கள். நான் இந்தப் பிரேரணையை ஆதரிப்பதற்கான காரணம், அந்தப் பிள்ளைகள் பாதுகாக்கப்பட வேண்டும் என்பதற்காகத்தான். அவர்களின் கல்வி, சுகாதாரம், கலாசாரம் என்பன பாதுகாக்கப்பட வேண்டும். நாட்டின் எதிர்காலத்தைத் தீர்மானிக்கின்ற அல்லது நாட்டின் எதிர்காலத்தைத் தமது கைகளில் வைத்துக்கொண்டிருக்கும் இந்தச் சிறுவர்களுக்குப் பாதுகாப்பான ஓர் இடம் அமைக்கப்படுவது ஒரு நல்ல செயற்பாடாகும்.

தோட்டப்புறங்களில் 'லயன்' குடியிருப்பிலேயே எமது மக்கள் வாழ்கின்றார்கள். அவர்களுக்கு அங்கு எந்தவிதமான வசதிகளும் இல்லை. இந்த நிலைமையில், இவ்வாறான ஒரு பிரேரணை உண்மையிலே ஆதரிக்கத்தக்க ஒன்றாகும். இந்தச் செயற்றிட்டத்தை நாம் நகரப்புறங்களுக்கு மாத்திரமல்லாது, தோட்டப்புறங்களுக்கும் கொண்டுசெல்ல வேண்டும். பாடசாலை முடிந்து வீடு திரும்புகின்ற மாணவர்களை விளையாட்டுத்துறை, கல்வித்துறை, கலாசாரத்துறை மற்றும் பண்பாட்டுத் துறையில் ஈடுபடுத்துவதன் மூலம் அவர்களது வாழ்வைச் சிறந்த முறையில் முன்கொண்டுசெல்வதற்கு ஆவன செய்ய முடியும். மேலும், தீங்கான செயல்களில் ஈடுபடுவதில் இருந்து அவர்களை விடுவிப்பதற்கு இந்த மாதிரியான மத்திய நிலையங்கள் அமைக்கப்படுமானால் அது உண்மையிலேயே வரவேற்கத்தக்கது என்பதை நான் இந்தச் சபையில் கூறிக்கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[5.14 p.m.]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Hon. Presiding Member, I must thank the Hon. (Mrs.) Samanmali Gunasingha for bringing in this Motion on quite an important issue.

Sir, actually, the social structure of Sri Lanka has changed. Today, both parents are compelled to work to meet the rising cost of living. Also, single-parent households are increasing. Yet, our public support system has failed to evolve and to bringing about a system to look after the children who are left at home without the care of the parents during the daytime. It is a very serious matter. Thousands of school children are left unsupervised before and after school hours, not because their parents are irresponsible but because the State has not provided for an alternative structure for their safety. This is not merely a children's issue, but actually an issue of child safety, child development and social equity.

Sir, many children spend long hours alone at home, on the streets or in unsafe environments.ගොඩක් දරුවන් අම්මලා තාත්තලා නැතිව පාරේ යනවා. අපිත් පොඩි කාලේ පාරේ ගියා. එතකොට නම්, අපි වටේට අම්මා ඒ හැම තැනම හිටියා; බලාගෙන හිටියා. අපිත් සෙල්ලම් කළා. ඒක වෙනම දෙයක්. නමුත් අද තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස්. Therefore, I say that there should be, specially, proper, well-structured day care centres attached to schools or operated at the community level. That would address these issues. I think the most important thing is, we may have to bring in some supporting service more than a law.

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

I do not agree that there should be a law, but it should be a supporting service provided as day-care centres at the local authority level, the provincial council level and at educational institution level. That is important.

உண்மையிலே, சிறுவர்களைப் பாடசாலை நேரம் தவிர்ந்த பகல் நேரத்தில் பராமரிப்பு நிலையங்களை அமைத்துப் பாதுகாப்பது தொடர்பான செயற்றிட்டத்தை மேற்கொள்வதற்காகக் கொண்டுவரப்பட்டிருக்கின்ற சபை ஒத்திவைப்பின் போதான பிரேரணை என்பது முக்கியமான ஒரு விடயம்! அத்துடன், இன்னுமொரு முக்கியமான விடயம் பற்றி நான் பேச வேண்டும். இம்முறை 'ஹஜ்' கடமைக்குச் செல்வதற்கான ஏற்பாடு சம்பந்தமாக ஒரு பிரச்சினை ஏற்பட்டிருக்கின்றது. அது சம்பந்தமாகச் சுருக்கமாகச் சொல்லிவிட்டு இந்தப் பிரேரணை சம்பந்தமான விடயத்துக்கு வருகின்றேன். 'ஹஜ்' யாத்திரிகர்களுக்கான group leaders இன்னுமே நியமிக்கப்படவில்லை. அவர்கள் இன்னும் மக்கா - மதீனாவுக்குப் போய்த் தங்களுடைய ஆயத்த வேலைகளைச் செய்யவில்லை. 'ஹஜ்' கடமை மேற்கொள்வது தொடர்பான இணையத்தளம் ஒன்று - nusukmasar.com - இருக்கிறது. அதனடிப்படையில், காலக்கெடு விதிக்கப்பட்டிருக்கின்றது. அதாவது, பெப்ருவரி 8ஆம் திகதிக்கு முன் சில வேலைகளைச் செய்ய வேண்டும் என்று காலக்கெடு கொடுக்கப்பட்டிருக்கிறது. அதற்கான நடவடிக்கைகளை எங்களுடைய Hajj tour operators - leaders - செய்யவில்லை. இந்தக் காலக்கெடு முடிந்துவிட்டால், இலங்கை முஸ்லிம் 'ஹஜ்' யாத்திரிகர்களுக்குப் பாரிய பிரச்சினை ஏற்படும். எனவே, முஸ்லிம் சமய பண்பாட்டலுவல்கள் திணைக்களம் இது சம்பந்தமாகக் கவனத்திற்கொள்ள வேண்டும். முக்கியமாக, ஜித்தாவில் உள்ள எங்களுடைய Consulate Generalஇல் Consul General நியமனம் சம்பந்தமாகவும் பிரச்சினை ஏற்பட்டிருக்கின்றது. அது சம்பந்தமாகவும் அரசாங்கத்தின் கவனத்துக்குக் கொண்டுவருகின்றேன். அது ஒரு முக்கியமான விடயம்!

Let me come back to the topic of day-care centres. இந்த day -care centresஐப் பற்றி பேச வேண்டும். முக்கியமாக, குறைந்த வருமானம் உள்ள குடும்பங்களுக்கும், சேரிப் பகுதிகளில் வாழுகின்ற குடும்பங்களுக்கும் பாரிய பிரச்சினைகள் இருக்கின்றன. சேரிப் பகுதிகளில் வாழுகின்ற பிள்ளைகள் பாடசாலைவிட்டு வீட்டுக்கு வரும்பொழுது தாய், தகப்பன் வேலைக்குப் போயிருப்பார். அவர்கள் 5 - 6 மணிக்குத்தான் வீடு திரும்புவார்கள். அப்பிள்ளைகளின் அம்மாவின் அம்மா, அப்பாவின் அம்மா ஆகியோரும் பெரும்பாலும் வேலைக்குப் போய் இருப்பார்கள். இப்பொழுது நாட்டில் இருக்கின்ற பொருளாதார நிலைமை அதற்குக் காரணமாக இருக்கின்றது. இவ்வாறு இருக்கின்றபொழுது, அவர்களுடைய பிள்ளைகள் அச்சேரிப் பகுதியில் நடந்து திரிகின்றபொழுது தேவையில்லாத பிரச்சினைகளை எதிர்கொள்ள வேண்டி ஏற்படும். அவர்கள் பிழையான வார்த்தைப் பிரயோகங்களை மேற்கொள்வார்கள். இதனால் அவர்களுடைய parentsக்குப் பாரிய சிக்கல் ஏற்படுகின்றது. I think there should be a pilot project.

ඔබතුමිය මේ යෝජනාව ගෙනාපු එක හරි හොඳයි. පුළුවන් නම් අපට මේ ගැන පොඩි pilot project එකක් විශේෂ තැන්වල පටන් ගන්න පුළුවන්. ඔය slumsවල, ඒ වාගේම ජනාකීර්ණ තට්ටු නිවාස සංකීර්ණවල ඉන්න කට්ටියට ඒ පළාත් පාලන ආයතනත් සමඟ එකතු වෙලා යම්කිසි වැඩ පිළිවෙළක් හදන්න පුළුවන් නම් හොඳයි. විශේෂයෙන් CCTV cameras ආශ්‍රයෙන් හෝ ඒ දරුවන්ගේ අම්මලා තාත්තලාට වැඩ කරන ස්ථානයේ සිට ඒගොල්ලන්ගේ phones හරහා හෝ දරුවන්ට මොනවාද වෙන්නේ කියලා බලාගෙන වැඩ කර ගන්න පුළුවන් ක්‍රමයක් හදනවා නම් ඒක ලොකු දෙයක්. ඇත්තටම මේක හරිම ප්‍රශංසනීයයි. මේක සංකල්පයක් හැටියට ගෙනැල්ලා කරන්න පුළුවන්. නීතියක් මඟින් මේක කරන්න අමාරු වෙයි. බටහිර රටවල නම් සමහර විට මේ කටයුත්ත private and government කියලා එකතු කරලා කර තිබෙනවා. ලංකාවට ඒ ක්‍රමය හරියන්නේ නැහැ.

සල්ලි තිබෙන කට්ටියට සල්ලි ගෙවලා day-care centresවලට දරුවන් දාලා යන්න පුළුවන්. ඉතා ලොකු පාසල්වල ඉගෙන ගන්න දරුවන්ගේ අම්මලා තාත්තලා ලොකු තැන්වල වැඩ කරන නිසා ඒගොල්ලන්ට ඒ පාසලේම ඒ පහසුකම් ලැබෙන අවස්ථා තිබෙනවා. ඔබතුමිය දන්නවා ද දන්නේ නැහැ, ඒ පාසලේම හදලා තිබෙනවා, day-care centres. ඒ දරුවන්ට ඉන්න. නමුත් අඩු ආදායම් මාර්ග තිබෙන පවුල්වලට ඒක කරන්න බැහැ. ඒ වාගේම ඒ අයගේ දරුවන් යන පාසල්වලත් ඒවා නැහැ. ඒ පාසල්වලට හෝ ඒ මධ්‍යස්ථානයට ඒ දරුවා ගියාද කියන එක හරි වැදගත්. එතකොට ඒකට එතැන ඉන්න ගුරුවරයාත් සම්බන්ධ කර ගන්න වෙනවා. ඒ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිතුමා සම්බන්ධ කර ගන්න වෙනවා. ඒ ප්‍රදේශයේ පළාත් පාලන ආයතනවල ඒ සම්බන්ධ විශේෂ නිලධාරීන් ඉන්නවා නම්, ඒ අයත් සම්බන්ධ කරගෙන pilot project එකක් විධියට මේ වැඩේ පටන් ගන්න ඔබතුමියට පුළුවන් නම් හොඳයි. ඒක ඉතා වැදගත්. ජාත්‍යන්තර සංවිධාන ගොඩක් මේවාට ඒ අයගේ සහයෝගය දක්වන්න ලෑස්තියි. ඒවායේත් සහයෝගය අරගෙන මේක කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දෙමළෙන් කියපු අනික් කාරණයත් අවසාන වශයෙන් කියන්න ඕනෑ. මේ වතාවේ අපේ මුස්ලිම් ජනතාව හජ් වන්දනා ගමන යෑමේදී යම්කිසි ප්‍රශ්න වගයක් මතු වෙලා තිබෙනවා. Nusukmasar.com කියන වෙබ් අඩවියේ පෙබරවාරි 1වෙනි දා සහ පෙබරවාරි 8වෙනි දාට ඉස්සෙල්ලා ඒගොල්ලන්ව register කර ගන්න තිබෙන අවස්ථාව සම්බන්ධයෙන් ගැටලු තිබෙනවා. අපේ Hajj group leadersලා තවමත් ගිහිල්ලා නැහැ, සවුදියට. ඒ, ඔය ජිද්දාවල තිබෙන Consulate Generalහි ප්‍රශ්නය නිසා. ඒ පිළිබඳවත් මේ සභාවේ අවධානය යොමු කරමින් මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාටත්, මේ Adjournment Motion එක ගෙන ආ අපේ ගරු මන්ත්‍රීතුමියටත් ස්තුතිය ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.20]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

இன்றைய தினம் கௌரவ சமன்மலீ குணசிங்ஹ அவர்களால் கொண்டுவரப்பட்டுள்ள ஒத்திவைப்புப் பிரேரணையை எதிர்க்கட்சி, ஆளுங்கட்சி என்ற பேதங்களுக்கு அப்பால் நான் ஆமோதிக்கின்றேன். நான் மலையகத்தில் கிட்டத்தட்ட 7 வருடங்கள் வைத்தியராகவும், ஹட்டன்,

நோர்வூட், டிக்கோயா பகுதிகளில் 5 வருடங்கள் ஆசிரிய ராகவும் கடமையாற்றி இருக்கிறேன். அங்கு வாழுகின்ற மக்களுடைய வாழ்க்கைத் தரம், அவர்களுடைய நிலைமை தொடர்பாக எனக்கு நன்றாகத் தெரியும்! கௌரவ சமன்மலீ குணசிங்ஹ அவர்களுக்கு முக்கியமாதொரு விடயத்தை நான் சொல்கின்றேன். மலையகத்தில் இருக்கின்ற குழந்தைகள் மூன்று விதமான பிரச்சினைகளை எதிர்நோக்குகின்றார்கள். ஒன்று, மந்த போஷணை. இரண்டாவது, கல்வி தொடர்பான பிரச்சினை. மூன்றாவது, பாதுகாப்பு தொடர்பான பிரச்சினை.

அவர்கள் எதிர்கொள்ளும் பாதுகாப்புப் பிரச்சினைக்கு நான் நல்லதோர் உதாரணத்தைச் சொல்லுகின்றேன். 2022ஆம் ஆண்டு மலையகத்தில் தாய், தந்தை இல்லாத குழந்தைகளைப் பொறுப்பேற்பதாகக் கூறி, 12 வயதுக்குட்பட்ட குழந்தைகள் யாழ்ப்பாணம், தெல்லிப்பளையிலுள்ள ஓர் ஆசிரமத்தில் வைக்கப்பட்டார்கள். அந்த ஆசிரமத்தில் அவர்கள் குளிக்கும் அறையில் - bathroomஇல் - camera பொருத்தப்பட்டிருந்தது கண்டறியப்பட்டது. பின்னர், அது தொடர்பாக ஒரு வழக்கும் தொடரப்பட்டது. எங்களுடைய குமாரவடிவேல், குருபரன் போன்ற இனத்துக்கு ஒவ்வாத சில lawyers உடைய வேலை காரணமாக அந்த வழக்கு நீர்த்துப்போகச் செய்யப்பட்டது. இதன் ஆழம் எப்படியென்றால், குழந்தைகளுடைய bathroomக்கு - toiletக்கு - camera பூட்டுகின்ற அளவுக்கு அந்தக் குழந்தைகள் பாதிக்கப்பட்டிருந்தார்கள். தயவுசெய்து, இதைக் கருத்திலே எடுங்கள்!

இன்றைய இந்த ஒத்திவைப்புப் பிரேரணையில் லயன்கள் மற்றும் குடியிருப்புகளில் வசிக்கின்ற சிறுவர்களை மட்டும் கருத்திற்கொண்டு இருக்கின்றீர்கள். ஆனால், வடக்கு மாகாணத்தில் போரால் பாதிக்கப்பட்ட மற்றும் அம்மா, அப்பா இல்லாதோர் ஏராளமாக இருக்கிறார்கள். வடக்கு மாகாணத்தில் இருக்கின்ற குழந்தை பராமரிப்பு நிலையங்கள் தொடர்பான ஒரு கருத்துக் கணிப்புகூட அரசாங்கம் இதுவரைக்கும் மேற்கொள்ளவில்லை. சில இடங்களுக்கு நாங்கள் போயிருக்கின்றோம். Save our Souls - SOS - என்பது அங்கீகரிக்கப்பட்ட ஒன்றென்பது உங்களுக்குத் தெரியும். அது தவிர, தனியார் நடத்துகின்ற தரம் குறைந்த எத்தனையோ குழந்தை பராமரிப்பு நிலையங்கள் வடக்கு மாகாணத்தில் இருக்கின்றன. அந்தப் பிள்ளைகளுடைய தகவல்களைக் கணக்கெடுத்து, அவர்களை அரசாங்கத்தின் பொறுப்பின்கீழ் கொண்டுவர வேண்டும் என்று மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர் கௌரவ சாவித்திரி போல்ராஜ் அவர்களிடம் நான் நேரடியாகக் கேட்டிருந்தேன். இரண்டாவது, இந்தக் குழந்தைகள் தொடர்பான விஷயத்தில் சாதாரணமாக வெளிநாட்டில் ஒரு குழந்தை துன்புறுத்தப் பட்டால், Child Protection Officeஇனுடைய hotlineக்குக் call பண்ணுகின்றபோது அவர்கள் நேரடியாக அந்த இடத்துக்குச் செல்வார்கள். அவர்களுக்கு பொலிஸாரைவிட அதிக தராதரங்கள் இருக்கும். அவர்கள் நேரடியாகப்போய் intervention செய்யலாம். ஆனால், இலங்கையைப் பொறுத்தவரைக்கும் ஒரு complain வந்தால், Development Officer அல்லது வேறு உத்தியோகத்தர்களால் ஒரு பிள்ளையைப் பாரமெடுக்க முடியாது. ஆகவே, அரசாங்கம் இந்த விடயத்தில் அதிகம் கவனம் செலுத்த வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

அம்மணி அவர்களே, இன்னொரு விடயத்தையும் செல்கிறேன். அதை அறிந்தால் நீங்கள் மிகவும் கவலைப் படுவீர்கள். நீங்களும் ஓர் அம்மா என்று நினைக்கின்றேன். முல்லைத்தீவிலுள்ள மாஞ்சோலை வைத்தியசாலையில் இரண்டு கிழமைக்கு முன்னர், குகநேசன் டினோஜா என்கின்ற 12 வயதுப் பிள்ளை உணவு ஒவ்வாமை காரணமாக admit பண்ணப்பட்டு, அங்கு dilute பண்ணாமல் adrenaline ஏற்றியதால் அந்தப் பிள்ளை இறந்துபோய்விட்டது. நானும் ஒரு வைத்தியர் என்பதால் இதனைச் சொல்கிறேன். எங்களுடைய சுகாதார அமைச்சர் அவர்கள் இற்றைவரைக்கும் அது தொடர்பில் எந்தவொரு விசாரணையையும் மேற் கொள்ளவில்லை. தெற்கிலோ அல்லது சிங்கள மக்கள் வாழுகின்ற பிரதேசங்களிலோ 12 வயதுப் பிள்ளைக்கு adrenaline ஏற்றி அந்தப் பிள்ளை செத்துப் போய்விட்ட தென்றால் நிலைமை என்னவாகும்?

உதாரணமாக, asthma வந்தால் salbutamol nebulize பண்ண வேண்டும், hydrocortisone கொடுக்க வேண்டும். ஆனால், இங்கு எதுவுமே செய்யவில்லை. Adrenaline ஏற்றி பிள்ளை செத்துப் போய்விட்டது. உறவினர்கள் வைத்தியசாலைக்கு வெளியேயிருந்து போராடினார்கள். அது தொடர்பான செய்திகள் வெளிவரவில்லை. உங்களுடைய மனச்சாட்சி பற்றி எனக்குத் தெரியவில்லை. வடக்கு, கிழக்கு மாகாணத்தையும் இந்தப் பிரேரணையில் சேர்த்திருக்கலாம். நான் எதிர்க்கட்சியைச் சேர்ந்தவன். நான் இதனை எதிர்த்துத்தான் பேச வேண்டும். இருந்தாலும், உங்களுடைய பிரேரணையில் நல்ல விடயமும் உள்ளடங்கியிருப்பதால் நான் இதனை ஆதரித்துப் பேசுகின்றேன். வடக்கு, கிழக்கையும் சற்றுப் பாருங்கள்! அங்கே எத்தனையோ அநாதை இல்லங்கள் இருக்கின்றன. போரால் பாதிக்கப்பட்டவர்களின் பிள்ளைகள் இருக்கிறார்கள்; அம்மா, அப்பா இல்லாத எத்தனையோ பிள்ளைகள் இருக்கிறார்கள். அவர்களைப் பராமரிப்பதாகக் கூறி வெளிநாட்டில் இருக்கின்ற diasporasஇடம் சிறீதரன் போன்ற சில பாராளுமன்ற உறுப்பினர்கள் பணம் வசூலிக்கின்றார்கள். கடைசி நேரத்தில் விடுதலைப் புலிகள் வைத்திருந்த குழந்தைகள் இப்போது வளர்ந்து கலியாணம் கட்டியிருக்கிறார்கள். ஆனால், அவர்களுக்கு அப்பா, அம்மா இல்லை; இருப்பதற்கு வீடில்லை. இந்தப் பிரேரணையில் நீங்கள் வடக்கு மாகாணத்தையும் அல்லது போரால் பாதிக்கப்பட்டவர்களது குழந்தைகளையும் சேர்த்திருந்தால் சந்தோஷப்பட்டிருப்பேன்.

எங்களுடைய எதிர்கால சந்ததியினர்தான் குழந்தைகள்! எனக்கும் ஒரு குழந்தை இருக்கிறது. அவர்களுடைய கல்வி விடயம் சம்பந்தமாக நான் குறிப்பிட விரும்புகின்றேன். සමලිංගික සම්බන්ධතා எனப்படும் ஒரு பால் புணர்ச்சி சம்பந்தமான விடயத்தை இந்தப் பாராளுமன்றத்தின் கவனத்துக்கு முதல்முதலாகக் கொண்டுவந்தவன் நான். அப்படி ஒரு விடயம் இருக்கின்றது என்பதை அப்பொழுது யாருமே நம்பவில்லை. ஆனால், 6ஆம் ஆண்டு பிள்ளைகளுடைய பாடத்திட்டத்தில் இப்போது அதைப் புகுத்தியிருக்கிறார்கள். ஒரு காலத்தில் வடக்கு மாகாணத்தில் இருந்த வைத்தியர்கள் கூட தெற்குக்கு வந்து வேலைசெய்து பிரபல்யமான வைத்தியர் களாக இருந்திருக்கிறார்கள். இப்போது இந்தியாவிலிருந்து கஞ்சா, அபின் போன்ற போதைப்பொருள்தான் வட மாகாணத்திலிருந்து தெற்குக்குக் கொண்டுவரப்படுகின்றன.

ஆகவே, குழந்தைகளுடைய எதிர்காலம் என்று சொல்லும் பொழுது, இவ்வாறான விடயங்களையும் நீங்கள் பார்க்க வேண்டும். குழந்தை பராமரிப்பு நிலையம் கட்டுவது தொடர்பாக, NPP அரசாங்கம் இந்தப் பிரேரணையைக் கொண்டுவருவதை நான் வரவேற்கின்றேன். ஏனென்றால், எங்களுடைய வடக்கு மாகாணத்தில்கூட உங்கள் சார்பாக இளங்குமரன் என்ற ஒரு குழந்தை இருக்கின்றார். அந்தக் குழந்தைக்குச் சில நேரங்களில் என்ன விடயத்தைக் கதைப்பது, என்ன விடயத்தைக் கதைக்காமல் விடுவது என்பதுகூட தெரியாது. ஆகவே, குழந்தை பராமரிப்பு நிலையம் மிகவும் முக்கியமானது. குறிப்பாக, NPP அரசாங்கத்துக்கு இது மிகவும்

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

முக்கியமானது. ஏனென்றால், இளங்குமரன் போன்ற குழந்தைப் பிள்ளைகள் மற்றும் எங்களுடைய றஜீவன் போன்ற வயதுபோன குழந்தைப் பிள்ளைகளும் அதில் பராமரிக்கப் படலாம்!

அத்துடன், வடக்கு மாகாணத்தில் இருக்கின்ற போரால் பாதிக்கப்பட்டவர்களது குழந்தைகளுக்குத் தயவுசெய்து ஏதாவதொரு நல்ல விடயத்தைச் செய்ய வேண்டும். தாய், தந்தையர் இல்லாத எத்தனையோ பிள்ளைகள் அங்கு வாழ்கின்றார்கள். முக்கியமாக, வடக்கு மாகாணத்தில் கிளிநொச்சி, முல்லைத்தீவு, மன்னார், வவுனியா என்பன வருமானம் குறைந்த மாவட்டங்களாக உள்ளன. ஆகவே, இப்படியான proposalsஐக் கொண்டு வரும்பொழுது தெற்கு, மலையகம் என்று மட்டுப்படுத்தாமல் வடக்கையும் சேர்த்துக்கொள்ள வேண்டும். அந்த வகையில், வடக்கில் வாழுகின்ற தமிழ் மக்களையும் இந்த நாட்டின் பிரஜைகளாகக் கருதி, நீங்கள் இந்தப் பிரேரணையைக் கொண்டுவந்திருந்தால் நன்றாக இருந்திருக்கும். என்றாலும், உங்களால் முன்வைக்கப்பட்ட இந்தப் பிரேரணையை நான் வரவேற்கின்றேன். Thank you.

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කියන්න, ගරු මන්ත්‍රීතුමිය.

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
පිළිතුරු කථාව නොවුණත්, මේ කාරණයත් මම කියන්න අවශ්‍යයි. ගරු මන්ත්‍රීතුමා කියපු විධියට අපි මේක pilot project එකක් විධියට කරනවා. මෙහි තිබෙන ප්‍රායෝගික තත්ත්වය පිළිබඳව යම් සමීක්ෂණයක් කරලා, මේ වැඩසටහන උතුර, නැඟෙනහිර, කඳුකරය ඇතුළු සියලු පළාත්වල සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම කරන්න පුළුවන්. ඒ නිසා මම ඉතාම වගකීමෙන් කියනවා, උතුර, නැඟෙනහිරත් ඇතුළුව අපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සියල්ලකම මෙම වැඩසටහන සිදු කරනවා කියන එක. එක තැනක් අත්හැරලා කථා කරන්න මම සූදානම් නැහැ. මොකද, හැම තැනකම ඉන්නේ අපේ දරුවන්. දරුවන්ගේ ආරක්ෂාව ගැන අපට වගකීමක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට පිළිතුරු කථාව, ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.29]

**ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා (කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நாமல் சுதர்சன - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Namal Sudarshana - Deputy Minister of Women and Child Affairs)
අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද දින සභාව කල් තබන අවස්ථාවේ මෙම යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් විශේෂයෙන්ම ගරු සමන්මලී ගුණසිංහ මහත්මියට මම ස්තුතිවන්ත වෙනවා. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශය තුළත් අපි දරුවන් සම්බන්ධයෙන් "සුරක්ෂිත ළමා ලෝකයක් - නිර්මාණශීලී අනාගත පරපුරක්" කියන යෝජනාව ඉදිරිපත් කර තිබෙනවා. අපි අසා තිබෙනවා, හොඳම දේ දරුවන්ට කියලා. හැබැයි, මේ රට ඇතුළේ මේ මොහොතේත් මෙවැනි විශාල ගැටලු ප්‍රමාණයක් අපි අත්විඳිනවා. දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන්, රැකවරණය සම්බන්ධයෙන් සුරක්ෂිත පරිසරයක් නොමැතිකම අපි දකිනවා. ඒක උතුරේද, දකුණේද, මධ්‍යම කඳුකරයේ වතු ආශ්‍රිතවද කියලා නැහැ, සියලුම තැන්වල අපට අත්විඳින්න ලැබෙනවා.

අද දින ඉදිරිපත් කළ මේ කල්තැබීමේ යෝජනාව අතිශයින්ම වැදගත් යෝජනාවක්. මෙය, රජයක් විධියටත් අපේ වැඩි අවධානයක් යොමු වෙලා තිබෙන ක්ෂේත්‍රයක්. මේ සඳහා මැදිහත් වෙන කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයට සම්බන්ධ නිලධාරින් ප්‍රමාණයක් සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉන්නවා; ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරින්, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින්, මුල් ළමා විය සංවර්ධනය පිළිබඳ නිලධාරින් ආදී නිලධාරින් විශාල ප්‍රමාණයක් ඉන්නවා. නිලධාරින් ඒ විධියට හිටියත්, දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් තවදුරටත් මේ රටේ විශාල ප්‍රශ්න ප්‍රමාණයක් තිබෙනවා. විශේෂයෙන්ම දිවා කාලයේදී - පාසල් වේලාවෙන් පසුව - දෙමව්පියන්ගේ රැකවරණය අහිමිව දරුවන්ට තනියම ඉන්න බැරි පරිසරයක් නගර ආශ්‍රිතව නිර්මාණය වෙලා තිබෙනවා.

වතු ආශ්‍රිතවත් ඒ ප්‍රශ්නය තිබෙනවා. ඒ නිසා මා හිතනවා, රජයක් විධියට අපට මේ සඳහා නිශ්චිත වැඩ පිළිවෙළක් අවශ්‍ය වන බව. අපි අමාත්‍යාංශය විධියටත් ඒ සම්බන්ධව යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා.

පළාත් පාලන ආයතනවලට අදාළව දැනට ක්‍රියාත්මක වන පෙර පාසල් විශාල ප්‍රමාණයක් තිබෙනවා, ළමා සුරැකුම් මධ්‍යස්ථාන විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒවා දිවා සුරැකුම් මධ්‍යස්ථාන විධියට තවදුරටත් සංවර්ධනය කරන්නට අපට හැකියාව තිබෙනවා. ඒ නිසා රාජ්‍ය පරිපාලන සහ පළාත් පාලන අමාත්‍යාංශය මැදිහත් වෙලා මේ සම්බන්ධව පළාත් පාලන ආයතනවලට අදාළව, පළාත් සභාවලට අදාළව යම් වැඩ පිළිවෙළක් සකස් කරන්නට හැකියාව ලැබෙනවා.

ඒත් එක්කම අපට අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධ කරගෙන පාසල් වේලාවෙන් පසුව දරුවන්ට රැකවරණය සලසන මධ්‍යස්ථාන විධියට පාසල් තුළත් ඒ අවශ්‍ය පහසුකම් සපයන්නට වැඩ පිළිවෙළක් සකස් කරන්නට හැකියාව තිබෙනවා. අපේ අමාත්‍යාංශය තුළ මේ සම්බන්ධයෙන් දැනුමක් තිබෙන, මේ සම්බන්ධයෙන් මැදිහත් වෙන්න පුළුවන් නිලධාරින් විශාල පිරිසක් ඉන්නවා.

අපේ මන්ත්‍රීතුමිය pilot project එකක් විධියට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා, "අවදානම් සහිත දරුවන් සඳහා රැකවරණ මධ්‍යස්ථාන පිහිටුවීමේ ව්‍යාපෘතිය" කියලා. ඒක දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශයට අදාළවත් සිදු විය යුතු බව එතුමිය සඳහන් කළා. අපි දන්නවා, එවැනි ස්ථානවල මේ වාගේ ගැටලු අතිශයින් දරුණු විධියට තිබෙන බව. එක පැත්තකින් එවැනි ප්‍රදේශවල මත්ද්‍රව්‍ය ප්‍රශ්නය විශාල වශයෙන් තිබෙනවා. එම නිසා ඒ පරිසරය තුළ සිටින දරුවන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමේ වැඩි ප්‍රවණතාවක් තිබෙනවා. සමහර තැන්වල දරුවන් සිටින්නේ සීමිත ඉඩ ප්‍රමාණවල. ඔවුන්ට එළියට බහින්න තැනක් නැහැ. ඒ නිසා අපි හිතනවා, එවැනි දරුවන් සම්බන්ධයෙන් ගත්තාම, මේ

යෝජනාව අතිශයින් වැදගත් කියලා. අමාත්‍යාංශය විධියට අපි මේක අනිවාර්යයෙන්ම අවධානයට ගන්නවා. නමුත් කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය විධියට අපට මේක තනියම මැදිහත් වෙන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. මම හිතන විධියට, මෙතැනදී අපට සාමූහික වගකීමක් දරන්න වෙනවා, සියලු ආයතන සම්බන්ධ කරගනිමින්. ඒ අනුව පළාත් පාලන ආයතන හා පළාත් සභා අයත් වන රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, ඒත් එක්කම අධ්‍යාපන අමාත්‍යාංශය, අපේ කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය කියන සියලු අමාත්‍යාංශවල අදාළ නිලධාරින් එක තැනකට ඇවිල්ලා මේ සම්බන්ධයෙන් හොඳ කතිකාවක් ගොඩනැඟිය යුතුයි. එම කතිකාව හරහා මේ සම්බන්ධව සුදුසු වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑය කියන යෝජනාව මෙහි තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේදී අපේ මන්ත්‍රීතුමියට විශේෂයෙන්ම ස්තුතිවන්ත වනවා, මෙම යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්. අමාත්‍යාංශය විධියට අපි මේ සම්බන්ධයෙන් දිගටම සාකච්ඡා කරනු ලබනවා, අනෙකුත් ආයතන එක්ක සම්බන්ධ වෙමින්. අපට මේ සම්බන්ධයෙන් උදවු ලබා ගන්න පුළුවන් ආයතන තිබෙනවා; UN agencies තිබෙනවා. ඔවුන් අපට උදවු කරන්න කැමැතියි. අපට මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න පුළුවන්. මේ සම්බන්ධයෙන් මැදිහත් විය හැකි විවිධ පෞද්ගලික ආයතන තිබෙනවා. මෙම යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙමින්, අපට උදවු කිරීමට ඉදිරිපත් වන සියලුදෙනා එක්ක සාකච්ඡා කර, ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කරන්නට අමාත්‍යාංශය විධියට අවශ්‍ය මැදිහත්වීම කරන බවත් ප්‍රකාශ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය ලබා දීම සම්බන්ධව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.34ට, 2026 ජනවාරි 09වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.34க்கு, பாராளுமன்றம் 2026 சனவரி 09, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.34 p.m. until 9.30 a.m. on Friday, 09th January, 2026.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.